යේසුස් නම්
බුද්ධ ශ්‍රාවකයාණෝ



කොලට් සේනානායක
නාරද කරුණාතිලක

යේසුස් නම් බුද්ධ ශ්‍රාවකයාණෝ

කොලට් සේනානායක
නාරද කරුණාතිලක

2000 ක්‍රිස්තු ජයන්තිය නිමිත්තෙනි

ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ
675, පී. ද ඇස්. කුලරත්න මාවත
කොළඹ 10

යේසුස් නම් බුද්ධ ශ්‍රාවකයාණෝ
කොලට් සේනානායක
නාරද කරුණාතිලක

පළමු මුද්‍රණය 2000 දෙසම්බර් 25
දෙ වන මුද්‍රණය 2001 ජනවාරි 25
තුන් වන මුද්‍රණය 2001 මැයි

© කොලට් සේනානායක, නාරද කරුණාතිලක
සියලු හිමිකම් කතුවරුන් සතු ය.

ISBN 955-20-4952-0

පිටකවරය:
කරුණාසිරි විජේසිංහ
පරිගණක අක්ෂර සංයෝජනය:
අංජුල චාමින්ද, ''සිංහලේ'', බෝවත්ත, බිංගිරිය.
ප්‍රකාශනය:
ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, 675, මරදාන පාර, කොළඹ 10.
මුද්‍රණය:
පැනසර, 180/15, "ලිච්ඡවි", සොයිසා පුර, ගාලු පාර, කටුබැද්ද.

පෙරවදන

ක්‍රිස්තියානි ආගමෙහි පදනම බයිබලය යි. බයිබලය යනු යේසුස් වහන්සේ සහ උන්වහන්සේ ගේ දහම විග්‍රහ කෙරෙන ඓතිහාසික ග්‍රන්ථයකි. බයිබලයෙහි ඓතිහාසික තොරතුරු සපයන සාක්ෂිකරුවෝ සතර දෙනෙක් සිටිති. ශුභාරංචිකරුවන් හෙවත් අපොස්තල්වරුන් වශයෙන් හඳුන්වනු ලබන මොවුහු, මැතිව්, **මාක්, ලූක් සහ ජෝන් (යොහාන්)** නම් වෙති. ක්‍රිස්තියානි බැතිමත්හු බයිබලය දේව වාක්‍යය වශයෙන් විශ්වාස කරති.

ක්‍රිස්තියානි, බෞද්ධ, හින්දු සහ මහමදික බැතිමත්හු ලංකාවේ වෙසෙති. සායි බාබා අදහන කල්ලියක් ද වෙයි. බියෙන් තැතිගත් මිනිසුන් ගස්වල පිහිට පතන බවක් ධම්මපද ගාථාවක* සඳහන් වෙතත් බොහෝ බෞද්ධයෝ බෝ ගස්වල පිහිට පතති. ඉන්දියාවේ මී, වඳුරු ගොන් හා සර්ප කෝවිල් තිබේ. බැතිමත්හු මේ කෝවිල්වලට ගොස් රැකියා දියුණුව, ගොවිතැන්වල සශ්‍රීකභාවය, රෝදුක්වලින් මිදීම ආදිය පතා මීයන් වඳුරන් බඳු සතුනට කන්නලව් කරති. දෙමව්පියන් විසින් හෝ අවශේෂ ජනයා විසින් හෝ දෙපාර්ශවය ම විසින් හෝ කුඩා කල සිට ම ඇදහීමට පුරුදු පුහුණු කරන ලද තරුණ තරුණියන් විභාග සමත්වීමට බෝ ගස්වල, සතුන් ගේ හෝ භූතයින් ගේ හෝ පිහිට ඉල්ලන්නේ ප්‍රසිද්ධියේ ම ය. පුරාණ ලංකාවේ කිසියම් පිරිසක් හරකුන් ගේ පිහිට පතා ඇති බව රත්මලානේ හා වත්තල ප්‍රදේශයේ ඇති **ගොනාකෝවිල** ග්‍රාමනාමය සාක්ෂි දරයි. පොළොන්නරුවේ ශිව දේවාල නටබුන්, ගැහැනුන් පුරුෂ ලිංගවලට වැඳුම් පිදුම් පුද පූජා පැවැත්වූ බවට සාක්ෂියකි.

---

* බහුං වේ සරණං යන්ති පබ්බතානි වනානි ච
ආරාම රුක්ඛ චේත්‍යානි මනුස්සා භය තජ්ජිතා

දෙ වන මුද්‍රණයට පෙරවදන

යේසුස් නම් බුද්ධ ශ්‍රාවකයාණෝ පළමු මුද්‍රණය නිකුත් වී මසක් ඇතුළත දෙ වන මුද්‍රණයක් නිකුත් කරන්නට ලැබීම සතුටට කරුණකි. පොත කියවූ සිය ගණනක් දෙනා දුරකතනයෙන්, ලිපිවලින් හා ඊමේල් මගින් අප ඇමතූ හ. භික්ෂූන් වහන්සේලා, ක්‍රිස්තියානි ආගමික නායකයින්, ප්‍රකට උගතුන් හා දේශපාලන ක්‍රියාකාරිකයින් ද ඒ අතර විය. දිරිගැන්වීම්, පැසසුම්, අඩුපාඩු පෙන්වාදීම්, නින්දා අපහාස මෙන් ම මරණ තර්ජනවලින් ද අඩුවක් නොවිණි. අප දිරිමත් කළ ඒ හැම දෙනාට ම අප ගේ ගෞරවාදර ස්තුතිය පිරිනමනු කැමැත්තෙමු.

පළමු මුද්‍රණයේ තිබූ දෝෂ කිහිපයක් මෙම මුද්‍රණයේ දී නිදොස් කොට ඇති අතර වැදගත් ය යි සැලකෙන ඡායාරූප කිහිපයක් ඇතුළත් කළෙමු. වටහා ගැනීමට අපහසු ය යි පාඨකයන් පෙන්වා දුන් ස්ථාන කිහිපයක් ද සංස්කරණය කෙරිණි.

දෙ වන මුද්‍රණය පිණිස උපදෙස් දෙමින් අප දිනුම්වත් කළ පූජ්‍යපාද මලගනේ අත්ථදස්සි - බිංගිරියේ ලොකු හාමුදුරුවන් වහන්සේ සහ මහින්ද කුමාර දළුපත සොහොයුරා පෑ අනුග්‍රහය අතිශය පලවත් විය. පූජ්‍යපාද ගංගොඩවිල සෝම, තලල්ලේ චන්දකිත්ති, කයිකාවල සන්තින්ද්‍රිය, දූවුවැව ලංකානන්ද සහ නරමානේ බුද්ධරක්ඛිත යන ස්වාමීන් වහන්සේලාත් ආචාර්ය සූරිය ගුණසේකර, මතුගම සෙනෙවිරුවන්, සමන් කළුආරච්චි, සරත් ඉඹුලමුරේ, උදිත දිසානායක, සුදත් බාලසූරිය යන මහත්වරුත් මෙහිලා නන් අයුරින් දක්වූ අනුග්‍රහය කෘතවේදී ව සඳහමු.

පොත පාඨකයා අතරට ගෙන යාම පිණිස දායක වූ සියලු ම මාධ්‍යවේදීනට අප ගේ ස්තුතිය පිරිනමන අතර නිදහස් අදහස් පළ කිරීමට අවස්ථාව ලබාදීම නිසා අපහසුතාවට පත් දිවයින පුවත්පත් සමාගමේ පාලක පක්ෂයත් දිවයින කර්තෘ මණ්ඩලයත් මේ අවස්ථාවේ ගෞරවයෙන් සිහිපත් කරමු.

කොලට් සේනානායක
2001. 01. 25
නාරද කරුණාතිලක

පටුන

1 බයිබලය හා දාස් කැපිටලය 17
2 යේසුස් වහන්සේ ගේ අප්‍රකට ජීවිතය සෙවීම 59
3 යේසුස් වහන්සේ පිළිබඳ සාක්ෂි 96
4 යෙරුසලමේ දූවරුනි මා නිසා නොහඬන්න 117
5 යේසුස් නම් බුද්ධ ශ්‍රාවකයාණෝ 161
6 උප ග්‍රන්ථය 188
ආශ්‍රිත මාධ්‍ය 204

බුදුන් වදාළ පරිදි ඇදහීම අගය කළ යුතු දෙයක් නොවේ. අගය කළ යුත්තේ විමර්ශනය යි. විමර්ශනය යනු කිමෙක් දැ යි බුදුන් වහන්සේ භික්ෂූන් හමුවේ ගෙනහැර දක්වූ පහත උපමාවෙන් පැහැදිලි වෙයි.

"මහණෙනි, දක්ෂ රන්කරුවකු උණුකිරීමෙන් හා උරගලෙහි ඇතිල්ලීමෙන් රත්රන්වල නියම ස්වභාවය දනගන්නා පරිද්දෙන් විචාරාත්මක පරීක්ෂාවෙන් මිස මා කෙරෙහි ඇති ගෞරවය නිසා මගේ ධර්මය නොපිළිගත යුතු ය."

බයිබලයේ සඳහන් ක්‍රිස්තියානි ශුභාරංචිකරුවන් ගේ සාක්ෂි පිළිබඳ ව විචාරයන්හි නිරත වූවෝ සිටිති. පළමුවෙන් ම බයිබලය විමර්ශනය කරමින් ශුභාරංචිකරුවන් ගේ සාක්ෂි විමසන ලද්දේ ජර්මන් ජාතිකයන් පිරිසක් විසිනි. **කොන්ස්ටන්ටයින් ටිචන්ඩෝෆ්** (Constantin Tichendorf 1815- 1874) ඔවුන'තරින් අයෙකි. ටිචන්ඩෝෆ් ශුභාරංචිකරුවන් ගේ ප්‍රකාශිත ලේඛනවල අත්පිටපත් සෙවීමට වෙහෙසුණේ ය.* ශුභාරංචිකරුවන් සතර දෙනා ගේ අත්පිටපත් සෙවූ පසුකාලීන ගවේෂකයනට අප්‍රධාන අපොස්තල්වරුන් පිරිසක් ද සිටින බව දැන ගත හැකි විය. අප්‍රධාන අපොස්තල්වරු, යේසුස් වහන්සේ හා සමකාලීන පලස්තීනය පිළිබඳ වටිනා තොරතුරු සම්භාරයක් හෙළි කරති.

ශුභාරංචිකරුවන් ගේ සාක්ෂි සන්සන්දනය කර බැලීම (Parallel Passage Technique) ආරම්භ කිරීමේ ගෞරවය ද ජර්මානු බුද්ධිමතුන් කිහිප දෙනකුට හිමි වෙයි. එහි දී අපොස්තල්වරුන් ගේ සාක්ෂි එකිනෙකට පරස්පර බව ඔවුහු වටහාගත් හ. යේසුස් වහන්සේ පාවාදීමෙන් පසු ජුදාස් ඉස්කොරිත් මිය යාම අහම්බෙන් සිදු වූ දෙයක් බව වරෙක බයිබලයේ සඳහන් වේ (ක්‍රියා 1:18). මැතිව් කියන පරිදි ජුදාස් ගෙළවැලලාගත්තේ ය (මැතිව් 27.8).

ඇණ ගැසූ පසු ව යේසුස් වහන්සේ ගේ සිරුර තැන්පත් කළ සොහොන වෙත ගිය කාන්තාවනට සොහොනේ ගල්දොර විවෘත ව ඇති බවත් පසෙක සුදු ඇඳගත් තරුණයකු වාඩිවී සිටින අයුරුත් දක්නට ලැබුණු බව මාක් කියයි (මාක් 16. 1-5). ලූක්, කාන්තාවන් එහි සිටින විට දිළිසෙන ඇඳුමින් සැරසුණු

---

* ටිචන්ඩෝෆ් ගේ ගවේෂණ වාර්තා බර්ලින් රාජ්‍ය පුස්තකාලයේ තිබේ.

මිනිසුන් දෙ දෙනකු හදිසියේ ම පහළ වූ බව කියයි (ලූක් 24. 1-5). මැතිව් ඊට හාත්පසින් ම වෙනස් කතාවක් ඉදිරිපත් කරයි. භූමිකම්පාවක් ඇතිවූ බවත් දෙවියන් විසින් එවන ලද දූතයකු ගල්දොර පෙරළාගෙන සොහොනට ඇතුළු වූ බවත් ඔහු පවසා ඇත (මැතිව් 28. 2-3).

මාක් හා ලූක් සඳහන් කරන ලෙසට යේසු **පීටර්** ගේ නිවසේ දී ඔහු ගේ භාර්යාව ගේ මව සහ තවත් අය සුව කොට පසු ව කුෂ්ට රෝගියකු සුවපත් කළේ ය. (මාක් 1. 29-45, ලූක් 4. 38). මැතිව් ගේ සාක්ෂිය පරිදි යේසු පළමු ව කුෂ්ට රෝගියා සුවපත් කර පසු ව පීටර් ගේ නිවෙසට ගියේ ය. (මැතිව් 8. 1-4).

සාක්ෂි සන්සන්දනය කළ ජර්මන් බුද්ධිමතකු වූ **යොහාන් ග්‍රිස්බහ්** (Johann Griesbach) මැතිව්, මාක් හා ලූක් ගේ ප්‍රකාශයනට වඩා ජෝන්ගේ ප්‍රකාශ බොහෝ වෙනස් බව හෙළි කළේ ය.

ශුභාරංචිකරුවන් ගේ පරස්පර විරෝධී ප්‍රකාශයන් අතර අන්දමන්ද වූ ක්‍රිස්තියානි විචාරකයන් ගෙන් කෙනකු වූ හැම්බර්ග් විශ්වවිද්‍යාලයේ පෙරදිග භාෂාව පිළිබඳ මහාචාර්ය **හර්මාන් සමුවෙල් රයිමරුස්,** (Hermann Samuel Reimarus) **'යේසු ගේ ශ්‍රාවකයන් ගේ අරමුණ'** (On the Aims of Jesus and his Diciples) නමින් පොතක් ලිව්වේ ය.

ඔහු තර්ක කළ අන්දමට යේසු රෝමවරුනට විරුද්ධ ව සැළසුම් කළ යුදෙව් විප්ලවය අසාර්ථක විය. යේසු ඇණගසා මරා දමන ලද්දේ ය. අනුගාමිකයන් පිරිසක් ඔහු ගේ මෘතදේහය සොරකම්කර 'යේසු සොහොනෙන් නැගිට දෙව්ලොව ගියේ ය' යන ප්‍රවාදය ගොඩනංවමින් රෝම විරෝධී යුදෙව් විප්ලවය ඉදිරියට ගෙන ගිය හ.

ටියුබින්ගන් විශ්වවිද්‍යාලයේ ආචාර්යවරයකු වූ **ඩේවිඩ් ෆ්‍රිඩ්රිෂ් ස්ට්‍රාවුස්** (David Friedrich Strauss) සාක්ෂි සන්සන්දනය යටතේ බයිබලය ඉතා ම සූක්ෂ්ම ලෙස ගවේෂණය කර The Life of Jesus Critically Examined-1835-36* මැයෙන් කාණ්ඩ දෙකකින් යුතු පොතක් ප්‍රකාශයට පත් කළේ ය. කිසිදු ශුභාරංචිකරුවකු ඔවුන් සඳහන් කරන සිදුවීම් ඇසින් දක නැති බව ඔහු ගේ මතය විය.

---

* බර්ලින් රාජ්‍ය පුස්තකාලයේ මෙහි පිටපතක් තිබේ.

ශුභාරංචිකරුවන් ඉදිරිපත් කරන කරුණුවල අසමානතාව ඔප්පු වූ පසු ඒවායේ සත්‍යාසත්‍යභාවය සෙවීමට ද ජර්මානු ගවේශකයන් පිරිසක් වෙහෙස දරා ඇත. ඔවුන් පෙන්වා දෙන පරිදි පේත්‍රුස්, ශුභාරංචිකරුවන් පවසන ආකාරයේ යේසු ගේ සමීපතමයෙක් නොවූයේ ය. ශුභාරංචිකරුවන් සමහර ප්‍රකාශ කරන්නේ පලස්තීනයේ භූගෝලීය කරුණු පිළිබඳ ව හෝ දැනීමකින් තොරව ය. යේසු තීර්වලින් පිටත් ව සිඩෝනය හරහා දෙකපොලිසයේ සීමා මැදින් ගැලීලිහි මුහුද ළඟට ගමන් කළ බව මාක් කියයි (මාක් 7.31). යේසු ජීවත්වූ කාලයේ සිඩෝනය හරහා ගැලීලි දක්වා ගමන් මාවතක් තිබී නැත. තත් කාලීන පලස්තීන සිතියම පරීක්ෂා කරන විට මාක් පවසන යේසුස් වහන්සේ ගේ ගමන වටෙන් නහය ඇල්ලීමකට සමාන බව පෙනේ. මාක්ට භූගෝලීය කරුණු මතු නොව යුදෙව් නීති ගැන හෝ දැනුමක් නොවූ බව පැහැදිලි වන ස්ථාන බයිබලයේ තිබේ. 'කාන්තාවක් තම ස්වාමියා ගෙන් දික්කසාද වී වෙනත් පුරුෂයකු සමඟ විවාහ වුවහොත් ඇය පරදාර සේවනය කළ තැනැත්තියක ලෙස වරදකාරිය වේ' ය යි මාක් කියයි (මාක් 10. 12). මෙය යුදෙව් සමාජයේ ජීවත් නොවූ අයකු කළ ප්‍රකාශයකි. යුදෙව් සමාජයේ කාන්තාවකට දික්කසාද විය නොහැකි ය.

ශුභාරංචිකරුවන්ට යුදෙව් සිරිත්, පලස්තීනයේ භූගෝලීය ලක්ෂණ හා යුදෙව්වන් ගේ ප්‍රධාන භාෂා දෙක වූ ඇරමයික් සහ හීබෲ පිළිබඳ දැනුමක් නොතිබුණ බව පැහැදිලි වීම, අප්‍රධාන අපොස්තල්වරුන් ගේ සාක්ෂි ආදි කරුණු නිසා 'අලුත් ගිවිසුම රෝමයේ ලියවුණු ප්‍රබන්ධ කතාවක් ද' යි ප්‍රශ්න කිරීමට පවා ඉහත ගවේෂකයෝ ඉදිරිපත් වූ හ. 'රෝම ලේඛකයන් යුදෙව්වන් ගේ නම්වලින් තමන්ට අවශ්‍ය දේ ලියා බයිබලය සකස්කර ඇතැ' යි ඔවුහු පවසති.

ජර්මන් බුද්ධිමතුන් ගේ බයිබල් සංවාදයට එංගලන්තයේ ගවේෂකයන් ද එක්වීමෙන් බයිබලය කුමක්දැ යි තේරුම් කර ගැනීම තවත් පහසු කෙරිණි. 1890 දී රුසියානු ගවේෂකයකු වූ නිකොලස් නොටෝවිච්, යේසුස් වහන්සේ ගේ ජීවිතයේ බයිබලයේ සඳහන් නොවන හෝ සඳහන් නොකරන හෝ දීර්ඝ කාල පරිච්ඡේදය පිළිබඳ ව තොරතුරු අනාවරණය කරමින් La Vie Inconnue de Saint Issa නම් ග්‍රන්ථය ප්‍රකාශයට පත් කළේ මේ අතරතුරේ දී ය. ඉතා ඉක්මනින් පොත ඉංග්‍රීසි හා ජර්මන් භාෂාවලින් ද පළ වුණි. රුසියානු ගවේෂකයකු වූ නිකොලායි රෝරයිෂ්, නොටෝවිච් ගේ ගවේෂණ තහවුරු කළේ ය.

රුසියානු විප්ලවයෙන් පසු යේසුස් වහන්සේ පිළිබඳ ව ගවේෂණයේ යෙදීමට රුසියානු බුද්ධිමතුන්ට ඉඩ නොලැබුණි. ඔවුන් සමහරෙකුට විවේචනය පසෙක දා අකැමැත්තෙන් හෝ යේසු අගය කිරීමට සිදු වුණි. ස්ටාලින් දේවස්ථානයක හැදී වැඩී කොමියුනිස්ට් පක්ෂයට බැඳී එහි ලේකම් ධුරයට පත්වූ අතිශය කෲර පාලකයෙකි. සිය පාක්ෂිකයන් පවා මරා දැමූ ඔහු ගේ පාලන සමයේ රුසියානු ගවේෂකයනට සත්‍යය සෙවීම පසෙක දමා යුරෝපයේ වහල් සමාජය දෙදරවූ විප්ලවවාදීන් වශයෙන් හඳුන්වමින් ස්පාටකස් හා යේසුස් අගය කරන්නට සිදු විය. රුසියානු කොමියුනිස්ට්වරු ආසියා, අප්‍රිකා හා ලතින් ඇමරිකානු රටවල කොමියුනිස්ට් අපොස්තල්වරුන් පිරිසක් ද නිර්මාණය කළ හ. ලංකා සමසමාජ පක්ෂයේ ආරම්භක නායකයන් කිහිප දෙනා ලංකාවේ කොමියුනිස්ට් අපොස්තල්වරුන් පිරිස යි.

අර්නස්ටෝ ගුවේරා හෙවත් චේ ගුවේරා ද කොමියුනිස්ට් අපොස්තල්වරයෙකි. ඔහු මුහුණ "මේක් අප්" කරගෙන රෝම චිත්‍රවල දක්වෙන යේසු ලෙස පෙනී සිටියේ ය. ඔහු ගේ ප්‍රයත්නයේ ප්‍රතිපල තිබුණි. මරා දමන ලද "චේ" ගේ ඡායාරූප දුටු දහස් ගණන් ලතින් ඇමරිකානුවන් යේසු මරාදමා ඇතැ යි කියමින් හඬාවැළපුණු බව පුවත්පත්වල පළ විය.

දලයි ලාමා වහන්සේ කොටළුවකු පිට නැඟී ඉන්දියාවට පලා ගියේ ය යි උන්වහන්සේ උපහාසයට ලක් කළ රෝහණ විජේවීර* පෙළපාලි යද්දී චේ ගුවේරා අනුකරණය කරමින් රැවුලක් වවාගෙන තොප්පියක් පැළඳුවේ ය. තොප්පිය දකුණු ඇමරිකානු රටවල ජාතික ඇඳුමේ කොටසක් බව විජේවීර නොසිතන්නට ඇත. චේ ගුවේරා පසුපස රෝම අධිරාජයා විසින් නිර්මාණය කරන ලද යේසු සිටි බව ඔහු දැන සිටියේ ද නැත.

* රෝහණ විජේවීර ජ.වි.පෙ. මධ්‍යම කාරක සභාවට ඉදිරිපත් කළ අවසන් මුද්‍රිත ලිපිය.

විජේවීර අනුකරණය කරමින් "චේ කට්" වවා කැප් තොප්පි පළඳින "හිස් මාස්ටර් වොයිස්ලා" ද මේ යථාර්ථය නොදනිති.

යේසුස් නම් බුද්ධ ශ්‍රාවකයාණෝ කෘතිය ලිවීමේ ප්‍රධාන අරමුණු කිහිපයකි. පළමු වැන්න කතෝලික හා ක්‍රිස්තියානි ආගම අදහන සිංහලයන් අතර බුද්ධිමය සංවාදයක් ඇති කිරීම යි. ඔවුනට බයිබලය විමර්ශනය කිරීමට අනුබල දෙන කිසිදු සිංහල ග්‍රන්ථයක් අපට සොයාගත නොහැකි විය. විද්‍යාවේ නාමයෙන් ඔවුන් සඳහා ලියවුණු පොත් පුරවා ඇත්තේ විමර්ශනය වළක්වන, ඇදහීමට පොළඹවන කරුණුවලිනි. මෑතක දී පළ කෙරුණු වෛද්‍ය ලලිත් මෙන්දිස් ගේ විද්‍යාව හා කිතු දහම ග්‍රන්ථය නිදසුනකි. එහි මෙසේ සඳහන් වේ.

"මවක් ලේ කිරිකර පුජා වීමේ ආත්මයකින් තම දරුවන් උදෙසා ක්‍රියාකරන බව අප කවුරුත් දන්නෙමු."

මේ වෛද්‍යවරයා ක්‍රිස්තියානි ආගම දෙසන්නේ කිරි බී වැඩෙන සතුන් පිළිබඳ ව හෝ දනුමක් නැත්තකු වශයෙනි. ලේ කිරි කරන්නේ කෙසේ ද?

"ක්‍රිස්තුස් වහන්සේ මහායාන බුද්ධාගම හැදෑරුවාය යන මතය අමූලික බොරුවකි. මිනිස් ප්‍රබන්ධයකි. යේසුස් වහන්සේ පැහැදිලිව ම ඉගැන්වූයේ තමන් මිහිබට දෙවිඳුන් බවය. එය මහායාන බුදුදහමේ නැති ඉගැන්වීමකි. මහායාන බුදුදහම පැතිරුණේ චීනයේ හා ජපානයේ ය. එම මතය අනුව ක්‍රිස්තුස් වහන්සේ ජපානයට ගියා ද? ඇරත් මහායාන බුදු දහම පැතිරුණේ ක්‍රිස්තුස් වහන්සේගේ මරණයෙන් පසුවය" (87 පිටුව).

ක්‍රිස්තියානි ජනයාට කියවීමට ලැබෙන්නේ මිනිසා මෝඩයා කරවන මෙබඳු අවිද්‍යාත්මක, අශාස්ත්‍රීය, මන්දබුද්ධික කතාවලින් පිරුණු පොත් ය. මිනිස් ප්‍රබන්ධ හැර වෙනත් ප්‍රබන්ධත් තිබේ ද?

පොත ලිවීමේ දෙවැනි අරමුණ මාක්ස්වාදය පසුපස තවමත් හඹා යන සිංහල තරුණ තරුණියන්ට ඔවුන් නොදන්නා ඉතිහාස තොරතුරු ස්වල්පයක් පැහැදිලි කිරීම යි. පසුගිය කාලයේ ලංකාවේ තරුණ තරුණියන් විශාල පිරිසක් ජනතා විමුක්ති පෙරමුණට බැඳී අකාලයේ මිය ගියේ ඔවුන් විප්ලවවාදීන් වූ නිසා ය යි සිතීම මුළාවකි. මාක්ස්වාදය හා වෙළී සිටින යුදෙව් ක්‍රිස්තියානි චින්තනය ඔවුන් ගේ නිදහස් චින්තනය නවතා දමීම හේතුවෙන් ඔවුහු වල්මත්වූ හ. පිළුණු වූ මාක්ස්වාදය කෙරේ තවමත් උනන්දුවක් දක්වන තරුණ තරුණියනට බුද්ධිමය සංවාදයේ වටිනාකම පැහැදිලිකරදීම අප ගේ වෑයම යි.

යොහෝවා ගේ සාක්ෂිකරුවන් ප්‍රමුඛ ඇමරිකාවේ සිට ක්‍රියාත්මක වන නොයෙකුත් ක්‍රිස්තියානි මිෂනාරී සංවිධාන සිංහල බෞද්ධයන් මුදලේ බලය පා අවිද්‍යාවෙන් රැවටීමට වෙහෙසෙන මේ සමයේ ඔවුන්ට යේසුස් වහන්සේ යනු කවුරුන් ද යි වටහා දීම ද අප ගේ තවත් ප්‍රයත්නයකි. අප ඉදිරිපත් කරන කරුණු පිළිබඳ ව වැඩිදුරටත් සොයාබලන ලෙසත් අප ඒවා සත්‍ය බව වැටහේ නම් පමණක් පොත නොකියවූ අයට පොත හඳුන්වා දෙන ලෙසත් ඔබ සැමට ආරාධනය කරමු.

අප ගේ කටයුතුවල දී නිරතුරු ව ම අතහිත දෙන බර්ලින් ශ්‍රී ලංකා මානව හිමිකම් සංවිධානයේ ආ. රො. වි. අබේසිංහ මහතා සහ ආචාර්ය එඩ්වඩ් පෙරේරා මහතා මේ කාර්යයේ දී ද දක්වූ සහයෝගය කෘතවේදී ව සඳහමු. පොත කියවා අදහස් පළ කිරීමෙන් සහ විවිධාකාරයෙන් අපට සහයෝගය දුන් ඩබ්ලියු. ඒ. අබේසිංහ, රංජිත් අමරකීර්ති පලිහපිටිය, උදය මානවසිංහ, ලලිතා මානවසිංහ, මංජුල බටුගෙදර, දීප්ති පලිහපිටිය, එල්. ජයසේකර යන මහත්ම මහත්මීන්ට ද නිබඳ දිරි දෙමින් අප සමඟ සිටි මංගල, රතිල්, චූලා, ආරි, චන්දන, අමරදීප, කුසුම්, ගංගි, අංජුල, බුද්ධික, චින්තක, මුදිතා, පළිඟු, නිශාන්ති සහ යේසු අනුව පාද තබමු සංවිධානයේ සොයුරු සොයුරියන්ට ද පිටකවරය නිර්මාණය කළ කරුණාසිරි විජේසිංහ මහතාට සහ කඩිනමින් පොත මුද්‍රණය කරදුන් පැනසර ආයතනයේ සේවක පිරිසට ද පොත ප්‍රකාශයට පත් කළ සත්ගුණවත් ඇස්. ගොඩගේ මහතාට ද අප ගේ ස්තුතිය හිමි වෙයි.

කොලට් සේනානායක
නාරද කරුණාතිලක

2000. 12. 25
තාරණ උඩවෙල, 60227
☎: 032-46574, 46582
E-mail: nkarunatilaka@yahoo.com

හැඳින්වීම

දෙවියන් වහන්සේ ලෝකය මැවූ සේකයි කුඩා අවදියේ සිටම අදහන්නට හුරුපුරුදු කරනු ලැබූ අපි පෘථිවියේ උපත පිළිබඳව පාසලේදී ඉගැන්වූ කරුණු අසා දෙගිඩියාවට පත් වීමු. දෙවියන් වහන්සේ ගහ කොළ සතාසීපාවුන් සහ මිනිසුන් මැවූ සේක යි ඇදහූ අපි පසු කලෙක පරිණාමවාදයත් බයිබලයත් අතර අතරමං වීමු.

මේ පරස්පර විරෝධී ඉගැන්වීම්වල සත්‍යාසත්‍යතාව දෙගුරුන්ගෙන් හෝ පූජක පක්ෂයෙන් හෝ විචාරීමට තරම් ධෛර්යයක් උපතින් ලද අන්ධ භක්තියෙන් යුතු අපට නොතිබුණි. එසේම නවීන විද්‍යාව හදාළ අපේ ගුරුවරුන්, දෙමාපියන් සහ දන්නා කියන වැඩිහිටියන් පවා බයිබලය අදහන්නන් වීම අපගේ මුව ගොලු කරන්නට සමත් විය. එහෙයින් අන්ධ භක්තිය හා බුද්ධිය අතර සීතල යුද්ධයක් අප සිත් තුළ ඇවිලෙන්නට විය.

"ඕනෑම උපකල්පනයක් සාක්ෂි තුළින් ඔප්පු කළ යුතුය. ඉක්බිති එම තර්කය හෙවත් වාදය පර්යේෂණාත්මකව ඔප්පු කළ යුතුය. නැතහොත් එය හුදෙක් කල්පිතයක් පමණක්ම වන්නේය" යනුවෙන් අප උගත් විද්‍යාත්මක ක්‍රමය වැඩි කලක් යන්නට මත්තෙන් බයිබලය පිළිගත නොහැකි සුරංගනා කතාපොතක් බව අපට වටහා දුනි.

මිනිසාත් තිරිසනාත් අතර ඇති ප්‍රධානතම සහ වැදගත්ම වෙනස මිනිසා සතු දියුණු මනසයි. දියුණු මනසක් ඇත්තවුන්ට හිමිකර ගත හැකි ඉහළ ම දායාද වන්නේ බුද්ධිය සහ ප්‍රඥාවයි. එහෙත් සියලුම මනුෂයෝ ඒ මහඟු දායාදයන්ට හිමිකම් නොකියති. ලෝක ජනගහනයෙන් බහුතරයක් බුද්ධි මට්ටමෙන් අඩු මිනිසුන් බව මනෝවිද්‍යාඥයන්ගේ මතයයි.

සිංහලයන් වන අපි ඉහළ බුද්ධිමට්ටමකින් යුතු වූ ජාතියක් බව ඓතිහාසික සාක්ෂිවලින් තහවුරුවෙයි. මේ සඳහා පෙන්වා දිය හැකි හොඳම නිදසුන මිහිඳු හිමියන් සහ දේවානම්පියතිස්ස රජතුමා අතර ඇතිවූ සංවාදයයි. එහෙත් අවාසනාවකට මෙන් ක්‍රිස්තු භක්තිකයන් වන අප අපේ ඒ බුද්ධිමය උරුමයට හිමිකම් නැත්තවුන් බවට පමුණුවා තිබේ. ඒ, අපේ රට අල්ලාගත් යුරෝපීය ජාතීන් කඩුවත්, තුවක්කුවත් පෙරටුකොටගත් හිංසාවේ බල මහිමයෙන් අපගේ මුතුන් මිත්තන් ක්‍රිස්තියානි ආගමට හැරවූ බැවිනි. අපේ උරුමය වන බුද්ධිය මත පදනම් වූ සංස්කෘතිය කෙරෙන් අප ඈත් කරන ලද්දේ එසේය. ඉන්පසු ක්‍රිස්තු භක්තිකයෝ දේවානම්පියතිස්ස රජුගේ සංවාදයෙන් ගම්‍යවන

බුද්ධිය පෙරටුකොටගත් ජාතිකත්වයකට හිමිකම් නැත්තන් බවට පත් කරනු ලැබූහ. අද අපි දෙවනපෑතිස් රජු පිළිබඳව කතා නොකරමු. ඒ වෙනුවට අපේ කතාබහට ලක්වන්නේ සාන්ත අන්තෝනි, සාන්ත පීතර වැනි සුරංගනා කතාවල චරිත බඳු පුද්ගලයන් පිරිසකි.

ආගම යනු මනුෂ්‍යයාට ජීවිතාවබෝධය ලබාදෙන යථාර්ථවාදී, සත්‍යවාදී, මැදහත් ජීවනමාර්ගෝපදේශ සංග්‍රහයක් විය යුතුය. ක්‍රිස්තු භක්තිකයන් වන අපි අන්‍ය ආගම් මිථ්‍යා දෘෂ්ටි සේ සලකා බැහැර කරමින් ක්‍රිස්තියානිය විමුක්ති මාර්ගය ලෙස ඇදහීමට පුරුදු පුහුණු කරනු ලබති. එහෙත් බයිබලය අපට උගන්වන දේ අපගේම බුද්ධිය විසින් අභියෝගයට ලක්කෙරේ නම් තව දුරටත් අප බයිබලය විශ්වාස කරන්නේ කෙසේ ද?

ග්‍රහ ලෝක තරණය කරන යුගයේ වෙසෙන මිනිසුන් තවමත් බයිබලය අදහන්නේ මන්ද? ලොව පුරා මහා ධනස්කන්ධයක් වියදම් කරමින් නොමිලයේ බයිබල් බෙදාහරින්නේ මන්ද? මේ පරිසරය තුළ අපගේ භූමිකාව කුමක්ද? බයිබලයේ ඉගැන්වීම් පිළිබඳව අප තුළ හට ගත් කුකුස විසින් අවසානයේදී අප සිත්වල එබඳු ප්‍රශ්න මාලාවක් උපදවන්නට සමත් විය.

තවදුරටත් සුරංගනා කතා අදහමින්, අන්ධ භක්තිය ජානානුගත කර මන්දබුද්ධික අනාගත පරපුරක් බිහිකරමුද, නැතහොත් දෙවනපෑතිස් පරපුරේ උරුමය පිළිගනිමින් බුද්ධිමත් අනාගත පරපුරක් බිහිකරමු ද යන්න අද අප හමුවේ පවත්නා අභියෝගයයි. යේසුස් නම් බුද්ධ ශ්‍රාවකයාණෝ, එම අභියෝගයට මුහුණු දිය යුත්තේ කෙසේ දැයි වටහා ගැන්මට අපට උපකාරී වෙයි. මෙම කෘතියෙහි අත්පිටපත කියවා බැලූ ක්‍රිස්තු භක්තිකයන් වන අප කිහිප දෙනකු එක්වී **යේසු අනුව පාද තබමු** නමින් සංවිධානයක් පිහිටුවූයේ මේ කෘතියෙහි කතුවරයන්ගේ උත්සාහයට දිරිදෙමින් යේසුස් වහන්සේ පිළිබඳ සත්‍ය කතාව ක්‍රිස්තු භක්තිකයන් අතර පැතිරවීමේ සද්කාර්යයට උරදීමේ අරමුණෙන් බව දන්වා සිටිනු කැමැත්තෙමු. යේසුස් වහන්සේ පිළිබඳ ඔබේ අදහස් අප හා බෙදාහදාගන්නා ලෙසත් ඔබේ දරුමුණුබුරන්ගේ අනාගතය වෙනුවෙන් අප හා එක්වන ලෙසත් ඉල්ලා සිටිමු.

දෙවන මුද්‍රණයට

පළමු මුද්‍රණයේ පළවූ අපගේ පණිවිඩය කියැවූ සමහරු "යේසු අනුව පාද තබමු" යනු තවත් කතෝලික බළල් අතක් දැයි සැක පහළ කර තිබුණි. යේසු අනුව පාද තබමු යන්නෙහි අරුත වටහා ගැනීමට නම් මේ පොත කියවා සැබෑ යේසුස් වහන්සේ කවුරුන්දැයි වටහා ගත යුතුය. සැබෑ යේසුස් වහන්සේ යුදෙව් පවුලක ඉපිද යුදෙව්වන්ට බුද්ධ ධර්මය දේශනා කළ බුද්ධ ශ්‍රාවකයෙකි. අපගේ වෑයමද එවැන්නකි. එනම් ක්‍රිස්තු භක්තිකයන් අතර බුදුදහම පැතිරවීමයි.

කැ. පෙ. 28,

හලාවත

1

බයිබලය හා දාස් කැපිටලය

නොමිලයේ බෙදාහැරීම නිසා ලෝකයේ වැඩියෙන් ම ප්‍රසිද්ධියට පත් පොත් දෙකකි. පළමුවැන්න ක්‍රිස්තියානි බයිබලය යි. අනෙක දාස් කැපිටලය යි. පොත් දෙකේ ම මුල් උරුමක්කාරයෝ යුදෙව්වෝ ය. සෝවියට් සංගමය බිඳවැටීමෙන් පසු ව දාස් කැපිටලය බෙදාහැරීම ඇණහිටියේ ය. ලංකාව නිදසුනකට ගතහොත්, ආර්. ප්‍රේමදාස ජනාධිපතිවරයා ගේ ගම්උදා ප්‍රීති සැණකෙළිවල පමණක් බයිබල් ලක්ෂ පහකට වඩා බෙදාහැර ඇත්තේ ය. මිහින්තලා ගම්උදා සැණකෙළියේ බයිබල් ලක්ෂ දෙකක් බෙදාහැරීමට ක්‍රිස්තු ධර්ම ප්‍රචාරක සංවිධානයක් කටයුතු යොදා තිබුණි.[1]

බයිබල් බෙදාහැරීම කෙතරම් සාර්ථක වී ද යත්, අකුරු කියවීමට නොහැකි, බ්‍රසීලයේ ඇමසෝනා වනාන්තරයේ ජීවත්වන ගෝත්‍රිකයන් ගේ පැල්කොට අතරට ද බයිබල් රිංගවා තිබේ. බයිබලය පැලේ තබාගෙන සිටින ගෝත්‍රික පවුල්වලට, මිෂනාරීන් ගෙන් තෑගිබෝග ලැබෙන බැවින්, ඔවුහු සිය දූදරුවන්ට වඩා පරිස්සමින් බයිබල් රැක බලාගනිති.[2]

නොමිලයේ බයිබල් සපයන බවට මිෂනාරී සමාගම් පළ කරන දැන්වීම්, මහමදික නොවන සෑම රටක ම දිනපතා පුවත්පත්වල නිරතුරු දක්නට ලැබේ. බයිබල් දික්කරගත් යොහෝවා ගේ සාක්ෂිකාරයෝ* ලොව පුරා ගෙයින් ගෙට ඇවිදිති. "ගැලවුම්කාරයා පිළිබඳ පණිවුඩය ප්‍රකාශ කිරීම සඳහා අපි පැමිණියෙමු." ඔවුහු කියති. ඔවුන් ගැලවුම්කරුවා යනුවෙන්

---

* ඇමරිකානු බයිබල් සමාගමකි.

හඳුන්වන්නේ යේසුස් වහන්සේ ය. යේසුස් වහන්සේ, කිසිවකු ගලවා නොගත් හ. යටත් පිරිසෙයින් එතුමාට වත් ගැලවිය නොහැකි විය. කිසිවෙකුට, තවත් කිසිවකු ගලවාගත නොහැකි බව, උපන්ගෙයින් ලද අන්ධභක්තියෙන් යුතු මොවුන්ට නොවැටහෙයි.

මුලු මහත් ලෝකය ම ක්‍රිස්තියානි කරන්නැ යි බයිබලය අණකර සිටී. එයට එකඟ ව ක්‍රියා කරන ක්‍රිස්තියානි සංවිධාන ක්‍රිස්තියානි ලෝකයක් බිහිකිරීමට උත්සාහ දරති. රටවල් සොයා යාම ද ක්‍රිස්තියානි ව්‍යාපාරයේ ම කොටසකි. අරාබීන් රතු මුහුද පාලනය කරමින් පෙරදිග මාර්ගය අසුරා ගෙන සිටි සමයේ **ප්‍රෙස්ටර් ජෝන්** නමැති ඉතා බලවත් ක්‍රිස්තියානි අධිරාජයකු පෙරදිග වෙසෙතැ යි යුරෝපයේ ප්‍රචලිත ව තිබිණි. ප්‍රෙස්ටර් ජෝන් අධිරාජයා ගෙන් යුධ ආධාර ලබාගෙන මහමදික බලය මැඩපවත්වා පෙරදිග හා සම්බන්ධ වීමට යුරෝපා ජාතීහු උත්සාහ කළ හ. ස්පාඤ්ඤ හා පෘතුගාල සමුද්‍ර යාත්‍රිකයන් ගේ මූලික අරමුණක් වූයේ ප්‍රෙස්ටර් ජෝන් වෙත් යාම යි. ඇමරිකාවට ගොඩබට **කොලොම්බස්** සිතා ඇත්තේ තමා ඉන්දියාවට ළඟා වී ඇති බව යි. එකල ඇමරිකාවේ සිටි ස්වදේශිකයන් රතු ඉන්දියානුවන් නමින් හැඳින්වීමට හේතුව ද එය යි. යුරෝපයේ කතෝලික රාජ්‍යයන්හි ක්‍රිස්තියානි ධර්මයේ මුල් බිම හෙවත් යේසුස් වහන්සේ බිහිවූ බිම ඉන්දියාව ය යන අදහස මුල් කාලයේ පැවති බවට ප්‍රෙස්ටර් ජෝන් විශ්වාසය සාක්ෂියකි. අප යුරෝපයේ ජනප්‍රවාද පිළිබඳ ව විමර්ශනය කරන විට පැහැදිලි වූයේ ප්‍රෙස්ටර් ජෝන් යනු **අශෝක අධිරාජයා** හැඳින්වීම පිණිස භාවිතා වූ නමක් බව යි.[3]

යුරෝපීයයන්, ක්‍රිස්තියානි ලෝකයක් වෙනුවෙන් ලෝකය පුරා මේතාක් කර ඇති යුද්ධ ප්‍රමාණය සංඛ්‍යාවෙන් දහස් ගණනකි. යුද්ධවලින් තොර ව ලෝකයේ විවිධ රටවල දී මරා දමන ලද මිනිසුන් සංඛ්‍යාව ගණනය කළ යුත්තේ දශ ලක්ෂ ගණනිනි. යක්දෙස්සියන් සේ සලකා මරා දමූ යුරෝපා කාන්තාවන් ගේ සංඛ්‍යාව පමණක් දස දහස් ගණනකි.[4]

දාස් කැපිටලයේ ඉංග්‍රීසි පිටපත ලංකාවේ නොමිලයේ බෙදාහරින ලද්දේ, සෝවියට් සංගමය බිඳවැටීමට පෙර රුසියානු තානාපති කාර්යාලය මගින් නඩත්තු කෙරුණු "කොටා රෝඩ්"හි **ශ්‍රී ලංකාවේ කොමියුනිස්ට් පක්ෂ කාර්යාලය** විසිනි. දාස් කැපිටලය **කාල් මාක්ස්*** නමැති යුදෙව් ජාතිකයා ගේ කෘතියකි. රැකියාවක් නොකළ, කම්කරුවන් සමඟ ජීවත් නොවූ කාල් මාක්ස්, කම්කරුවන් පිළිබඳ ව එබඳු ග්‍රන්ථයක් සම්පාදනය කළේ, **හේගල්#** නම්

---

* කාල් මාක්ස් (Karl Marx) ක්‍රි. ව. 1818 දී ජර්මනියේ Trier හි යුදෙව් පවුලක උපන්නේ ය. පසු කලෙක ජර්මනිය හැරදමා, එංගලන්තයට ගොස් දේශපාලන රැකවරණය ලැබූ මාක්ස් ලන්ඩනයේ ජීවත් වූයේ ය.

# හේගල් (Hegal George Wilhelm Freidrich (1770 - 1831) ක්‍රිස්තියානි ධර්මය හැදෑරීම පිණිස ජර්මනියේ ටියුබින්ගන් විශ්වවිද්‍යාලයට පැමිණි ශිෂ්‍යයෙකි. ඔහු එහි දී ග්‍රීක හා පෙරදිග දර්ශනය හදාරන සිසුන් පිරිසක් සමඟ ඇසුරට වැටුණි. ඔවුන් ගෙන් කෙනකු වූ ෂෙලින්ග්, හේගල් ගේ අඹ යහළුවා බවට පත් විය. ෂෙලින්ග් ගේ පියා ටියුබින්ගන් විශ්වවිද්‍යාලයට නුදුරින් පිහිටි බේබන්හවුසන්හි ක්‍රිස්තියානි සෙමනේරියේ පෙරදිග භාෂා මහාචාර්යවරයා ලෙස කටයුතු කළේ ය. අරාබි වෙළෙඳුන් ගෙන් මිල දී ගත්, පැරණි භාරතීය ග්‍රන්ථ** රාශියක් බේබන්හවුසන් සෙමනේරියේ පුස්තකාලයෙහි තිබුණි. එම ග්‍රන්ථ අතර තිබූ චාර්වාකවාදීන් ගේ දර්ශන ග්‍රන්ථයක් හේගල් ගේ අවධානයට යොමු කරවූ ෂෙලින්ග් ගේ පියා, හේගල්ට ඩිප්ලෝමාව ලිවීම සඳහා උදව් කළේ ය. හේගල් ඩිප්ලෝමාවෙන් පසු සිය න්‍යාය ඉදිරිපත් කිරීමේ දී බෞද්ධ, හින්දු, ජෛන හා වෙනත් ඉන්දියානු ආගමික දර්ශන අඩංගු පොත් රාශියක් පරිශීලනය කර ඇත.[5]

** ඉරානය ජයගත් මහමදිකයෝ, අවකානය (නූතන ඇෆ්ගනිස්ථානය) ඔස්සේ භාරතය ආක්‍රමණය කළ හ. ඊට හේතුව වශයෙන් ඔවුන් පවසන්නේ, 'සිංහල දේශයේ වෙළෙඳාමේ යෙදී සිටිය දී මිය ගිය ඊජිප්තියානු වෙළෙන්දන් ගේ වැන්දඹු භාර්යාවන් සහ දූදරුවන්හට ආපසු සිය රට බලා යාම පිණිස, සිංහල රජතුමා පිළියෙල කර දුන් නැව් පන්තිය උතුරු ඉන්දියානු මංකොල්ලකාරීන් විසින් පැහැර ගනු ලැබූ නිසා, ඔවුන්ට දඬුවම් කරනු වස් උතුරු භාරතයට කඩාවැදුණු බව' යි. ඊජිප්තියානු වෙළෙඳුන් ගේ අඹුදරුවන්ට සිය රට බලා යාමට නැව් පිළියෙල කර දී ඇත්තේ දාඨෝපතිස්ස රජතුමා විසිනි.[6] උත්තර භාරතය ආක්‍රමණය කළ මහමදිකයෝ ඊට අයත් රාජධානි එකි'නෙක කොල්ලකෑ හ. ඔවුන් කොල්ලකෑ වස්තුව අපරදිග වෙළෙඳුන්ට අලෙවි කරන ලද්දේ ඉස්තාන්බුල් නමින් වර්තමානයේ හැඳින්වෙන පැරණි කොන්ස්තන්තිනෝපල් නගරයේ දී ය. මහමදිකයන්, භාරතයෙන් කොන්ස්තන්තිනෝපලයට ගෙන ගිය භාණ්ඩ රාශියකි. ඒ අතර, වහල් ස්ත්‍රීන් හා නොයෙකුත් ග්‍රන්ථ ද වූ බව මහමදික වාර්තාවල සඳහනි. වහල් වෙළෙඳාම ආරම්භ කර ඇත්තේ මහමදිකයන් විසිනි.[7]

ජර්මානු ජාතිකයා විසින් ලියන ලද අපෝහක න්‍යාය නම් ග්‍රන්ථය කියවීමෙන් ලද දැනුමෙන් මනුෂ්‍ය ජීවිතය පිළිබඳ ව සිතන්නට වූ බැවිනි.

බුදුන් වහන්සේට පෙර භාරතයේ ජීවත් වූ චාර්වාක, සුප්‍රකට පඬිවරයෙකි; දාර්ශනිකයෙකි. මනස හා පරලොව පිළිබඳ ව දේශනා කළ භාරතීය ආචාර්යවරුන් ගේ තර්ක බිඳහෙළූ අතිශූර තාර්කිකයෙකි. එතුමෝ විශාල ශිෂ්‍ය පිරිසක ගේ ආචාර්යවරයා වූ හ.

ඔහු ගේ දර්ශනය කුමක්ද යි පැහැදිලි කරන කිසි ම ග්‍රන්ථයක් මෙකල සොයා ගත නොහැකි ය. චාර්වාක යනු චාර්වාක දර්ශනයෙහි නිර්මාතෘවරයා නොවන බවටත් බෘහස්පති ඍෂිවරයා ගේ ප්‍රාකෘති - අචේතන වාදය චාර්වාක දර්ශනයට පදනම් වී ඇති බවටත් මතයක් ඇත.[8] ආසියාවේ ආගම් හා දර්ශන පිළිබඳ දුර්ලභ පොත් පත් ඇති මදුරාසියේ අද්යාර් පුස්තකාලය පවා චාර්වාක ග්‍රන්ථවලින් හිස් ය. බේබන්හවුසන් පුස්තකාලවල පැවති ග්‍රන්ථ, පුස්තකාලවල පවත්නා ලාගර් හෙවත් ගබඩා කාමරවල දමා සඟවා ඇත. එහෙයින්, චාර්වාක දර්ශනය මේ ය යි යමෙකුට දැන ගත හැක්කේ, එම දර්ශනය දැඩි ලෙස දෝෂ දර්ශනයට ලක් කරන බ්‍රාහ්මණ, බෞද්ධ හා ජෛන ග්‍රන්ථ මගින් පමණි. එම ග්‍රන්ථවලට අනුව චාර්වාකවාදීහු මෙබඳු තර්ක ඉදිරිපත් කළ හ.

ලෝකය මැවූ දෙවියකු නැත.
ආත්මයක් නැත.
නැවත ඉපදීමක් නැත.
පරලොවක් නැත.
කර්මයක් නැත.
හොඳින් හෝ නරකින් හෝ කම්සැප විඳීම ජීවිතයේ ඒකායන පරමාර්ථය යි.
මරණය නිර්වාණය යි.
මරණයෙන් සියල්ල කෙළවර වේ.
පොළොව, ජලය, ගින්න, වායුව යන සතර මහා භූතයෝ මූලද්‍රව්‍යයෝ වෙති.

ලෝකය සතර මහා භූතයන් ගෙන් සැදුණකි.
බීජයක ඇති පිටිවලින් මදය, ශක්තිය හටගන්නා පරිදි භූතයන් ගේ එක්වීමෙන් සිත පහළ වෙයි.
සිත ශරීරයෙන් වෙන් කළ හැකි දෙයක් නොවේ.

බුදුන් වහන්සේ ජීවමාන කාලයේ, චාර්වාක නමින් ගොඩනැංවුණු විශ්වවිද්‍යාලයක් මගධයේ තිබුණි.[9] චාර්වාක යන වචනයේ අර්ථය මිහිරි පණිවිඩය යන්න යි. ඊට ලෝකායත යන නම ද භාවිතා කර තිබේ. ලෝකායත යන්නෙහි අර්ථය ප්‍රසිද්ධ යන්න යි. ලෝකායත දර්ශනවාදීහු, බ්‍රාහ්මණ දර්ශනය නිෂේධ කළ හ. බුදුන් ගේ කාලයේ විසූ සියලු ම ශාස්තෘන් වහන්සේලා ලෝකායත දර්ශනය බිඳහෙළූ අතර, එම කාර්යයෙහි පුරෝගාමියා වූයේ ජෛනාගමේ නිර්මාතෘ මහාවීර යි.[10] බුදුරජාණන් වහන්සේ බ්‍රාහ්මණ දර්ශනය මෙන් ම ලෝකායත දර්ශනය ද ප්‍රතික්ෂේප කරමින් ආර්ය අෂ්ටාංගික මාර්ගය දේශනා කළ සේක.[11]

චාර්වාක දර්ශන ග්‍රන්ථයකින් කොටසක් උපුටාගත් හේගල්, අපෝහක න්‍යාය නමින් දර්ශනයක් ඉදිරිපත් කළේ ය. මාක්ස් භෞතිකවාදය කෙරේ ආකර්ශණය වූ පුද්ගලයෙකි. ඔහු සිය උපාධිය වෙනුවෙන් විශ්වවිද්‍යාලයට ඉදිරිපත් කළ නිබන්ධය නිදසුනකි.[12] හේගල් ගේ අපෝහක දර්ශනය කියවා පිබිදුණු සිත් ඇති මාක්ස් අවුරුදු ගණනාවක් වෙහෙසෙමින් හේගල් දර්ශනය පිළිබඳ ව තවදුරටත් කරුණු සෙවී ය. අවසානයේ, ඔහු, හේගල් ගේ දර්ශනය වෙනස් කරමින් දයලෙක්තික භෞතිකවාදය නමින් තවත් දර්ශනයක් ඉදිරිපත් කළේ ය.[13] පැරණි පෙරදිග ඥානයට පේටන්ට් බලපත්‍ර නොවූ නිසා හේගල්ට හෝ මාක්ස්ට හෝ 'බුද්ධිමය දේපල සොරුන්' ය යි කියනු නොලැබේ. ඔවුහු දාර්ශනිකයෝ ව සිටිති!

මාක්ස් ගේ දර්ශනය අගය කරමින් ලියා ඇති අටුවා ටීකා ග්‍රන්ථ දහස් ගණනකි. දෝෂදර්ශනයට ලක් කරන ග්‍රන්ථ ද දහස් ගණනකි. මෙනයින් සලකන කල මාක්ස්වාදී දර්ශනය තරම් අවධානයට ලක් වූ වෙනත් කිසිදු දර්ශනයක් නැති තරම් ය. එහෙත් කිසි ම මාක්ස්වාදියකු හෝ මාක්ස්වාදය හෙළාදකින්නකු හෝ කාල් මාක්ස් ස්වකීය දර්ශනය ඉදිරිපත් කිරීම සඳහා ආධාර

කරගත් හේගල් දර්ශනය පෙරදිග දර්ශනයකින් උපුටා ගත්තක් බව සඳහන් කර නැත. එයින් වැටහෙන්නේ මාක්ස්වාදය ප්‍රතික්ෂේප කරන යුරෝපීය විචාරකයන් පවා මාක්ස් පෙරදිගට ණයගැති බව හෙළි කිරීමට අකමැති බව යි.

මාක්ස් ගේ පවුල නඩත්තු කළ ෆ්‍රෙඩ්රිච් එංගල්ස්* නම් වෙළෙන්දා, තම නමත් සම්බන්ධ කර ගෙන මාක්ස් ගේ පොත ප්‍රචාරය කරන්නට විය. මාක්ස් ගේ කෘතිය අපූර්ව න්‍යාය ග්‍රන්ථයක් ලෙසින් භාරගත් ලන්ඩනයේ තරුණයෝ පිරිසක්, බයිබලය ඇඳහීම අතැර දාස් කැපිටලය ඇඳහීම ඔවුන් ගේ මෝස්තරය කරගත් හ. ඒ, ලෝකයේ පළමුවෙනි කොමියුනිස්ට් කල්ලිය යි. කොමියුනිස්ට් කල්ලි මෝස්තරය ලන්ඩනයෙන් ආරම්භ වී, පැරිස්, මැඩ්රිඩ්, බර්ලින් ආදී නගරවලට ද පැතිර ගියේ, කලකට පෙර යුරෝපයේ හිපි සංස්කෘතිය පැතිරගිය පිළිවෙළට තරමක් සමාන අයුරකිනි.

බ්‍රිතාන්‍ය යටත් විජිතයන් ව පැවති ආසියාතු රටවල දේශීය ධනපතියන් ගේ දරුවෝ උසස් අධ්‍යාපනය පිණිස ලන්ඩනයට පැමිණ සිටිය හ. කලු සුදු භේදය නිසා එංගලන්තයේ දී පීඩාවට ලක් ව, හීනමානයෙන් ජීවත්වූ මොවුන'තරින් සමහරෙක්, නිරායාසයෙන් ම කොමියුනිස්ට් කල්ලි වෙත ඇදී ගිය හ. ඇතැම්හු, කල්ලිවලට නොබැඳුණ ද කොමියුනිස්ට්වරුනට හිතවත්කම් දැක්වූ හ. ආචාර්ය ඊ. ඩබ්ලියු. අදිකාරම් ලන්ඩනයේ දී කොමියුනිස්ට් හිතවතෙක් වූයේ ය. සමසමාජ පක්ෂය යන නම පවා ඔහු ගේ යෝජනාවකි.[14]

රුසියාවේ කොමියුනිස්ට්වරු, එරට ආණ්ඩු බලය අල්වා ගත් හ. රුසියාව, ජර්මනිය පරාජය කරමින් දෙවන ලෝක යුද්ධය ජයගෙන නැගෙනහිර යුරෝපා රටවල් එක් කර සෝවියට් කඳවුර හෙවත් වෝර්සෝ ආරක්ෂක හවුල පිහිටුවූ හ. තැතිගත් ඇමරිකාව බටහිර යුරෝපා රටවල් හා එක් ව නැටෝ නමින් යුද හවුලක් ඇති කරගෙන සෝවියට් සංගමය දුර්වල කිරීමේ උපාය මාර්ග සෙවී ය. මා ඕ සේතුං යටතේ සංවිධානය වූ කොමියුනිස්ට්වරුන් චීනයේ බලය ඇල්ලීම නැටෝව දුටුවේ ආසියාවේ පැතිරෙන දේශපාලන වසංගතයක් ලෙසිනි.[16] ඔවුහු, කොමියුනිස්ට් ආසියාවක් ඇතිවීම වැළැක්වීමට වගබලා ගත් හ.

සෝවියට් කඳවුර බිඳවැටීමත් සමග ම ආසියාතු රටවල කොමියුනිස්ට් පක්ෂ ඉබේට ම ගරාවැටුණි. කොමියුනිස්ට්වාදීන් ගේ සංස්කෘතික උපාංග පමණක් රටරටවල ඉතිරි විය. නිදසුනක් දක්වතොත්, වාමාංශික ව්‍යාපාරය හා මැයි දිනය ලංකාවේ කොමියුනිස්ට්/සමසමාජ ව්‍යාපාරයේ සංස්කෘතික උපාංග දෙකකි.

ව්‍යවහාර ඉංග්‍රීසි භාෂාවේ රයිට් (Right) යන වචනය දකුණ හැඳින්වීමටත් නිවැරදි (හරි) ය යි කීමටත් භාවිතා කෙරේ. හිපියන් ගේ ක්‍රියාකාරකම් 'රයිට්' -නිවැරදි- නොවේ ය යි පොදු සමාජ පිළිගැනීමක් තිබේ.

හිපියන් දෙදෙනෙක් ගමනක් යමින් උන් හ.

"උඹ පුක පිස්සෙ නැද්ද?"

එක් හිපියෙක් අනෙකා ගෙන් ඇසුවේ ය.

"පුක පිහින්ඩ මං අද රිච්චෙ නැනෙ." අනෙකා කී ය.

"එහෙනං ඔය කලිසමේ ගූ තියෙන්නෙ?"

"ආ.... ඒ ඊයෙ එච්ච."

මෙකල හිපියන් ලෙසින්, එකල කොමියුනිස්ට්වරුන් 'රයිට් -හරි- වැඩ නොකළ පිරිසක්' වශයෙන් සමාජයේ පිළිගැනිණි. ලන්ඩන් නගරයේ දාස් කැපිටලය ඇදහීමට පටන් ගත් කොමියුනිස්ට්වරුනට කණපිට වැඩ කරන්නන් යන අරුතින් යුතු ව ලෙෆ්ටිස්ට් යන නමක් ද පටබැඳුණි.

භාෂාව උපයෝගී කරගෙන ජන විඥානය වෙනස් කිරීම වර්තමානයේ බටහිර රාජ්‍ය පාලන උපායකි. මෙය මුලින් ම ක්‍රියාවේ යොදවන ලද්දේ ජර්මනියේ නාසිවාදීන් විසිනි. ඔවුන් රාජ්‍ය බලය ලබාගත් අලුත ම බර්ලින් නගරයේ සියලු ම යුදෙව් කඩ සාප්පුවල වීදුරු, ගල් හා බෝතල් ගසා බිඳ දැමූ රාත්‍රියක් විය. මේ බිහිසුණු රාත්‍රිය ජර්මන් ජනමාධ්‍යයන් විසින් "ක්‍රිස්ටල් නයිට්" හෙවත් පළිඟු රාත්‍රිය ලෙස නම් කරන ලද්දේ බියකරු රාත්‍රියේ ප්‍රචණ්ඩබව වසං කිරීමේ චේතනාවෙනි. ඇමරිකාව,

---

* මාක්ස් Die Rheinniche Zeitunge නමින් පුවත්පතක් පළ කළේ ය. එංගල්ස්ට (Friedrich Engels 1829-1895) පළමුවෙන් මාක්ස් හමුවූයේ 1842 දී ජර්මනියේ Cologne නගරයේ පිහිටි පුවත්පත් කාර්යාලයේ දී ය. පැරිසියේ දී නැවත එක් වූ ඔවුහු නොකැඩුණු මිත්‍ර සබඳතාවක් ඇති කර ගත් හ. මාක්ස් ගේ කොමියුනිස්ට් ප්‍රඥප්තිය Commiunist Menifesto එළිදැක්වීමට එංගල්ස් ආධාර කළේ ය.[15]

සෝවියට් බලය පැතිරුණු වෝර්සෝ සම්මිලිතය "**සෝවියට් බ්ලොකේඩ්**" යනුවෙන් හැඳින්වූයේ නාසිවාදීන් ගේ භාෂා උපාය උපයෝගි කරගනිමිනි. "බ්ලොකේඩ්" යන ඉංග්‍රීසි වචනයේ කණ්ඩායම යන අර්ථය ඇතත් බ්ලොක් යන ප්‍රසිද්ධ ඉංග්‍රීසි වචනය නිසා කතා ව්‍යවහාරයේ දී මනසට තදබදයක් හිරවීමක් බඳු හැඟීමක් දනේ. මීට සමාන ආකාරයෙන් ලංකාවේ පූජනීය බෞද්ධ නම් හැල්ලුවට ලක්කිරීමේ ව්‍යාපාරයක් ක්‍රියාත්මක වේ. කතෝලික පාදිලිවරු, භික්ෂු පදවිනාම උදුරා ගනිමින් සිටිති. හොඳ ම උදාහරණය දේවගැතිවරුන් හිමි, නාහිමි පදවිවලින් පෙනී සිටීම යි. කොළඹ බිෂොප් නිවස ලංකාරාමය වී තිබේ. "**කුඩා කිතුණු සංඝ තුළින් ප්‍රකාශ වන ශුද්ධෝත්තමයාණන් වහන්සේ**" යනුවෙන් ලියූ පුවරු මේ දිනවල බොහෝ දේවස්ථානවල ප්‍රදර්ශනය කෙරේ.

එංගලන්තයේ කොමියුනිස්ට්වරුන් 'ලෙෆ්ටිස්ට්ලා' වන හෙයින් ලංකාවේ කොමියුනිස්ට්වරු වාමාංශිකයන් වූ හ!

මාක්ස්වාදය ඔසවාගෙන පැමිණි ලංකාවේ සමසමාජ නායකයෝ සිය පක්ෂය 'වම' ලෙසින් හඳුන්වා ගත් හ. මොවුන්ට බටහිර පාලකයින් ගේ දේශපාලන උපායයන් පිළිබඳ කිසි ම වැටහීමක් නොතිබුණු බව සනාථ කිරීම පිණිස මීට වඩා සාක්ෂි වුවමනා නොවේ.

වාමාංශිකයා (ලෙෆ්ටිස්ට්) යන්න නිග්‍රහශීලී වචනයකි. වාමාංශිකයා යන්න සවන් පත් පුද්ගලයකු ගේ සිත අභ්‍යන්තරයේ මැවෙන්නේ සමාජයේ හරි වැඩ නොකර, වැරදි ක්‍රියාවන්හි යෙදෙන පුද්ගලයෙකි. දකුණු අතින් බත් කන සිංහල සමාජයේ, වම් අතින් බත් කන්නකු ගේ චිත්‍රයකි.

මැයි දිනය ලංකාවේ වාමාංශිකයන් විසින් ද මහ ඉහළින් පවත්වන උත්සවය යි. මෙබඳු වාර්ෂික සැමරුම් උත්සව ලෝකයට හඳුන්වාදීම ඇමරිකානු වෙළෙඳ ප්‍රචාරක සමාගම්වල ප්‍රකට වෙළෙඳ උපක්‍රමයකි. සැමරුම් දිනවලට නේකප්‍රකාර බඩුභාණ්ඩ 'සැමරීම' මුවාවෙන් අලෙවි කෙරේ. ඇමරිකාවේ **චිකාගෝ** වරායේ ඇතිවූ සිද්ධියක් තේමා කරගෙන, මැයි දිනය හඳුන්වා දෙන ලද්දේ ද ඇමරිකානු වෙළෙඳ සමාගමක් විසිනි. එය ආසියා අප්‍රිකා දිළිඳු

රටවල ජාතික උළෙලක් තරමට ජනප්‍රිය වී තිබේ. ඇමරිකාවේ හා බටහිර යුරෝපයේ කම්කරුවා යන පුද්ගලයා වඳකරනු ලැබ සේවා යෝජකයන් සහ සේවා දායකයන් ඇති කර තිබේ. මෙය ද භාෂාව මඟින් පුද්ගල මනස වෙනස් කිරීමකි. කම්කරුවන් නොමැති ඇමරිකාවේ මැයි දිනය සැමරීමට පුද්ගලයන් නැත. සේවා යෝජකයෝත් සේවා දායකයෝත් හවුලේ මෙමෝරියල් ඩේ, ෆාදර්ස් ඩේ, මදර්ස් ඩේ, තැන්ක්ස් ගිවින් ඩේ, හැලෝයින් ඩේ, ක්‍රිස්මස් ඩේ, වැලන්ටයින් ඩේ ආදී දින සමරති. ඇමරිකාව අනුකරණය කරන නැගෙනහිර යුරෝපය ද මැයි දිනය වෙනුවට ඇමරිකානු වෙළෙඳුන් ගේ දින සැමරීමට උනන්දුවක් දක්වති.

වසර කීපයක සිට ලංකාවේ ද මාධ්‍යකරුවෝ වෙසින් පෙනී සිටින බ්‍රෝකර්ලා **වැලන්ටයින් දිනය** විකුණති. පාසල් දරු දැරියන්ට පිට්ටනිවලට බැස 'ආදරේ' කියා කෑගසන ලෙස මොවුන් ඉල්ලූ බව වාර්තා විය. ඉදිරියේ දී පහසුවෙන් ම අලෙවි කළ හැකි මව් දිනය, පිය දිනය, දූ දිනය, පුතු දිනය ආදී තව තවත් 'දින' ජනප්‍රිය කරවනු ඇත. දින ඉලක්ක කර තැනෙන වෙවාරන්න වෙළෙඳ බඩු, සුබපැතුම් පත් කලඑළි බසිනු ඇත. ඒ පිළිබඳ වෙළෙඳ දැන්වීම් මාධ්‍ය බ්‍රෝකර්ලා ගේත් දැන්වීම් නිර්මාණකරුවන් ගේත් සාක්කු පුරවාලනු ඇත.

යුදෙව්වෝ වූ යේසුස් වහන්සේ සහ කාල් මාක්ස් දෙදෙනා ම ඉතා දිළිඳු පවුල්වල ඉපදී, ඉතා දිළිඳු ජීවිත ගත කළෝ ය. මොවුන් දෙදෙනා ම දිළින්දන් සහ දිළිඳුකම අගය කළ හ. මාක්ස් ධනපතියන් කෙරේ වෛරයෙන් යුතු ව, ධනපතියන් ද දිළින්දන් බවට පත් කිරීමට අදහස් කළේ ය. ඔහු දිළින්දන් විසින් ගොඩනැංවිය යුතු ලෝකය හැඳින්වූයේ **නිර්ධන පන්ති ආඥාදායකත්වය** යනුවෙනි. යූජින් පොතිගේ ප්‍රංශ ජාත්‍යන්තර කම්කරු ගීතය අනුව නීතිඥ බී. ජේ. පෙරේරා ලියූ ලංකා සමසමාජ පක්ෂයේ "සාදුකින් පෙළෙනවුන් දැන් ඉතින් නැගිටියව් අන්තිම සටනට සැරසියව්" සින්දුව රාජ්‍ය බලය අල්ලා ගැනීම පිණිස ඉදිරිපත් වන නිර්ධන පන්තියේ රණ ගීතය යි.

සමසමාජකාරයන් ගේ 'සින්දුව' ප්‍රායෝගික සටනක් බවට පෙරළීමට අදහස් කළ රෝහණ විජේවීර, ජනතා විමුක්ති පෙරමුණ

නමැති දේශපාලන පක්ෂය යටතේ, දේශප්‍රේමී ජනතා ව්‍යාපාරය නමින් සාදුකින් පෙළෙන්නවුන් ගේ මිලිටරි හමුදාවක් තැනීමට වෙහෙසුණේ ය. සාදුකින් පෙළෙන්නවුන්ට සටන් කළ නොහැකි බව තේරුම් ගැනීමට උගත්කමක් වුවමනා නැත. හමුදා භටයන්ට සටන් කළ හැක්කේ හොඳ කාය ශක්තියක් ඇත්නම් පමණි. මොළය වර්ධනය වීම සඳහා ද ආහාර අවශ්‍ය වේ. කිසියම් පිරිසකට, 'තුඹලා සාදුකින් පෙළෙන්නන්' ය යි කී විට, ඔවුහු මානසික ව අකර්මණ්‍ය වෙති. ගොවි කම්කරුවන් පිරිසක් අමතා, 'උඹලා සාදුකින් පෙළෙනවුන්' ය යි පවසා, ඔවුන් ගේ සිත් දුර්වල කොට, 'දන් ඉතින් සටන් කරන්නට නැගිටපල්ලා' කී විට ඔවුනට නැඟිටගත නොහැකි ය.

එම නිසා 'සාදුකින් පෙළෙනවුන්' සින්දුව ඉංග්‍රීසිය මවු භාෂාව කරගෙන සිටි 'වමේ' පැරණි නායකයින්ට ලංකාවේ 'වමේ' ව්‍යාපාරය බිඳ දැමීම සඳහා වෙහෙසුණ බටහිර රහස් සංවිධානයකින් දුන් 'ලණුවක්' විය යුතු ය. හෙළිදරව් කරන ලද සී. අයි. ඒ. වාර්තාවල, ඔවුන් ලෝකයේ රට රටවල මාක්ස්වාදීන්ට දුන් මෙබඳු 'ගුණ්ඩු' පිළිබඳ ව සඳහනි. වරක් සී. අයි. ඒ. නිලධාරියෙක් රතු හමුදාවේ නායකයකු මාර්ගයෙන් මා ඕ සේතුං වෙත ගැමි කෘෂි නිලධාරියකු ගේ සොයාගැනීමක් ලෙසින් ගේකුරුල්ලන් පිළිබඳ වාර්තාවක් යැව්වේ ය. චීනය ගේකුරුල්ලන් ගේ මුල් බිම යි. ගේකුරුල්ලන් ලංකාවට පැමිණ ඇත්තේ චීන නාවිකයන් සමඟිනි. ගේකුරුල්ලකු දිනකට කන ධාන්‍ය ප්‍රමාණය, චීනයේ ගමක සිටින ගේකුරුල්ලන් සංඛ්‍යාව, නගරයක සිටින සංඛ්‍යාව, මුළු චීනයේ ගේකුරුලු සංඛ්‍යාව ආදී වශයෙන් වාර්තාව දත්ත සංග්‍රහයක් විය.

ගේකුරුලු වාර්තාව කියැවූ මා ඕ, ප්‍රතිගාමී ගේකුරුල්ලා වැඩවසම් යුගයේ සංකේතයක් ලෙස හඳුන්වමින් උන් වඳකිරීම රතු හමුදාවට භාර කළේ ය. රතු හමුදාව චීනයේ ගේකුරුල්ලන් සත්ව උද්‍යානවලට පමණක් සීමා කළේ ගේකුරුල්ලන් මැරීම මෝඩකමක් බව කී භික්ෂූන් වහන්සේලා කිහිප නමකට ද අච්චු කරමිනි. ඊළඟ වසරේ චීනය පුරා කෘමි වසංගතයක් පැතිර ගියේ ය. ඊට හේතුව කෘෂි විද්‍යාඥයන් දැනගත්ත ද ඔවුනට ඇත්ත ප්‍රකාශ කළ නොහැකි විය. ගේකුරුල්ලන් වඳ කිරීම නිසා චීනයට

වැඩි වැඩියෙන් කෘමි නාශක අවශ්‍ය විය.[17]

මාක්ස්ට පෙර ජීවත් වූ යේසුස් වහන්සේ, ධනපති පන්තියට වෛර නොකළ හ; ඔවුන් නින්දාවට ලක් කළ හ. ඊශ්‍රායලයේ පොහොසතුන් අමතා, "ඵරිසිවරුනි, ලියන්නෙනි, වංචාකාරයින් වූ තුඹලාට දුක් වේ. මක්නිසා ද තුඹලා ගේ ජීවිත සුදු කළ සොහොන් ගෙවලට සමාන ය. ඒවා ලක්ෂණට පෙනෙන නමුත් ඇතුළ මිනීවලින් ද සියලු අපවිත්‍රකමෙන් ද පිරී තිබේ."[18] ය යි එතුමා කී බව බයිබලයේ සඳහන් වේ. සුදු හුණු පිරියම් කළ සොහොන් ගෙවල් එකල පලස්තීනයේ තිබුණේ ද යන්න සැක සහිත නමුදු, යේසුස් වහන්සේ ගේ එම ප්‍රකාශය ඉතා ප්‍රසිද්ධ එකකි.

"දිළින්දෝ ආශීර්වාදලද්දෝ ය. දේව රාජ්‍යය ඔවුන් ගේ ය"[19] කියමින් එතුමා දිළින්දන් ධෛර්යමත් කළේ ය. 'ඔටුවෙක් ඉඳිකටු සිදුරකින් රිංගුවත් ධනපතියකුට දිව්‍ය ලෝකයට ඇතුළුවිය නොහැකි බව'[20] කීවේ මාක්ස් නොවේ; යේසුස් වහන්සේ ය. එය නිවැරදි නම් දිව්‍ය ලෝකය පිරෙනු ඇත්තේ, ලංකාව, ඉතියෝපියාව, බංගලාදේශය වැනි රටවල මනුෂ්‍යයන් ගෙනි. ජර්මනිය, නෙදර්ලන්තය, නෝර්වේ වැනි රටවල වැසියන්ට ස්වර්ග රාජ්‍යයට කිට්ටුවන්නට හෝ නොහැකි වෙයි. ස්වර්ග රාජ්‍යයට කිට්ටුවන්නට වත් නොහැකි රටවල කෝටිපතියන්, මිෂනාරී ව්‍යාපාරයන්ට මුදල් හළමින් දුප්පත් රටවල වැසියන්ට ක්‍රිස්තියානි ආගම බෙදන්නේ මන්ද යි අප විසින් ප්‍රශ්න කළ යුතු වන්නේ ය. ස්වර්ගය දුප්පතුන් ගේ උරුමයකි. දිළින්දන්ට ස්වර්ගය වෙත යාමට ධනපතියන් ගේ ඉනිමං වුවමනා නැත. යේසුස් වහන්සේ ගේ ඉහත ප්‍රකාශය ධනපතියන් කෙරෙහි වෛරයෙන් කළ එකක් නොව, මිනිසුන් දානපාරමිතාව කෙරේ යොමු කිරීම පිණිස කරන ලද එකකි.

යේසුස් වහන්සේ මරණින් මතු යාහැකි දේව රාජ්‍යය ගැන නිතර කී හ. එය සියලු යස ඉසුරින් පිරුණු ලෝකයකි. මාක්ස්, 'දේව රාජ්‍යය වෙත යාමට මිය යන තෙක් බලා සිටිය යුතු නැත. ධනපතියන් වනසා දමන නිර්ධනීන්ට, ජීවිත කාලය තුළ දී ම බිහිකරගත හැකි ය' යි තර්කානුකූල ව කියා සිටියේ ය.[21]

මාක්ස් තර්ක කළ ලෙසට පුද්ගලයා යනු භෞතික වස්තුවකි. භෞතික ශරීරය විසින් මනස නිර්මාණය කරයි. මනස ද්‍රව්‍යයේ උච්චතම වර්ධනය හා සංවිධානය යි. ආගම අබිං ලෙසින් මනස

විනාශ කරයි.[22]

මාක්ස් ගේ වයස අවුරුදු දහසයේ දී ඔහු ගේ පියා 1834 මාර්තු 23 වන දින මාක්ස් ඇතුළු පවුලේ සැම බෞතීස්ම කරවා තමා ද ක්‍රිස්තියානි ආගම වැළඳගත්තේ ය. ඉන් පසු ව මාක්ස් ගේ පවුල ඉතා භක්තිමත් ක්‍රිස්තියානීහු වූ හ. කාලාන්තරයක් මුළුල්ලේ නොකඩවා දේව මෙහෙයට සහභාගි වූ භක්තිමක් ක්‍රිස්තු භක්තිකයකු වූ මාක්ස්, බයිබලය හා දේව ඉගැන්වීම් දැඩි භක්තියකින් අධ්‍යයනය කළ පුද්ගලයෙකි. ඔහු පළමු ව බොන් සරසවියේත් දෙවනු ව බර්ලින් සරසවියේත් අධ්‍යාපනය ලැබී ය. මුල් කාලයේ හේගල් ගේ අපෝහකවාදය කෙරේ උනන්දු වූ ඔහු පසු ව හේගල් ගේ දර්ශනය ප්‍රතික්ෂේප කර දයලෙක්තික භෞතික දර්ශනය ඉදිරිපත් කළේ ය.

මාක්ස් මැදිවියේ දී අදේවවාදියකු වුව ද පුද්ගලයකු ගේ මානසික වර්ධනයෙන් වැඩි කොටසක් සම්පූර්ණ වන ළමා වියේ දී මෝසස් ගේ දැඩි මූලධර්මවාදී යුදෙව් චින්තනය යටතේ හැදුණි වැඩුණි. එතැන් පටන් තරුණ විය තෙක් ඔහු, සෝල් (සෝල් පිළිබඳ ව ඉදිරි පරිච්ඡේදයක දී විස්තර කෙරේ) ගේ ක්‍රිස්තියානි චින්තනයේ ග්‍රහණයට නතු විය. දැඩි මූලධර්මවාදී ආගම් දෙකක් විසින් මාක්ස් ගේ මානසිකත්වය මෙහෙයවන ලද බව පැහැදිලි ය. ක්‍රිස්තියානි ආගමේ හරය සෙවූ ඔහු ධනපතියන් දිළිඳු කිරීම ජීවිතයේ මූලික අරමුණ කරගත්තේ බයිබලය කියවීමෙනි. දිළිඳන් ගේ ස්වර්ග රාජ්‍යය මරණින් මතු නොව ජීවත් ව සිටිය දී ම ළඟා කර ගත හැකි ය යි ඔහු තර්ක කළේ ය. ඒ සඳහා මාර්ගය වශයෙන් ඔහු තෝරා ගත්තේ මෝසස් හඳුන්වා දුන්, සෝල් විසින් තහවුරු කරන ලද ප්‍රචණ්ඩත්වය යි. ක්‍රිස්තියානි හා යුදෙව් ආගම් 'ස්වර්ග රාජ්‍යය මරණින් මතු ලැබෙන එකක් බව මහජනයාට ඒත්තුගැන්වීම නිසා' මාක්ස් ආගම අබිං ය යි කියා සිටියේ ය. මාක්ස්ට අවශ්‍ය වූයේ ධනපතියන් වනසා මේ ආත්මයේ දී ම ස්වර්ග රාජ්‍යය පහළ කරගැනීමට ය.

රටක ධනවතුන් දිළිඳුන් කර ස්වර්ගයක් සෑදීම යනු විකාර අදහසක් බව තේරුම් ගැනීමට ආර්ථික විද්‍යාව හැදෑරිය යුතු නැත. ධනවතුන් නැති රාජ්‍යය දිළිඳු වෙයි. මහජනයාට රැකියා මාර්ග නැති වෙයි. විදේශ රටවලට අතපැමට සිදු වෙයි. රටේ සම්පත් විදේශීය ආයෝජකයන් අත පත් වෙයි.

මාක්ස් රැකියාවක් නොකළ පුද්ගලයෙකි. මන්දපෝෂණයෙන් වැඩුණු ඔහු ගේ එක් දරුවෙක් ක්ෂය රෝගය වැළඳී මිය ගියේ ය. මාක්ස් ගේ බිරිඳ පවුල නඩත්තු කළේ හිඟමනෙන් හා එංගල්ස් ගෙන් ලැබුණු සුළු මුදලෙනි. ඇතැම් විට මාක්ස් එම මුදල් ද දුම්පානය සඳහා වැය කළේ ය.

ලංකාවේ ඇතැම් තරුණ තරුණියෝ මාක්ස්වාදය තබා මාක්ස් පිළිබඳ ව හෝ දැනුමෙන් තොර ව මාක්ස්වාදීන් වී සිටිති.

මාක්ස් ආගම අබිං ය යි කීවේ ඇයි ද යි එකල යුරෝපයේ දී කොමියුනිස්ට් කල්ලිවලට බැඳුණු ආසියාතු ධනපතියන් ගේ දරුවන්ට නොවැටහුණි. මාක්ස් ගේ ප්‍රකාශයේ වචනාර්ථය පමණක් කරගසා ගෙන තම රටවලට ගිය ඔවුහු මාක්ස්වාදයෙන් මත් ව ආගම අබිං ය යි සලකමින් බුද්ධාගමට බැට දෙන්නට වූ හ. මාක්ස් බෞද්ධ දර්ශනය හෝ බුදු දහම හෝ හැදෑරුවෙක් නොවී ය. හැදෑරුවේ නම් මාක්ස් ගේ ඉහත සඳහන් ඓතිහාසික ප්‍රකාශය ඊට වෙනස් වීමට ඉඩ තිබුණි.

මහමදික සහ ක්‍රිස්තියානි ආගම් කොමියුනිස්ට්වාදීන්ට වඩා බලවත් විය; සංවිධානාත්මක විය. ලක්ෂ ගණනින් මනුෂ්‍ය ඝාතන සිදු කළ ජෝසප් ස්ටාලින් කොමියුනිස්ට් නායකයාට පවා රුසියානු ඕතඩ්‍රොක්ස් දේවස්ථානයට ආධාර කිරීමට සිදු විය. වරක් ඔහු ඉතා වටිනා මෝටර් රථයක් පල්ලියට රහසේ පරිත්‍යාග කළේ ය.[23] ආඥාදායක පිදෙල් ක්‍රුස්තෝ, පව් සමා කරගෙන පාප් වහන්සේ කියුබාවට කැඳවී ය. කොමියුනිස්ට්වාදීන් විනාශ කළේ නිදහස් බෞද්ධයන් පමණකි. සෑම කොමියුනිස්ට් රටක ම ක්‍රිස්තියානි සහ මහමදික දේවස්ථාන ආරක්ෂා වුණි: පාදිලිවරුන් රැකුණි.

කොමියුනිස්ට්වාදීහු, චීනය, ටිබෙටය, මොංගෝලියාව, වියට්නාමය, ලාඕසය ඈ රටවල භික්ෂු භික්ෂුණීන් ඇතුළු බෞද්ධයන් ලක්ෂ සංඛ්‍යාවක් මරා දමූ හ. දහස් සංඛ්‍යාත විහාරාරාම පොළොවට සමතලා කෙරිණි. කොමියුනිස්ට්වාදය නිසා, ලංකාව, කාම්බෝජය වැනි රටවල දහස් ගණනක් බෞද්ධයෝ මිය ගිය හ.

ප්‍රේමදාස ජනාධිපති සමයේ ඇති කරන ලද භීෂණය යටතේ ලංකාවේ භික්ෂූන් වහන්සේලා හත් සියයකට ආසන්න සංඛ්‍යාවක් ඝාතනය කර ඇති බව ජාත්‍යන්තර ලේඛනවල සඳහන් වේ.[24] සිවුරු හැර ගිය සංඛ්‍යාව දහස් ගණනකි. පාලු වූ ගම්බද විහාරාරාම සංඛ්‍යාව සිය ගණනකි. 1971 කැරැල්ලට සම්බන්ධ ය යි සිරගත කරන ලද තරුණ තරුණියන් කෙතරම් සංඛ්‍යාවක් ක්‍රිස්තියානිකරණයට ලක්වූයේ දැ යි සොයා බැලිය යුතු වෙයි. මැගසින් බඳු සිරගෙවල්වල සිර වූ තරුණයන් බාහිර ලෝකය සමග ලියුම් ගනුදෙනු කළේ පවා සිරගෙදරට පැමිණි කන්‍යා සොහොයුරියන් ගේ උපකාරයෙනි.

ලන්ඩන් සංස්කෘතිය වැලඳගත් ලංකාවේ කොමියුනිස්ට් ව්‍යාපාරයේ ආරම්භක නායකයන් සියලු දෙනා ම සංස්කෘතික අක්මුල් සිඳගත්තවුන් වශයෙන් හැඳින්විය යුතු ය. සමාජවාදයක් ගැන කියමින් වේදිකා දෙදරවූව ද ඔවුන් බොහෝ දෙනා කටින් බතල හිටවූවන් බව තහවුරු වන චිරප්‍රකට සිද්ධි එක්රැස් කළ හොත් 'වම' සැබෑ දේශපාලන මාර්ගයක් ය යි සිතා තවමත් වමේ පක්ෂ පසු පස හඹා යන තරුණ තරුණියන් ගේ නුවණැස පාදවන ඥාන කෝෂයක් වන්නේ ය. ඇමරිකාව හංග කරමු යි වේදිකා පැලූ පැරණි සමසමාජ හා කොමියුනිස්ට් නායකයන් ගෙන් සියයට අනූ අටක ගේ දූ පුතුන් අධ්‍යාපනය සඳහා යවා ඇත්තේ ඇමරිකාවට හෝ බටහිර යුරෝපයේ රටකට හෝ ය. ඔවුන් ගෙන් සියයට හැත්තෑ පහක් පමණ ඇමරිකාවේ හෝ එංගලන්තයේ හෝ පුරවැසිකම් ලබා ගෙන සිටිති.

සමසමාජ පක්ෂයේ ක්‍රියාකාරී සාමාජිකයකු වශයෙන් දේශපාලනය කළ ශ්‍රී චන්ද්‍රරත්න මානවසිංහ සිය අත්දැකීම් ඇසුරින් ලියූ ලිපි සමසමාජකාරයන් ගේ 'අන්තිම සටන'ත් සමාජවාදයත් පිළිබිඹු කරන කදිම කැඩපතක් වැන්න.

"යම් හෙයකින් හමුදා යොදවා කම්කරුවන්ට වෙඩි උණ්ඩ එල්ල කිරීමට අගමැති ඉදිරිපත් වුවහොත් එකා මෙන් නැඟී සිට සටන් කරමු."

"........ඉහත සඳහන් ප්‍රකාශය කළ පුද්ගලයා කවරෙක් ද? ඔහු එසේ මෙසේ කෙනෙකු නොව තව ටික දිනකින් මේ රටේ

නායකත්වය කර ගසා ගෙන ගොවි කම්කරු ආණ්ඩුවක් පිහිටුවීමට තතනන නව ලංකා සමසමාජ පක්ෂයේ අසහාය නායක, ඇන්. ඇම්. පෙරේරා පඬිතුමාය.

"......කම්කරුවෙනි එක් වව්! ආචාර්ය තුමාත් සමග සටන් බිමට වැදී සටන් කරව්." යන උද්ඝෝෂණය මහජනයා විසින් නැඟිය යුතු අවස්ථාව මෙයයි. එහෙත් මෙයට පොඩි කොස්සක් පරහට හිට ඇත. ඩී. ඇස්. සේනානායක මහතා අගමැති පදවිය උසුලද්දී 1947 වර්ෂයේ පැවති රජයේ සේවකයන්ගේ මහා වැඩ වර්ජනය "නොමළ මිනිසුන්ට" තවමත් මතක ඇත. ඒ මහා වැඩ වර්ජනයේ දී එදා රජය බිඳ වැටීමට ඔන්න මෙන්න කියා තිබුණි. ආචාර්ය පෙරේරා පඬිතුමා එදා වැඩ වර්ජනය කර සිටි කම්කරුවන් රැගෙන කොළොන්නාව කරා පෙළපාළියක් ගියේ ය. පොලිසිය මේ පෙළපාළියට හරස් කැපීය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් පොලිස් වෙඩි පහරකින් මිය ගියේ ආචාර්ය පෙරේරා පඬිතුමා නොව අහිංසක දෙමළ ලිපිකරුවෙකු වන කන්දසාමි මහතාය. ලිපිකරුවෙකු වන කන්දසාමි මහතා පොලිසියේ වෙඩි පහරට ලක්ව මහ මග මිය ගියේ ය. මහා නායකයාට කම්බිවැටකට ඔබ්බේ කීර කොටුවක තිබුණු ගෙය එදා පිහිට වූ අන්දම පෙළපාළියේ ගිය රජයේ සේවකයන්ට තාම අමතක වී නැත. ගාල්ලේ පැවති රැස්වීමකදී ද පොලිසිය හා ඇති වූ සට්නයකදී ද එකා මෙන් සටන් බිම වැදී මිය යන තුරු සටන් කිරීමට ගිගුම් දෙන මහා වීරයන් ගාලු පිට්ටනියේ සිට කොටු පවුර දක්වා කලිසම අමුඩ ගසා ගෙන දිවූ අන්දම ගැන ගාලු වැසියෝ අදත් කතා කරති. රජමල් වත්තේ සිද්ධියක දී කකුල්දෙකට පින් දිදී දිවීමෙන් සටන් ජය ගත් අවස්ථා වෘත්තීය සමිති ව්‍යාපාරයේ දක්නට නැත්තේ නොවේ. "එකා මෙන් සටන් කොට එක ගොඩේ මිය යමු" යයි කීම එකකි. එසේ කිරීම තවත් එකකි. මේ රටේ ප්‍රගතිශීලී කිසියම් ව්‍යාපාරයකදී හෝ සටනක දී වෙඩි උණ්ඩයට මුහුණ දුන් කෙනෙක් ඇත්නම් පීඩිත පංති ජනතාවගෙන් නැඟ ආ පීඩිත බවේ වේදනාවෙන් මිරිකී ගිය අසරණ කම්කරුවෙකු විනා කලිසම් අඳින නායකයෝ නොවෙති. මෙරට කම්කරුවා වෙනුවෙන් දිවි පිදීමට ප්‍රතිඥා දුන් නායකයන් ඒ ප්‍රතිඥාව ඉටු

කරන ලද නම් ඔවුහු සිය දහස් වරක් මැරි මැරී ඉපදී සිටින්නන් විය යුත්තේය.[25]

"………. ලංකාවේ කම්කරුවෝ වාසනාවන්තයෝ ය. නියම මාර්ගෝපදේශකත්වය දෙන කම්කරු නායකයෝ ඔවුන් වෙනුවෙන් දිවි පවා පූජා කිරීමට, එකාමෙන් සටන් බිම වැටී මැරීමට සූදානමින් සිටිති. ආදර්ශමත් පුද්ගලයෝ ඇත්තෙන්ම දුර්ලභය. එහෙත් එකක් කිවයුතු වෙයි. මෙරට කම්කරු නායකයෝ කම්කරුවන් වැඩ වර්ජන වලට පොළඹවත්. එහෙත් ආචාර්ය කොල්වින් රෙජිනෝල්ඩ් ද සිල්වා මහතා වැනි උදවිය වැඩවර්ජනය කළ එකම දවසක් වත් ගැන මෙරට කම්කරු ඉතිහාසයේ දැන ගන්නට නැත. වැඩ වර්ජනයේ යෙදෙන අසරණ කම්කරුවාත් වෙළඳ සේවකයාත් කාර්යාල වල අගු අයිනේ අව්වට වේලි වේලි වැස්සට තෙමි තෙමී දුක් විඳිද්දී ගිනි කන නීතිඥයෝ උසාවියේ මුදල් උපයති. කම්කරුවෙකු මාස තුනකට උපයන මුදල ගිනිකන්නෝ මිනිත්තු පහෙන් උපදවති. කම්කරුවන් වැඩ වර්ජනයට පොළඹවන්නෝ ධනපතීන්ගේ නඩුවලදී පෙනී සිට ධනපතීන් ගලවා ගනිති.

"…………ධනපතීන් සතු හැම දෙයක්ම පාලනය කරන්න කියන ආචාර්ය ද සිල්වා මහතා වැනි නීතිඥයන්ගේ ශාස්තු පාලනය කළ යුතුය යැයි කියන දිනය කවදාද යන්න කම්කරුවන් විසින්ම දැන් ඇසීමට පටන් ගෙන තිබේ. **ඔවා දෙනු පරහට - තමා සම්මතෙහි පිහිටා සිට - දුසිරිත දනන් දෙන - ඔවා වැද්දන් කියන බණ වැනි**, යන්න අද කම්කරු නායකයෝ නොදනිති.[26]

සිංහල බෞද්ධ වෙළෙඳුන්ට හා නායකයින්ට වෛර කිරීම මාක්ස්වාදයෙන් සිත් පුරවාගත් පැරණි වමේ නායකයන් ගේ පොදු ලක්ෂණයක් විය. ඉඩ ලද හැම විටක ම බණ්ඩාරනායක ආණ්ඩුවලට හේත්තු වූ ඔවුහු, උප්පරවැට්ටි ක්‍රියාත්මක කරමින් බස් ජනසතු කිරීම, ගුණසේන සමාගමේ පාසල් පොත් මුද්‍රණය රජය යටතට ගැනීම, දවස ආයතනයට සීල් තැබීම වැනි ක්‍රියාවන්හි නියැළී සිංහල වෙළෙඳුන් ගේ ශක්තිය වඳ කළ හ. ලොකු ම අපරාධය, පිලිප් ගුණවර්ධන ඉදිරිපත් කළ කුඹුරු පනත යි.

පිලිප්, අධ්‍යාපනය පිණිස ඇමරිකාවට ගිය, ලංකාවේ ධනපතියකු ගේ දරුවෙකි. පසු කලෙක යුරෝපයට පැමිණි ඔහු එහි දී මාක්ස්වාදී කල්ලියකට බැඳුණේ ය. කොමියුනිස්ට්වාදීහු මාක්ස්වාදී චින්තනය ලෝකයේ හැම රටකට ම සනාතන දහමක් ය යි අදහති. මාක්ස් ගේ ඓතිහාසික භෞතිකවාදී දර්ශනයට අනුව මුලින් ම පැවතුණේ වනචාරී සමසමාජ යුගයකි. ඉන් පසු ව වහල් සමාජය ඇති විය. වහල් සමාජය දෙදරා ධනපති සමාජය බිහි විය. ධනවාදී සමාජය නිරතුරු ව ම ගැටෙන ධනපති හා නිර්ධන පන්ති දෙකෙන් යුක්ත වේ. මාක්ස් ගේ න්‍යාය ලංකාවට ගැළපූ පිලිප් කෘෂිකර්ම ඇමති සිංහල ගොවි සමාජයේ කුඹුරු හිමියන් හා අඳ ගොවියන් ලෙසින් පන්ති දෙකක් ඇතැ යි පෙන්වූයේ ය.[27] 1817-18 උඩරට කැරැල්ලේ සහ බ්‍රිතාන්‍යයන් ගේ ඉඩම් ප්‍රතිපත්තියේ ප්‍රතිඵල වශයෙන් සිංහලයන් විශාල පිරිසකට ගම්බිම් අහිමි වුණි. ඔවුහු සරණාගතයන් සේ ගම්මාන ගානේ ගිය හ. සමහර ගම්මු අනාථයන්ට සිය ගම්වල රැකවරණ සලසා ඔවුන් තමන් ගේ කුඹුරු ගොවිතැන්වලට හවුල් කරගත් හ. ගම්වල ගමරාලලා සහ ගොවිරාලලා වශයෙන් දෙපාර්ශවයක් බිහි වූයේ එපරිද්දෙනි. ගමක කුඹුරු යායේ පාරම්පරික හිමිකරුවෝ ගමරාලලා වූ හ. දෙවනු ව පැමිණි පිරිස් ගොවිරාලලා වූ හ. ලංකාවේ ගමරාලලා ධනපතියන් හෝ ඉන්දියාවේ සමින්දාර්වරුන් හෝ මෙන් විශාල ඉඩම් හිමියෝ නොවූ හ. ඔවුන් ගෙන් බහුතරය අක්කර දෙක තුනක පරම්පරා කුඹුරු කැබැල්ලක් වගාකළ දනුමැත්තෝ වූ හ. සිංහල ගොවි සමාජය ගැන කිසිදු දැනුමක් නොතිබුණු පිලිප් ගමරාලලා ධනපතියන් ලෙසත් ගොවිරාලලා නිර්ධනීන් ලෙසත් හැඳින්වී ය.[28]

බටහිර චින්තනයෙන් බෞතීස්ම වී යුරෝපයේ සිට පැමිණි පිලිප් රෙද්ද බැනියම ඇන්ද 'කෘෂි අපොස්තල්වරයෙකි.' ලංකාවේ මාක්ස්වාදී පක්ෂයක් පිහිටුවූ ඔහු ඉදිරිපත් කළ කුඹුරු පනත එනාහි සිංහල කැරලිකරුවන්ට සහ ඉඩම් අහිමි වූ සිංහලයනට පිහිට වූ ගැමියන් ගේ පරම්පරාවලට දඬුවම් දීම පිණිස ඉදිරිපත් කරන ලද දුෂ්ට පනතකි. පනතේ විපාකය ලෙසින් සිංහල ගොවි සමාජය විනාශ විය. හෙක්ටර් කොබ්බෑකඩුව පළදා වර්ධන

පනත ඉදිරිපත් කරමින් ගොවි කැරලිකරුවන්[29] අසරණ කළේ ය.

වාමාංශිකයන් ගේ අදහස වූයේ කොබ්බෑකඩුව ගේ පලදා වර්ධන කමිටු කොමියුනිස්ට් රාජ්‍යයන්හි පැවති අස්වනු කමිටුවලට සමාන ආයතන විශේෂයක් බව යි. සැබෑව නම් මේවා කොබ්බෑකඩුවට යෝජනා කරනු ලැබ ඇත්තේ පිලිපීනයේ ජාත්‍යන්තර සහල් පර්යේෂණ ආයතනය (International Rice Research Institution) හෙවත් ඊරි (IRRI) ආයතනය විසින් බව යි. ඇමරිකාව රොක්පෙලර් සහ ෆෝඩ් පදනම්වල ආධාර ලබා දී පිලිපීනයේ ඊරිය පිහිටුවූයේ ආසියාවේ සටන්කාමී ගොවි පරපුර නැති කිරීමේ අරමුණිනි. ආසියානු ගොවියා ගේ ශක්තිය රඳා ඇත්තේ බීජ නිපදවීම, ගබඩා කිරීම හා බෙදාහැරීම ගොවීන් සතු ව තිබීම මත බව වටහා ගත් ඊරිය ඊට පිළියම් සෙවී ය. පනත යටතේ පලදා කමිටු මඟින් ගොවියන්ට බිත්තර වී සපයන්නට විය. ඇළවේලි පාලනය කිරීමේ බලය පලදා කමිටු වෙත පැවරීම නිසා තමන් කැමති වී වර්ගයක් තමන්ට වුවමනා වේලාවට වගාකිරීමට ගොවියාට තිබුණු බලතල නැති විය. සිංහලයා ගේ වී ගොවිතැන විනාශ කිරීම පිණිස අඩිතාලම දමන ලද්දේ එසේ ය.*

සිංහලයන් අතර බෙදාහැරීම පිණිස ඇමරිකාවේ ක්‍රිස්තියානි සංවිධානයක් විසින් ජපානයේ මුද්‍රණය කළ පොතක සඳහන් පරිදි, බයිබලය මුළුමනින් ම හෝ කොටස් වශයෙන් හෝ භාෂා දෙදහසකට (2000) අධික ගණනකට පරිවර්තනය කර ඇත. මුද්‍රණය කර බෙදාහරිනු ලැබූ එහි පිටපත් සංඛ්‍යාව කෝටි ගණනකි. බයිබල් පිටපතක් සොයාගත නොහැකි තැනක් ලෝකයේ නැති තරම් ය.[30] ඉරිදා දිවයින සංග්‍රහයේ පළවූ දැන්වීමකට අනුව, ලංකාවේ විශ්වවිද්‍යාලයක සිංහල පිළිබඳ මහාචාර්යවරයෙක්, දකුණේ පන්සලකින් පැරණි බයිබලයක් සොයාගෙන ඇත. එය මුද්‍රණය කිරීම පිණිස විශාල මුදලක් වැය වේ ය යි අපේක්ෂා කරන බැවින් මුදල් ආධාර සපයන්නැ යි මහාචාර්යවරයා ලංකාවේ මහජනයා ගෙන් ඉල්ලා සිටියි.[31] කොදිව්වල උපන් ඇතැමුන්, මහාචාර්යවරු වුවත් කූප මණ්ඩූකයන් වෙතැ යි යමෙකු කියා තිබුණි.

---

* වැඩි විස්තර සඳහා කියවන්න, පරම්පරා, කොලට් සේනානායක, නාරද කරුණාතිලක, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ, (මුද්‍රණයේ)

තමා වාමාංශිකයෙකි යි කියාගන්නා පුද්ගලයන් වැඩි දෙනකු ගේ නිවෙස්වල දාස් කැපිටල් ග්‍රන්ථය ඇතිවා සේ ම බයිබලයක් ඇති ක්‍රිස්තියානි නිවෙසක් ද නැත. උගතුන් ය යි සම්මත පුද්ගලයන් කාගේත් පාහේ පොත් රාක්කයෙහි බයිබලය හා දාස් කැපිටලය යන පොත් දෙක ම තිබේ. උගත් නූගත් භේදයකින් තොර ව, බයිබලය හෝ දාස් කැපිටලය හෝ ළඟ තබාගෙන සිටින පුද්ගලයන් ගෙන් සියයට දශමයක් වත් එම පොත් කියවා නැති බව මෙම පොත් පිළිබඳ ව සමීක්ෂණ පැවැත්වූවෝ කියති. තම නිවෙසේ බයිබලය ඇතත් එහි අතරින් පතර කොටස් මිස මුළුමනින් කියවූ ක්‍රිස්තු භක්තිකයකු අපට හමුවී නැත. බොහෝ දෙනා මේවා ළඟ තබාගන්නේ මෝස්තරයට ය. ඊටත්, නොමිලයේ ලැබෙන පොතක් ළඟ තබාගැනීමේ වරද කුමක් ද?

දාස් කැපිටලය සහ බයිබලය, කියවන්නා වෙහෙසට පත්කරන, මොළයට වධ දෙන පොත් දෙකකි.

"මාක්ස්, දාස් කැපිටල් නම් පොතේ ලියා තිබෙන්නේ මොනවා ද? .... මට මුණගැසී ඇති කොමියුනිස්ට්වාදීන් ගේ සංඛ්‍යාව සිය ගණනකි. ඔවුන් කිසිවකු එය කියවා නැත. ක්‍රිස්තියානි නිවෙසක බයිබලය ඇතිවා සේම, සෑම කොමියුනිස්ට්වාදියකු ගේ නිවෙසක ම දාස් කැපිටලය තිබේ. දාස් කැපිටලය කොමියුනිස්ට් බයිබලය යි. ඔවුන් ක්‍රිස්තියානීන් පරිද්දෙන් ම ත්‍රිත්වයක් ද සාදාගෙන ඇත. මාක්ස්, එංගල්ස් හා ලෙනින් ත්‍රිත්වය යි. මම දාස් කැපිටලය මුල සිට අග දක්වා ම කියවූයෙමි. පොත අත්දැකීම්වලින් තොර වචනවලින් පුරවා තිබේ. එහි වෙනත් පොත්වලින් උපුටාගත් කොටස් එමට ය. එහෙත් කිසි ම නිර්ව්‍යාජ අත්දැකීමක් නැත. මාක්ස් පොත්ගුල්ලෙකි. ඔහු සිහින ලෝකයේ මිස සමාජයේ ජීවත්වූ පුද්ගලයෙක් නොවී ය. ඔහුට වුවමනා කළේ න්‍යායක් ඔප්පුකර පෙන්වීමට ය. ඒ සඳහා ඔහු, වැඩි වැඩියෙන් සිගරට් ඉරුවේ ය. බ්‍රිතාන්‍ය පුස්තකාලයේ කල් ගත කළේ ය."[32]

දාස් කැපිටලය සිහින ලෝකයේ ජීවත් වූ උගතකු ගේ ක්‍රියාවකි. බයිබලය මිථ්‍යා දෙවියකු ඇදහූ පුද්ගලයන් පිරිසක් විසින් ලියන ලද්දකි. බුද්ධිමත් දරුවකු වුව නොපිළිගන්නා කථා, සිදුවීම් හා තොරතුරුවලින් බයිබලය පුරවා තිබේ. එය සකස්

කිරීම පිණිස ශත වර්ෂ දහ සයක (16) කාලයක් මුළුල්ලේ, විවිධ පසුබිම්වලින් යුතු පුද්ගලයන් හතළිස් හය දෙනෙක් (46) සහභාගි වී ඇත්තා හ. බයිබල් ප්‍රචාරකයන් බයිබලයෙන් උපුටා පෙන්වන ලෙසට, 'මිනිසුන් එහි ලේඛකයන් වුව ද දෙවියන් වහන්සේ ඔවුන් ගේ සිතුවිලි මෙහෙයවූ සේක. බයිබලය සැබැවින් ම දෙවියන් ගේ වචනය වේ.'[33]

ඔවුන් තර්ක කරන පරිදි මනුෂ්‍යයන් ගේ සිත් මෙහෙයවනු ලබන්නේ දෙවියන් විසින් නම්, කතෝලිකයන් වූ ජර්මනියේ **හිට්ලර්**, ස්පාඤ්ඤයේ **ෆ්‍රැන්කෝ**, ඉතාලියේ **මුසෝලිනි** ආදීන් කළ අපරාධවලට ඔවුන් වගකිය යුතු නොවේ. දෙවන ලෝක යුද්ධ සමයේ දී හිට්ලර්ට ජර්මනියේ ක්‍රිස්තියානි බිෂොප්වරයා ආශීර්වාද කළේ ය. ජර්මන් පක්ෂය ගත් ඉතාලි හමුදාවට පාප් ආශීර්වාද කළේ ය.[34] මහමදිකයෝ ද, මිනිසා ගේ සියලු සිතුවිලි පාලනය කරන්නේ දෙවියන් බව අදහති. මහමදික ඇදහීම පිළිගන්නේ නම් මිනිසුන් වැරදි කරන්නේ ද දෙවියන් ගේ කැමැත්ත පරිදි ය. ලෙබ්බේවරු 'දෙවියන් ගේ කැමැත්ත ඉටු කරන' මනුෂ්‍යයන් වරදකරුවන් කොට දඬුවම් කරති.

දෙවියකු බයිබල් ලේඛකයන් ගේ සිත් මෙහෙයවූ බව කීම මුසාවකි. බයිබල් ලේඛකයන් ගේ සිත් පිරික්සා බැලූ මනෝවිද්‍යාඥයකු නැත. බයිබලය අර්ථකථනය කළ තාර්කිකයෙක් නම් සිටියේ ය. ඔහු, කාල් මාක්ස් ය. දුම්බීමට ඇබ්බැහි වී සිටි මාක්ස් ආගම අබිං ය යි කීවේ ය. අබිං කෑමේත් දුම්බීමේත් අරමුණ තාවකාලික ආස්වාදයක් ලබාගැනීම යි. තාවකාලික සුවය ගෙන දෙන අබිං, සෙමින් සෙමින් භාවිත කරන පුද්ගලයා විනාශ කර දමයි. දේව වන්දනාවෙන් මනුෂ්‍යයා තාවකාලික සුවයක් ලබයි. තාවකාලික සුවය ලබාගන්නා මනුෂ්‍යයා ගේ මනස ආබාධිත වෙයි. ඓතිහාසික යුදෙව් හා රෝම කෘෘරත්වයේ ජාන තැන්පත් ව ඇති මාක්ස්වාදය මනස විකෘති කරයි. පුද්ගලයා අධර්මිෂ්ටයකු කරයි.

පුද්ගලයන් ගණනාවක් එක්වී කළ නිර්මාණයක් වීමත්, රෝම පූජකයන්ට අවශ්‍ය පරිදි සංශෝධනය කරමින් සකසනු ලැබීමත් හේතු කොටගෙන බයිබලය අවුල් ජාලාවක් වී තිබේ.

යේසුස් වහන්සේ ගේ ප්‍රධාන ගෝලයන් එක ම සිද්ධිය පිළිබඳ ව දෙන සාක්ෂි පවා පරස්පර විරෝධී ය. ඇතැම් විට ඔවුහු, ඇසින් දුටු සාක්ෂිකරුවන් බව පවසමින් බොරු සාක්ෂි කියති. යේසුස් වහන්සේට ලී කඳේ ඇණ ගසන ස්ථානයේ මායිමක වත් නොසිටි එතුමා ගේ ගෝලයන් කිහිප දෙනා ඇණ ගැසීම ඇසින් දුටුවන් ලෙස එකිනෙකට පරස්පර අයුරින් සිද්ධිය විස්තර කිරීම එක් උදාහරණයකි.

පරණ හා අලුත් තෙස්තමේන්තු (ගිවිසුම) වශයෙන් කොටස් දෙකකින් යුතු සම්පූර්ණ බයිබලය නම් සංග්‍රහයට අයිති වෙළුම් හැට හයකි (66). ඉන් තිස් නවයක් (39) පරණ තෙස්තමේන්තුවට අයත් ය.[35] පරණ තෙස්තමේන්තුව යුදෙව් බයිබලය යනුවෙන් ද හැඳින්වේ.

පරණ තෙස්තමේන්තුව හෙවත් යුදෙව් බයිබලය

පරණ තෙස්තමේන්තුවේ විස්තර කෙරෙන පරිදි, යුදෙව් ජනයා, ඊජිප්තුවේ වහලුන් වශයෙන් ජීවත් වූ හ. ඔවුන් වෙනුවෙන් ගැලවුම්කරුවෙක් පහළ වූයේ ය. හේ මෝසස් නම් විය. මෝසස් ඊජිප්තුවේ සිට මිදියන් දේශයට පලා ගියේ ය. යෙත්‍රෝ නම් පූසාරියා ළඟ නැවතුණු ඔහු, යෙත්‍රෝ ගේ දියණිය ශිප්පෝරා විවාහ කරගත්තේ ය.[36] යෙත්‍රෝ යුදෙව්වකු නොව, ආරාබියෙකි. ඔහු යොහෝවා (යාවේ) වෙනුවෙන් පූජා පැවැත්වූ පූසාරියෙක් වූයේ ය. යොහෝවා දෙවියකු නොවේ; පුළුටු යකෙකි. මෝසස් ද යුදෙව්වෙක් නොවූයේ ය. ඔහු හෙලියෝපොලිස්හි පූජකාරාමයේ පුහුණුව ලැබූ, ආටන් ඇදහූ ඊජිප්තියානු පූසාරියෙක් විය. ආටන් ඇදහීම නීතිගත කරන ලද්දේ, ක්‍රි. පූ. 1375 - 1358 ඊජිප්තුවේ සිටි සිව් වැනි ආමෙන් හොටපේ හෙවත් ආක්නේටන් රජු විසිනි. ආටන් හඳුන්වනු ලැබ ඇත්තේ සූර්ය ප්‍රභා මණ්ඩලයේ ඇති ජීව ශක්තිය ලෙස ය. හෙලියෝපොලිස්, හිරු වන්දනාවට ඉතා ම ප්‍රසිද්ධ ස්ථානය යි. යෙත්‍රෝ ගේ දියණිය වෙනුවෙන් ආටන් දෙවියා ඉවතලූ මෝසස් යොහෝවා අදහන්නට පටන්ගත්තේ ය.

සමහර පුද්ගලයෝ ලිංගික තෘප්තිය ලබාගැනීම උදෙසා පරහට පීඩා කරන්නෝ ය. තමා පීඩා ලබාගැනීමෙන් ප්‍රීතිය ලබන්නෝ ද සිටිති. බටහිර යුරෝපයේ සමහර රටවල පිරිමින්ට පීඩා ලබාගත හැකි නීත්‍යානුකුල වෛශ්‍යා නිවාස තිබේ. සල්ලාල පුරුෂයන් විශාල මිල ගණන් ගෙවා මේවාට රිංගන්නේ ස්ත්‍රීන් ගෙන් පීඩා ලබාගැනීම නම් කම්සුවය ලැබීමේ පරමාර්ථයෙනි. සම්වලින් මැසූ සුවිශේෂ ඇඳුම්වලින් සැරසුණු ස්ත්‍රීන්, තමන් වෙත පැමිණෙන පුරුෂයන් සතුටට පත්කරන්නේ, දම්වැලින් බැඳ කස පහර දී ගුටි බැට ඇණ ඔවුන්ට විවිධාකාර කාම හිංසා කරලීමෙනි.

මනෝවිද්‍යානුකුල ව ස්ත්‍රියක් වෙනුවෙන් තම පාරම්පරික ආගම ඉවතලෑම පුරුෂයකු ලබන ස්ථිර මානසික පීඩාවකි. එවැනි පීඩාවක් ලැබීමේ ආශාව විකෘති කාමාශාව යි. මෝසස් ද යෙත්‍රෝ ගේ දියණිය වෙනුවෙන් ආටත් ඉවත දා යොහෝවා වැළඳගත්තේ ය. හේ, යෙත්‍රෝ පූසාරියාටත් අන්ත යොහෝවා බැතිමතෙක් වූයේ ය. දිනක් මාමණ්ඩිය ගේ බැටලු පට්ටියට තණ කැවීම පිණිස හෝරෙබ් නම් කන්ද මුදුණට ගිය ඔහුට යොහෝවා මුණගැසුණ බව පැවසේ.[37]

යොහෝවා ගේ වර්ණය, හැඩරුව, ඔහු සිටියේ කුමන ජාතික ඇඳුමකින් ද, වස්ත්‍ර රහිත ව ද, හිස්වැස්මක් වී ද තමාට කන්දේ දී මුණගැසුණේ යොහෝවා බව නිගමනය කරගත්තේ කෙසේ ද ආදී කිසිවක් හෙළිදරව් නොකරන මෝසස් 'යුදෙව්වන්ට කිරි පැනි ඉතිරෙන රම්‍ය වූ දේශයක් ලබාදෙමි'[38] යි යොහෝවා පොරොන්දු වූ බව පමණක් පවසා තිබේ. මෝසස් ගේ ප්‍රකාශයෙන් හෙළිදරව් වන්නේ යොහෝවා හීබෲ හෝ ඊජිප්තියානු හෝ භාෂාවක් කථා කරන භූතයකු බව පමණි.

ආපසු නිවෙසට ගිය මෝසස්, 'මිසරයෙහි වෙසෙන සිය සොහොයුරන් ජීවත් වන්නේ ද යි සොයාබැලීම පිණිස එහි යමි' යි මාමණ්ඩියට බොරුවක් කියා බිරිය හා දරුවන් ද කොටළුවකු පිට නංවාගෙන ඊජිප්තුව බලා ගියේ ය.

සිය සොහොයුරා වූ ආරොන් ද එක් කරගත් මෝසස්, යොහෝවා ගේ කුටෝපායවලින් ඊජිප්තුවේ පාරාවෝ රජු බියගන්වා යුදෙව් ජනතාව සමඟ කිරි පැනි ඉතිරෙන දේශය බලා යන ගමන ඇරඹී ය. යොහෝවා ගේ ආරක්ෂාවත් මගපෙන්වීමත් මැද අවසානයේ දී ඔවුහු හතළිස් වසරකට පසු ඊශ්‍රායලය නම් 'කිරි පැනි ඉතිරෙන රම්‍ය වූ දේශයේ' ජනාවාස පිහිටුවූ හ.[39]

යොහෝවා මගපෙන්වද්දී පවා මෝසස් සහ පිරිසට ඊජිප්තුවේ සිට ඊශ්‍රායල් භූමියට යාමට හතළිස් අවුරුද්දක් ගත වූයේ මන්ද? අතරමග දී එක කණ්ඩායමක් මගහැරුණේ කෙසේ ද? මෝසස් ගමන් මගේ තෙල් නිධි සහිත සරු බිම් සියල්ල මගහැර කාන්තාර බිමක් වෙත පැමිණ 'රම්‍ය භූමිය මේ ය' යි කීවේ ඇයි? යන ප්‍රශ්නවලට පිළිතුරු සෙවීමේ දී වැදගත් කරුණු කිහිපයක් හෙළිදරව් වෙයි.

- ඊජිප්තුවේ සිටි යුදෙව් වහලුන් ගේ නිජබිම ඊශ්‍රායලය යි.
- ඊජිප්තුවෙන් පිට වූ පිරිසෙන් කණ්ඩායමක් පලස්තීනයට යාමට අකමැති ව ඔවුන් ගේ ඥාතීන් විසූ ආසියාව දෙසට ගමන් කර ඇත.
- ඊශ්‍රායලයට ගිය මෝසස් ඇතුළු පිරිසට නැතිවූ රාජධානි ලබාගැනීමට දීර්ඝ යුද්ධයක් කරන්නට සිදු විය.

මේ කරුණු පිළිබඳ ව ඉදිරි පරිච්ඡේදවල දී විස්තර කෙරේ.

ඊශ්‍රායලයේ කටුක බවත් වෙනත් ගෝත්‍රිකයන් හා කරන්නට සිදු වූ කෙළවරක් නැති යුද්ධත් නිසා කෝපයට පත් සමහර යුදෙව්වෝ, 'ස්වාමීන් වහන්සේ දෙනවා යි කී කිරියෙන් පැනියෙන් උතුරන රට මේක ද'[40] යි යුදෙව් රාජධානිය ගොඩනැංවූ මෝසස් ගෙන් ප්‍රශ්න කරන්නට පටන් ගත් හ. කෞටිල්‍යාට* වඩා ශූරයකු වූ මෝසස් විවේචන වැඩි වන විට 'යොහෝවා හමුවීමට' යි පවසා සිනායි කන්දට නැග්ගේ ය. පෙරළා පැමිණි ඔහු යොහෝවා විසින් පැනවූ දස පනත නම් නීති සංග්‍රහය ඉදිරිපත් කළේ ය.

1. මා හැර වෙනත් ස්වාමිවරුන් සරණ නොයා යුතුයි.
2. අහසේ, පොළවේ, ජලයේ හෝ කිසි ම තැනක මට සමාන දෙයක් (ප්‍රතිමා සහ චිත්‍ර) නොසැදිය යුතු යි. එවැනි දේකට වන්දනා නොකළ යුතු යි. සේවනය නොකළ යුතු යි.
3. තුඹලා ගේ ස්වාමි වූ මාගේ නාමය බොරුවට ව්‍යවහාර

---

* මගධ රාජ්‍යය බිහිකළ අති දක්ෂ ආර්ථික විශේෂඥයෙකි.

නොකළ යුතු යි.

4. සබත් දිනය ශුද්ධ ලෙස පැවැත්වීමට අමතක නොකළ යුතු යි. එදිනට කිසිවකු කිසි ම වැඩක නොයෙදිය යුතු යි. මක්නිසා ද නුඹලා ගේ දෙවි ස්වාමීන් වහන්සේ අහසත් පොළවත් මුහුදත් එහි ඇති සියල්ලත් දින හයකින් සාදා හත් වැනි දවසේ නිවාඩු ගත් හ. ස්වාමීන් වහන්සේ සබත් දිනය නිවාඩු දිනයක් කොට ආශීර්වාද කොට ඇත.
5. ඔබ ගේ පියාටත් මවටත් ගෞරව කළ යුතු යි.
6. මිනී නොමැරිය යුතු යි.
7. කාම මිථ්‍යාචාරය නොකළ යුතු යි.
8. සොරකම් නොකළ යුතු යි.
9. අසල්වැසියාට විරුද්ධ ව බොරු සාක්කි නොකිය යුතු යි.
10. අසල්වැසියා ගේ නිවසට, බිරිඳට, වහලාට, වහලියට, ගවයාට හෝ ඔහු ගේ කිසි ම දේකට ආසා නොකළ යුතු යි.[41]

දේව පනත් පිළිපැදිය යුතු බවත් පිළිපදින යුදෙව්වන් ලෝකයේ ශ්‍රේෂ්ඨතම මනුෂ්‍ය කොට්ඨාශය කිරීමට තමා විසින් නියෝජිතයකු එවනු ලබන බවත් පිළිනොපදින යුදෙව්වන්ට දඬුවම් දෙන බවත් යොහෝවා පැවසූ බව මෝසස් කියා තිබේ.

දස පනත අනිවාර්යයෙන් ම යුදෙව් ජනතාව ආරක්ෂා කළ යුතු හා පිළිපැදිය යුතු ආගමික නීති සංග්‍රහයකි. නීති සංග්‍රහය ක්‍රියාත්මක කරවීම සඳහා පූජක පන්තියක් ඇති කළ මෝසස් නීති කඩන්නවුන්ට දඬුවම් දීමේ විධායක බලය රජතුමාට පැවරුවේ ය.

මෝසස් රාජත්වය හා පූජායතනය ස්ථාවර කිරීම සඳහා ද නීති ව්‍යවස්ථා සහ ආර්ථික මාර්ග හැමෙ'කක් ම පිළියෙල කළේ ය. සියලු කටයුතු අවසන් කළ පසු නැතිවුණු කණ්ඩායම සොයා ගැනීම සඳහා රටින් පිට විය. නැතිවුණ කණ්ඩායම කාශ්මීරයේ පදිංචි ව සිටින බව මෝසස්ට ආරංචි වූ බවට සැක නැත. ඔහු ඔවුන් වෙත ගොස් කාශ්මීරයේ නැවතුණි. කාශ්මීරයේ

මෝසස් ගේ සොහොන ඇති බව ඊශ්‍රායල් ඉතිහාසය ගවේෂණ කරන පීඩා හස්නේන් කියයි.[42]

යුදෙව් ආගමේ පළමු රබීවරයා* වූ මෝසස්, සිය දේශපාලන ව්‍යාපාරය මෙහෙයවූයේ යොහෝවා නමැති භූතයා ගේ නාමයෙනි. යොහෝවා යුදෙව්වන්ට පක්ෂපාත අයෙකි. යුද්ධයේ දී යුදෙව් සේනා මෙහෙයවූ ඔහු, නපුරු භූතයෙකි; බාල බිළිඳුන් මරා දමන නිසා 'බාලගිරියාට'** වඩා දරුණු වූයේ ය. මංගල්‍යයක් පැවැත්වීම පිණිස යුදෙව්වන් වනාන්තරයට කැඳවාගෙන යාමට යොහෝවා අණ කළ බව මෝසස් පාරාවෝ රජුට කීවේ ය. යොහෝවා නොඇදහූ පාරාවෝ ඊට අකමැති ව 'මට අණ දෙන යොහෝවා කවරෙක් දැ' යි විරෝධතාව ප්‍රකාශ කළ විට යොහෝවා පුරාණ මිසරවරුන්ට පීඩා දහයක් ගෙනාවේ ය. අවසන් පීඩාව මිසරයේ සියලු ම කුළුඳුල් දරුවන් මරණයට පත් කළ අතර මීට උඩඟු පාරාවෝ ගේ පුත්‍රයා ද ඇතුළත් විය.[43] බාල බිළිඳුන් ඝාතනය කරන්නා බාලගිරියෙකි. පාරාවන් සමඟ කෝප වී ඊජිප්තුවේ උපන් කුළුඳුල් දරුවන් මරා දැමීම කුමන නීතියක් ද?

යොහෝවා යථා ස්වරූපයෙන් මුණගැසී ඇති එක ම පුද්ගලයා මෝසස් පමණි. ඔහු ආබ්‍රහම්ට ද ඊසොප්ට ද යාකොබ්ට ද පෙනී ඇති නමුදු සැබෑ වේශයෙන් හෝ සැබෑ නමින් හෝ නොවේ. යොහෝවා වෙස් මාරු කරගෙන පැමිණ බොරු නම් කියා ඔවුන් රවටා ඇත. මේ කථා සැක නොකර විශ්වාස කරන්නෑ යි පරණ ගිවිසුම තරයේ කියා සිටී. ක්‍රිස්තියානි පාදිලිවරුන් පවසන පරිදි 'විශ්වාසවන්තයෝ භාග්‍යවන්තයන් වෙති'. මෙය අතිශයින් ම අවිද්‍යාත්මක, ආඥාන ප්‍රකාශයකි. යමකු දොඩවන අවිද්‍යාත්මක දෙයක් කිසිදු ගවේෂණයකින් තොර ව විශ්වාස කරන්නා අඥානයෙකි. මෝසස් සැකකටයුතු පුද්ගලයකු බව සිතුවහොත් යුදෙව් ආගමක් නැත. මැවුම්කරුවා බලි රූපයක් වෙයි. පරණ ගිවිසුම මිථ්‍යා කතාවක් බවට පත් වෙයි.

යුදෙව්වන් ගේ ගැලවුම්කරුවා යුදෙව්වන් වෙත එවන බව

* යුදෙව් ආගමේ පූජකයන් හැඳින්වුණු නම.

** දරුවන් බියවද්දා මරන බවට සිංහලයන් අතර ප්‍රකට භූතයෙකි.

යොහෝවා තමාට කී බව මෝසස් පැවසී ය. බයිබලයේ අලුත් ගිවිසුමෙන් විස්තර කෙරෙන්නේ මෝසස් කී යොහෝවා විසින් එවන ලද ගැලවුම්කරුවා පිළිබඳ ව ය. ඔහු යොහෝවා ගේ දූතයා වූයේ ය; පුත්‍රයා වූයේ ය. එතුමා වනාහි යේසුස් වහන්සේ යි. යුදෙව්වෝ යේසු පිළිබඳ කතාව නො පිළිගනිති. කිසි ම යුදෙව් මූලාශ්‍රයක යේසු නමැත්තකු ගැන සඳහන් නොවේ. ක්‍රිස්තු භක්තිකයෝ පමණක් යේසු යොහෝවා ගේ පුත්‍රයා ලෙස පිළිගනිති.

අලුත් ගිවිසුම හෙවත් ක්‍රිස්තියානි බයිබලය

අලුත් ගිවිසුමේ විස්තර කෙරෙන අන්දමට ඊශ්‍රායලය රෝමයට යටත් ව තිබුණි. ටිබැරියස් සීසර් නම් රෝම අධිරාජයා ගේ ආඥාවක් පරිදි, ඊශ්‍රායලයට අයත් යුදා ප්‍රදේශයේ ආණ්ඩුකාරයා එහි වාසීන් ගේ සංගණනයක් පැවැත්වූයෙන් ඊට පෙනී සිටීම පිණිස බෙත්ලෙහෙමට පැමිණි යෝසප් හා මරියා යුවළට රාත්‍රියේ නවාතැන් ගැනීමට ස්ථානයක් නොමැති විය. යෙරුසලමේ තානායම් ආගන්තුකයන් ගෙන් පිරී තිබුණෙන් ඔවුනට ගවමඩුවක නවාතැන් ගැනීමට සිදු විය. ගැබ්බර ව සිටි මරියාට ප්‍රසව වේදනා හටගෙන ගවමඩුවේ ම දරුවා ලැබුණි.

බයිබලයේ විස්තර කෙරෙන අන්දමට දරුවා ගේ පියා යෝසප් බව කීව ද, ඔහු යෝසප් ගේ දරුවෙක් නොවී ය. ඊට එක ම සාක්ෂිය මරියා කන්‍යාවක් වීම යි. කන්‍යා මරියා යොහෝවා විසින් ගැබ් ගන්වනු ලබන බවත්, උපදින දරුවාට යේසු යන නම තබන ලෙසත් ගාබ්රියල් නමැති යොහෝවා ගේ දූතයා මරියාට කීයේ ය.[44] දූතයා යොහෝවා විසින් එවන ලද්දෙකි. නාසරත්හි විසූ යෝසප් නමැති දුප්පත් වඩුවෙක් යොහෝවා වෙනුවෙන් දරුවා ගේ පීතෘත්වය භාරගත්තේ ය. මරියා යේසුට පසු තවත් පිරිමි දරුවන් සතර දෙනකු සහ ගැහැණු දරුවන් (කීදෙනකු ද යන්න නොදැක්වේ.) ලැබූ බව ශුභාරංචි ග්‍රන්ථ පවසයි.[45]

යොහෝවා ගේ දස පනත අනුව කාම මිථ්‍යාචාරය වරදකි. දස පනත නීතිය කරගත් ඊශ්‍රායලයේ එම නීතිය කඩකරමින් වරදේ යෙදෙන්නන්, ස්ත්‍රී පුරුෂ භේදයෙන් තොර ව ගල්ගසා හෝ හිසගසා දමා හෝ මරාදැමීමේ දඬුවම් ක්‍රමයක් ද පැවතිණි. අවිවාහක කාන්තාවක් ගැබ් ගතහොත් දස පනත අනුව ඇය කාමයේ වරදවා හැසිරුණු තැනැත්තියකි. මරියා කන්‍යාවක් වූවා ය; දහ හතර හැවිරිදි බාල වයස්කාරියක් වූවා ය. ඇය ගැබ්ගන්වන ලද්දේ යොහෝවා විසින් එවන ලද දූතයකු විසිනි.[46]

දසපනත යටතේ කාමයේ වරදවා නොහැසිරිය යුතු ය යි නීතියක් ඉදිරිපත් කළ යොහෝවා, එම නීතිය සාහසික ලෙස උල්ලංඝණය කරයි. අවිවාහක බාල වයස්කාර දැරියක් ගැබ් ගැන්වීම නීතිය උල්ලංඝණය කිරීමක් මෙන් ම සදාචාර විරෝධී ක්‍රියාවක් ද වන්නේ ය.

ඉන්දියානු ජනකතාවක් මෙසේ යි. පොහොසත් බ්‍රාහ්මණ පවුලක මවක්, තම තරුණ දියණිය සමඟ වෛද්‍යවරයා හමුවීමට ආවා ය. තරුණිය පරීක්ෂා කර බැලූ වෛද්‍යවරයා, ඇය තුන් මස් ගැබිණියක බව මවට දන්වූ විට මව වෛද්‍යවරයා සමඟ වාද කරන්නට පටන්ගත්තා ය.

"අපේ හත්මුතු පරම්පරාවෙ ළමයෙක් එහෙම නොහොබිනා වැඩක් කරල නෑ. දොස්තර මහත්තයට වැරදිලා" යි කියමින් ඇය හඬන්නට වන්නා ය.

ඒ සැන්දෑ කාලය විය. වහා ම කාමරයේ කවුළුව වෙත ගිය වෛද්‍යවරයා හිස කවුළුවෙන් පිටතට දමා අහස බලන්නට විය. ටික වේලාවක් වෛද්‍යවරයා දෙස බලා සිටි මව, 'මොනවද ඔබ බලන්නෙ' යි ඔහු ගෙන් ඇසුවා ය.

"මම මීට ඉස්සර මෙහෙම සිද්ධියක් ගැන අහල තියෙනව. එදා අහසෙ අමුතු තරුවක් පායල තිබුණලු. අදත් තරුව තියෙනව ද කියල යි මේ බලන්නෙ" වෛද්‍යවරයා පිළිතුරු දුන්නේ ය.

පැරණි ඊජිප්තු හා බැබිලෝනියානු ජනශ්‍රැතිවල කන්‍යා දරු උපත් පිළිබඳ ව සඳහන් වේ.[47] දෙවිවරුන් බිසෝවරුන්ට දුන් දරුවන් ගැන ද කියවේ. දෙවිවරුන් ගේ මාර්ගයෙන් දරුවන් නැති කාන්තාවන්ට දරුවන් ලබාදුන් පූසාරීන් ලංකාවේ ද සිටි බවට පොළොන්නරුව නටබුන් නගරයේ ශිව දේවාල සාක්ෂි දරයි. දරුවන් නැති වංශවත් කාන්තාවන් කළ යුතු වූයේ ලිංග පූජා පවත්වමින් ශිව දේවාලයේ දින කිහිපයක් නවාතැන් ගෙන සිටීම

යි. එවිට පූසාරීහු 'දෙවියන් ලවා' ඔවුන් ගැබ්ගන්වති. සැළලිහිණි සන්දේශ කාව්‍යයේ උලකුඩය නම් රජ බිසවට දරුවකු ලබා දෙන මෙන් දෙවියන් ගෙන් ඉල්ලීමක් කෙරේ.[48] බෞද්ධ සාහිත්‍යයට අනුව දෙවිවරු වෙන ම සත්ව කොට්ඨාශයක් වෙති. එම නිසා දෙවිවරුන් විසින් සදනු ලබන දරුවන් මනුෂ්‍ය දරුවන් විය නොහැකි ය. කන්‍යාවන් දරුවන් ලබන්නේ ද ජනශ්‍රැතියේ මිස සැබෑ ලෝකයේ නො වේ.

බයිබලයේ සඳහන් අන්දමට යේසු උපන් දින රාත්‍රියේ බටහිර අහසේ සුවිශේෂ තරුවක් පායා තිබුණේ ය. 'ශාස්ත්‍රවන්තයන් තිදෙනෙක්' පෙරදිග සිට බෙත්ලෙහෙමට පැමිණිය හ. බෙත්ලෙහෙමේ උපන් යුදෙව්වන් ගේ රජ කුමරා සෙවූ ඔවුහු, යේසු බිළිඳා බැහැදැක එතුමන්ට රත්රන්, සුවඳලාටු, කට්ටකුමන්ජල් හා වෙනත් තෑගි පිරිනැමූ හ.[49] එස්. ජී. පෙරේරා උන්නාන්සේ කියන්නේ එම පඬිවරු තිදෙනා ගෙන් එක් අයකු ලංකාවේ යාපනයේ රජකම් කළ ගස්පාර් පෙරිය පෙරුමාල් රජු බව යි.[50] එස්. ජී. පෙරේරා යනු ලංකාවේ අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් පාසල් සඳහා නිර්දේශ කරන ලද ඉතිහාස පොත් සම්පාදනය කළ ප්‍රකට කතෝලික ඉතිහාසඥයෙකි. ලංකාවේ ඇතැම් මහාචාර්යවරු පවා නිබන්ධන සඳහා පෙරේරා උන්නාන්සේ ගේ කෙප්ප උපුටා දක්වති.

බයිබලය අනුව යේසු ළමා කාලයේ සිට ම ආගමික හැඟීම් ඇති ව කටයුතු කළ බුද්ධිමත් ළමයෙකි. වරක් යෝසප්, මරියා සහ කුඩා යේසු යෙරුසලමේ දේවස්ථානයේ පාස්කු මංගල්‍යයට ගියෝ ය. සෙනඟ අතර මාපියන්ට කුඩා යේසු මගහැරුණි. හැම තැන ම සොයා තම දරුවා සොයාගැනීමට නොහැකි වූ තැන දෙමාපියෝ දේව මාළිගාවට ඇතුළු වූ හ. එහි දී දුටු දර්ශනයෙන් ඔවුහු බිරාන්ත වූ හ. යේසු, රබීවරුන් අතරේ හිඳගෙන ඔවුන් ගේ ආගමික කතාවලට කන්දෙමින්, ඔවුන් ගෙන් ප්‍රශ්න අසමින් සිටියේ ය.

"ඇයි ඔබ අපට නොකියා දේව මාළිගාවට ආවේ?" මරියා ඇසුවා ය.

"මගේ පියා ගේ නිවෙසට එන්ඩ කාගෙන් වත් අවසර ගන්ඩ වුවමනා ද?" යේසු පිළිතුරු දුන්නේ ය.[51]

වයස දොළහෙන් පසු ව තිස් හැවිරිදි විය තෙක් යේසු ගේ තරුණ විය පිළිබඳ කිසි ම සඳහනක් බයිබලයේ නැත්තේ ය. මරියා ගැබ් ගැන්වීම බඳු අද්භූත තොරතුරු සොයාගත් අපොස්තල්වරුන්ට යේසු අධ්‍යාපනය ලැබුවේ කොහේ ද, කාගෙන් ද, දහ අට වසරක කාලයක් එතුමා කොහි සිටියේ ද ආදී තොරතුරු සොයා ගැනීමට නොහැකි වී තිබේ.[52] ඔවුන් නැවත යේසු චරිතය ආරම්භ කරන්නේ යේසු තිස් හැවිරිදි වියේ දී යොහාන් නමැති දේශකයා හමුවීමට ගිය සිද්ධියකිනි.[53] යොහාන් දේශකයා ගෙන් බෞතිස්මය ලබා අසල වනාන්තරයට ගොස් දින හතළිහක් උපවාස කළ එතුමා ධර්ම දේශකයකු වශයෙන් කටයුතු කරන්ට විය.[54]

මෙය සිද්ධාර්ථ ගෞතම චරිතයේ සිදුවීමක් පටළැවී බයිබලයට ඒමක් බව විචාරකයෝ පවසති.[55] සත් සතිය බෞද්ධ සාහිත්‍යයේ චිරප්‍රකට සිද්ධියකි. සත් සතිය විමසීමේ දී එම කාලය තුළ බුදුන් වහන්සේ තමන් වහන්සේ විසින් පසක් කරගන්නා ලද ධර්මය මෙනෙහි කරමින් ද අනාගත වැඩපිළිවෙල සැලසුම් කරමින් ද ගතකර ඇති බව පෙනේ. යේසුස් වහන්සේ ද තම ශාස්තෘන් වහන්සේ අනුකරණය කළා විය යුතු ය. සත් සතියට දින හතළිස් නවයකි. යේසුස් වහන්සේ ගත කර ඇත්තේ දින හතළිහකි.

ඉන් පසු සිද්ධාර්ථ කුමාරයා කී බව පැවසෙන උදාන වාක්‍යය* අර්ථයෙන් "නුඹලා බලාපොරොත්තුවෙන් සිටි දෙවියන් වහන්සේ ගේ පුත්‍රයා මම වෙමි. නුඹලා ගේ ගැලවුම්කරුවා මම වෙමි" යි කී එතුමා, මහජනයාට ධර්මානුකූල ව ජීවත්වීමේ යහපත්කම සහ අධර්මිෂ්ට ව ජීවත්වීමේ විපාක කියාදෙමින් ගම් දනව්, නගර ඔස්සේ චාරිකා කරන්නට වූයේ ය. යුදෙව් ජනතාව අධ්‍යාත්මික වශයෙන් පිරිහී සිටීම පිළිබඳ ව කම්පා වූ එතුමා ඊට වගකියයුත්තන් සේ සලකා රබීවරුන්ව නිර්දය ලෙස විවේචනය කළේ ය. ඉන් නොනවතුණු එතුමා, වරක් යෙරුසලමේ ප්‍රධාන දේව මාළිගාවට ගොස්, 'සියලු දෙනාට ම යාඥා මන්දිරයක් විය යුතු මෙම ස්ථානය වෙළෙඳාම් පොළක් කර නොගතිල්ලා' යි

---

* මම ලෝකයට අග්‍ර වෙමි, ජ්‍යෙෂ්ඨ වෙමි, ශ්‍රේෂ්ඨ වෙමි. මින් මතු මගේ ඉපදීමක් නැත.

කියමින් මාළිගාව තුළ වූ, වෙළෙන්දන් ගේ බඩු පිරි මේස පෙරළමින් කසයක් ගෙන වෙළෙඳුන්ට තළමින් දේවස්ථානය තුළ විශාල කලබැගෑනියක් කළේ ය.[56]

යේසුස් වහන්සේ රබීවරයෙක් නොවේ. රබීවරයකු හෝ දේව මාලිගාවේ සේවකයකු හෝ වුව මාලිගාව තුළ එබඳු කලබලයක් කිරීම නීති විරෝධී ක්‍රියාවකි. ඩේවිඩ් යෙලොප් David Yellop නමැති ගවේශකයා, 'දෙවියන් ගේ නාමයෙන්' මැයෙන් වටිනා ග්‍රන්ථයක් සම්පාදනය කළේ ය.

"වර්තමාන පෝලන්ත පාප්ට පෙර විසූ ජෝන් පෝල් පාප් වතිකානු බැංකුවට 'හෙරොයින් මුදල්' ඩොලර් කෝටි ගණන් ලැබෙන්නේ ය' යන චෝදනාව පිළිබඳ ව පරීක්ෂණයක් පැවැත්වීමට අපේක්ෂා කළේ ය. උපත් පාලනයට විරුද්ධ ව දේශනා කරන වතිකානුව, හොර රහසේ පවත්වාගෙන යන උපත් පාලන පෙති නිපදවන කර්මාන්ත ශාලාවක් ඇතැ යි පිළිගත් ඔහු, එහි නිපදවෙන කතෝලික පෙත්තක් පිළිබඳ ව හෙළිදරව් කළේ ය. ඉතාලියේ ආච් බිෂොප්වරු, බිෂොප්වරු හා කාදිනල්වරු රහසේ සම්බන්ධතා පවත්වන මැසොනික් ලොජස් (Masonic Lodges) නම් රහස් දුරාචාර සමාගම් ගැන සෙවීමට තමා අදහස් කරන බව ඔහු කීවේ ය. ඒ කිසිවක් කිරීමට පෙර කිසිදු රෝගයක් නොතිබූ එතුමා නිදි ඇඳේ ම මිය ගොස් සිටියේ ය. එතුමා ගේ පෞද්ගලික ලියවිලි හා දිනපොත අතුරුදහන් ව තිබිණි. එතුමා ගේ අතෙහි කොළ කිහිපයක් තිබුණු බවත්, මියෙන්නට පෙර අන්තිම කැමති පත්‍රයක් ලිවීමට එතුමන් උත්සාහ කර තිබුණු බවත් වතිකානු සේවකයින් පවසා ඇත. පාප් ගේ වෛද්‍යවරයාට මළසිරුරවත් පරීක්ෂා කිරීමට ඉඩ නොදී, මරණ පරීක්ෂණයක් නො පැවැත්වා ම මිනිය එම්බාම් කරන ලදි. එම නිසා පාප් මියගියේ කෙසේ ද යන්න කිසිවෙකුටත් සොයා ගත නොහැකි විය. මරණ සහතිකයක් නිකුත් නොකෙරුණෙන් අදටත් නීත්‍යනුකූල ව එතුමන් ජීවත් වෙයි."[57]

ඩේවිඩ් යෙලොප් රහස් පරීක්ෂකයකු පරිද්දෙන් රහස් හෙළිදරව් කරමින් පාප් ගේ මරණය ස්වභාවික එකක් නොවන බව පෙන්වයි. කතෝලික සභාව මෙවැනි වැරදි කෙතරම් කළත් වතිකානු දේවස්ථානය තුළ කලබල ඇති කිරීමට අයිතිය ඇත්තේ කාට ද?

යේසුස් වහන්සේ "මම ද පියාණන් වහන්සේ ද එක ම තැනැත්තෙකි" යි කීවේ ය.[58]

වරක් කොළඹ කෞතුකාගාරයට රිංගූ පුද්ගලයෙක්, සිංහාසනයේ වාඩිවී ශ්‍රී වික්‍රම රාජසිංහ රජතුමා ගේ ඔටුන්න පැළඳගෙන, 'මම ලංකාවේ රජතුමා' යි කීවේ ය. කිසිවෙක්, ඔහු රජතුමා ය යි පිළිනොගත් හ. තමන් බ්‍රිතාන්‍ය අගමැති වින්ස්ටන් චර්චිල් ය යි කියා ගන්නා පුද්ගලයකු තමාට හමුවූ බව චර්චිල් ඔහු ගේ ජීවිත කතාවේ සඳහන් කරයි. කලකට ඉහත විප්ටොප් නමින් ප්‍රසිද්ධ ව සිටි පුද්ගලයා තමා බෞද්ධයින් කියන දියසේන කුමාරයා බව ප්‍රසිද්ධියේ දිවුරා කියා සිටියේ ය. අංගොඩ මානසික රෝහලේ වෛද්‍යවරයෙක් උමතු රෝගියකු හා කතාවක යෙදුණේ ය.

"ඔබ කවුද?" රෝගියා වෛද්‍යවරයා ගෙන් ඇසුවේ ය.

"මම රෝහලේ දොස්තර" වෛද්‍යවරයා කීයේ ය.

එවිට රෝගියා හඬනගා සිනාසුණේ ය. "යාළුවා උඹට සනීප මදි. මමත් ඕක කියල තමයි මෙතෙන්ට ආවෙ," ඔහු කී ය.

යේසු මැවුම්කරු ගේ පුත්‍රයා නම් එය එතුමා විසින් ඔප්පු කළ යුතු වන්නේ ය. එකල ඊශ්‍රායලයේ සිටියේ එක ම එක මැවුම්කරුවකු පමණි. එම නිසා යේසු විසින් කළ යුතු ව තිබුණේ තමා එම මැවුම්කාරයා ගේ පුත්‍රයා බව ඔප්පු කිරීම පමණි. යේසු ලංකාවේ හෝ දඹදිව හෝ ඉපදුණේ නම් තමා "දෙවියන් ගේ පුත්‍රයා" බව ඔප්පු කිරීම දුෂ්කර ක්‍රියාවකි. ලංකාවේ වෙවාරන්න දෙවිවරු සිටිති. 'මනමාල දෙවියෙන්' නමින් ද දෙවියෙක් සිටියි. මොහු අනුරාධපුර ප්‍රදේශයේ වාසය කළ ග්‍රීකයෙකි. මීමකු පිට නැඟ වැව්බැම්වල ඇවිදින මනමාල දෙවියෝ නාන තොටවල් අසල සැඟවී බලා සිට ගැහැනුන්ට සහ තරුණියන්ට බැල්ම හෙළා ඔවුන් ලෙඩ කරති. එබැවින් රජරට සහ වන්නි ප්‍රදේශවල ස්ත්‍රීන් දියරෙද්ද මාරු කරන විට මනමාල දෙවියන් ගේ බැල්මෙන් මිදිය හැකි 'කෙමක්' සේ සලකා රෙද්දට කෙළ ගැසීමේ සිරිතක් පැවතුණි. මනමාල දෙවියන් ක්‍රිෂ්ණා ගේ අවතාරයක් ය යි හින්දු බැතිමතකුට අනුමාන කළ හැකි ය. දිය නාන්ට ගහට බසින ස්ත්‍රීන් දෙස සැඟවී බලා සිටීම සහ ඔවුන්

ගේ ඇළුම් සොරකම් කිරීම ක්‍රිෂ්ණ දෙවියන් ගේ හොඳ ම විනෝදාංශය යි. ඉන්පසු ඔහු නිරුවත් ස්ත්‍රීන් තම අන්තඃපුරයට ගෙන යයි.[59]

අලුත් ගිවිසුමේ සඳහන් යේසුස් වහන්සේ පිළිබඳ බොහෝ කතා සත්‍ය ඒවා නො වේ. යොහෝවා ලෝකය මැව්වේ යේසුස් වහන්සේ ගේ උත්පත්තියට අවුරුදු හාර දහසකට පෙර බව බයිබලය ස්ථිර ව ම කියයි. උත්පත්ති කතාවේ යේසුස් වහන්සේ දක්වා මනුෂ්‍ය පරම්පරා ගණන ද දක්වා තිබේ. මැතිව් පරම්පරා 41ක් පෙන්වයි.[60] ලූක් පරම්පරා 77ක් ඉදිරිපත් කරයි.[61] මොවුන් සඳහන් කරන පරම්පරා ගණන නිවැරදි නම් මානව විද්‍යාඥයන් හෙළිදරව් කරන **බලංගොඩ මානවයා**, **කිතුල්ගොඩ මානවයා** පිළිබඳ තොරතුරු සාවද්‍ය වන්නේ ය. ශුභාරංචිකරුවන් ඉපදීමට අවුරුදු දහස් ගණනකට පෙර ඉන්දියාවේ බමුණෝ මහා බ්‍රහ්මයා ලෝකය මැවූ බව කී හ. ඇමරිකාවේ ආදිවාසී ඉන්දියානුවෝ ලෝකය මැවූ හිරු දෙවියකු ගැන කී හ. මැවුම්කරුවන් රාශියක් සිටින බැවින් ආගමකට බැඳී නැති පුද්ගලයකුට ලෝකය මැවූ දෙවියා තෝරාගැනීම මහා ගැටලුවක් ව ඇත. සියල්ලෝ ම අපේ මැවුම්කරුවා නිවැරදි ය යි කියති.

පෘථිවිය විශ්වයේ පිහිටි කෝටි සංඛ්‍යාත සෞරග්‍රහ මණ්ඩල අතරින් එක් සෞරග්‍රහ මණ්ඩලයකට අයත් ග්‍රහ වස්තුවකි. අගක් මුලක් නොපෙනෙන විශ්වය වූ කලි, අතිශයින් ම විවිධ වූ නිබඳ ව නිරන්තර ව වෙනස් වන ක්‍රියා සන්තතියකි. පෘථිවියේත් එහි පිහිටි සියලු වස්තූන් ගේත් ස්වභාවය නිරන්තර වෙනස්වීම යි. **ක්‍රිස්තියානි දේවධර්ම ආචාර්යවරු දේවධර්ම විද්‍යාව නම් විෂය මඟින් එඬේර සමාජයක සිතුම් පැතුම් නවීන ලෝකයේ මනුෂ්‍යයන් වෙත පැවරීමට වෙහෙසෙති.**

මාක්ස් ගේ ඓතිහාසික භෞතිකවාදයට අනුව වැඩවසම් සමාජය එඬේර සමාජයට වඩා දියුණු අවස්ථාවකි. ධනවාදය වැඩවසම් සමාජයෙන් බිහිවූ, වැඩවසම් සමාජයට වඩා දියුණු අවස්ථාවකි. ලංකාවේ මාක්ස්වාදී පොතේගුරුවරු සිංහල රජවරුන්ට විරුද්ධ වන්නේ ඔවුන් වැඩවසම් යුගයේ පාලකයන් ලෙස සලකමිනි. ලංකාවේ වැඩවසම් යුගය නැති කළ බ්‍රිතාන්‍යයෝ ධනවාදය

හඳුන්වා දුන් හ. විකාශය හා පරිණාමය පිළිබඳ ව එපරිද්දෙන් තර්ක කරන ලංකාවේ මාක්ස්වාදී පොතේගුරුවරු ම එඬේර චින්තනයට අනුබල දෙමින් ක්‍රිස්තියානි හා මහමදික ව්‍යාපාරවලට අනුග්‍රහය දක්වන අවස්ථා නිතර ම ප්‍රදර්ශනය වේ. පන්සලකින් සොයාගන්නා ලදැ යි කියන බයිබලය මුද්‍රණය කිරීම සඳහා මහජන ආධාර පතන මහාචාර්යවරයා හොඳ ම නිදසුන යි. ඔහු කොමියුනිස්ට්වාදියෙකි. එහෙත් බයිබලය බෙදාහැරීම පිණිස වෙහෙසෙයි.

යොහෝවා, එඬේරුන් විසින් අදහන ලද දෙවියෙකි. වන්නි රටේ ගව සම්පතට අධිපති ගොපලු දෙවියන් නමින් ප්‍රකට දෙවියෙක් සිටියි. මෙබඳු මිථ්‍යා දෙවිවරු හැම රටක ම හැම සමාජයක ම වෙසෙති. ලංකාවේ ප්‍රසිද්ධ හා අප්‍රසිද්ධ දෙවිදේවතාවන් ගේ සංඛ්‍යාව සිය ගණනකි. ජනවහරේ එන අන්දමට **තිස් තුන් කෝටියක් දෙවිදේවතාවෝ** වෙසෙති. හොරුන්ට අධිපතිකම් කරන්නේ ඔවුන'තරින් කෙනකු වූ **හූනියම් දේවතාවා** යි. අතීතයේ හොරු, හොරකමේ යාමට පෙරාතුව හූනියම් දෙවියන්ට පහනක් දල්වා අවසර ගත් හ. **ගම්බාර** දෙවිවරු වන්නියේ රුස්ස ගස් විමාන කරගෙන විසුවෝ ය. සමහරු, බෙර හෝ උඩැක්කි හෝ පදයට 'මත්වී' දෙවිවරුන් ආවේශ කරගනිති. ඇඟ ගැස්සීම හා හිස කරකැවීම දෙවි දේවතාවියන් ආවේශවූවන් ගේ එක් ලක්ෂණයකි. අනතුරුව ආවේශ වූ ඇතැම්හු පේන කියති.

කපුවෝ, දෙවිවරුන් ගේ ආවතේවකරුවෝ වෙති. ආවතේවකරුවන් වුව ද, සිංහල කපුවන් දෙවිවරුන්ට වඩා බලවත් බව ඇමරිකාවේ ආගම් සංවිධානය (American Association of Religion) සොයාගෙන ඇත්තේ ය. සිංහල කපුමහත්වරුන් දෙවිවරුන්ට අඬගසා කැඳවා, ගැමියන් ගේ නැතිවූ ගවයන් සෙවීම පිණිස ඔවුන් පිටත්කර යවන අවස්ථා සංවිධානයේ පර්යේෂකයන් දැක තිබේ. අනාගතයේ යේසුස් වහන්සේ ද මෙබඳු කාර්යයන් සඳහා යෙදවීම සිංහල කපුවන්ට සුළු දෙයක් වනු ඇත. ඇතැම් දේවගැතිවරු යේසු බලයෙන් ලෙඩ සුව කරති; යකුන් පන්නති. සිංහල කපුවන් දේවගැතිවරුන් ගේ ශාස්ත්‍රය අල්ලා නොගනිති යි කාට නම් කිව හැකි ද?[62] ආගම් සංවිධානයේ ප්‍රකාශනය කියවීමේ දී අපට

සිහිවූයේ කලකට පෙර **ඒබ්‍රහම් ටී. කොවූර්** නමැති ක්‍රිස්තු භක්තිකයා ගේ නායකත්වයෙන් ලංකාවේ පිහිටුවා ගෙන තිබුණු **හේතුවාදී සංගමය** යි. හේතුවාදී සංගමය, පූසාරියන් සහ දේවගැතිවරුන් ඉවසමින්, සිංහල කපුවන් නැති කිරීමට වෙහෙස ගත් අන්දම බුද්ධිමතුන්ට රහසක් නො වේ. හේතුවාදී සඟරාවේ සඳහන් වූ ලෙසට පාතදූරාවාදය ගෝරනාඩුවකි.[63] හේතුවාදී සංගමයේ සමහර සාමාජිකයෝ, අරක්කු බොමින්, හරක් මස් ගිලිමින්, ගිනි පාගා, කටුවල එල්ලී කපුවන් 'පචයන්' කිරීමට ප්‍රසිද්ධියේ උත්සාහ දරූ හ.

ඇමරිකානු ආගමික සංවිධානයේ ප්‍රකාශනයකට අනුව, ලංකාවේ ථෙරවාදී බුද්ධාගම දෙවියන් හැල්ලු කරන දහමකි. එහි භික්ෂූන් මහායානික ආභිධර්මිකයන් මෙන් කාල්පනික දර්ශන ඉදිරිපත් කර නැත. පැරණි බුද්ධ වචනය රකිනු මිස නව බුද්ධ වචන නිර්මාණය කිරීමට උත්සාහ දරා නැත. සිංහල බෞද්ධ සම්ප්‍රදායයෙහි හුදෙක් ලෞකික වූ දෙවිවරු, ආගමික වශයෙන් ගත් කල නිරර්ථක දෙවිවරු වෙති.[64] දෙවියකුට මාර්ග ඵල ලැබීමට ඇවැසි නම්, ඔහු මනුෂ්‍ය භවයක් ලැබ භාවනා කළ යුතු බව සිංහල භික්ෂූහු කියති. ලංකාවේ ථෙරවාදී ග්‍රන්ථවල සඳහන් වන පරිදි බුදු සමය බුද්ධිවාදයක් ලෙස ආරම්භ වූවකි.

බුදුන් වහන්සේ කාලාමයන් අමතා මෙසේ කී හ.

"කාලාම කුමරුනි, ඔබට මම මෙය කීවෙමි. නමුත් එය වාර්තාවක් ය යි සිතා පිළිගන්ට එපා. පරම්පරාවෙන් පැවතෙන්නක් ය යි සිතා පිළිගන්ට එපා. පුරාණ ආචාර්යවරුන් දේශනා කර ඇතැ යි සිතා පිළිගන්ට එපා. තුන් පිටකයේ ඇති නිසා ය යි සිතා පිළිගන්ට එපා. තමන් ගේ ගුරුවරයා භික්ෂුවක් වූ නිසා පිළිගන්ට එපා. තමන් ම මේ ගැන කල්පනා කර මේ දෙය නිවැරදි ය, යහපත් ය, කුසල් සහිත ය කියා අවබෝධ කරගෙන එය තමන් ගේත් අනුන් ගේත් යහපත පිණිස වේ ය යි පිළිගත හැකි විට පමණක් භාරගන්න."[65]

ඇමරිකානු ආගම් සංවිධානයේ ලියවිලි පරිදි, තමන් රැක ගෙන එන පිරිසිදු බුද්ධ වචනය පිළිබඳ ව සිංහල භික්ෂූන් තුළ ආඩම්බරයක් ඇති අතර ම සමහර භික්ෂූහු දේව වන්දනාව ද

බුදු සසුනට ඇතුළු කරගෙන ඇත්තා හ. මෙය සිදු වී ඇත්තේ නායක්කර් රජවරුන් හා බිසෝවරුන් නිසා ය යි පොදු පිළිගැනීමක් තිබේ. ඇතැම් භික්ෂූන් තර්ක කරන ලෙසට නම්, 'සිංහල භික්ෂූන්, බුදු සසුනට දෙවිවරුන් ඇතුළු කරගෙන ඇත්තේ නායක්කර්වරුන් නිසා නො වේ. දෙවියන් හා මනුෂ්‍යයන් අතර අතරමැදියන් ලෙසින් පෙනී සිටින පූසාරියන් ගෙන් හා පාදිලිවරුන් ගෙන් නූගත් ජනතාව බේරා ගැනීමේ පරමාර්ථයෙනි. බුදු සමය බුද්ධි වාදයක් වුව ද සාමාන්‍ය ජනතාව භක්තිවන්තයන් වී විවිධ බලවේගයන්හි පිහිට සොයති. එවිට ඔවුන් පූසාරීන්ට කොටු වෙති. ඊට විසඳුමක් සෙවූ සිංහල භික්ෂූන්, පන්සල් තුළ දේව ප්‍රතිමා තනවා, 'පූසාරීන්, වුවමනා නැහැ. මෙන්න දෙවිවරු පන්සල ඇතුළෙ ඉන්නව. කාටවත් ගාස්තු ගෙවන්ඩ වුවමනා නැහැ. තමන් ගෙ භාෂාවෙන් ම දෙවිවරු සමඟ කතා කරන්ඩ. වුවමනා උපකාර අල්ලගෙන ඒ අයටත් පින් ටිකක් දෙන්නැ' යි භක්තිමතුන්ට ඉඩ සලසා දී ඇත.'

මාතලේ කපුවෙක්, බුදුන් පතුළ පිහිටුවූ ස්ථාන අතරට **මක්කම** ද ඈඳාගෙන යාඥා පවත්වයි. **හලාවත** ප්‍රදේශයේ **යක්දෙස්සාවේ ශ්‍රී සුනන්දාරාමය** බස්නාහිර වෙරළබඩ පිහිටි පැරණි ම විහාරස්ථානය යි. මෙහි විහාර ගෙයි චිත්‍ර සහ ප්‍රතිමා නිර්මාණය කර ඇත්තේ **කැලණිය** විහාරයේ බිතුසිතුවම් නිම කළ **සොයිලියස් මැන්දිස්** සිත්තරා ගේ අත්තා විසිනි. සුනන්දාරාම විහාර ගෙට ඇතුළු වන දොරටුවේ මකර තොරණ මත සිටින සමහර ආරක්ෂක හේවායන් ජප මාලය සහිත කුරුස පැළඳගෙන සිටින අයුරින් නිර්මිත ය. සිංහල 'කපු භික්ෂූන් වහන්සේලා' නුදුරු දිනක යේසුස් වහන්සේ ද දෙවියකු කර ගෙන පන්සලේ කොනක සිටුවන්නට ඉඩ තිබේ. ක්‍රිස්තු භක්තිකයන් දැන් ලංකාවේ කරගෙන යන ක්‍රිස්තියානිකරණය යේසු අත් හත අටක් ඇති විරූපී දෙවියකු වීමෙන් අවසන් වන්නට බැරි කමක් නැත. ලංකාවේ කපුවන් උන්වහන්සේ නැතිවූ හරක් සොයනු පිණිස පිටත් කරන්නට පුළුවන. දෙවිවරුන් පන්සල්වලට ඇතුළත් කිරීම පිළිබඳ ව ඇමරිකානු පර්යේෂකයන් දක්වන ඉහත කී අදහස් ඔවුන් ගේ යටි සිතේ පවත්නා අදහස් ද යි අප සැක පහළ කළ යුත්තේ ය.

එසේ නම් මොවුන් බිය වී ඇත්තේ ලංකාවේ කපුවන් හෝ කපු භික්ෂූන් වහන්සේලා යේසුස් වහන්සේ තවත් වැඩට ගත හැකි දෙවියකු කරනු ඇතැ යි සැකයෙනි.

"කාශ්‍යපය, රන්වැනි වූ කෘතිම රන් පහළ වන විට ප්‍රකෘති රන් අතුරුදන් වන්නේ ය. එපරිද්දෙන් ධර්මයේ ස්වරූපයෙන් අධර්මය පහළ වෙද්දී ධර්මය අතුරුදන් වන්නේ ය"[66] යි බුදුන් වහන්සේ වදාළ පරිදි මෙබඳු කටයුතු නිසා ජනතාව බුදු දහම විකෘති ආකාරයෙන් වටහාගැනීම නොවැළැක්විය හැක්කක් බවත් එය බුදු සසුන හමුවේ පවත්නා අභියෝගයක් බවත් සඳහන් කළ මනා ය.

ඊශ්‍රායලයේ යුදෙව්වෝ යොහෝවා නමින් දෙවියකු ඇදහුවෝ ය. යේසු, 'මම දෙවියන් ගේ එක ම පුතා වෙමි" යි කියන්නට විය. යුදෙව් රබීවරු කෝප වූ හ. දෙවියන්ට අපහාස කිරීම අද වුව යුදෙව්වන් මෙන් ම මහමදිකයන් ද සමාව නොදෙන වරදකි. හොඳ ම නිදසුන **සල්මන් රුෂ්ඩි** ගේ සිද්ධිය යි. ඉන්දියාවේ ඉපදී එංගලන්තයේ ජීවත් වූ සල්මන් රුෂ්ඩි ලියූ පොතක් නිසා මොහොමඩ්තුමාට අපහාසයක් වී ඇතැ යි තීන්දු කළ ඉරානයේ ආගමික ඒකාධිපති නායක **අයතුල්ලා කුමේනි**, රුෂ්ඩි මරාදමන්නැ යි මහමදික බැතිමතුන් ගෙන් ඉල්ලීමක් කර රුෂ්ඩි ගේ හිසට ත්‍යාග මුදලක් ද නියම කළේ ය. බංගලාදේශයේ **තස්ලිමා නස්රින්** නමැති ලේඛිකාව ගේ සිද්ධිය තවත් උදාහරණයකි. වෛද්‍යවරියක වූ ඇය, සුප්‍රකට කිවිඳියකි; පුවත්පත් කාලවේදිණියකි. වෛද්‍යවරියක වූ නිසා ජීවිතයේ යථාර්ථය දකීමට හැකි වූ බව පවසන ඇය ලියූ **ලජ්ජා** නම් කෘතියත්, **නිර්බච්චා** නම් පුවත්පත් ලිපියත් නිසා කුපිත වූ මහමදික පූජකයෝ ඇයට මරණ දඬුවම දිය යුතු ය යි ජනතාව පෙළඹවූ හ. තස්ලිමා ගේ නිර්මාණවල අල්ලා දෙවියන් ගැන සඳහන් ය. ලෙබ්බෙලා දකින අන්දමට ස්ත්‍රියක දෙවියන් ගැන ලිවීම කුරානයට කරන අගෞරවයකි.[67]

යේසුස් වහන්සේ දේශන පවත්වන අතර වෛද්‍යවරයකු හා කට්ටාඩියකු වශයෙන් ද මහජන සේවයේ යෙදුණ හ. ලෙඩුන් සුවපත් කළේ ය. රබීවරු, යේසු ඔල්මාදකාරයකු බවත් යකුන් සමඟ සම්බන්ධකම් පවත්වන්නකු බවත් ප්‍රචාරය කළ හ. යේසුස්

වහන්සේ ගිලනුන්ට වෙදකම් කළේ එසින්ස් පරපුරෙන්* හා භාරතයෙන් උගත් වෛද්‍ය ශාස්ත්‍රයේ පිහිටෙනි. (මේ පිළිබඳ ව ඉදිරි පරිච්ඡේදවල දී විස්තර කෙරේ.) උන්වහන්සේ ලැබූ ශාස්ත්‍රීය දැනුම ගැන වැටහීමක් නැති ඥාතීහු, එතුමා ගේ මව සහ සොහොයුරු සොහොයුරියන් සමඟ සසඳා උන්වහන්සේ තක්සේරු කරමින් රබීවරුන් ගේ කතා විශ්වාස කළ හ. උන්වහන්සේ නාසරත්වලට ගිය අවස්ථාවේ ඥාතීහු, "මේ වඩුවා ගේ පුතා නොවේද? මරියා මොහු ගේ මව නේද? යෙකොබ්, සීමොන්, යෝසෙප්, යුදස් මොහු ගේ සහෝදරයන් නොවේ ද? මොහු ගේ සියලු සහෝදරියෝත් අප අතර නොවෙයි ද? එහෙම නම් මොහුට මෙබඳු දැනුමක් ලැබුණෙ කොහොම ද? මොහු මිනිස්සුන් ගෙ ලෙඩ සනීප කරන්නෙ කොහොම ද?"[68] යි පැවසූ හ.

යේසුස් වහන්සේ, රබීන් ගේ අවලාද ගැන කිසිත් නොසලකා සිය ධර්ම ප්‍රචාර කටයුතු සංවිධානය කරන්නට වූයේ ය. ප්‍රධාන අනුගාමිකයන් දොළොස් දෙනකු (12) නම් කෙරිණි. ඒ සිමොන් **පේත්‍රුස්, අන්ද්‍රුස්, ජේම්ස්, ජෝන්, පිලිප්, බර්තොලමියු, තෝමස් පබ්ලිකන්, මැතිව්, ඇල්පියස් ගේ පුත්‍ර ජේම්ස්, ලෙබ්බුස් තාඩියස්, කැනියට් සීමොන් සහ යුදාස් ඉස්කාරියොත්** ය.[69] අපොස්තල්වරුන් මොවුහු වෙති. තවත් අනුගාමිකයන් හැත්තෑ දෙනෙක් (70) දෙදෙනා බැගින් නගර ගම් ගණනාවක් වෙත පිටත් කර යවනු ලැබූ හ.[70] යේසු වටා යුදෙව් ජනතාව රොක් වෙන්ට පටන් ගත් හ. එතුමා ඊශ්‍රායලයේ ජනප්‍රියතම පුද්ගලයා බවට පත් විය.

යේසුස් වහන්සේ වාසය කළ යුදා ප්‍රදේශය පාලනය කරන ලද්දේ **පොන්ටියස් පිලාතේ** නමැති රෝම ආණ්ඩුකාරවරයා විසිනි. ඔහු යෙරුසලමේ පාලකයා ද වූයේ ය. යෙරුසලම නගරය පාලනයේ දී, හැත්තෑ එක් (71) දෙනෙකු ගෙන් සමන්විත **සැන් හෙන්ඩ්‍රින්** නමැති යුදෙව් මන්ත්‍රී මණ්ඩලය පිලාතේට සහාය විය. මහා දේවාලයේ නායක රබීවරයා මන්ත්‍රී මණ්ඩලයේ සභාපති වූයේ ය. යුදෙව් සමාජයේ ආගම හා නීතිය එකක් වූ නිසා කිසිවකුටත් අභියෝග කළ නොහැකි බලයක් නායක දේවගැතිවරයා සතු ව තිබුණි. ඔහු යටතේ හමුදාවක් පවා පැවතිණි. ඔහු ගේ තීරණ

---

* යුදෙව් බෞද්ධ සමාජය

හා ඉල්ලීම් ඉවත දැමීමට ආණ්ඩුකාරයා පවා අකැමැති විය.

යේසු රෝම පාලනයට විරුද්ධ ව කැරැල්ලක් ගැසීම සඳහා ජනතාව පොළඹවන බවට ආණ්ඩුකාරවරයාට පැමිණිලි ලැබුණි. යේසු කෙරේ වෛරයෙන් කටයුතු කළ රබීවරු, 'යේසු තමා දෙවියන් ගේ පුතා බව කියමින් දෙවියන්ට අපහාස කරන්නේ ය, යුදෙව්වන් ගේ ගැලවුම්කරුවා බව කියමින් මහජනයා රවටන්නේ ය' යන චෝදනා නඟමින්, යෙරුසලමේ ඔලිව් කන්දේ දී, යේසුස් වහන්සේ අත්අඩංගුවට ගත් හ.[67]

යේසුස් වහන්සේට නොයෙකුත් ශාරීරික වධහිංසා පැමිණවූ ඔවුහු, පසු දින එතුමන් අධිකරණය හමුවට ඉදිරිපත් කළ හ. නඩුව ඇසූ පිලාතේ ආණ්ඩුකාරයා යේසු අහිංසකයකු බව කීව ද, දේවගැතිවරයන් සතුටු කරමින්, යේසු ඇණ ගසා මරාදැමිය යුතු ය යි අධිකරණ තීන්දුව දුන්නේ ය. ශුභාරංචිකරුවන් පැහැදිලි කරන ලෙසට යේසුස් වහන්සේ කුරුස කණුවේ මිය ගියේ ය. යෝසප් නමැත්තෙක් එතුමා ගේ සිරුර කුරුසියෙන් බිමට බා ඔහු විසින් සැදූ සොහොනක තැන්පත් කළේ ය. තෙ දිනකට පසු එතුමා මළවුන් ගෙන් උත්ථානය වූ හ.

පාදක සටහන්

1 මිහින්තලේ ගම්උදාවට බයිබල් ලක්ෂ දෙකක් බෙදන වැඩසටහනක්. දිවයින ඉරිදා සංග්‍රහය 1993 පෙබරවාරි 21

2 bie den Kanela Indianer (කැනීලා ඉන්දියානුවන් සමග) ජර්මන් චිත්‍රපටය, නිෂ්පාදක- Jurgen Diekert, German TV N3, 1993.

3 Hemming, John , Prester John, Atlas of Exploration, Reed Books, 1997.

4 Levack, Brain P. Witch Hunting in Continental Europe, Garland Publishers

5 Hodgson, Peter C, Hegal Lecturers on the Philosophy of Religion Vol. 11, University of California Press, 1987.

"More, sources however, were utilized by Hegal for his treatment of Hindunism than for any other Oriental Religion" 7p

"In the second place Hegal relied on mostly unfavorable materials related to the East India company" 7p

6 බී. ජේ. පෙරේරා, පුරාණ ලංකාව සහ විදේශයන් අතර වූ වෙළඳාම, පුරාණ යුගය 111 පිටුව, තිසර ප්‍රකාශකයෝ, 1962.

7 කොලට් සේනානායක, සැඟවුණු සුවඳ, විසිදුනු ප්‍රකාශකයෝ, බොරලැස්ගමුව, 1995, 24 පිටුව.

8 පූජ්‍ය නාරාවිල ධම්මරතන හිමි, හැඩිපන්නල පඤ්ඤාලෝක හිමි, භාරතීය දර්ශන, එම්. ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ, 228-229 පිටු.

9 Rajneesh Bible, Rajneesh Publication, Inc. Boulder, Colorado, USA, 1984, 121p.

10 Rajawanragi Shrimad, Atma Siddhi, India, 211p. (ප්‍රකාශක හෝ මුද්‍රණකරු පිළිබඳ තොරතුරු පිටපතෙහි දක්නට නොවිණි. පිටපත ලබාගත්තේ ජර්මනියේ ටියුබින්ගන් ඉන්ඩියෝලොජි පුස්තකාලයෙනි.)

11 ඩබ්ලිව්. එස්. කරුණාරත්න, බෞද්ධ දර්ශනය හා චරණය, සමයවර්ධන, කොළඹ 10, 1992.

"කුශල හා අකුශල ක්‍රියා ප්‍රවෘත්තිය පිළිබඳ ව විවිධ වූ අන්තවාදී මත ඇත. මේවා අතර අධිච්ච සමුප්පනවාදය හා ස්වයංකෘතවාදය නිසංගතිවාදය චාර්වාකවාදය නම් කළ හැකිය. නමුත් බුදුසමය මේ අන්ත අතහැර ප්‍රතීත්‍ය සමුත්පාදය අනුව කුශලාකුශල කර්ම විභාග කරයි.", 33 පිටුව.

12 Kamenka, Eugene, The Portable Marx, Viking Penguine Press, NY, 1983. "The Difference between the Democtrieten and Epicurean Philosophy of Nature."

13 එම

14 කොලට් සේනානායක, රොබට් ගේ නිවෙසේ පැවති සංස්කෘතික විවාදය, දිවයින, 1984. 10. 21.

ආචාර්ය ඊ. ඩබ්ලිව්. අදිකාරම් සමඟ පාගොඩ අදිකාරම් නිවෙසේ දී සහ රොබට් ගුණවර්ධන සමඟ බොරළුගොඩ වලව්වේ දී 1970 පැවති සම්මුඛ සාකච්ඡා ඇසුරිනි.

15 Kamenka, Eugene, The Portable Marx, Viking Penguine Press, NY, 1983.

16 Shiva, Vandana, The Violence of Green Revolution, 51p, Zed Books, UK, 1991.

17 කොලට් සේනානායක, ගිලන්පස පූජාවට හැලි අරක්කු මුසු කළ වසන්ත රාජා, බර්ලින් ශ්‍රී ලංකා මානව හිමිකම් සංවිධානය, බර්ලින්, 1994

18 මතෙව් 23. 27

19 ලූක් 6. 20

20 ලූක් 18. 25,

21 කොමියුනිස්ට් ප්‍රඥප්තිය, ශ්‍රී ලංකාවේ කොමියුනිස්ට් පක්ෂය

22 Marks, Karl, The Capital

23 World War II TV Series, History Channel, TV, USA.

24 කොලට් සේනානායක, නෝබල් තෑග්ග, බර්ලින් ශ්‍රී ලංකා මානව හිමිකම් සංවිධානය, 1991

25 ශ්‍රී චන්ද්‍රරත්න මානවසිංහ, 'වගතුග', ලංකාදීප, 1957 දිනය සොයාගත නොහැකි විය.

26 ශ්‍රී චන්ද්‍රරත්න මානවසිංහ, 'වගතුග', ලංකාදීප, 1956 ජුලි 17

27 කුඹුරු පනත පිළිබඳ පාර්ලිමේන්තු විවාද

28 කොලට් සේනානායක, නාරද කරුණාතිලක, පරම්පරා, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ, (මුද්‍රණයේ)

29 Shiva, Vandana, The Violence of the Green Revolution, Zed Books, 1991

"The Green Revolution was prescribed as a techno-political strategy that create abundance in agricultural soceities and reduce the threat of commiunist insurgency and agrarian conflict. The British-American sponsored Colombo plan of 1952 was the explicit articulation of the development philosopy which saw the peasantry in Asia as incipient revolutionaries....." 14p

30 දනුම, International Bible Students Association, NY, USA, 1995, 19p

31 අවුරුදු 150ක් පැරණි බයිබලයේ පිටපතක්, දිවයින ඉරිදා සංග්‍රහය, 1995 ජනවාරි 15

32 Rajaneesh Bible, Rajneesh Publication, Inc. Boulder, Colorado, USA, 1984.

33 Mankind's search for God, Watch Tower Bible Society, USA, 1990, Who wrote the bible, 241p.

34 Himmlischer Diktator, (දෙව්ලොවේ ආඥාදායකයා) Papst Johannes xxiii, Der Spiegel 44/1993

35 දැනුම, International Bible Students Association, NY, USA, 1995, 19p

36 Churchward, Albert, The Origin and Evolution of Religion, 1924, 31p

37 නික්මයාම 3. 1-7

38 නික්මයාම 3. 9

39 නික්මයාම 4. 8 සිට ගණන් කතාව 14 තෙක් මේ පිළිබඳ දීර්ඝ විස්තරයක් ඇතුළත් ය.

40 නික්මයාම 16. 3-10, ගණන් කතාව 14

41 නික්මයාම 20. 1 - 17

42 Hassnain, Fida , The Search for the Historical Jesus, Gateway Books, UK, 1994

43 නික්මයාම 12. 29-30

44 ලූක් 1. 26-35

45 මාක් 6. 3

46 Jesus in Heaven on Earth, Nazeer Ahmed, Muslim Mission, UK .පොතේ අඩංගු The Gospel of James කොටස බ්‍රිතාන්‍ය පුස්තකාලයෙන් ලබාගෙන ඡායාපිටපත් කර අප වෙත එවන ලද්දේ Chantal Benjamin මහත්මිය විසිනි.

47 The Book of Enoch, Tr. R. H. Charles, Oxford, 1893

48 සැළලිහිණි විවරණය, කුමාරතුංග මුනිදාස, කේ. ඒ. ආරියදාස සහ සමාගම, කොළඹ 10, බු. ව. 2500, පිටුව 28

49 මතෙව් 2. 1-12

50 Perera, S. G. Historical Sketches, 1983, 1-2p

51 ලූක් 2. 41-50

52 Hassnain, Fida, The Search for the Historical Jesus, Gateway Books, UK, 1994

"There is not a single reference to jesus in the Gospels during this entire period. This raised many suspicions in my mind. I felt disgusted with the Church for having removed or destroyed this information. Hence for the lost years from the age of 12 to 30 I tried to find information from other sources, predominently in the East." 58p

53 මාක් 1. 9

54 මාක් 1. 12

55 Hassnain, Fida, The Search for the Historical Jesus, Gateway Books, UK, 1994

"As in the case of Buddha, he fasted, hungered and met temptation" 79p

56 යොහාන් 2. 13-17

57 Rajneesh Bagvan, Priest & Politics, Rebel Publishers, Germany p28-29

58 යොහාන් 10. 30

59 Rajneesh Bible Vol. 1, Rajneesh Publications Inc., Boulder, USA, 249p

60 මැතිව් 1. 1-17

61 ලූක් 3. 23-38

62 ඇමරිකානු ආගම් සංවිධානයේ එක් පොතක් සිංහලයට පරිවර්තනය වී ඇත. පී. බී. මීගස්කුඹුර (පරි.), මකුට මුනිදාරී අවලෝකිතේශ්වර නාථ පුරාණය, ප්‍රදීප ප්‍රකාශකයෝ, කොළඹ, 1994.

63 හේතුවාදී සන්දේශය, ප්‍රගති මුද්‍රණ ශිල්පියෝ, 1973

64 ප්‍රස්ථාවනාව, මකුට මුනිධාරී අවලෝකිතේශ්වර නාථ පුරාණය, ප්‍රදීප ප්‍රකාශකයෝ, කොළඹ, 1994.

65 කාලාම සූත්‍රය

66 ගංගොඩවිල සෝම හිමි, දේව සංකල්පය හා බෞද්ධ ආකල්පය, සිරි වජිරඥාණ ධර්මායතනය, මහරගම, 2000

67 ජාත්‍යන්තර ක්ෂමා ආයතනයේ වාර්තා Net-Amnesty.com

68 මතෙව් 13. 53-58, මාක් 6. 2-4

69 The Family Bible Encylopedia Copy pub. Hose, USA, 1972, p223.

70 ලූක් 10





2

යේසුස් වහන්සේ ගේ අප්‍රකට ජීවිතය සෙවීම

ඓතිහාසික යේසුස් සෙවීම (The Search for the Historical Jesus) මැයෙන් ග්‍රන්ථයක් කළ කාශ්මීර කෞතුකාගාරයේ අධ්‍යක්ෂ ධුරය දරූ මහාචාර්ය ෆීඩා හස්නේන්* මෙසේ සඳහන් කරයි.

"ඇතැම් ජර්මානු දේශ සංචාරකයන් ගේ වාර්තාවන්හි මොංගෝලියාව, මධ්‍ය ආසියාව, ටිබෙටය සහ ලඩාක් යන රටවල පුරාණයේ විසූ නෙස්ටෝරියානු ක්‍රිස්තියානීන් පිළිබඳ ව මෙබඳු සටහන් ලියවී තිබේ. නෙස්ටෝරියානු ක්‍රිස්තියානීන් ගේ මූලස්ථානය පැවතියේ පර්සියාවේ ය. එහි ධර්මදූත සේවාව ටිබෙටය, චීනය ආදී රටවල් කරා ද ව්‍යාප්ත විය. මෙබඳු සංචාරක වාර්තා 19 වෙනි සියවසේ දී ජර්මන් මිෂනාරීන් ගේ විශේෂ අවධානය දිනාගත් තොරතුරු බවට පත්වූයෙන්, හයිඩ් සහ පගල් යන ජර්මන් පූජකයන් දෙදෙනා, ක්‍රි. ව. 1883 දී ඉන්දියාවට පැමිණ ලඩාකයට යාමට අවසර ඉල්ලූ නමුදු බ්‍රිතාන්‍ය ආණ්ඩුව විසින් ඔවුන් ගේ ඉල්ලීම ප්‍රතික්ෂේප කරනු ලැබී ය. ක්‍රි. ව. 1885 වර්ෂයේ දී අවශ්‍ය ව තිබූ වීසා අවසරය ලබාගත් ජර්මානු මිෂනාරී පිරිසක් ලඩාකයට ගොස් ලේහ් නගරයේ දේවස්ථානයක් ඉදි කළ හ. පළමුවන ලෝක යුද්ධය සමයේ ජර්මන් මිෂනාරීහු ලඩාකයෙන් පිටමං කරනු ලැබූයෙන්, දේවස්ථානයේ අයිතිය බ්‍රිතාන්‍ය සහ ස්විස් මිෂනාරීන් සතු විණි. දෙවන ලෝක යුද්ධයෙන් පසු ව එහි පාලනය ස්වදේශිකයන්ට ලැබුණෙන්, දේවගැති වතාන් ජුන්වුක් මිෂනාරී කටයුතුවල ප්‍රධානියා වශයෙන් පත් විය.

---

* කාශ්මීරයේ ශ්‍රී නගර්හි උපත ලැබූ ෆීඩා හස්නේන් කාශ්මීරයේ රාජ්‍ය ලේඛනාගාරයේ සහ පුරාවිද්‍යා පර්යේෂණ කෞතුකාගාරයේ අධ්‍යක්ෂ වශයෙන් දීර්ඝ කාලයක් සේවය කළේ ය. ඔහු ඉතිහාස ග්‍රන්ථ කිහිපයක කතුවරයා වන අතර, 'කාශ්මීරයේ බෞද්ධ ඉතිහාසය' ඉන් එක් කෘතියකි.

"මා ලඩාකයට ගොස් යේසුස් වහන්සේ ගේ අප්‍රකට ජීවිතය පිළිබඳ ව තොරතුරු සොයමින් සිටි අතර, දිනක් දේවගැති චතාන් පුන්චුක්, ජර්මන් මොරවියානු මිෂනාරි පූජකයන් ගේ දිනපොත් මිටියක් ඔසොවාගෙන'වුත්, 'ඒවායෙහි ජර්මානු මිෂනාරීන් ගේ දෛනික වැඩකටයුතු සියල්ල ම සටහන් කර ඇතැ' යි මා සමඟ කීවේ ය. වාසනාවකට මෙන් එක දිනපොතක අංක 118 යොදා ඇති පිටුවේ ශාන්ත ඉසා ය යි රතු තීන්තෙන් සටහන් කර තිබුණි. චතාන් පුන්චුක් ගෙන් මේ පිළිබඳ ව වැඩිදුරටත් කරුණු විමසමින් තොරතුරු සොයද්දී නිකොලොස් නොටෝවිෂ් නමැත්තෙකු ලඩාකයට පැමිණ ඉසා පිළිබඳ තොරතුරු අඩංගු ලේඛනයක් සොයාගත් බව සඳහන් දිනපොත් පිටුවක් ද මට දැකගත හැකි විය. මම එම පිටු දෙකේ ම ඡායාරූප ගතිමි. මිෂනාරි දිනපොත්වල සඳහන් කෙරෙන ඉසා අන් කිසිවකු නොව යේසුස් වහන්සේ බව මම තේරුම් ගතිමි. මා ඊළඟ වාරයේ ලඩාකයට ගොස් දේවගැති චතාන් පුන්චුක් සමඟ සාකච්ඡා කරන්නට සූදානම් වූ විට ඔහු මා මඟහැරියේ ය. මගේ විමසීම් කිසිවකටත් පිළිතුරු නොදුන් ඔහු, අප ගේ සම්බන්ධය ද කෙළවර කර දැම්මේ ය."[1]

නිකොලොස් නොටෝවිෂ්

නිකොලොස් නොටෝවිෂ් වර්ෂ 1858 දී ක්‍රිමියාවේ යුදෙව් පවුලක උපන්නෙකි. තරුණ වියේ දී ග්‍රීක ඕතඩොක්ස් ක්‍රිස්තියානි ආගම වැළඳගත් නොටෝවිෂ්, මාධ්‍ය ශිල්පියකු වශයෙන් ජීවිතය ඇරඹී ය. ඔහු පොත් ගණනාවක් ප්‍රකාශයට පත් කළේ ය. රුසියන් ජනතාව ගේ සමාජ හා දේශපාලනය පිළිබඳ ව උනන්දුවක් දැක්වූ ඔහු, Pravda Obevrejah නමැති ආගම් පිළිබඳ විමර්ශන ග්‍රන්ථය මඟින් යුදෙව් ආගම විවේචනය කරමින් ක්‍රිස්තියානි ආගම අගය කර ඇත්තේ ය.[2]

1870 ගණන්වල තුර්කි යුද්ධය සමයේ පෙරදිග සංචාරයක් ඇරඹූ නොටෝවිෂ් බෝල්කානු රටවල් ඔස්සේ ඉන්දියාවට ගියේ ය. රාවල්පිණ්ඩි නුවර ටික කලක් විසූ ඔහු, ලඩාකය බලා පිටත් විය. ඔහු ගමන සඳහා කොටළුවකු, කුලීකරුවන් පිරිසක් සහ

භාෂා පරිවර්තකයකු සපයා ගත්තේ ය. වකා ගංගාව අසල මුල්බෙක්හි ආශ්‍රම දෙක නැරඹූ නොටෝවිෂ්, එහි ඇති සුප්‍රසිද්ධ මෛත්‍රය බෝධිසත්ව ප්‍රතිමාව නැරඹීම පිණිස ගියේ ය. ගමනේ දී, බෝධිසත්ව ප්‍රතිමාවට නුදුරින් පිහිටි කුඩා ආශ්‍රමයේ විසූ ලාමාවරයා නොටෝවිෂ්ට මුණගැසිණි. මහමදාගමිකයන්, බලහත්කාරයෙන් බෞද්ධයන් මහමදාගමට හරවා ගැනීම පිළිබඳ ව අප්‍රසාදයෙන් කතාකළ ලාමාවරයා, තම රටේ බෞද්ධයන්ට යුරෝපීය ක්‍රිස්තියානි මිෂනාරීන් ගෙන් එවැනි කරදරයක් සිදු නොවූ බව පවසමින්, නොටෝවිෂ්ට වටිනා ඉතිහාස කතාවක් කියා දුන්නේ ය. කතාව ලුහුඬින් මෙසේ ය.

"ඔබ කියන දෙවියන් ගේ එක ම පුත්‍රයාට අපි ද ගරු කරන්නෙමු. ගින්දර හෝ කඩුව හෝ භාවිතා නොකර බුදුරජාණන් වහන්සේ ගේ ධර්මය ලෝකයේ පැතිරවූ එතුමා අපේ පොත්වල සඳහන් වන්නේ ඉසා නමිනි. එතුමා මෙලොවට පැමිණි බෝධිසත්වවරයෙකි. ඉසා ගේ නම හා විස්තර අපේ ඉතිහාස පොත්වල තිබේ."

ඉසා පිළිබඳ ව සඳහන් ව ඇතැ යි ලාමා වහන්සේ කී ඉතිහාස පොත් පිරික්සීමේ ආශාව නොටෝවිෂ් තුළ ඇති වුව ද එතුමා ගේ ආශ්‍රමයෙහි එම ලියවිලි නොමැති බැව් ලාමා වහන්සේ කී හෙයින්, ඉසා ගැන සඳහන් පොත් ඇත්තේ කොහිද යි නොටෝවිෂ් එතුමා ගෙන් විමසී ය.

ලාසා නුවර ඇති එබඳු වටිනා ග්‍රන්ථ දහස් ගණනක තල්පිටපත්වලින් පිටපත් කරගන්නා ලද අනුපිටපත් සමහර ප්‍රධාන ආරාමවල ඇති බවත් තමන් ගේ කුඩා ආශ්‍රමයෙහි එම පිටපත නැති බවත් පැවසූ උන්වහන්සේ ඒවා පූජනීය වස්තූන් හෙයින් නොටෝවිෂ්ට කොතැනක දී වත් දැකගත නොහැකි වනු ඇතැ යි ද වැඩි දුරටත් කී හ. ලාමා වහන්සේ පැවසූ පොතේ පිටපතක් සොයාගැනීමේ දැඩි අධිෂ්ඨානයෙන් ඉදිරියට ගමන් කළ නොටෝවිෂ්, දින ගණනක ගමනකින් පසු ලඩාක්හි හෙමිස් (Hemis) ආශ්‍රමයට ළඟා විය.

හෙමිස්, ලඩාකයේ විශාලතම ආරාමය යි. එහි නැවතී පූජා කටයුතු නැරඹූ නොටෝවිෂ්, ඉක්මනින් ම නායක ලාමා

වහන්සේ ගේ හිතවතෙක් බවට පත් විය. මුල්බෙක්හි ලාමා වහන්සේ තමාට ඉසා පිළිබඳ ව කී කතාව එතුමාට පවසා, එවැනි ග්‍රන්ථයක් හෙමිස් ආරාමයේ ඇත්ද යි විමසීමට අවස්ථාවක් ඔහුට ලැබුණි. ලාමා වහන්සේ, ඉසා පිළිබඳ බොහෝ විස්තර දන සිටිය ද ආරාමයේ ඇති පුස්කොළ පොත් දහස් ගණන අතර ඉසා ගේ තොරතුරු ඇතුළත් ග්‍රන්ථය ඇත් ද යි කීමට උන්වහන්සේ අපොහොසත් වූ හ.

තමා ගේ වුවමනාව හෙමිස් ආරාමයෙන් ඉටුකර ගැනීමට නොහැකි බව වටහාගෙන නැවතත් ගමන ආරම්භ කළ නොටෝවිෂ්, අකරතැබ්බකට මුහුණ පෑවේ ය. කොටළුවා පිටින් වැටුණු ඔහු ගේ දණහිස බිඳුණි. මාර්ගෝපදේශකයෝ, ප්‍රතිකාර ලබාදීම පිණිස, නොටෝවිෂ් හෙමිස් ආරාමයට ම ගෙන ගිය හ. ලාමා වහන්සේලා ගේ ප්‍රතිකාර සහ සංග්‍රහ සත්කාර ලබමින් සිටි නොටෝවිෂ් හමුවීමට දිනක් පැමිණි නායක ලාමා වහන්සේ, "ඔබ කී ඉසා පිළිබඳ විස්තර අඩංගු **ඉසානාථ සූත්‍රය** ඇතුළත් **නාථ නාමාවලී** කෘතිය මෙන්න" යි පවසමින් පුස්කොළ පොතක් නොටෝවිෂ්ට පෙන්වූ හ. පාලියෙන් ලියැවුණු නාථ නාමාවලී පුස්කොළ පොතේ සෑම සූත්‍ර කොටසක් සමඟ ම එහි ටිබෙට් පරිවර්තනය ද විණි. ලාමා වහන්සේ නාථ නාමාවලියේ **ඉසානාථ සූත්‍රයේ** පාඨ කියවූ අතර නොටෝවිෂ් පරිවර්තකයා ගේ උදව් ඇති ව ඒවා පිටපත් කරගත්තේ ය.

පෙරළා රුසියාවට ගිය නොටෝවිෂ් **කිව්** (Kiew) නගරයේ '**ආච් බිෂොප්වරයා**' වූ **මොන්සිඤ්ඤෝර් ප්ලැතෝන්** (Monsiegneur Platon) හමුවී තමා සොයාගත් ලේඛන මුද්‍රණය කිරීමට උත්සාහ ගත් නමුදු ඔහු ඊට අකැමැති වූයේ ය. ඉන් වසරකට පසු ව රෝමයට ගිය නොටෝවිෂ්, **වතිකානුවේ කාදිනල්** මුණගැසී තමා සොයාගත් ලේඛනය පෙන්නා එය මුද්‍රණය කිරීමට හැකි ද යි විමසුවේ ය. "ඔවැන්නක් මුද්‍රණය කිරීමෙන් සිදුවන එක ම ප්‍රතිඵලය ඔබට සතුරන් පිරිසක් ඇතිවීම පමණකැ යි" කී කාදිනල් ටිබෙටයේ කළ සංචාරය පිණිස වැයවූ වියදමට සමාන මුදලක් නොටෝවිෂ්ට දී ඔහු රවටා ලේඛන මංකොල්ලයකට සැරසුණි. නොටෝවිෂ් රෝමයේ කාදිනල් මඟහැර ප්‍රංශයට ගොස් පැරිස් කාදිනල් **රොටෙලි** (Roteli) හමුවී ලේඛන මුද්‍රණය කරන්නට යෝජනා කළේ ය. ඔහු ද නොටෝවිෂ් ගේ අදහස හෙළාදකිමින් කතාකරන්නට විය.

පැරිසියේ දී නොටෝවිෂ් සමඟ මිත්‍ර වූ **ජූලෙස් සිමොන්,** (Jules Simon) කනස්සල්ලෙන් සිටි නොටෝවිෂ් ඉතිහාසඥයකු විචාරකයකු හා දාර්ශනිකයකු වශයෙන් ප්‍රංශයේ කීර්තියක් දිනා සිටි **ජෝසප් අර්නස්ට් රෙනාන්** (Joseph Ernest Renan) හමුවට යැවී ය. අමිල වස්තුවක් සොයාගැනීම පිළිබඳ ව නොටෝවිෂ් පැසසූ රෙනාන්, නොටෝවිෂ් ගේ ලේඛන ප්‍රකාශයට පත් කිරීම පිණිස දිරි දුන්නේ ය.

ක්‍රි. ව. 1890 දී නොටෝවිෂ් ගේ ලේඛන Vie Inconnue de Saint Issa නමින් ප්‍රකාශයට පත් කෙරිණි. එම වසරේ දී ම The Life of Saint Issa නමින් එහි ඉංග්‍රීසි පරිවර්තනය **නිව්යෝර්ක්හි** දී ප්‍රකාශයට පත් වූ අතර 1895 වසරේ දී The Unknown life of Jesus Christ නමින් එහි තවත් මුද්‍රණයක් **ලන්ඩනයේ** දී ප්‍රකාශයට පත් කෙරිණි.[3]

යේසු ගේ අප්‍රකට ජීවිතය නමැති නොටෝවිෂ් ගේ ග්‍රන්ථය යුරෝපයේ සහ ඇමරිකාවේ බුද්ධිමත් ගවේශකයන් අවදි කළ ග්‍රන්ථයක් විය. පොත කියවූ සමහරු නොටෝවිෂ් ඉදිරිපත් කරන තොරතුරු පිළිබඳ ව වැඩිදුරටත් කරුණු දන ගැනීම පිණිස ටිබෙටයට ගියෝ ය.

ඔවුන'තරින් හින්දු න්‍යායාචාර්යවරයකු වූ ස්වාමි අබේධානන්දට ප්‍රමුඛස්ථානය හිමිවන්නේ එතුමන් භාෂාවේදියකු ද වූ බැවිනි. ස්වාමි අබේධානන්ද එතුමන් වාසය කළ ඇමරිකාවේ පමණක් නොව යුරෝපයේ පවා හින්දු ධර්මය පිළිබඳ ශාස්ත්‍රඥයකු වශයෙන් නම් දරා හුන්නේ ය. නොටෝවිෂ් ගේ ග්‍රන්ථය කියවා කුතුසට පත් ඔහු 1922 ඔක්තෝබර් මස 04 වන දින හෙමිස් ආරාමයට ගොස් ඉසානාථ සූත්‍රය කියවා දෙ වනු ව ලාසා නුවර දලයි ලාමා මාලිගාවට ගොස් සූත්‍රයේ මුල් පිටපත ද පිරික්සා සැක දුරු කර ගත්තේ ය. ඔහු ගේ ආචාර්යවරයා වූ ස්වාමි විවේකානන්දතුමා ද ඉසානාථ සූත්‍රය කියවූ බව ලාසා පුස්තකාලයේ සටහන් ව තිබෙනු ඔහු දුටුවේ ය.[4]

ස්වාමි ප්‍රඥානන්ද ටිබෙටයේ මාබෝර් ආරාමයේ තිබී

ඉසානාථ සූත්‍රය කියවූ බව ඇමරිකානු චිත්‍රපට නිෂ්පාදක රිචඩ් ඩික් හා පැවති සම්මුඛ සාකච්ඡාවක දී ඔහු පවසා ඇතැ යි ජැනට් බොක් ලේඛිකාව සඳහන් කරන්නී ය.[5] **හෙන්රිටා මෙරික්** නම් ඇමරිකානු කාන්තාව ද හෙමිස් ආරාමයට ගොස් ඉසානාථ සූත්‍රය පරීක්ෂා කළ තැනැත්තියකි.[6]

රුසියානු ගවේෂකයකු වූ **නිකොලායි රෝරයිෂ්*** (Nicolai Roerich) තම භාර්යාව ද සමඟ හිමාල ප්‍රාන්තයේ ගවේශණයක යෙදෙමින් හෙමිස් ආශ්‍රමයට ගොස් ලේඛන පරීක්ෂා කළේ ය. පැරණි **තක්ෂිලා** නගරයට සැතපුම් 45ක් ඔබ්බෙන් කාශ්මීර දේශසීමාවෙහි යේසුස් වහන්සේ ගේ මව ගේ සොහොන ඇතැ යි ලෝකයට අනාවරණය කළ රෝරයිෂ්, මරියා මගදලේනා මියගොස් ඇත්තේ කැෂ්ගාර්හි දී බව ද සොයා ගත්තේ ය.[7]

මරියා ගේ සොහොන පිළිබඳ විස්තරයක් හා ඡායාරූපයක් හස්නේන් ගේ ඓතිහාසික යේසු සෙවීම ග්‍රන්ථයෙහි 158 වන පිටුවේ ඇතුළත් ය. මරියා ගේ ගමන ගැන ලියවුණු මහමදික ඉතිහාස සටහන්වල යේසු, මරියා, ඇගේ සොහොයුරිය සහ මගදලේනා සමඟ පර්සියාව හරහා කාශ්මීරයට ගිය බව සඳහන් වේ.[8]

නොටෝවිෂ් එළිදැක්වූ යේසුස් වහන්සේ ගේ අප්‍රසිද්ධ ජීවන සංග්‍රහය ග්‍රන්ථයේ සඳහන් කරුණු ගැන ගවේෂකයන් ගේ අවධානය යොමුවීම කතෝලික සභාව නොඉවසූ කරුණක් විය. ඔවුහු

---

* නිකොලායි රෝරයිෂ් ගේ දිනපොත්වල සෙයිලෝනයේ අනගාරික ධර්මපාල ගේ නම සඳහන් ව ඇති බව අපට දැනගන්නට ලැබුණි. බුද්ධ වර්ෂ 2483 හෙවත් ක්‍රි. ව. 1939 අප්‍රියෙල් මස 29 දින සිංහල බෞද්ධයා වෙසක් අතිරේකයේ ඔහු විසින් ලියන ලද වෙසක් පණිවුඩයක් අන්තර්ගත ය.[9] 'රෝරික් මහතා ටිබෙට් දේශයෙන් සාධක දක්වමින් යේසුස් වහන්සේ බුද්ධ ශ්‍රාවකයෙකැයි පළමු වරට ලෝකයට හෙළි කළ පුද්ගලයා වෙතැයි' එහි සඳහන් වෙයි.

අප රෝරයිෂ් පිළිබඳ ව මොස්කව් පුස්තකාලයෙන් විමසූ කල්හි, "රෝරයිෂ්ල වගේ විශාරද බුද්ධිමතුන් දැන් රුසියාවෙ නෑ. එවැනි පුද්ගලයින් රටක උපදින්නෙ කලාතුරකින්" යි පුස්තකාලයාධිපතිනිය කීවා ය. එය සැබෑවක් බව ඇමරිකානුවන් රෝරයිෂ් වෙනුවෙන් කෞතුකාගාරයක් පිහිටුවා තිබීමෙන් ඔප්පු වෙයි.

ඉන්දියාවේ කතෝලික සභාව සහ කුලියට ගන්නා ලද මහමදිකයන් මාර්ගයෙන් ලඩාකයේ හා ටිබෙටයේ ඉසානාථ සූත්‍ර අත්පිටපත් අත්අඩංගුවට ගැනීමේ හා විනාශ කිරීමේ දැවැන්ත රහස් මෙහෙයුමක් ආරම්භ කළෝ ය.[10]

පරම විඥානාර්ථ සමාගම

ඇමරිකාවේ පරම විඥානාර්ථ සමාගමේ උන්නතිය සඳහා ද නොටෝවිෂ් ගේ සොයාගැනීම් කිසියම් ලෙසකින් ආධාර වී ඇති බව, **ඉලිනොයිස්හි එච්. එස්. ඕල්කොට්** පුස්තකාලයේ සහ දකුණු ඉන්දියාවේ අද්‍යාර්හි පරම විඥානාර්ථ සමාගමේ මූලස්ථාන පුස්තකාලයෙහි ඇති සංගමයේ ආරම්භකයන් ගේ ලේඛන හා දිනපොත්වල තොරතුරු පිරික්සන විට පැහැදිලි වෙයි. පරම විඥානාර්ථ සමාගමේ ආරම්භකයෝ හෝ එහි සාමාජිකයෝ හෝ කිසිවෙකුත් බෞද්ධයන් නොවූ හ. ඔවුන් සියලු ම දෙනා උපතින් ක්‍රිස්තු භක්තිකයන් වුව ද පූජකයන් ගේ දේශන අසමින් සම්ප්‍රදායික භක්තිකයන් ලෙස ජීවත් නොවූ ගවේෂකයෝ වූ හ. සංගමයේ ප්‍රථම සභාපතිනිය වූ **බ්ලැවට්ස්කි** මැතිනිය ටිබෙට් ඓතිහාසික ග්‍රන්ථ කියවා මරණයෙන් මතු ජීවිතය හා භූතාත්ම පිළිබඳ වටිනා ග්‍රන්ථ ගණනාවක් ම සම්පාදනය කළා ය.[11]

ටිබෙට් බුද්ධාගමට අනුව බෝසතාණන් වහන්සේලා දෙපිරිසකි. මින් පළමුවන හා බහුතර සංඛ්‍යාව පසේබුදුවරු ලෙස නිවන් දකින්නෝ ය. කොටසක් ලෝක සත්වයා කෙරේ ඇති අනුකම්පාව නිසා ම නිවන් දැකීම කල් දමා බුදුවීමට පෙරුම් පුරති. මෙවැනි බුද්ධාංකුරවරුන් එක් දහස් දෙ දෙනකු ගේ (1002) නම් 'නාථ නාමාවලියෙහි' අන්තර්ගත ය. අවසන් වරට ලොව පහළ වුණු බෝසත්වරයා වශයෙන් ඉසා ගේ නම සහ මීළඟට පහළ වන මෛත්‍රය බෝසතාණන් ගේ නම එහි අවසානයෙහි සඳහනි.[12]

'මනුෂ්‍යයන් වන අප උත්සාහ දැරූ විට, මෛත්‍රය බුදුන් පහළවීමට උචිත පරිසරයක් ලෝකයේ ගොඩනැංවිය හැකි ය' යන බලාපොරොත්තුව ඇති කරගත් පරම විඥානාර්ථවාදීහු, ඒ

සඳහා ලෝක වාසීන්ට දනුම සැපයීමේ පරමාර්ථයෙන් මාර්ගෝපදේශකයකු (ඔවුන් ගේ වචනයෙන් වර්ල්ඩ් ටීචර් - World Teacher - ජගත් ගුරු) බිහිකිරීමට සිතුවෝ ය. ටිබෙට් නක්ෂත්‍ර ක්‍රමයකට ළමයින් පස් දෙනකු තෝරාගත් මොවුහු, ඉන්දියාවේ අද්යාර්හි සංගම් මූලස්ථානයට කැඳවා ඔවුන් පුහුණු කරන්නට වූ හ. ක්‍රිෂ්ණ මූර්ති පරම විඥානාර්ථ සමාගම විසින් අද්යාර් මූලස්ථානයේ 'ජගත් ගුරු කෙනකු' වශයෙන් පුහුණු කරන ලද එක් ළමයෙකි. මේ සඳහා ලංකාවෙන් ද එක් අයකු කැඳවන ලද බව සඳහති.[13]

එය ලංකාව බ්‍රිතාන්‍ය පාලනය යටතේ පසු වූ කාලය යි. පාලකයන් ගේ ආගම වූ ක්‍රිස්තියානි ආගම රාජ්‍ය ආගම බවට පත් ව තිබුණු අතර, ක්‍රිස්තියානි දේවගැතිවරු බුද්ධාගම මිථ්‍යා දෘෂ්ටියක් සේ සලකා කටයුතු කළ හ. ඔවුහු බෞද්ධ සාරධර්ම සියල්ලක් ම විනාශ කළ හ. සිංහල බෞද්ධයෝ තම රට තුළ ම ආත්ම ගරුත්වයක් නැති නින්දාවට පත්වූ ජන කොටසක් ව සිටිය හ. 1825 මාර්තු මස 25 වන දින කෝළඹ දී ප්‍රසිද්ධ කතාවක් පැවැත්වූ ලංකාවේ පළමු වන වෘත්තිය සමිතියේ ප්‍රාරම්භක වූ ජ්. ඊ. බුල්ජන්ස් කී පරිදි, 'බ්‍රිතාන්‍යයෝ, ලංකාවට මිෂනාරීන්, තුවක්කු සහ 'බෝතල්' ගෙනා හ. මිෂනාරීන් සංස්කෘතිය විනාශ කිරීමට ය. බෝතල් රටවාසීන් ගේ මනස විනාශ කිරීමට ය. තුවක්කු රටවාසීන් ගේ සිරුරු විනාශ කිරීමට ය.'[14]

භික්ෂූන් වහන්සේලා ගේ ප්‍රධානත්වයෙන් ලංකාවේ ජාතික ව්‍යාපාරයක් ඇති වූයේ එම විනාශයෙන් ජාතියත් ආගමත් බේරා ගැනීමේ පරමාර්ථයෙනි. මෙය නවජීවන ව්‍යාපාරය යනුවෙන් ද හැඳින්වේ. නවජීවන ව්‍යාපාරයේ ලිපි හා ප්‍රකාශන කියවූ පෙරදිග පිළිබඳ ව සොයමින් සිටි ඇමරිකාවේ පරම විඥාර්ථ සමාගමේ නායකයෝ ලංකාවට පැමිණ පරම විඥානාර්ථ බෞද්ධ සමාගම පිහිටුවූ හ. ඔවුහු ක්‍රමයෙන් භික්ෂු නායකත්වය ඉවත් කර නව ජීවන ව්‍යාපාරය සියතට ගත් හ.* මෙය පසු පරිච්ඡේදයක විස්තර කෙරෙන, යේසුස් වහන්සේට ඇණ ගැසීමෙන් පසු ව සෝල්, උන් වහන්සේ ගේ ව්‍යාපාරය සියතට ගත්තාට සමාන සිද්ධියකි.

ලංකාවේ පරම විඥානාර්ථ බෞද්ධ සමාගමේ නායකයෝ බ්‍රිතාන්‍ය පාලකයන් ගේ ගෞරවය දිනාගත් පිරිසක් වූ හ. ඒ, 'සුදු සම' නිසා ම නො වේ. කර්නල් ඕල්කට්, නීතිඥයකු, ලේඛකයකු හා කෘෂි විද්‍යාඥයකු වශයෙන් විශාල කීර්තියක් හිමි කරගෙන සිටි පුද්ගලයෙකි. ඇනී බෙසන්ට් එංගලන්තයේ සුප්‍රසිද්ධ දේශපාලන නායිකාවක් වූවා ය. ජෝර්ජ් බර්නාඩ් ෂෝ විසින් කරන ලද විවාහ යෝජනාව ප්‍රතික්ෂේප කිරීම බෙසන්ට් මැතිනිය බර්නාඩ් ෂෝට වඩා ඉහළින් සමාජයේ පිළිගැනුණු බවට සාක්ෂියකි. ඇය ඉන්දීය ජාතික කොංග්‍රස් සභාවේ සභාපතිනිය ද වූවා ය. මෙපරිද්දෙන් සමාගමේ අනෙකුත් සාමාජිකයෝ ද අතිශය කීර්තිමත් පුද්ගලයන් ම වූවෝ ය. නවජීවන ව්‍යාපාරයේ නායකයන් වූ, පූජ්‍ය මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමි, ශ්‍රීමත් අනගාරික ධර්මපාලතුමා ආදීන් සතු නොවූ සුවිසල් ධන බලයක් ද ඔවුනට තිබුණි. එම නිසා සිංහල බෞද්ධයන් ගේ නවජීවන ව්‍යාපාරය ගොඩනැංවීමේ දී දේශීය නායකයන් අභිබවමින් ලංකාවේ සම්ප්‍රදායික ථෙරවාදී බෞද්ධ ආකල්ප මඩිමින්, තමන් පිළිගත් ක්‍රිස්තියානි සහ තන්ත්‍රයානික ආකල්ප සිංහල සමාජයේ තහවුරු කරන්නට පරම විඥානාර්ථ බෞද්ධ සමාගමේ විදේශීය නායකයන්ට හැකි විය. ඔවුන් ක්‍රිස්තියානි පාසල් අනුකරණය කරමින් ආරම්භ කළ බෞද්ධ පාසල් නිදසුනි. මේවා පරමාර්ථ, අධ්‍යාපනය හා විනය යන කරුණු අතින් මිෂනාරී ක්‍රමයටත්, මිෂනාරී පරමාර්ථයන්ටත් බිඳකුදු වෙනස් නොවූයේ ය. ඕල්කට් ඇමරිකානු වෙළෙඳ සම්ප්‍රදායේ පිහිටා වෙසක් පොහොය වෙසක් 'දිනයක්' කළේ ය. භක්ති ගී ගායනා සහ වීථි සංචාර ආරම්භ කළේ ය. බෞද්ධයනට බෞද්ධ ඇදහිලි පොතක් සම්පාදනය කළේ ය.

ආනන්ද විදුහල්පති ප්‍රිට්ස් කුන්ස් සහ මියුසියස් විදුහල්පතිනිය වූ මේරි මියුසියස් හිගින්ස් ආදීහු, මෛත්‍රය බෝසතාණන් පිළිබඳ විශ්වාසය ලාංකිකයන් අතර පැතිරවීමට

---

* වැඩි විස්තර සඳහා බලන්න, පෙරවදන, මහාචාර්ය එම්. යූ. ද සිල්වා, අනගාරික ධර්මපාල අප්‍රකට අත්ලිපි දෙ වන වෙළුම, (සං.ස්.) පූජ්‍ය දොඩන්දූවේ ධර්මසේන හිමි, රංජිත් අමරකීර්ති පලිහපිටිය, නාරද කරුණාතිලක, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ, (මුද්‍රණයේ ය.)

අප්‍රමාණ වෙහෙසක් දැරූ හ. එකල බෞද්ධ පාසල් පොතක් වූ, ඓතිහාසික කථා හෙවත් ගුත්තිල කථාව පොතේ පෙරවදනෙහි මේරි හිගින්ස් මෙසේ ලියන්නී ය.

"එක් බුදුවරයකු ලොව පහළව පිරිනිවන් පා හවුරුදු බොහෝ දහස් ගණනකට පසු තවත් බුදුවරයෙක් ලොව පහළ වෙයි. මෙසේ ගෞතම බුදුන් ගේ ශාසනය කෙළවරවූ පසු දැනට බුදුවීමට පෙරුම්පුරාගෙන එන බෝධිසත්ව තෙම මෛත්‍රය නමින් බුදු බවට පැමිණෙන්නේ ය.

ප්‍රේමණීය මව් වන මේරි මියුසියස් හිගින්ස්."[15]

ලාමා වහන්සේලා ඉසා පිළිබඳ ව දැන සිටි කරුණු

හෙමිස් ආශ්‍රමයෙන් නිකොලොස් නොටෝවිෂ් ලබාගත් ඉසානාථ සූත්‍ර කාණ්ඩය, පද්‍ය දෙ සිය හතළිස් තුනකින් (243) යුතු, කොටස් දහ හතරකින් (14) සමන්විත වූවකි. එහි අන්තර්ගත ලාමා වහන්සේලා ඉසා පිළිබඳ ව දැන සිටි කරුණුවලින් කොටසක් සංක්ෂිප්ත කර සටහන් කරමු.

1. ඊශ්‍රායලය නමැති සරුසාර භූමියේ විසූ ඊශ්‍රායල්වරුන්ට විශාල එළු, බැටළු හා ගව පට්ටි තිබුණි. එහෙත් ඔවුන් ගේ පාපී ක්‍රියා නිසා දෙවියෝ ඊශ්‍රායල් වාසීන් සමඟ කෝප වූ හ.

2. ඔවුන්ට තදබල දඬුවමක් ලැබුණි. ඔවුන් ගේ භූමිය, සතුන් පට්ටි සහ දේපල දෙවියන් විසින් ආපසු ගන්නා ලදි. ඊශ්‍රායලය ඊජිප්තුවේ පාරාවෝ රජුන් ගේ වහල් දේශයක් විය.

3. වැරදිවලට සමාව දී මෙම ශාපයෙන් මුදාලන්නැ යි ඔවුහු තම වංශයේ දෙවියන්ට කන්නලව් කළෝ ය.

4. අලුත් පාරාවෝ රජෙක් පත් විය. ඔහුට පුතුන් දෙදෙනෙක් වූ හ. එයින් බාලයා (මෝසා) යහපත් ගති ඇති කරුණාවන්ත මිනිසෙකි.

5. ඊශ්‍රායල් වහලුන්ට නිදහස ලබාදෙන ලෙස මෝසා පාරාවෝ රජු ගෙන් ඉල්ලා සිටියේ ය. මෝසා සමඟ උරණ වූ පාරාවෝ රජු, වහලුන්ට තව තවත් රළු ආකාරයෙන් සලකන්නට විය.

6. මේ අතර ඊජිප්තුව පුරා වසංගතයක් පැතිරෙන්නට විය. දහස් ගණන් ජනයා මිය යන්නට වූහ. තමන් අදහන දෙවියන් තමන්ට පීඩා පමුණුවන බව පාරාවෝ ගේ අදහස විය.

7. මෙය, පාරාවෝ කෙරෙහි උරණ වූ ඊශ්‍රායල්වරුන් ගේ දෙවියා ඊජිප්තියානුවන්ට කරන දඬුවමක් බව මෝසා පාරාවෝට ඒත්තුගැන්වී ය.

8. සියලු ම යුදෙව්වන් තමා ගේ නුවරින් පිටතට ගෙන යන්න යි පාරාවෝ රජ මෝසාට නියෝග කළේ ය.

9. ඊශ්‍රායල්වරුන්ට අහිමි වූ දේශය වෙත නැවත යාම නිසා මෝසා ඔවුන්ට නායකත්වය දුන්නේ ය.

10. සොලමන් රාජ්‍ය කාලය වන විට ඊශ්‍රායල් රාජ්‍යයේ බලය ලෝකයේ හැම දෙසට ම පැතිර ගියේ ය. ඊශ්‍රායල්වරු ධනවත් හා කීර්තිමත් ජාතියක් වූවෝ ය.

11. ඊශ්‍රායල්වරු තම දෙවියන් අමතක නොකළත් අවාසනාවකට මෙන් මෝසා පැනවූ නීති සංග්‍රහය අමතක කළ හ.

12. දෙවියෝ කෝප වූ හ. මිථ්‍යා දෘෂ්ටික රෝමවරු ඊශ්‍රායලය ආක්‍රමණය කර යටත් කරගත්තෝ ය. ඊශ්‍රායල්වරු රෝමවරුන් ගේ වහලුන් බවට පත් වූ හ.

13. ඔවුහු, හඬා වැලපෙමින් කළ වැරදිවලට සමාව දෙන්නැ යි දෙවියන්ට කන්නලව් කළ හ.

14. මෙම අවස්ථාවේ දී සානුකම්පිත දෙවියෙක් මනුෂ්‍ය වෙස්ගෙන මනුෂ්‍ය ලෝකයට පැමිණියේ ය.

15. ඊශ්‍රායල් දේශයේ පින්වත් දරුවෙක් උපන්නේ ය. හේ ඉසා ය.

16. දරුවා දෙවියන් පිළිබඳ ව කතාකරන්ට පටන් ගත්තෙන්, (විවිධ රටවලින්) සැදැහැවත්හු ඔහු දැකීමට පැමිණිය හ.

17. දරුවා ගේ වයස, ඊශ්‍රායල්වරුන් විවාපත් වන වයස වූ අවුරුදු දහ තුන වෙත් ම බොහෝ පොහොසත් කුලවත් පවුල්වල දෙමාපියෝ, ඉසා තම බෑණා කරගන්නට සිතූ හ.

18. ඉසා දෙමව්පියන් ගෙන් වෙන් වී යෙරුසලමෙන් පිටවී සින්ද් දෙසට යන වෙළෙඳ කණ්ඩායමකට එක්වූයේ ය.

19. වයස අවුරුදු දහ හතරේ දී ඉසා, සින්ද්හි නැගෙනහිර ප්‍රදේශයට පැමිණ සිටි අතර ජෛනයන් සමග විසූ ඔහු ගේ කීර්තිය එම ප්‍රදේශයේ පැතිර ගියේ ය.

20. ජෛනයන්, ඔවුන් සමග ඉන්නැ යි ඉසා ගෙන් ඉල්ලා සිටිය ද, හේ ඔරිස්සාව බලා ගියේ ය.

21. බ්‍රාහ්මණයෝ, ඔහු ඉතා සතුටින් පිළිගෙන වේදය, වෛද්‍ය ශාස්ත්‍රය, යෝග ශාස්ත්‍රය, ඉන්ද්‍රජාලය, යන්ත්‍ර මන්ත්‍ර ඈ සියලු ශිල්ප ඔහුට ඉගැන්වූ හ.

22. ඉසා, ජගන්නාත්, වාරනාසි, රාජග්‍රිහ ආදී පූජනීය නගරයන්හි සය අවුරුද්දක් වාසය කළේ ය.

23. ශුද්‍රයන්ට දේශනා කිරීම සහ ඔවුන් ඇසුරු කිරීම බ්‍රාහ්මණයන් ගේ අමනාපයට හේතුවූයෙන්, ඉසාට මරණ තර්ජන ඇති විය. එවිට හේ, කපිලවස්තුපුර හික්ෂූන් වෙත ගියේ ය.

24. ඉසා ටිබෙටයට පැමිණ ත්‍රිපිටකට හැදෑරුවේ ය. හාවනාවේ යෙදුණේ ය. හික්ෂුවක් වූයේ ය.

25. සදාකාල ජීවනය කුමක්ද යි දේශනා පවත්වමින් එතුමා, බටහිර බලා පිටත්වූ හ.

26. පා තබන හැම රටක දී ම මහත් ගෞරව සත්කාර ලැබූ ඉසාට පන්ජාබයේ දී කාශ්මීරයේ සිට පර්සියාව බලා යන වෙළෙඳ තවලමක් හමු විය.

27. පර්සියාවට පැමිණි ඉසා කෙරේ පර්සියානු පූජකයෝ බිය වූ හ. එම නිසා ඔවුන් ගේ ප්‍රශ්නවලට පිළිතුරු දීමටත් ඔවුන් සමග වාද කිරීමටත් එතුමාට සිදු විය. පර්සියානු වැසියන් ගෙන් බොහෝ ගරුබුහුමන් ලැබූ ඉසා පර්සියාවෙන් පිටත් වූයේ ය.

28. ඊශ්‍රායලයට පැමිණි එතුමාට තම රටවාසීන් අධර්මිෂ්ට පාලකයන් නිසා වේදනාවෙන් සිටින සැටි දුටුවේ ය. රටවැසියෝ වක්තෘවරයකු පැතුවෝ ය. ඉසා ඔවුන් ගේ ධර්ම පිපාසය සංසිඳවමින් නගරයෙන් නගරයට වැඩියේ ය.

29. ඉසා රාජ්‍ය පාලනය විවේචනය කරමින් මහජනයා කුපිත කරවන බව ප්‍රධාන නගරාධිකාරීහු යෙරුසලමේ පාලකයාට දන්වා යැවූවෝ ය.

30. ඉසා වසර තුනක් තිස්සේ ඊශ්‍රායලයේ ධර්ම චාරිකාවේ යෙදුණු අතර පිලාත් එතුමා ගැන සෙවිල්ලෙන් විසුවේ ය.

31. ඉසා ගේ ජනප්‍රියත්වය ගැන බියවූ පිලාත්, ඉසා අත්අඩංගුවට ගැනීමට ආඥාවක් නිකුත් කළේ ය. හේවායෝ, එතුමන් අත්අඩංගුවට ගෙන සිරමැදිරියකට දමා නොයෙකුත් ආකාරයේ ශාරීරික වධ හිංසා පැමිණවූ හ.

32. ආණ්ඩුකාරයා ගේ නියෝගය පරිදි ඉසා සහ තවත් සොරු දෙදෙනෙක් කණුවල බැඳ ඇණ ගසන ලද හ.

33. හිරු බැස යන විට ඉසා ගේ සිහිමූර්ඡා වී ගියේ ය.

34. යම් පුද්ගලයෙක් ඉසා ගේ දේහය ඒ අසල ස්ථානයක තැන්පත් කළේ ය.

35. ඊශ්‍රායල් දේශයේ සිදු කළ එම බිහිසුණු අපරාධය නිසා මිහිකත කම්පා වූයේ ය. දෙව්ලොව සසල වූයේ ය.

36. තුන් දිනකට පසු ව ඉසා ගේ දේහය එම ස්ථානයෙන් ඉවත් කර වෙනත් ස්ථානයක වැළලීමේ රාජ්‍ය නියෝගය ඉටු කිරීමට ගියෝහු, සොහොන විවෘත කර ඇති බව දුටුවෝ ය. ඉසා ගේ මළ සිරුර එහි නොවූයේ ය.[16]

නොටෝවිච් ඉසානාථ සූත්‍රය කියවා ඇති බව සනාථ කෙරෙන මොරවියානු මිෂනාරිවරයා ගේ දිනපොත

මහමදික සහ වෙනත් සාක්ෂිකරුවන් සපයන ඉසා පිළිබඳ තොරතුරු

යේසු පිළිබඳ ව තොරතුරු සපයන මහමදික මූලාශ්‍ර බොහෝ ය. කුරානය ද ඉන් එකකි.[17] 'යේසු අවුරුදු එකසිය විස්සක් ජීවත් වී ය යි මොහොමඩ්තුමා තමන්ට කියා ඇති බව මහමදාගමේ නිර්මාතෘවරයා වූ හස්රාට් මොහොමඩ් ගේ බිරිඳක වූ අයිෂා සිද්දික් පවසා ඇත්තේ ය.[18] මොහොමඩ්තුමා විවාහ කරගෙන සිටි කදීජා සහ අයිෂා උගත් ස්ත්‍රීහු වූ හ. එතුමාට නම් තම නම වත් ලියාගැනීමට තරම් උගත්කමක් නො තිබුණි.[19] ඔහු මැකාහි කව්බා දේවස්ථානය භාර ව සිටි අබ්ද් අල් මුතාලිබ් ගේ පුත් අබ්දුල්ලා ගේ පුත්‍රයා ය. මොහොමඩ් උපදින්නට ද පෙර පියා මිය ගිය අතර ඔහු ගේ වයස අවුරුදු නවයේ දී මව ද මිය ගියා ය. මුතාලිබ් සීයා විසින් ළමා මොහොමඩ් හදාවඩාගන්නා ලද අතර සීයා ද මිය ගියෙන් හේ සිය මාමා වූ අබුතාලිබ් ගේ රැකවරණයට පත් විය. අබුතාලිබ් 'පොළ රවුමේ' ගිය වෙළෙන්දෙකි. තරුණ වියට පත් මොහොමඩ් මැකාහි විසූ කදීජා නමැති හතළිස් පස් හැවිරිදි වැන්දඹුවක ගේ වෙළෙඳසලේ රැකියාවක් ලබා ගෙන පසු ව ඇ විවාහ කර ගත්තේ ය.[20]

විවාහයෙන් ගැහැනු දරුවන් සිව් දෙනකු ලැබුණි. මොහොමඩ්, දෙවියන් වහන්සේ ගේ නියෝජිතයා වුව ද ලැබුණු පිරිමි දරුවන් දෙදෙනා ම මිය ගිය හ. මොහොමඩ් ආගමික ජීවිතය කෙරෙහි දැඩි උනන්දුවක් දක්වූ අතර තමන්ට උරුම විය යුතු කව්බා දෙවොල ගැන සිතමින් හුන්නේ ය. දිනක් අල්ලා ඔහු ඇමතූ බව මොහොමඩ් කියයි.[21]

මෙම සිද්ධිය ද මෝසස් ගේ යොහෝවා හමුවට සමාන එකකි. ඔහු ටික දිනක් කල්පනා කරමින් සිට සිද්ධිය කදීජා සමඟ කීවේ ය. කදීජා ගේ සොහොයුරා, ඉබාන් නවුපල් නුවණක්කාරයකු ලෙස ප්‍රසිද්ධ ව සිටි පුද්ගලයෙකි.

"නුඹව සර්ව බලධාරී අල්ලා ගේ අනාගත වක්තෘ වශයෙන් පත් කරගෙන තියෙනව. බය වෙන්ඩ එපා" ඔහු කීවේ ය.

එදා පටන් මොහොමඩ්, තමා අල්ලා ගේ නියෝජිතයා

ලෙස සිතා කටයුතු කරන්නට වූයේ ය.

කදීජා ගේ මරණයෙන් පසු මොහොමඩ්, අයිෂා, හෆ්ෂා, සන්ඩා, ෂයිනබ්, උම්මු හබීබා, මාරි, ජුවනියා, ෂෆියා, උම්මා සලාම් යන කාන්තාවන් නව (09) දෙනකු පාවා ගත්තේ ය. මෙයින් අයිෂා හැර අන් සියල්ලෝ ම වැන්දඹුවන් වූ හ.

කුරානයේ සඳහන් ඉතිහාස පුවතින් අයිෂා සහ මොහොමඩ් සහ දෙදෙනා ම යේසු ගැන දන සිටි බව කියවෙයි. සුප්‍රකට අරාබි ලේඛක අබුහරයිරා සඳහන් කරන අන්දමට යේසු මියගියේ නැත. අල්ලා ගේ පිහිටෙන් යෙරුසලමෙන් පිටවූයේ ය.[22]

යේසු ගේ පලායාමේ ගමනට මරියා මාතාව, ඇගේ සොහොයුරිය සහ මරිය මගදලේනා ති දෙනා ද එක් වූ හ.[23] ඔවුහු බැබිලෝනියාවට ගොස් එහි සිට ගොඩබිම මාර්ගයෙන් නොගොස් මුහුදු මාර්ගයෙන් පර්සියාවට ඇතුළු වූ හ. යේසු පර්සියාවට ඇතුළුවූයේ යුසු අසාෆ් යන නමින් ය යි පර්සියානු ඉතිහාසඥයෝ කියති.[24] මීර් මොහොමද් සහ ෂායිඩ් ෂයික් උස් සදික් ලේඛකයන් දෙ දෙනා පලස්තීනයේ සිට පර්සියාවට පැමිණ ඉසා පිළිබඳ ව සඳහන් කර ඇතැ යි හසානියන් ලේඛන සාක්ෂි දක්වමින් පෙන්වා දෙයි.

අප්‍රධාන අපොස්තල්වරු

හීබෲ භාෂාවේ ෂාලියා යන වචනය වර්තමාන ඉංග්‍රීසි භාෂාවට පරිවර්තනය වී ඇත්තේ "අපොස්තල්වරුන්" යන තේරුම ඇති ව ය. අපොස්තල් යන වචනය හැඟීම්බර එකක් නොවන නිසා දෝ අපොස්තල්වරු "ශුභාරංචිකරුවන්" ලෙස ද හඳුන්වනු ලබති. ක්‍රිස්තියානි ඉතිහාසය ඉදිරිපත් කරන ශුභාරංචිකරුවෝ සතර දෙනෙක් වෙති. බයිබලයට පදනම දමන ලද්දේ ඔවුන් විසිනි. ශුභාරංචිකරුවන් ගේ සාක්ෂිවලට පටහැනි කිසිවක් විශ්වාස නොකිරීම රෝමානු කතෝලික සභා ඉතිහාසයේ චාරිත්‍රයක් විය. රෝමානු සභාව එබඳු තීරණයක පිහිටිය ද යේසුස් වහන්සේ අවසන් වරට යෙරුසලමට යාමට පෙර ප්‍රධාන අනුගාමිකයන් දොළොස් දෙනාට අමතර ව තවත් ශුභාරංචිකරුවන් හැත්තෑ

දෙනකු පත් කළේ ය.[25] යේසුස් වහන්සේට ඇණ ගැසීමේ යුගයෙන් පසු ව එතුමා ගේ ධර්මය ප්‍රචාරය සඳහා මොවුන් ගෙන් බොහෝ දෙනෙක් මහත් වෙහෙසක් දැරූ හ.

ජේම්ස් අපොස්තල්තුමා යේසු ගේ සොහොයුරෙකි. ඇණ ගැසීමෙන් පසු ව යේසු ගෙන ගිය ආගමික ව්‍යාපාරයේ මෙහෙයුම්කරුවා එතුමා වූයේ ය. ජේම්ස්තුමා පවසන පරිදි, "**ජෝකිම්** නාසරත්හි විසූ පොහොසත් ගොවියෙක් විය. ඔහු හනා නමැති කාන්තාව විවාහ කරගෙන සිටියේ ය. ඔවුනට දරුවන් නොසිටියෙන් ඔවුහු දරුවකු ලබාදෙන්නැ යි දෙවියන්ට කන්නලව් කළ හ. ගැහැණු දරුවකු උපන්නොත් ඇය දේවාලයට බාරදෙන බවට ඔවුහු බාර වූ හ. සුරදූතිකාවක් පැමිණ දෙවියන් හනාට දරුවකු ලබාදෙන බව දන්වූවා ය. හනා ගැහැනු දරුවකු ලැබුවා ය. ප්‍රදේශයේ ප්‍රධාන දේවාලය භාරකරු **ෂෙචරියා** නම් විය. ඔහු විවාහ වී සිටියේ හනා ගේ නැනන්ඩිය **එළිසබෙත්** සමඟ ය. ඇය ආරොන් ගේ පරපුරේ කාන්තාවක් වූවා ය. හනාට ලැබුණ ගැහැනු දරුවා **මරියම්** (හීබෘ මරියම් ග්‍රීක් භාෂාවට මරියා ය. ඉංග්‍රීසියෙන් මේරි ය) යනුවෙන් නම් කෙරිණි. බාරය පරිදි වයස අවුරුදු තුනේ දී මරියම්, එළිසබෙත් සිටි දේවාලයට බාර දෙන ලදි."[26] බයිබලයට අනුව දෙව්පියා ගේබ්‍රියල් නමැති සුරදූතයා මාර්ගයෙන් කන්‍යා මරියාට ඇ ගැබ් ගත් බව දන්වී ය.[27] හනා ගැබ්ගැන්වූ ගේබ්‍රියල් එළිසබෙත්ට ද ඇය ගැබ්ගන්නා බව දන්වී ය. එළිසබෙත් ගැබ්ගත් බව ඇසූ මහලු ෂෙචරියා විස්මයට පත් විය. බයිබලයේ සඳහන් මෙම පුවත හා ජේම්ස් අපොස්තල්වරයා පවසන තොරතුරු සසඳන විට බයිබල් රචකයන් ඉතිහාසය විකෘති කර ඇති බව වැටහෙයි. ජේම්ස් අපොස්තල් පවසන පරිදි යේසු උපදින විට මරියා ගේ වයස අවුරුදු දහ හතර (14)කි.[28] **ජෝන් ද බැප්ටිස්ට්** එළිසබෙත් ලැබූ දරුවා යි.[29] ගැබ්ගත් මරියා යෝසප්ට විවාහ කර දෙන ලද්දේ ෂෙචරියා විසිනි.[30]

විනාශයට හසුවූව ද පිටපතක් හෝ ඉතිරිවුණු අප්‍රධාන අපොස්තල්වරුන් ගේ කෘති කිහිපයක් වෙයි. **ඊජිප්ටියන්**, **නිකොඩමුස්**, **තෝමස්**, **ජේම්ස්**, **බර්නබස්**, **පීටර්**, **එබොයිනිට්ස්** හා **පිලිප්** අපොස්තල්වරුන් පිළිබඳ සාක්ෂි විද්‍යමාන ව ඇත්තේ

ය. මොවුන්'තරින් බර්නබස් යේසු ගේ ශිෂ්‍යයෙකි. මාක් ගේ මාමා ය. යේසු ගේ ධර්මය පැතිරවීමට මහත් වෙහෙසක් දැරුවෙකි. කොන්ස්ටන්ටයින් අධිරාජයා පැවැත්වූ **නිසොයින් කවුන්සලය*** බර්නබස් ගේ සියලු ම ලේඛන පිටපත් විනාශ කිරීමටත් පිටපත් ළඟ තබාගන්නෙකුට මරණ දඬුවම දීමටත් තීරණය කළේ ය. බර්නබස් ගේ ලේඛනවල සියලු ම පිටපත් විනාශ කරන ලද අතර පසු කලෙක ඔහු ගේ සොහොන හෑරීමේ දී ඔහුත් සමඟ වළලා තිබූ ලේඛනයක අත්පිටපතක් හමු වී ඇත.[31]

ටැටියොන් අපොස්තල්වරයා ඔඩෙස්සාවේ විසූවෙකි. එතුමා අපොස්තල්වරුන් ගේ තොරතුරු රැස්කරමින් බයිබලයක් සම්පාදනය කළේ ය. අපොස්තල්වරුන් පස් දෙනකු පිළිබඳ විස්තර රැස්කර ගැනීමට එතුමාට හැකි විය. නිසොයින් කවුන්සලය ටැටියොන් ගේ බයිබලයේ සියලු ම පිටපත් රැස්කර ගිනි තැබීමටත් පිටපත් ළඟ තබාගන්නනට මරණ දඬුවමත් නියම කළේ ය. ටැටියොන් බයිබලය, මරණයෙන් ගැළවුණු යේසු එතුමා ගේ මව හා අනුගාමිකයන් හමු වූ සැටි හෙළිදරව් කිරීම හේතුව යි.[32]

"ඇක්ටා තොමේ" (Act of Thomas) යනු තෝමස් ඉන්දියාවේ සිට එවන ලදුව ඊජිප්තුවේ දී සොයා ගැනුණු ලිපි එකතුවකි.[33] යේසුස් වහන්සේ ගේ සමීපතම ඥාතියකු බව පැවසෙන තෝමස් ක්‍රිස්තියානියකු නොව එසීන්ස්වරයෙකි.[34] යේසුස් වහන්සේ ගේ අනුගාමිකයකු වූ මොහු ගේ මුල් නම යුදාස් ය. මොහු යේසුස් වහන්සේ ගේ සොහොයුරකු විය හැකි ය. යේසුස් වහන්සේ ගේ උපදෙස් පරිදි උන්වහන්සේ ගේ බෞද්ධ පණිවිඩය ඉන්දියාවේ විසිරී සිටි යුදෙව්වන් වෙත ගෙන ගිය තෝමස් දකුණු ඉන්දියාවේ

---

* ආරියස් නමැත්තකු යේසුස් වහන්සේ සහ දෙවියන් වහන්සේ ගේ පුත්‍රයා යනු දෙදෙනකු බව කියා සිටියේ ය. ක්‍රිස්තියානීන් අතර මේ පිළිබඳ ව මහත් ආන්දෝලනයක් ඇති විය. මෙය විසඳාගැනීම පිණිස ක්‍රි. ව. 324 දී කොන්ස්තන්තිනෝපල් නගරයෙන් සැතපුම් 58ක් දුරින් පිහිටි කොන්ස්ටන්ටයින් අධිරාජයා ගේ නිජබිම වූ නිසියා (Nicea) නම් නගරයේ දී කොන්ස්ටන්ටයින් අධිරාජයා ගේ මූලිකත්වයෙන් පවත්වන ලද සම්මේලනය නිසොයින් කවුන්සලය නමින් හැඳින් වේ. මෙහි දී යේසුස් වහන්සේ සහ දෙවියන් ගේ පුත්‍රයා යනු එක ම තැනැත්තකු බව තීරණය කෙරිණි.[35]

දී මිය ගියේ ය. තෝමස්ට තක්ෂිලාවේ දී ඊශ්‍රායලයෙන් පලා ආ යේසු හමුවූ විස්තර එතුමා ගේ ලිපිවල අන්තර්ගත ය. යේසු එතුමා ගේ මව මරියා හා මගදලේනා සමඟ පෙරදිග බලා ඒම පිලිප් ශුභාරංචිකරුවා ද විස්තර කරයි. රෝමානු පල්ලිය පිලිප් ශුභාරංචිකරුවා ගේ ලේඛන තහනම් කිරීමට වෙනත් හේතුවක් අවශ්‍ය නොවේ.

අප්‍රධාන අපොස්තල් ග්‍රන්ථ රෝම පූජකයන් විසින් සකසන ලද ප්‍රධාන අපොස්තල්වරුන් ගේ කතාවලට වඩා නිර්ව්‍යාජ ය. යේසුස් වහන්සේ හාස්කම් කළ අද්භූත පුද්ගලයකු නොව සාමාන්‍ය මිනිසකු බව ඔවුහු කියති. පෘථිවියේ අද්භූත මිනිසුන් පහළ වූයේ හෝ පහළ වන්නේ හෝ නැත. රෝමානු පල්ලිය පිළිගන්නේ රෝමයේ නිෂ්පාදිත හාස්කම් දක්වන යේසු චරිතය පමණි. ක්‍රිස්තියානි ඉතිහාසයේ අප්‍රධාන අපොස්තල්වරුන්ට සිදු වී ඇති ලොකු ම අසාධාරණය නම් යේසුස් වහන්සේ වෙනුවෙන් ජීවිත පරිත්‍යාගයෙන් කටයුතු කළ එතුමන්ලා පසෙකලා යේසුස් වහන්සේ ඇසින් හෝ නොදක උන්වහන්සේ ගේ ව්‍යාපාරයේ නායකත්වය ගත් සෝල් විසින් නිර්මාණය කරන ලද ක්‍රිස්තියානි ආගමේ පූජකයන් ඔවුන් ගේ සත්‍ය අසත්‍යතාව තීන්දු කිරීම යි. පුරාණයේ සෝල් සැබෑ අපොස්තල්වරයකු ද යි කිසියම් අපොස්තල්වරුන් පිරිසක් ප්‍රශ්න කළ අවස්ථාත්, සෝල්, අපොස්තල්වරුන් බොරුකාරයන් ය යි කියමින් තමා නිවැරදි අපොස්තල් බව කී අවස්ථාත් තිබුණි.[36]

ඓතිහාසික මූලාශ්‍රයන්හි යේසුට නම් කිහිපයක් ඇත. එතුමාට උත්පත්තියෙන් දෙවියන් ගේ පුත්‍රයා යන ඇරුත ඇති ඉම්මානුවෙල්* යන නම තබා ඇත්තේ ය. පැරණි ලේඛනවල එතුමා යොසුවා නමින් ද තවත් සමහර අවස්ථාවන්හි දී දෙවන යොසුවා නමින් ද හඳුන්වා තිබේ.[37] යුදෙව්වන් ගේ දෙවියා පැරණි ම ලේඛනවල හඳුන්වන්නේ යාවේ නමිනි. පරණ තෙස්තමේන්තුවේ එක් ස්ථානයක පමණක් යොහෝවා ලෙසින් සඳහන් කරයි. යොසුවා යන්නෙන් යාවේ ගේ පුත්‍රයා නැතිනම් යොහෝවා ගේ පුත්‍රයා යන්න අර්ථවත් වූවා විය හැකි යි. යම්කිසි සිද්ධියක් පසුබිම් කරගෙන පුද්ගලයන්ට අන්වර්ථ නම් පටබැඳීම හැම සමාජයකට ම පොදු ලක්ෂණයකි. අරාබි හා ටිබෙට් ලේඛනවලට අනුව එතුමා ඉසා ය. ඉසා යන්නෙහි අරුත සෘෂි යන්න යි. යේසු උර්දු හා පර්සියන් වහරේ දී යුසු වන්නේ ය. යුසු සමඟ අසාප් යන නම යොදා ඇත්තේ ගෞරවාර්ථයෙනි. පර්සියානු ඉතිහාසඥයන් විස්තර කරන පරිදි, පර්සියාවේ කෙටි කලක් වාසය කළ යුසු අසාප් තක්ෂිලාව වෙත ගියේ ය.[38]

යේසුස් වහන්සේ පලස්තීනයෙන් පිටත්වීමට පෙර තෝමස් කාශ්මීරය වෙත පිටත් කර යැව්වේ ය. යේසුස් වහන්සේ ගේ අනුගාමිකයකු වීමට පෙර ඔහු දක්ෂ වඩුවකු හා ගෘහ නිර්මාණ ශිල්පියකු ද වූයේ ය. එතුමා යුදෙව් වෙළෙඳ නායකයකු වූ අබාන් සමඟ එක්ව හෝමුස්වලට ගොස් එතැනින් නැව් නැඟී සින්ද්වලට පැමිණියේ ය. අබාන්, අබ්ඩගාසේස් නමැති ග්‍රීක වෙළෙඳ නායකයාට තෝමස් හඳුන්වා දුන්නේ ය. අබ්ඩගාසේස්, තෝමස්ව ගොන්දපාරස් (ක්‍රි. ව. 21 - 50) රජතුමන් වෙත කැඳවාගෙන ගියේ ය. ගොන්දපාරස්, ඉන්දු-ග්‍රීක රජ කෙනෙකි. තක්ෂිලාවේ මාලිගාවක් ඉදිකරමින් සිටි ඔහු, මාලිගාවේ ගෘහ නිර්මාණ කටයුතුවලින් කොටසක් තෝමස්ට භාර කළේ ය.[39] තෝමස් පිළිබඳ ඓතිහාසික සටහන් පරීක්ෂා කරන විට පැහැදිලි වන කරුණක් වන්නේ එතුමා ගේ කාශ්මීර ගමන රහසිගත එකක් වූ බව යි. යේසුස් යටතේ පැවිදි ව සිටි එතුමා උපැවිදි පුද්ගලයකු ලෙස ගමනේ යෙදී ඇත. තක්ෂිලාවේ පුරාවිද්‍යා කැනීමක දී, ඇරමයික් භාෂාවෙන් ලියවුණු ශිලා ලිපියක් හමු විය. 'දෙවියන් ගේ පුත්‍රයා ගේ අනුගාමික, ගෞරවනීය සම්මාන ලැබූ විදේශීය ගෘහ නිර්මාණ ශිල්පියා විසින් මෙම මාලිගාව නිමකරවන ලදි' යනුවෙන් එහි සඳහන් වේ. පුරාවිද්‍යාඥයෝ, තක්ෂිලාවේ කැනීම්වලින් තෝමස් ගේ ය යි අනුමාන කෙරෙන රූප තහඩුවක් ද සොයා ගත් හ.[40]

කාශ්මීරයේ ශ්‍රී නගර්වලට නුදුරු පෙහෙල්ගම්හි (පෙහෙල්ගම් යන්නෙහි අර්ථය යහපත් එඬේරුන් ගේ ගම්මානය යන්න යි.) මෙහි අසාප් නමැත්තකු ගේ සොහොනක් තිබේ. පර්සියානු ඉතිහාසඥයන් පවසන පරිදි සොහොන ස්ථිර වශයෙන් ම යේසුස්

---

* Immanuel=God is with us, Who's who in the Bible, Readers Digest Associations, NY, 1994.

වහන්සේ ගේ ය.[41] බෞද්ධ චාරිත්‍රයක් අනුව, බෝධිසත්වවරයකු ලෙස සලකා, යේසු ගේ සොහොන මත තබා ඇති එතුමා ගේ පතුල් පිහිටුවූ ගලක් ද දක්නට ලැබේ. යේසු තුමා ගේ පරපුරෙන් පැවතෙන්නෝ කාශ්මීරයේ දනටත් වෙසෙති. මහමදාගමිකයන් බවට පත්කර ඇති ඔවුහු, යුසු අසාප් නාමය ගෝත්‍ර නාමයක් වශයෙන් දනුදු භාවිතා කරති.

හින්දුන් ගේ ලේඛනවල ද යේසු ගැන සඳහන් වේ. 1910 වර්ෂයේ බොම්බායේ ප්‍රකාශයට පත්, ක්‍රි. ව. 115 දී රචිත බවිෂ්‍ය මහා පුරාණය නමැති සූත්‍රාවලිය මෙහිලා නිදසුන් කොට දැක්විය හැකි ය. එහි, කාශ්මීරයේ විසූ ඉසා නමැති තවුසකු පිළිබඳ තොරතුරු අන්තරගත වේ. කාශ්මීරයේ මහාරාජා ගේ නිවෙසේ තිබී සොයා ගන්නා ලද සංස්කෘත භාෂාවෙන් රචිත බවිෂ්‍ය මහා පුරාණයේ මෙසේ සඳහන් වේ.

"තම පිය රජතුමා ගෙන් පසු රාජ්‍යය ලබාගත් වික්‍රමාදිත්‍ය රාජයා ගේ මුණුබුරු ශාලිවාහනයෝ, ශකයන් පරාජය කළ හ. චීන, බැක්ට්‍රියා, පර්සියා, මොංගෝල, රෝම සහ කොරාසන් හමුදා සමහ යුද වැද ඔවුන් ගේ හමුදා පළවා හරිනු ලැබූ හ. එතුමා, සින්දු ගංගාව ආර්යයන් ගේ සහ ම්ලේච්ඡයන් ගේ රාජ්‍ය සීමා මායිම බවට පත් කළ හ. මෙම ජයග්‍රහණයෙන් පසු දකුණේ යුද සඳහා එතුමා පිටත්වූ කාලයේ ශක රජතුමා හිමාල ප්‍රදේශයට පැමිණිය හ. එහි දී එතුමාට සුදු සිවුරක් පොරවාගත් විදේශීය තාපසයකු හමුවිණි. ඔහු ගේ දර්ශනයෙන් විශ්මයට පත් රජතුමා, "ඔබ කවුරුන්දැ" යි තාපසයා ගෙන් විමසූ විට, "මහරජතුමනි, මම කන්‍යා කුසයෙන් උපන් ඊශ්වර පුත්‍ර (දෙවියන් ගේ පුත්‍රයා) වෙමි" යි තවුසා පිළිතුරු දුන්නේ ය."[42]

නාථ නාමාවලිය[43] නමැති හින්දු සූත්‍රයේ සඳහන් අන්දමට "වයස අවුරුදු දහ හතරේ දී ඉසා නාථ භාරතයට ආවේ ය. ආපසු සිය රටට ගිය එතුමා දේශකයකු ලෙස කටයුතු කරන්නා විය. යුදෙව්වෝ ඔහු අල්ලා ඇණ ගැසූ හ. ඉසා නාථ සමාධිගත විය. සොහොන් පල්ලන් ඉසා මියගිය බව තීරණය කළ පසු ඒ සිරුර ගුහාවක තැන්පත් කර වසා දමන ලදි. යුදෙව්වන් කෙරෙහි දෙවිවරුන් කෝප වූයෙන් අහස කළුවර වී විදුලිය හා මේඝ

ගර්ජනා ඇති වී පරිසරය බියජනක එකක් බවට පත් විය. චේතන් නමැති ඉසා නාථ ගේ ගුරුවරයා සොහොන වෙත ගියේ ය. ඔහු, ඉසා සොහොනින් එළියට ගෙන සමාධියෙන් ඉවත් කරවා ගත්තේ ය. ඉන්පසු ඔවුන් දෙදෙනා ම හිමාල ප්‍රදේශයේ පූජනීය භූමිය වෙත ආහ."

නාථ යෝගීහු අදටත් ඉන්දියාවේ සිටිති. පරමහංස යෝගීන් නමින් හැදින්වෙන ඔවුන් පැහැදිලි කරන ලෙසට නාථ යෝග විද්‍යාව ප්‍රගුණ කළ යේසුට ලී කදේ ඇණ ගැසීම බඳු දඬුවමකට මුහුණදීමේ ආත්ම ශක්තිය තිබුණි. සමාධියට සමවැදුණු යේසුට තම සිරුරට ඇණ ගසන බව නො දනුණි. වර්තමානයේ ද, නාථ යෝගීහු මෙබඳු අපූර්ව ක්‍රියා පිළිබඳ ව ප්‍රසිද්ධියක් ලබා සිටිති. නාථ යෝග විද්‍යාව ප්‍රගුණ කළ යෝගීහු, විසඳ කිරීමකින් හෝ මත්ද්‍රව්‍ය භාවිතයකින් හෝ තොර ව සමාධි බලයෙන් ශල්‍යකර්මවලට මුහුණ දෙති.

කාශ්මීරයේ ඓතිහාසික ග්‍රන්ථය ලෙස පිළිගැණෙන ක්‍රි. ව. 1148 දී රචිත කල්හාන ගේ රාජතරංගණී නමැති සංස්කෘත ග්‍රන්ථය එරටේ පැරණි ඉතිහාස පුවතක් මෙසේ සඳහන් කරයි.

"ඉසනා නමින් අති ප්‍රසිද්ධ ශාන්තුවරයෙක් ඩල් ගංගාව අසල ඉසබාර්හි විසුවේ ය. ඔහුට බොහෝ ශිෂ්‍යයන් සිටි අතර ප්‍රධාන ගෝලයා සව්දිමතී විය. සියලු රටවැසියෝ, සව්දිමතී ඔවුන් ගේ රාජ්‍යය හෙබවීමට සුදුස්සා බව කී හ. භීතියට පත් නපුරු රජතුමා, සව්දිමතී කුරුසියේ ඇණ ගැසුවේ ය. මෙය ඇසූ ඉසානා එහි ගොස් සව්දිමතී ගේ නාසයට සුවඳ තෙලක් පිම්බේ ය. තුන් දිනකින් සව්දිමතීට සිහිය ලැබුණි."[44]

කාශ්මීර ඉතිහාසයේ සඳහන් වන එක ම කුරුසියේ ඇණ ගැසීමේ කතාව මෙය යි. එහෙත්, කුරුසියේ ඇණ ගසා මරා දැමීමේ දඬුවමක්, කවර කලෙක වත් එ රටේ නො පැවතිණි. කල්හාන, කාශ්මීරයේ යුදෙව් ජනයා දන සිටි කිසියම් ඉතිහාස පුවතක් ලේඛන ගත කර ඇති බව ඉතිහාසඥයන් ගේ අදහස යි.

ඇෆ්ගනිස්ථානයේ ඉසා මුස්ලිම් නමැති මහමදික සමාජයක් ඇතැ යි ෆීඩා හස්නේන් සඳහන් කරයි. ඔහු විස්තර කරන ලෙසට ඉසා මුස්ලිම්වරුන් වෙසෙන ගම්මාන ගණනාවක් ම

ඇෆ්ගනිස්ථානයේ බටහිර ප්‍රදේශයේ හෙරාට් සමීපයෙහි වෙයි. ස්වාධීන ගෝත්‍රයකට අයත් වන මොවුහු, මහමදිකයෝ වෙති. ඉසා මුස්ලිම් ගෝත්‍රයේ නායකයා පවසන පරිදි ඔවුන් ගේ මුල් ම පරම්පරා වාසය කර ඇත්තේ කාශ්මීරයේ ය. ඔවුන් ගේ ආදි පුරුෂයා මරියාම් ගේ පුත් ඉසා ය. ඔවුන් දන්නා පරිදි, දෙවියන් වහන්සේ අල්ලා ය. ඉසා අල්ලා විසින් පත් කරනු ලැබුවෙකි.[45] ෆීඩා හසානියන් සඳහන් කරන මුස්ලිම් සමාජය වනාහි මහමදික ආක්‍රමණ මගින් අනන්‍යතාව සිඳදැමූ යුදෙව්වෝ ය.

යුදෙව් බෞද්ධයන් හෙවත් එසීන්ස්වරු

ඊශ්‍රායලයේ ජෝදාන් ගංගාවට බටහිරින් පිහිටි විශාල බෑවුම් ඇති කඳුකර භූමිය කනානය යි. කනාන් කඳුකර රාජ්‍යය පුරාණයේ පටන් ම ආසියාව හා ඊජිප්තුව යා කළ සංස්කෘතික මධ්‍යස්ථානයක් වූයේ ය. එහි ඉන්දු ආර්ය ගෝත්‍ර විසුවෝ ය. ඉන්ද්‍රගුත්ත, බිර්සවාස, පුලතිසි ආදී කනානයේ ඉන්දු ආර්ය රජවරුන් ගේ නම් වැලක් ඊජිප්තු ලේඛන අතර වෙයි.[46]

බානි ඊශ්‍රායල් වංශයේ ආදි පුරුෂයා ඌර් නගරයේ විසූ ආබ්‍රහම් ය. ඉසාක් ඔහු ගේ පුත්‍රයා යි. ඉසාක් ගේ පුත් ජාකොබ්ට විවාහක හා අවිවාහක භාර්යාවන් ගෙන් පුතුන් දොළොස් දෙනෙකු ලැබුණි.[47] කණ්ඩායම් දොළහක් සදාගෙන වෙන් ව ගිය මොවුන් දොළොස් දෙනා අපරදිග ඉතිහාසයේ ඊශ්‍රායලයේ දරුවන් වශයෙන් හැඳින්වේ. පෙරදිග ජනවහරට අනුව බානි ඊශ්‍රායල්වරු වෙති. තැනින් තැන ඇවිදිමින් සංචාරය කළ මොවුන් ගෙන් කණ්ඩායම් නවයක් හෝ දහයක් හෝ කනානයේ රාජධානි පිහිටුවා ගත් හ. ප්‍රදේශයේ තවත් ගෝත්‍ර රාජධානි තිබුණි. එකිනෙකා යුධ කරගනිමින් ඇණකොටා ගනිමින් සිටි ඔවුන් ගේත් ඉන්දු ආර්යයන් ගේත් රාජධානි නිතර සතුරු ආක්‍රමණවලට ගොදුරු විණි. ඇසිරියන්වරු, බැබිලෝනියන්වරු, පර්සියන්වරු, ග්‍රීක්වරු සහ ඊජිප්තියානුවෝ කනානය ආක්‍රමණය කර ඇත්තා හ. සෑම ආක්‍රමණයකින් පසු ව ම ජුදා කණ්ඩායම බානි ඊශ්‍රායල්වරුන් අතුරින් නැවත හිස එසවීම ඓතිහාසික සිද්ධියකි. යුදෙව් ආගම

හා නාම ඇති වූයේ යුදා නමැති කණ්ඩායම සිහි කරමිනි.[48]

ජාකොබ් ගේ පුතුන් දෙ දෙනෙක් හෝ තුන් දෙනෙක් හෝ ඔවුන් ගේ කණ්ඩායම් සමඟ කනානය හැරදා වෙනත් රටක් සොයමින් සංචාරයක නිරත වූ හ. මොවුන් ඊජිප්තුව, පර්සියාව හරහා කාශ්මීරය දක්වා පැමිණියේ අතරමග නැවතුණු ස්ථානවල නිවාස පිහිටුවමිනි. බානි ඊශ්‍රායල්වරුන් ගේ සංචාරක දිවිපෙවෙත කාශ්මීරයෙන් අවසන් නො විණි. වර්තමාන ගවේෂණවලට අනුව ඔවුන් ගේ පිරිස් දකුණු ඉන්දියාවේ තමිල්නාඩුව දක්වා පැමිණ ඇත. පැරණි දේශාටන වාර්තාවල අනුරාධපුරයේ විසූ යුදෙව්වන් ගැන සඳහන් වේ.[49] අපට වැටහෙන පරිදි බානි ඊශ්‍රායල්වරු ලංකාවට ද පැමිණ ඇත්තෝ ය.

පාරාවෝ රජවරු කනානය ආක්‍රමණය කර යුදෙව්වන් පරාජය කළ හ. පැරදුණු යුදෙව්වන් දහස් ගණනකට, වහලුන් වශයෙන් ඊජිප්තුවට යාමට සිදු විය. මෙසේ පරණ ගිවිසුමේ සඳහන් ඊජිප්තුවෙහි විසූ යුදෙව් වහලුන් පිළිබඳ කතාව ඊජිප්තු ඉතිහාසයෙන් ද තහවුරු වෙයි. එමතු නොව ටිබෙටයේ ඉසානාථ සූත්‍රය මඟින් ද එය සනාථ වෙයි. ඊජිප්තුව යුදෙව් වහලුන් ගෙන් පිරී ගියේ පාරාවෝ රජවරුන් කනානය ආක්‍රමණය කර යුදෙව් වහලුන් තම රටට ගෙනා බැවිනි. ඔවුන් ගේ අන්තරාගාමීන්ට කනානය නමැති තම මුතුන්මිත්තන් ගේ රාජ්‍යයට යාමට වුවමනා විය. පරණ ගිවිසුමට අනුව, යුදෙව් වහලුන් වහල්බවින් මුදාගෙන ඊජිප්තුවෙන් පිටතට කැඳවාගෙන යන්නේ මෝසස් නමැති වහලකු විසිනි. ඉසා නාථ සූත්‍රය පවසන්නේ, මෝසස්, පාරාවෝ රජු ගේ බාල පුතා බව යි.[50] මිසරයේ පාරාවෝ හා රෝම අධිරාජයන් සතු බිසෝ මාලිගා තිබුණි. ඔවුන් ගේ අන්තඃපුරයන්හි යුදෙව් සහ වෙනත් නොයෙකුත් ජාතීන්ට අයත් බිසෝවරු විසූ හ. මෝසස් යුදෙව් බිසවක ගේ දරුවකු විය හැකි ය. ඔහු වැඩුණේ පාරාවෝ රජ බිසවක ගේ රැකවරණයේ ය.[51] ඔහු වහලුන්ට නායකත්වය දුන්නේ තමා යුදෙව්වකු ලෙස පිළිගනිමිනි. පාරාවෝ අධිරාජයාට මෝසස් තර්ජනයක් වීමත් එකල ඊජිප්තුව පුරා පැතිරී ගිය වසංගතත් නිසා යුදෙව්වන් සමඟ රටින් පිටවීම පිණිස ඔහුට අධිරාජයා වෙතින් අවසර ලැබුණු බව ඉසානාථ සූත්‍රය අනුව සිතිය හැකි ය.[52]



යේසුස් වහන්සේ ගේ සොහොන මත පිහිටුවා ඇති පතුල් සටහන



යේසුස් වහන්සේ ගේ සොහොන පිහිටා ඇත්තේ මෙතුළ ය

මෝසස් යුදෙව්වන් සමඟ ඊජිප්තුවේ සිට කනානය වෙත ආ විට එහි වෙනත් ගෝත්‍ර බලවත් වී සිටිය හ. මෝසස් ගේ [illegible] 'නැතිවූ රම්‍ය දේශය' සොයාගැනීමට හතළිස් අවුරුද්දක් ගතවූයේ, කනානය අත්පත් කරගෙන සිටි ගෝත්‍ර සමඟ දීර්ඝ වශයෙන් යුද්ධ කරන්නට සිදු වූ බැවිනි. මෙම යුද්ධවල දී මෝසස්, යුද්ධාධිපති යොහෝවාට යාඥා කරමින් යුදෙව්වන් මෙහෙයවූයේ ය. රම්‍ය භූමිය සඳහා කළ සටන් නිසා යොහෝවා, හින්දූන් ගේ ඉන්ද්‍ර මෙන්, යුද්ධාධිපති දෙවියෙක් ද වූයේ ය. මෝසස් ගේ පරම්පරාව සතුරන් නසා ඊශ්‍රායලය ඉදිකර බොහෝ කලකට පසු ව එම රාජ්‍යය වෙනත් අධිරාජයකුට යටත් වූ අවස්ථාවක යුදෙව් අනාගත වක්තෘවරයකු වූ ජෙරමියා, යොහෝවාට කරන පහත සඳහන් කන්නලව්ව බඳු යාඥා සෘග් වේදයෙහි බහුල ව තිබේ.

"ස්වාමීන් වහන්ස, අපට සිද්ධ වී ඇති දේ බලන්න. අප ලබනා නින්දා ගැරහුම්වලට සවන් දෙන්න. අපේ උරුමය අන්‍යයන්ට අයිති වී තිබේ. අපේ නිවාසවල අන්‍යයන් පදිංචි වී තිබේ. අපි [illegible] කවුරුවත් නැති ව අනාථ වී සිටිමු. පියා නැති ව අසරණ දරු කැළක් වී සිටිමු. අපේ මව්වරු වැන්දඹුවන් වී සිටිති. අපි අපේ ම ජලය මුදලට ගෙන බොමු. අපි අපේ ම දර මුදලට අරගන්නෙමු. අපේ පැවැත්මේ අවසානය පැමිණ ඇත. ස්වාමීනි අපව මේ ලෙස අමතක කර සිටින්නේ මන්ද? ඔබතුමා අප අතහැර කොයි තරම් කාලයක් ගෙවුණා ද? අපට සමාවී අප නැවත ඔබ වෙත කැඳවාගන්න. පුරාණයේ මෙන් නැවතත් අපට සතුටින් හා සාමයෙන් ජීවත්වීමට පිහිට වන්න."[53]

සෘග් වේදයෙහි මෙසේ සඳහති.

" බලසම්පන්න දෙවියනි, දස්යුන් දැන් අප හැම පැත්තකින් ම වට කරගෙන සිටිති. ඔවුන් ගෙන් අප ගලවා ගන්න. ඔවුන් ගේ ගම් ගිනි තබන්න. ජල කොටු විසුරුවා හරින්න. පූජා නොපවත්වන ඔවුහු මනුෂ්‍යයෝ නොවෙති. සතුරන් නසනා [illegible], ඔවුන් මරන්න.

"අහෝ අග්නි ඔබ කොහේ බලා සිටින්නේ ද? පිශාචයෝ [illegible] අප අතරෙහි හොල්මන් කරති. උන් විද මරන්න. අපේ [illegible] අපේ අසුන් පමණක් නොව මිනී මස් ද කන උන් විද මරන්න."[54]

'යොහෝවා ගේ ආධාර ඇති ව' මෝසස් විසින් මෙහෙයවන ලද හමුදාව ඊශ්‍රායල් රාජධානිය පිහිටුවූයේ ය. දාවිත්, සලමන් වැනි පසුකාලීන යුදෙව් රජවරු ඊශ්‍රායලයේ දේශසීමා විශාල කරමින් කනානයේ සියලු ම උප රාජධානි ඊශ්‍රායලයට එක් කරගත් හ. ඉන් පසු ව බලසම්පන්න යුදෙව් රාජ්‍යයේ උතුරු ප්‍රදේශය ඊශ්‍රායලය ලෙසින් ද කනානය පිහිටි දකුණු යුදා (Juedah) ලෙසින් ද නම් කෙරිණි. ක්‍රි. පූ. 63 දී යුදාව රෝමවරුන් යටතට පත් විය. යුදා නම මකා එය පලස්තීනය ලෙසින් නැවත නම් කරන ලද්දේ රෝමවරුන් විසිනි.[55]

කනානයේ ඉන්දු ආර්ය ගෝත්‍රික රාජධානි පැවති සමයේ එහි වැසියෝ ආර්ය දෙවිදේවතාවියන් වන්දනා කළ හ. ශක්ති, අග්නි පූජා ද බලි යාග ද පැවැත්විණි. එහෙත් යුදෙව් ආගමට අනුව වෙනත් කිසිදු ආගමක් නොඉවසිය යුතු ය. පරණ ගිවිසුමේ සඳහන් පරිදි යොහෝවා මෝසස්ට මෙසේ කියා තිබේ.

"ප්‍රතිමා රූප සාදා නොගන්න. කැපූ පිළිමයක් වත්, රූප කණුවක් වත් සිටුවා නොතබන්න. පුද පූජා සඳහා කැටයම් ගලක් වත් නොතබා විනාශ කරන්න. ඒවා අනුන් ගේ ය. තුඹලා ගේ දෙවි ස්වාමි මම ය..... තුඹලා මගේ කියමනට ඇහුම්කන් නොදී හැසිරෙන්නාහු ද, එවිට මම තුඹලා ගේ උස්තැන් විනාශ කරමි. සූර්ය රූප බිඳහෙළමි. දේවරූප කැබලි කරමි. තුඹලා මළකඳන් කරමි."[56]

දේවගැතිවරුන්ට යොහෝවා ගේ අණ එලෙසින් ම ඉටු කළ නොහැකිවූ අවස්ථා ද තිබුණි. යුදෙව් රජවරු වෙනත් ජාතික බිසෝවරුන් පාවාගත් අවස්ථාවන්හි දී එම බිසෝවරුන් සමඟ ඔවුන් ගේ ඇදහීම් ද රට තුළට පැමිනුණි. යෙරුසලමේ සූර්ය දේවාල ගොඩනැංවූ යුදෙව් බිසෝවරු සිටිය හ. වෙනත් රටවලින් පැමිණි වෙළෙඳුන් සහ සංස්කෘතික දූතයින් මැඩීම ද අපහසු කාර්යයක් විය. වෙනත් ආගම් හා දර්ශන ඇදහූ යුදෙව්වෝ විශාල පිරිසක් ඊශ්‍රායලයෙන් පිට රටවල විසුවෝ ය. බලගතු අධිරාජයන් යුදෙව් දේශයට ආගමික හා සංස්කෘතික දූත කණ්ඩායම් එවූ අවස්ථා ද තිබුණි. භාරතයේ අශෝක රජතුමා, මැසිඩෝනියාව, ග්‍රීසිය හා කනානය යන රටවලට ධර්මදූත

කණ්ඩායම් එවීම නිදසුනකි.[57]

යේසු උපදින විට ද පලස්තීනය නොයෙකුත් ආගම් හා ඇදහීම් පැවති රටකි. රටේ ප්‍රධාන ආගම් වූයේ පැරිසිස්, සැඩුසිස් සහ එසින්ස් ආගම් තුන යි. (Pharisees, Sadducees & Essense)[58] පැරිසිස්, මෝසස් පිහිටුවූ දැඩි මූලධර්මවාදී ආගමික කොට්ඨාශය වූයේ ය. සැඩුසිස්වරුන් මෝසස් පිහිටුවූ යොහෝවා වන්දනාවේ ම විශේෂ කණ්ඩායමකි. එසින්ස්වරු බෞද්ධයෝ වූ හ. එසින්ස් නිකාය ඇති වූයේ ඉහත දක්වූ ධර්මාශෝක රජතුමා ගේ ධර්මදූත ව්‍යාපාරයේ ප්‍රතිඵලයක් වශයෙනි. ඉසිනො යන පාලි වචනය බින්න වී ඉසිනි හෙවත් එසින්ස් නිකාය බිහි වුණි.[59]

සියලු යුදෙව් බෞද්ධයන් එසින්ස් නමින් හැඳින්වුව ද යේසු උපදින කාලයේ පලස්තීනය, ඊජිප්තුව හා පර්සියාව ආදි රාජ්‍යයන්හි මහායාන හා ථෙරවාදී සසුන් දෙක ම පැවතිණි. ජොසපුස්* සඳහන් කරන අන්දමට එසින්ස් සමාජයේ නිකායයන් දෙකක් තිබුණි. තෙරපියුටිස්වරුන් (Therapeutees) කසා වස්ත්‍ර පෙරවූ අතර සම්පසින්ස්වරු (Sampaseans) ධවල වස්ත්‍ර පෙරවූ හ. පලස්තීනයේ මළ මුහුද ප්‍රදේශය සම්පසින්ස් ආගමිකයන් ගේ ප්‍රදේශයක් විය. තෙරපියුටින් යනු ථෙරවාදීන් ය. සම්පසින්ස් යනු සර්වාස්තිවාදීන් හෙවත් මහායානිකයන් ය.[60]

එසින්ස්වරුන් පිළිබඳ තොරතුරු සපයන්නන් කිහිප දෙනෙකි. ෆිලෝ[61] ප්ලිනි[62] ජොසපුස්[63] ප්‍රධාන වෙති. එසින්ස්වරුන් මළ මුහුද අසල ප්‍රදේශයේ විසූ බව ප්ලිනි සඳහන් කරයි. ජොසපුස් කී

---

* **Josephus, Flavius** ජෝසපුස් ප්ලාවියස් උපන්නේ යේසුස් වහන්සේට කුරුසියේ ඇණ ගැසීමෙන් වසර හතකට පසු ව ය යි පොදු පිළිගැනීමක් ඇත. ඔහු පැරිසිස් පූජකයන් යටතේ අධ්‍යාපනය ලැබූ පැරිසිස්වරයෙකි. රෝමවරුන්ට එරෙහි ව පැරසිස්වරුන් ගෙනගිය නිදහස් සටනට ආධාර කළ ඔහු පසු ව රෝම අධිරාජයාට පක්ෂපාත වෙමින් ඉතිහාසඥයකු වශයෙන් රෝමයේ විසී ය. ඔහු ඉතිහාස පොත් හතරක් ලියා ඇත. Bellum Judaicum (The Jewish War), Antiquitates (The Antiquties of Jews), Vita (The Life or Autobiography) and Contra Apionem (Against Apion). ඔහු යේසුස් වහන්සේ දෙවියන් ගේ පුත්‍රයා නොව ප්‍රඥාවන්ත මනුෂ්‍යයකු වූ බව සිය ලේඛනයක සඳහන් කර ඇත. යේසුස් වහන්සේ ජීවත් වූ සමයේ ඉතිහාසය හැදෑරීමේ දී ජොසපුස් සපයන ඉතිහාස තොරතුරු සප්‍රයෝජනවත් වේ.

ලෙස, 'මේ ලෝකයේ සිටින වඩාත් ඥානවන්ත මනුෂ්‍යයෝ එසින්ස්වරු වෙති. යුදෙව්වන් අතර සිටින දාර්ශනිකයන් ඔවුහු ය. එසින්ස් නීතිය හමුවේ ජාති, ආගම් භේදයක් නැත. ඔවුහු විවාහ නො වෙති. එහෙත් දරුවන්ට ආදරය කරති. සියලු ම විද්‍යා ශාස්ත්‍රයන් දරුවන්ට ප්‍රගුණ කරවති. වහලුන් තබා නො ගනිති. ගොවිබිම්වල පෙරළි කරති. දැහැමි වෙළෙඳාමේ හා කර්මාන්තයෙහි නියැළෙති. ඉතා ම චාම් ජීවිත ගත කරති.' වෛද්‍ය විද්‍යාව, ගහකොළ හා පරිසරය කෙරේ එසින්ස්වරුන් උනන්දු වූ අයුරු පිළිබඳ ව ජොසපුස් ලියා ඇති තොරතුරු කියවද්දී, පලස්තීනයේ විසූ ආයුර්වේදය ගරු කළ තවත් භාරතීයයන් පිරිසක ගේ චිත්‍රය මැවී පෙනේ. රෝමවරුනට විරුද්ධ ව හටගත් යුදෙව් විප්ලවයට පෙර පැරිසිස්වරුන් විසින් එසින්ස්වරුන් විනාශ කරන ලද යි අනුමාන කිරීමට සාක්ෂි තිබේ.[64]

මළ මුහුද සමීපයේ කන්දක පිහිටි ගුහාවක් ක්‍රි. ව. 1947 දී අරාබි බැටලුපල්ලෙකුට හමු විය. එම ගුහාව පරීක්ෂා කළ පුරාවිද්‍යාඥයෝ, ලංකාවේ පුස්කොළ පොත්වලට සමාන, සම්ලේඛන පත්‍ර දහස් ගණනක් එහි තිබී සොයා ගත් හ. වඩි කුම්රාන් ලෙසින් නම් කරන එම ලෙන එසින්ස් පුස්තකාලයක් හෝ පොත් සඟවා තැබූ රහසිගත ලේඛනාගාරයක් හෝ වන්නේ ය. වඩි කුම්රාන් සමීපයෙන් තවත් ලෙන් දෙකක් පසු ව සොයා ගැනීමට හැකි විණි. මේවායෙහි ද කාසි සහ සම්පත්‍ර තිබුණි. ඊශ්‍රායලය භාරයේ පවතින මෙම සම්පත්‍රවලින් කොටසක් කියවා ප්‍රකාශ කොට කර ඇති අතර, තවමත් ප්‍රසිද්ධ නොකළ සම්පත්‍ර ද වේ. මේවා මළ මුහුදේ සම්පත්‍ර (Dead Sea Scrolls) ලෙසින් ලෝක ප්‍රකට ව ඇත්තේ ය.[65]

මළ මුහුද අසල ලෙන්වලින් සොයා ගන්නා ලද සම්ලේඛන පිළිබඳ ව උනන්දු වන පර්යේෂකයෝ බොහෝ වෙති. ක්‍රිස්තියානි දේවධර්මාචාර්යවරුන් කියා සිටින්නේ මළ මුහුදෙන් හමු වූ ලේඛන නිසා යේසුස් වහන්සේ ඓතිහාසික පුද්ගලයකු බව ඔප්පු වන බව යි. නූතන පර්යේෂිකාවක වන ඔස්ට්‍රේලියාවේ සිඩ්නි විශ්වවිද්‍යාලයේ දේවධර්ම ආචාර්ය බාබරා තියරින් පවසන ලෙසට කුම්රාන් ප්‍රදේශය ක්‍රි. පූ. 130 දී ද ජනාවාස පෙදෙසකි. ක්‍රි. ව. 66-73 කාලය තුළ ප්‍රදේශය වනසා පාළු කර ඇත්තේ ය. මරියා, ජෝසෙප් සහ යේසු යන තිදෙනා ම කුම්රාන් පෙදෙසේ විසූ එසින්ස් නිකායට අයත් යුදෙව්වෝ වූ හ.[66]

එසින්ස්වරුන් සතු ව ඓතිහාසික ආගමික සම්ප්‍රදායයක් පැවති බව, ඔවුන් ගේ ග්‍රන්ථ පරීක්ෂා කරන ගවේෂකයෝ පෙන්වා දෙති.[67] එම සම්ප්‍රදාය පරණ තෙස්තමේන්තුවේ පටන් නව තෙස්තමේන්තුව තෙක් ගලා එන යුදෙව් චින්තන රටාවක් නො වේ. ක්‍රි. පූ. 170 - 164 අතර කාලය ප්‍රථම ලියවිල්ලේ කාල වකවානුව යි. යේසු ජීවමාන කාලයේ ලියූ ලේඛන සහ එතුමා ගෙන් පසු කලෙක ලියූ ලේඛන ද සම්පත්‍ර අතර තිබේ. දෙව්වරුන් ගේ තෙස්තමේන්තුව, ජුබිලි පොත ආදී එසින්ස් ග්‍රන්ථ ස්ථිර ව ම යේසු කියවූ ඒවා වෙයි. එතුමා කන්ද උඩ දේශනාවට කරුණු ලබාගෙන ඇත්තේ එසින්ස් ග්‍රන්ථවලිනි.[68]

ශක්ති වන්දනාව පැරණි භාරත සමාජයේ ඉතා ජනප්‍රිය ආගමික අභිචාර විදියකි. එහි පරමාර්ථය වූයේ මිහිකත සතුටු කිරීම යි. ශක්ති යනු මිහිකත යි. මිහිකත සතුටු කළේ වැඩි අස්වැන්නක් ලබා ගැනීමේ පරමාර්ථයෙනි. රාම රාවණා කතාවත් අභිචාර උළෙලකි යි ඉතිහාසඥයෝ කියති. පරණවිතාන සූරීන් ගේ මතය සීතා යනු නගුලට භාවිතා කළ නමක් බව යි.[69] ආර්ය සංස්කෘතිය හා බ්‍රාහ්මණ දහම පැතිර තිබූ ඉරානය, ඊජිප්තුව, පලස්තීනය ආදී රටවල ද ශක්ති පූජා පැවැත්විණි. ශක්ති පූජා සඳහා විශේෂයෙන් කැපවූ දෙවොල් ස්ත්‍රීහු දේවාලවලට සම්බන්ධ වී සිටිය හ. මොවුහු, අභිචාර අවස්ථාවන්හි දී ඊට කැපවූ පූජකයන් සමඟ සම්භෝගයේ යෙදුණ හ. සම්භෝගය දෙවියන් වෙනුවෙන් කරන පූජාවක් ලෙස පිළිගැනුණි. එනිසා ශක්ති පූජාවක් නිසා දෙවොල් ස්ත්‍රියක් ලබන දරුවා දේව දරුවෙක් වූයේ ය. කිසිවෙක් දෙව් පියා ගැන සැක නොකළ හ. දේවදාසියෝ ශක්ති පූජාවල දී පුරුෂයන් සමග මෛථුනයේ යෙදීම පමණක් නොව වෛශ්‍යා වෘත්තිය මගින් දේවාල සඳහා මුදල් ඉපැයීම ද කළ හ. ක්‍රිස්තියානි ආගම විසින් මිථ්‍යා වන්දනාවන්හි නිරත මිනිසුන් අතර පැවති බහු භාර්යා සේවනය, වෛශ්‍යා වෘත්තිය ආදී දුසිරිත් වැලැක්වූ බව ක්‍රිස්තියානි ග්‍රන්ථවල අවධාරණයෙන්

සඳහන් කර ඇත.[70] ක්‍රිස්තියානීන් දුසිරිත් ලෙස හඳුන්වන සමහර සිරිත් බ්‍රාහ්මණ ආගමික සිරිත් ය.

යොහෝවා ඇදහීම බලවත් වූ පසු මූලධර්මවාදී පැරිසිස් පූජකයෝ අන් ආගම් පමණක් නොව ආගමික චාරිත්‍ර ද හිංසාවට ලක් කළ හ. දෙවොල් කාන්තාවන් අනාචාරයේ හැසිරෙන ස්ත්‍රීන් ලෙස හංවඩුගැසිණි. ඔවුන් ගේ පූජා සේවය ගල් ගසා මරාදමීම මගින් අවුරන ලදි. යොහෝවා ගේ අණ නොතකා පැරණි චාරිත්‍රවල යෙදුණු කාන්තාවනට එසින්ස්වරු පිහිට වූ හ. එසින්ස් භික්ෂූන් විවාහ නොවූ හ. එසින්ස් සමාජයේ පැරිසිස් මූලධර්මවාදීන් ගෙන් පීඩාවට ලක්වන කාන්තාවන් ගලවා ගැනීම සඳහා එසින්ස් භික්ෂූන් වහන්සේලා වෙහෙසුණ හ. මරියා දේවදාසියක ලෙස දේවාලයකට භාරදුන් අයුරුත් එහි දී ඇය ගැබ් ගත් අයුරුත් ඉහත දී විස්තර කෙරිණි (74 පිටුව). එසින්ස් ලේඛනයක මරියා සහ යෝසප් විවාහ වීමේ සිද්ධිය මෙසේ සටහන් වේ.

"අප ගේ එසින්ස් සහෝදරත්වය යෝසප් වෙත එසින්ස් දූතයකු යවමින් මරියා තනි නොකරන ලෙසත් ගැබ් පිහිටා ඇති ඇගේ භක්තියට හානිකරන කිසිවක් නොකියන ලෙසත් දරුවා ගේ පීතෘත්වය භාරගන්නා ලෙසත් ඔහුට දන්වී ය.[71]

කන්‍යාව (දේවදාසිය) යන අරුත ඇති පැන්තේරා (ග්‍රීක පර්තිනොස් Parthenos) නම් යුදෙව් වචනයක් ඇත. පැන්තර් නමින් දිවි (කොටි) වර්ගයක් ද සිටී. යුදෙව් ජනවහරේ යමෙක් බෙන් හ පැන්තේරා (Ben-ha-Pentera) යනුවෙන් හඳුන්වනු ලබන්නේ වෛශ්‍යාව ගේ පුත්‍රයා යන අරුතෙනි. (මෙහි දී දිවිදෙන ගේ පැටවා යන්න Son of the bitch යන අරුතෙන් යෙදෙන බව පෙනේ.) එසින්ස්වරුන් කන්‍යාව ගේ පුත්‍රයා යන අරුතින් යේසුස් වහන්සේ බෙන් හ පැන්තේරා නමින් හැඳින්වුව ද රබීවරුන් එම යෙදුම උන්වහන්සේ හැඳින්වීම පිණිස යෙදා ඇත්තේ වෛශ්‍යාව ගේ පුත්‍රයා යන අරුතෙන් බව වර්නන් කෙලර් පෙන්වා දෙයි.[72] මරියා කන්‍යාවක් (Virgin) නො වූ බවත්, ඉංග්‍රීසියෙන් නන් (Nun) ය යි හඳුන්වනු ලබන නොන් පුරාණයේ දේවාලවල කැප වූ දේවදාසියන් හැඳින්වූ නම බවත් බාබරා තියරින් ගේ පර්යේෂණ වාර්තාවලින් ද තහවුරු වෙයි.[73] යේසුස් වහන්සේ

ඉම්මානුවෙල් යන නම තැබීමට හේතුව මෙයින් පැහැදිලි වෙයි. දේවදාසියන් කාටත් 'ඉම්මානුවෙල්ලා' ලැබුණු බව සිතිය හැකි ය.

යේසු ළමා වියේ පටන් ආගමික ජීවිතයක් කෙරෙහි උනන්දුවක් දක්වා ඇත්තේ දේව හාස්කමක් නිසා නොවේ. එසින්ස් සමාජයේ බලපෑමෙනි. තමා උපන් දිනයේ පෙරදිග සිට තමා බැහැදැකීමට පැමිණි පඬිවරුන් තිදෙනා ගේ ප්‍රවෘත්තිය එතුමා දැන සිටියේ ය. ලාමාවරයකු වීමේ ආශාව යේසු සිතට බාල වියේ ම ඇතුළු වූ සිතුවිල්ලකි. මරියා යේසු සමඟ හෙරොඩ් පාලකයා ගෙන් ගැලවීම පිණිස ඊජිප්තුවට පලාගියේ ය. ඔවුන් කල්ගෙවූ ස්ථාන නාම අප්‍රධාන අපොස්තල්වරු සඳහන් කරති. සියලු ම ස්ථාන ඊජිප්තු පන්සල් ය.[74]

ඊජිප්තුවේ මතාරියා හෙවත් පුරාණ ඖෂධ උයනේ මෑතක් වන තුරු ම පැරණි බෝධි වෘක්ෂයක් වූ බවත් බෝධි වෘක්ෂය මරියා ගේ වෘක්ෂය ලෙසින් හඳුන්වා ඇති බවත් ඖෂධ උයන පිළිබඳ ව අප කළ සොයා බැලීමක දී දැනගන්නට ලැබිණි.

පාස්කු උත්සවයට මව්පියන් සමඟ යෙරුසලමට ගිය යේසු, දේව මන්දිරය තුළට ගොස් පූජකයන් සමඟ වාඩි ගෙන ඔවුන් ගේ කතාවලට සවන් දෙමින් ඔවුන් ගෙන් ප්‍රශ්න ඇසීම පිළිබඳ ව සාකච්ඡා කළ යුත්තේ එතුමා ළමා වියේ ලැබූ අධ්‍යාපනය සහ ඇසුරු කළ සමාජය පිළිබඳ ව ගවේෂණය කරමිනි. දිළිඳු වඩුවකුට දාව ඉපදී කිසි ම අධ්‍යාපනයක් නොලැබූ දරුවකු යුදෙව්වන් ගේ මහා දේවාලයට ගොස් පූජකයන් සමඟ ආගමික සංවාදයක යෙදුණු බව කීම පිළිගත නොහැකි අවිද්‍යාත්මක ප්‍රකාශයකි. එතුමන් අපවත් වූ දලයි ලාමාවරයකු ගේ පුනරුත්පත්තියක් බවත් දලයි ලාමාවරයකු වීමට සුදුසුකම් ලද තියුණු බුද්ධියකින් යුතු එසින්ස් දරුවකු බවත් අනාවරණය වන විට සිද්ධිය පිළිගත හැකි එකක් වේ.

තමා පැමිණියේ පැරණි ව්‍යවස්ථාව සම්පූර්ණ කිරීම පිණිස එය විනාශ කරනු පිණිස නොවේ ය යි යේසු කී බව අලුත් ගිවිසුමේ සඳහන් ය. එමෙන් ම එතුමා ව්‍යවස්ථාව කඩ කළ අවස්ථා ද දක්නට ලැබේ. මනුෂ්‍යයන් ගේ ලෙඩදුක් සනීප කරමින් සබත් දිනයේ ඇවිදීම එක් නිදසුනකි. යේසු පැරණි ව්‍යවස්ථාව

මළ එකක් ලෙසට හැඳින්වූයේ ය. වරක්, තමා සමඟ සාකච්ඡා කිරීමට පැමිණි පිරිසක් මධ්‍යයේ වාඩි වී, ඔවුන් පුදුමයට පත් කරමින් යේසු මෙසේ කීවේ ය.

"ජීවත් වන හැම වස්තුවකට ම නීතියක් තිබේ. මේ නීතිය ස්වභාවිකත්වය යි. එය තණබිමක, වෘක්ෂයක, ලතාවක, කන්දක, කුරුලු ගීතයක, සාගරයේ වසන මාලුවකු කෙරෙන් සොයා ගත හැකි ය. නමුත් ඔබ සෙවිය යුත්තේ ඔබේ ස්වභාවිකත්වය යි. ව්‍යවස්ථාව එය සොයන්නැ යි ඔබට නොකියයි. ව්‍යවස්ථාව මළ දෙයකි. දෙවියෝ පොත්වල ලියූ දෙයක් නැත. එහෙත් නීතිය ඔබේ හදවතේ හා ආත්මයේ ලියවී තිබේ."

තවත් වරෙක යේසු, 'මනුෂ්‍යයාට ආහාරය පිණිස එළවළු, පළතුරු, ධාන්‍ය, අල වර්ග ඕනෑ තරම් තිබිය දී ඔවුන් දැත්වල ලේ තවරාගෙන සතුන් ගේ මස්වලින් කටවල් පුරවා ගන්නා සැටි' පැහැදිලි කරයි.[75]

දැඩි මූලධර්මවාදී ආගමක් ඇදහූ යුදෙව් රාජ්‍යයේ ජීවත් වූ එසින්ස්වරු, යුදෙව් ආගම නො ඇදහූ යුදෙව්වන් පිරිසක් වූ හ. ඔවුහු, සාම්ප්‍රදායක යුදෙව් ආගමික නීතිවලින් මිදී, බෞද්ධයන් වශයෙන් ජීවත්වීමට උත්සාහ දැරූ හ.

මම මගේ දෑසින් කුරුසියේ ඇණ ගැසීම දුටුවෙමි

ඇලෙක්සන්ද්‍රියාවේ පැරණි නිවාසයක තිබී වටිනා පුරාවස්තු රාශියක් සොයාගන්නා ලදි. ඒවා අතර තිබූ ඇරමයික් ලිපියක් යේසුස් වහන්සේ ගේ ජීවිතය සම්බන්ධ ව තොතුරු සපයන ඓතිහාසික සාක්ෂියක් වී තිබේ. මෙම ලිපිය පලස්තීනයේ කුම්රාන්හි එසින්ස්වරයකු විසින් ඇලෙක්සන්ද්‍රියාවේ විසූ එසින්ස් සහෝදරයකු වෙත යවන ලද්දකි. ලිපිය ලියා ඇත්තේ යේසුතුමාට ඇණ ගැසීමෙන් හත් අවුරුද්දකට පසු ව ය.

ලිපිය ලියූ පුද්ගලයා ගොල්ගොතාවේ රැස් ව සිටි සෙනඟ අතර වෙසෙමින් ඇණ ගැසීම බලා සිටියෙකි. ඇණ ගැසීමෙන් පසු ව යේසුස් වහන්සේ ලී කඳෙන් මුදාගෙන දිවි ගැළවූ අන්දම සහ එතුමන් රටින් පිට කළ අයුරු පැවසෙන දීර්ඝ විස්තරයක් මෙම ලිපියෙහි අන්තර්ගත ය.

1873 දී එම ලිපිය පොතක් වශයෙන් මුද්‍රණය කෙරී ඇතත්, පසු ව ක්‍රිස්තියානි මූලධර්මවාදීහු, එම පොතේ සියලු පිටපත් මතු නොව මුද්‍රණ තහඩු පවා විනාශ කළ හ. එම විනාශයෙන් ගැළවුණු එක් පිටපතක් 1907 වසරේ ඇමරිකාවේ චිකාගෝ නුවර දී The Crucifixion by an Eye-Witness (කුරුසියේ ඇණ ගැසීම ඇසින් දුටුවකු ගේ සාක්ෂි) නමින් ප්‍රකාශයට පත් විය.[76]

පාදක සටහන්

1 Hassnain, Fida, A Search of The Historical Jesus, Gateway Books, UK, 1994, 20-21p

2 Hassnain, Fida, Ibid, p25

3 Notovitch, Nicolas, The Life of St Issa, New York, 1890.

4 Ghose, Ashutosh, Swami Abedananda, The Patron Saint. Calcutta, 1967.

5 Bock, Janet, The Jesus Mystery, Aura Books, Los Angeles, 1980, p20.

6 Merrick, Henrietta, In the Worlds Attic Putnams, NY, 1931 p215.

7 රෝරයිෂ් ගේ ගවේෂණ හා චිත්‍ර අඩංගු අංග සම්පූර්ණ කෞතුකාගාරයක් නිව්යෝර්ක්හි ලිහිටුවා තිබේ. Roerich Museum, New York.

8 Nazeer Ahmed, Jesus in Heavan on Earth, Muslim Mission, p361.
"There were three who always walked with the Lord: Mary his mother and her sister and Magadalena, the one who was called his companion. His sister and his mother and his companion were each a Mary" Gospel of Philip, Ed. Robinson, New York, 1977.

9 සිංහල බෞද්ධයා වෙසක් අතිරේකය, 1939 04. 29

10 Forrstrom, Johan, The King Of Jews, Deepani, Nugegoda. 1987, p187
පල්ලියේ රහස් මෙහෙයුම පිළිබඳ තොරතුරු අනාවරණය කෙරෙන කෘති කිහිපයක් මෙසේ යි.

1. මුස්ලිම්වරු ටිබෙටයේ හා ලඩාකයේ ආරාමයන්හි ඇති ඉසා ගැන සඳහන් ලේඛන ලබාගැනීමට මහන්සි ගනිති. Roerich, Nicolai, Altai Himalaya, NY, 1929, p89-90

2. අහමඩ් ෂා සහ අග්‍රා විද්‍යාලයේ මහාචාර්ය ඩග්ලස් දෙදෙනා ටිබෙටයේ හා ලඩාකයේ ගවේෂණයක යෙදවූ පල්ලිය ඔවුන්ට නොටෝවිෂ් ගේ සොයාගැනීම් බොරු ය යි ප්‍රකාශ කරමින් ලඩාකයේ හා ටිබෙටයේ

ඇති ඉසා පිළිබඳ සියලු ලේඛන විනාශ කිරීමට උපදෙස් දී තිබුණි.

"Church mission in India engaged the services of Ahmed Shah and Professor Douglas (of the Government collage - Agra) to destroy the Tibetian Gospels. " Hassnain, Fida, A Search of The Historical Jesus, Gateway Books, UK: 1994, p33.

3. "Trace, buy, confiscate and steal ancient documents referring interalia to Jesus life in India and his death in Kashmir." Forsstrom, Johan, The King of Jews, p187, Deepani, Nugegoda, 1987.

11 Dezirkoff, Boriz, H. P. Blavatsky Collected Writings Vol 1-15, Theosophical Publishing House, USA.

12 Notovitch, Nicolas, The Life of St Issa, New York, 1890. ඉසා ගේ ජීවිත කතාව ඉංග්‍රීසි, ප්‍රංශ හා ජර්මන් භාෂාවලින් මුද්‍රණය වී ඇත.

13 Rajneesh Bagvan, Rajneesh Bible, p.467

14 කුමාරි ජයවර්ධන, ශ්‍රී ලංකාවේ කම්කරු ව්‍යාපාරයේ නැගීම, පරි. ප්‍රේමලාල් කුමාරසිරි, වෙස්ලි මුද්‍රණාලය, කොළඹ, 1978

15 ගුත්තිල කතාව, මේරි මියුසියස් හිගින්ස්, කේව් සහ සමාගම, 1938

16 Notovitch, Nicolas, The Life of St Issa, NY, 1890.

17 The Koran, Tr. Al Ahmed ,1953, 5-46, 157-158.

18 Hassnain, Fida, A Search of The Historical Jesus, Gateway Books, UK, 1994, 166p

19 Durant, Will, The Age of Faith, Simon & Schuster, 1950

"Mohomed was never known to write anything himself" p162

20 William, M., The Life of Mohomad, 1920.

21 William, M., ibid, Ch. 11, 1920.

22 Imal collection - Teachings of Holy Prophet, 1836. ට්‍යුබින්ගන් ඉන්දු ශිෂ්ටාචාරය පිළිබඳ කෞතුකාගාරයේ පිටපත.

23 Robinson, James (Ed.), Gospel of Philip, New York, 1977

24 Hassanian, Fida, A Search of The Historical Jesus, Gateway Books, UK, 1994, "The writings of the Mullas", p168.

25 ලූක් 10. 1

26 Robinson Forbes, The Copttic Apocryphal Gospels, Methuen & Co., London, 1902.

27 ලූක් 1. 27-80

28 Hiren, Yrjo, The Sacred Shrine, Mcmillen, London, 1912.

29 Robinson Forbes, The Copttic Apocryphal Gospels, Methuen & Co., London, 1902.

30 Dictonary of the Apostalic Church, T&T Clerck, London, 1902

31 Ragg, Lonsdale and Laura, Tr. The Gospel of Barnabas, Oxford University Press, 1907.

32 Hassnain, Fida, A Search of The Historical Jesus, Gateway Books, UK: 1994, p219.

33 Keller, Werner, The Bible as History, Hodder, London, 1956, p407

34 Hassnain, Fida, A Search of The Historical Jesus, Gateway Books, UK, 1994, p220

35 Catholic Encyclopedia, Ed. Rv. Peter M. J. Strarinskis, Sunday Vision Publishers, USA, 1995.

36 The Family Bible Encyclopedia, Copy Publishing House, USA, p220.

"Am I not apostle? Am I not free? Have I not seen Jesus Christ our Lord? 9.1 There is some evidence that Paul's apostolicity had been contested, perhaps by those whom he called "false apostles" (11 Cor 1:1)

37 Hassnain, Fida, A Search of The Historical Jesus, Gateway Books, UK, 1994, p167

"One of his earlier names was Joshua, but the Gospels refrained from naming him so, because he would then be known as Joshua ii."

38 Hassnain, Fida, A Search of The Historical Jesus, Gateway Books, UK, 1994, p222.

39 Klijin, A. F., Tr. The Act of Thomas, Leiden, USA, 1962, 5p

40 Marshall, Sir John, Guide to Taxila, Cambrgdge, 1951, p.136-138.

41 Hassnain, Fida, A Search of The Historical Jesus, Gateway Books, UK, 1994, 17 cha., The Thomb of Yuzu Asaph.

42 Bavishya Mahapurana, Bombay, 1917. ජර්මනියේ ට්‍යුබින්ගන් පුස්තකාලයේ පිටපත.

43 Serrano, Miguel, The Serpant Paradise, Ridder & Co. London, 1950.

44 Kalhana's Rajatarangani, Tr. Stein, M. A., London 1900, p65-171, බර්ලින් ෆ්‍රී යුනිවර්සිටි ඉන්ඩියෝලොජි පුස්තකාල පිටපත.

45 Hassnain, Fida, A Search of The Historical Jesus, Gateway Books, UK, 1994, p195.

46 Keller, Werner, The Bible as a History, Hodder, London, 1956, p144-145.

47 විවාහක බිරියන් ගේ පුතුන් අට දෙනා Reuben, Siemon, Levi, Judah, Issachar, Zebulun, Joseph and Benjamin අවිවාහක බිරියන් ගේ පුතුන් සතර දෙනා Gad, Asher, Dan and Nephtali.

48 Margolis, Max & Marx, History of the Jewish People p9, USA, 1978.

49 Tennent, Ceylon, p586-88, British Museum.

50 Notovitch, Nicolas, The Life of St Issa, NY, 1890.

51 නික්මයාම 2. 1-10
52 Notovitch, Nicolas, The Life of St Issa, NY, 1890.
53 යෙරමියා විලාප 5.
54 සෘග් වේදය 10 කාණ්ඩය Guptha S. Vedantha India, 1956.
55 Hassnain, Fida, A Search of The Historical Jesus, Gateway Books, UK, 1994, p91
56 ලෙවී කතාව 26. 1-2 සහ 26. 27-30
57 Forrstrom, Johan, The King Of Jews, Deepani, Nugegoda. 1987, p275-285.
58 Hassnain, Fida, A Search of The Historical Jesus, Gateway Books, UK, 1994, p92-93
59 ඩී. ඊ. රණසිංහ, දේශාන්තරයන්හි ව්‍යාප්ත වූ මහා බෞද්ධ ධර්මදූත සේවය, සිංහල බෞද්ධයා වෙසක් කලාපය, බු. ව. 2483.

"බටහිර ආසියාවේ ඒ ඒ රටවල නිකායන් කිහිපයක් පහළ විය. මේ නිකාය අතරින් ඇසිනි නම් නිකායක් පලස්තීනයේ ද මාගි නම් නිකායක් පර්ශියාවේ ද ථෙරපුත්‍ර නිකාය මිසරයේ ද පැවතුනේයි...... ඒ ඒ නිකායට අයත් පැවිද්දන් දේශනා කරන ලද්දේ නිර්මල බුද්ධ ධර්මයම නොවේ. සියරට පැවති දූෂිත ධර්මය හා බුද්ධ ධර්මය සුසංයෝග කිරීමට ඔවුන් විසින් උත්සාහ දරා තිබේ. ඇසිනි නිකායේ ශ්‍රාවකයන් වූ ජෝන් ද බැප්ටිස් ද යේසුස් වහන්සේ ද බුද්ධ ධර්මය දන සිටි බව නිසැකය. නමුත් යේසුස් වහන්සේ දේශනා කළේ යුදෙව් ධර්මය හා මිශ්‍රකිරීමෙන් දූෂිත වූ බුද්ධ ධර්මයකි. ඇසිනි යේසු යන පද මාගධියෙන් බෞද්ධ ශ්‍රාවකයන් කියවෙන ඉසිනෙ ඉසයො යන පදයන්ට ඉතා සමානය." 39-40 පිටු.

60 Josephus, Flavius, The Wars of the Jews, London, 1873.

"There could be a connection between the Therapeutees and Sampsaeans mentioned by Eusebius and John Allgero, and the Theravadins and the Sarvastivadins of the Buddhist." p55, Hassanian, Fida, The Historical Jesus.

61 Philo, Judaeus, Every Good Man is Free, Tr. Colson, London, 1962.
62 Pliny the Elder, Natural History, Tr. Rackham, London, 1938.
63 Josephus, Flavius, Antiquitiesm of Jews, London, 1924
The Jews Wars, Tr. Whiston, London, 1978.
64 Josephus, Flavius, The Antiquities of the Jews, London, 1872, Josephus, Jews Wars.
65 Burrows, M., The Dead Sea Scrolls, Viking Press, London, 1956.
66 Berliner Zeitung 22 July 1992.

. "Jesus war zweimal verheiratel und hatte drei kinder."

67 Hassnain, Fida, A Search of The Historical Jesus, Gateway Books, UK, 1994, p96-97

68 Hassnain, Fida, A Search of The Historical Jesus, Gateway Books, UK, 1994, p98

"The Dead Sea Scrolls were written before Jesus was born..... The famous Sermon on the Mount now included in the New Testiment, was known to Jesus, for he had already become familier with it as a body of Essence teaching."

69 පැරණි දවස පුවත්පතකිනි. දිනය සොයාගත නොහැකි විය.
70 Mankind Search fo God, Watch Tower Bible Society, 1990, p262
71 Crucifixion by an eye-witness, Indo Ameracan Book, USA 1907 p40.

"And Joseph, through a messenger of our Order was influenced not to leave the women, nor disturb her faith in the sacrendence of her experience, and to be father to the child."

72 Werner Keller, The Bible as History, Hodder, London, 1956, p342
73 Berliner Zeitung , Babrara Tiarin
74 Hassnain, Fida, A Search of The Historical Jesus, Gateway Books, UK, 1994, p54

"Al-Mohrrac, Mataria, Wadi-El-Natrun. The Monasteries belongs to the Essens."

"Buddhist missionaries made their appearance in Egypt soon after the time of Alexander the Great." Forsstrom, John, The King of Jews, p289.

75 Forsstrom, John, The King of Jews, Deepani, Nugegoda. 1987, p345, 347
76 The Crucifixion By An Eye Witness, Indo Ameracan Book, USA 1907

3

යේසුස් වහන්සේ පිළිබඳ සාක්ෂි

දුටුවෝ තරුව දිග
තිදෙනෙකි පඩිතු පෙරදිග

යේසු උත්පත්තිය

බයිබලයේ ශුභාරංචිකරුවන් යේසුස් වහන්සේ ගේ උත්පත්තිය සිදුවූ පිළිවෙල විස්තර කරන්නේ මෙසේ ය.

"තවද හෙරොද් රජු ගේ දවස්වල යුදයේ බෙත්ලෙහෙම්හි යේසුස් වහන්සේ උපන් කල, පූර්වදිශාවෙන් ශාස්ත්‍රවන්තයෝ බෙත්ලෙහෙමට ඇවිත්: යුදෙව්වන්ට රජව උපන් තැනන් වහන්සේ කොතැන්හි ද? මක්නිසා ද අපි උන්වහන්සේ ගේ තාරකාව පූර්වදිශාවෙහි දී දැක, උන්වහන්සේට නමස්කාර කරනු පිණිස ආවෙමු යි කීවෝ ය.[1]

"ඔවුහු ගෙට වැද, ළදරුවා ස්වකීය මවු වූ මරියා සමඟ සිටිනවා දැක, බිම වැටී උන් වහන්සේට නමස්කාර කොට, තමුන් ගේ කරඬු හැර, රන් ද කට්ටකුමංචල් ද සුවඳ ලාටු ද යන පඬුරු උන්වහන්සේට පිදුවෝ ය. තවද හෙරොද් වෙතට නැවත නොයන ලෙස දෙවියන් වහන්සේ විසින් ස්වප්නයකින් දන්වනු ලැබ, ඔවුහු අන් මගකින් තමුන් ගේ රටට ගියෝ ය."[2]

ඇමරිකානු ඉතාලියකු වූ බර්නාඩෝ බර්ටෝලුසී (Bernardo Bertolucci) හොලිවුඩ්හි සුප්‍රසිද්ධ චිත්‍රපටකරුවෙකි. උපතින් කතෝලිකයකු වූ හෙතෙම පසු කලෙක බෞද්ධයෙක් වූයේ ය. බර්ටෝලුසී නිෂ්පාදනය කළ කුඩා බුදුන් (Little Buddha) සුප්‍රසිද්ධ ඇමරිකානු චිත්‍රපටයකි.

දලයි ලාමාවරයකු අපවත්වූ පසු උන්වහන්සේ යළි කොහේ උපදිනවා ද යි දැනගැනීමට ටිබෙට් ලාමා වහන්සේලා නක්ෂත්‍රය හා ගුප්ත විද්‍යාව මිශ්‍ර වූ අපූර්ව පර්යේෂණ ගණනාවක් කරති.

ඉන්පසු උන්වහන්සේලා ග්‍රහ වස්තූන් ගේ ක්‍රියාකාරිත්වය පිළිබඳ සෙවීමක් ද කරති. අනතුරු ව ලාමා වහන්සේලා කිහිප නමක්, අපවත් වූ දලයි ලාමා වහන්සේ භාවිතා කළ භාණ්ඩ කිහිපයක්, රන්, මැණික්, තෑගිබෝග සහ සුවඳ ද්‍රව්‍ය රැගෙන තුල්කු* සොයා යති. ඒ උන්වහන්සේලා ළමයා දැකීමට යන පළමු ගමන යි. මෙය ඉතා රහසිගත ව සිදු කෙරෙන ගමනකි. ඔවුන් තුල්කු සොයා දෙවන වරටත් යතහොත්, ඒ, මීළඟ දලයි ලාමා වහන්සේ පුහුණු කිරීම පිණිස ළමයා ඔවුන් ගේ භාරයට ගැනීමේ පරමාර්ථයෙනි.[3]

ටිබෙටය බෞද්ධ රටක් වූ කාලයේ සිට සිදුවන චාරිත්‍රයක් අධ්‍යයනය කළ බර්ටෝලුසී, තමා ළමා කාලයේ පටන් දන සිටි බයිබලයේ යේසුස් වහන්සේ ගේ උත්පත්ති කතාවේ සඳහන් එතුමන් බැහැදකීමට පෙරදිග පඩිවරයන් තිදෙනකු පැමිණීමේ සිද්ධිය නිවැරදි ව වටහා ගත්තේ ය. යේසුස් වහන්සේ ගේ විස්තර ඇතුළත් ටිබෙට් ඓතිහාසික ලේඛන පිළිබඳ තොරතුරු අධ්‍යයනය කිරීමෙන් අනතුරු ව සියලු සිද්ධි ගොනුකර චිත්‍රපටියක් නිපදවීමේ අවශ්‍යතාව ඔහුට ඇති විය. 'කුඩා බුදුන්' එහි ප්‍රතිඵලය යි.

ටිබෙටය බෞද්ධ රටකි. ටිබෙට් ජනගහනයෙන් සියයට අනූ හතක් ම බෞද්ධයෝ වෙති. ටිබෙටයේ බුද්ධාගම ලංකාවේ බුද්ධාගමට සමාන නොවේ. ටිබෙටයේ බුද්ධාගම ටිබෙට් බුද්ධාගම යි. බුද්ධ වචනය, ලංකාවේ දී ථෙරවාදී සම්ප්‍රදාය නමින් හැඳින්වෙන අතර, ටිබෙට් සම්ප්‍රදාය තන්ත්‍රයාන නමින් හැඳින්වේ. චීනය විසින් යටත් කරගනු ලබන තෙක් ම, ටිබෙට් බෞද්ධයන්ට බෞද්ධ රාජ්‍ය නායකයෙක් සිටියේ ය. එතුමා දලයි ලාමා වහන්සේ ය. ටිබෙට් බුද්ධාගමට අයත් බෞද්ධ චාරිත්‍ර සහ පූද පූජා සිරිත් සහා ලංකාවේ බෞද්ධ සම්ප්‍රදායට වඩා වෙනස් ය. හැම පවුලකින් ම ගැහැනු හා පිරිමි දරුවකු ශාසනයට පූජා කිරීමේ සිරිතක් ටිබෙට් (හැම මවක හා පියකු ගේ ම) ජාතිකයන් අතර පැවතීම එක් උදාහරණයකි. දරු දෙ දෙනකු ශාසනයට පූජා කරන්නේ ශාසනයේ උන්නතිය හා ජනතාව ගේ මාර්ගෝපදේශකත්වය

---

*අපවත් වූ දලයි ලාමාවරයකු ගේ නැවත උත්පත්තිය සොයාගත් පසු ඒ දරුවා හඳුන්වන්නේ තුල්කු නමිනි.

වෙනුවෙනි. ථෙරවාදී බුද්ධ ශාසනයේ මෙන් තන්ත්‍රයාන සහ මහායාන සසුන්වල රහත් භික්ෂූන් වහන්සේලා නොවෙති. එම සසුන් දෙකෙහි ම සඳහන් වනුයේ බෝධිසත්ව භික්ෂූන් වහන්සේලා පිළිබඳ ව ය. රහතන් වහන්සේ යනු සිය විමුක්තිය සොයා ගත් අයෙකි. බෝසත්වරු ලෝකයේ හා සත්වයා ගේ යහපත උදෙසා නිවන් දැකීම කල් දමා කලින් කල ලොව පහළ වෙති. ලංකාවේ නාථ දෙවියෝ නමින් ප්‍රසිද්ධ වූ අවලෝකිතේශ්වර සමිඳුන් බෝධිසත්වවරයෙකි.[4] ටිබෙට් බෞද්ධයෝ බෝධිසත්වවරුන් වන්දනා කරන්නෝ ය.

ටිබෙටයට යුද හමුදාවක් නොතිබුණි. චීනයේ කොමියුනිස්ට් හමුදාවෝ ටිබෙටය ආක්‍රමණය කළෝ ය. ටිබෙට් විහාර ආරාමවලට කඩා වැදුණු කොමියුනිස්ට් සොල්දාදු කණ්ඩායම්, භික්ෂූන් වහන්සේලාට නොයෙකුත් ශාරීරික වධ හිංසා පැමිණවූ හ; භික්ෂුණීන් දූෂණය කළ හ; පන්සල් කොල්ලකෑ හ. චීන ආක්‍රමණිකයන් ගෙන් ගැලවුණු දලයි ලාමා වහන්සේ ඉන්දියාවට පලා ගිය හ.[5]

කුඩා බුදුන් චිත්‍රපට කතාව මෙසේ ය. දලයි ලාමා වහන්සේ නමක් අපවත් වෙති. උන්වහන්සේ ඇමරිකාවේ සියාටල්හි උපත් බව දැනගෙන, චාරිත්‍රානුකූල ව තෑගිබෝග රැගත් ලාමාවරු තෙ නමක් දරුවා සොයා ඇමරිකාවට යති. දරුවා ගේ පියා ලාමා වහන්සේලා ගේ කතාව අකමැත්තෙන් ඉවසුවත්, බිරිඳ ගේ ඉල්ලීම නිසා ම දරුවා ද සමඟ ටිබෙටය බැලීමට යයි. චිත්‍රපටියේ ඉතිරි කොටස ගොඩනැඟෙන්නේ ළමයා ටිබෙට් දේශයේ දී මුහුණ දෙන අත්දැකීම් ඇසුරෙනි. දලයි ලාමා හාමුදුරුවන් ජීවමාන බුදු හාමුදුරුවන් වශයෙන් ටිබෙට් ජනයා විශ්වාස කරන බැවින්, මතු දිනෙක දලයි ලාමා කෙනකු වන තුල්කු ඇසුරින් බර්ටෝලුසී නිපදවූ චිත්‍රපටය කුඩා බුදුන් ලෙසින් නම් කර ඇත්තේ ය.

කුඩා බුදුන් චිත්‍රපටය නරඹන, බයිබලය කියවා ඇති හෝ ක්‍රිස්තියානි ආගම අදහන හෝ ඕනෑ ම පුද්ගලයකුට යේසුස් වහන්සේ උපන් බව දැනගෙන බෙත්ලෙහෙමට පැමිණි පෙරදිග පඬිවරුන් තිදෙනා සිහියට නැඟෙයි. උපන් දරුවකු බැහැදැකීමට පඬිවරුන් පැමිණීමේ සිරිතක් පලස්තීනයේ හෝ ඒ අසල කිසි ම රටක හෝ නොවූයේ ය. මෙබඳු චාරිත්‍රයක් පැවති හා පවතින එක ම රට ටිබෙටය පමණකි. බයිබලයේ සඳහන් වන, යේසුස් වහන්සේ ගේ උත්පත්තිය දැනගෙන, එතුමා බැහැදැකීමට තෑගි, කට්ටකුමන්ජල් සහ සුවඳ ලාටු රැගෙන පෙරදිග සිට පැමිණි පඬිවරුන් තිදෙනා ටිබෙට් ලාමාවරුන් බවට සැකයක් නැත.

පලස්තීනය සහ ආසියාව

ඉන්දියාවේ කශුර් භාෂාව කතාකරන ජනයා වාසය කරන රට කශිර් නම් වෙයි. වෙනත් ජාතීන් කශීරය හඳුන්වන්නේ කාශ්මීර් නමිනි. කාශ්මීරය යන නම ලැබී ඇත්තේ, කෂ්/කුෂ් නමැති සංක්‍රමණික ජනතාව එය වාසභූමිය කරගත් බැවිනි. කෂ්වරු වනාහි, බැබිලෝනියාව, ඊජිප්තුව, පර්සියාව, ඇෆ්ගනිස්ථානය යන රාජ්‍යයන් හරහා භාරතයට පැමිණි කැසයිට් ගෝත්‍රයට අයත් පිරිසකි.[6] ඉතිහාසඥයන් පැහැදිලි කරන ලෙසට මොවුහු යුදෙව්වෝ වෙති. මෝසස් ද කුෂ් කාන්තාවක් විවාහ කරගත් බව පරණ තෙස්තමේන්තුවේ සඳහති.[7] කාශ්මීර් වැසියන් යුදෙව්වන් ගෙන් පැවතෙන්නන් බව එරට ගැන ලියූ කූතෝ, අල් බිරූනි, ක්ලවුඩියස් ආදී සෑම ලේඛකයකු ම සඳහන් කර තිබේ.[8]

ඊජිප්තුව, සිරියාව, පර්සියාව, ඇෆ්ගනිස්ථානය, කාශ්මීරය ආදී හැම රටක ම යුදෙව් ජනපද පැවතිණි. රටරටවල විසිරී විසූව ද යුදෙව්වන් අතර කිසියම් සබඳතාවක් තිබුණි. බානි ඊශ්‍රායල් කණ්ඩායම් කිහිපයක් කනානයේ සිට පෙරදිග බලා ආයේ සිය ඥාතීන් ගේ සරණ පතමිනි. යුදෙව් විශ්වකෝෂය යුදෙව් ජාතියේ නේතෘවරයා, නීතිදායකයා, අනාගත වක්තෘන් ගේ ආරම්භකයා ආදී වශයෙන් ඉතා ගෞරවණීය ලෙසින් හඳුන්වන මෝසස් ගේ අවසානය සිදුවූ හැටි යුදෙව් ඓතිහාසික ග්‍රන්ථවලින් විස්තර නොකෙරේ. පෙරදිග මහමදික මූලාශ්‍රයන්හි ඔහු නැතිවූ කණ්ඩායම සොයා යන බව පවසා කාශ්මීරයට පැමිණි අන්දම සඳහන් වේ.[9]

"කාශ්මීරයේ පක්තූන් නම් යුදෙව් ගෝත්‍රයක් වාසය කරයි. ගෝත්‍රයේ නායක බද්ෂා නකාෂ්බන්දි මා සමඟ මෙසේ කී ය.

'මෝසස් දුන් කටුක ආහාර (Manan Salva) ප්‍රතික්ෂේප කරමින්, ඔහුට අකීකරු වූ යුදෙව් කණ්ඩායම අපි වෙමු. මෝසස් සහ එඬේර පිරිස අතැරදමූ අපේ කණ්ඩායම නැහෙනහිර බලා ගමන් අරඹා තිබේ. තුර්කීන් ද අපේ ම සහෝදර පිරිසකි. ඔවුන් ද මෝසස්ට අකීකරු පිරිසේ ම කොටසකි. අප ගේ පිරිස කාශ්මීරයට පැමිණ ඇත්තේ ය."[10]

මෝසස් යුදෙව්වන් මෙහෙයවූයේ ඔවුන්ට කිරියෙන් පැනියෙන් උතුරන රටක් ලබා දෙන බව කියමිනි. ඊශ්‍රායලයෙන් පිටවූයේ නැතිවූ කණ්ඩායම සොයා ගැනීමේ අදහසිනි. කාශ්මීරයට පැමිණි ඔහුට නැතිවූ කණ්ඩායම කිරියෙන් පැනියෙන් පිරුණු රටට පැමිණ ඇති අයුරු දකින්නට ලැබුණි. කාශ්මීරය ලෝකයේ පිහිටි සුන්දර ම රටක් ලෙස පිළිගැනේ. ඊට ඇතුළු වූ බාබුර්* 'දිව්‍ය ලෝකයට පැමිණියේ ය' යි කෑගැසූ බව කාශ්මීර ජනප්‍රවාදයේ සඳහන් වේ.

භාරතයෙන් බැහැර රටවල් ගණනාවකට ධර්මදූත කණ්ඩායම් යැවූ ධර්මාශෝක අධිරාජයා, දූත කණ්ඩායම් තේරීමේ දී කණ්ඩායම යන රට හා ඥාති සම්බන්ධකම් ඇති දූත පිරිසක් ම තෝරාගත්තේ ය. මැසිඩෝනියාවට වැඩම කළේ යෝනක ධම්මරක්ඛිත තෙරුන් ගේ නායකත්වයෙන් යුතු ග්‍රීක පිරිසකි.[11] යෝන යනු ග්‍රීකයෝ වෙති. ලංකාවේ පුරාණ ලේඛනවල ග්‍රීකයන් සඳහා කාක සහ යෝන යනුවෙන් නම් දෙකක් සඳහන් වෙයි. සෙල්ලිපිවල ග්‍රාමණේයවරුන් පිළිබඳ ව ද සඳහති. මොවුන් ගේ මුල් බිම් ඉන්දු නදී ප්‍රදේශය යි. අලෙක්සැන්දර් ගේ හමුදාවට බිහිසුණු තර්ජනයක් එල්ල කළ ග්‍රාමණේයවරුන් යුද්ධ භූමියේ මිය ගිය විට, ඔවුන් ගේ භාර්යාවන් කඩු රැගෙන සටනට පැමිණි අන්දම ග්‍රීක ඉතිහාසඥයන් සඳහන් කර තිබේ. ග්‍රීකයන් අතින් පැරදුණු ග්‍රාමණේය ක්ෂත්‍රියයෝ රැකවරණය පතා වෙනත් රටවලට පලා ගියෝ ය.[12] ඔවුන'තරින් පිරිසක් ලංකාවට ද පැමිණිය හ. ග්‍රීකයන් වයඹ දිග ඉන්දියාවේ රාජ්‍ය පාලනය පිහිටුවා ගත් පසු, ඔවුන් ග්‍රාමණේයයන් සමග සම්බන්ධකම් පැවැත්වූ අතර සැලියුකස් නිකේටර් වැනි ග්‍රීක පාලකයන් ලංකාව සමග ද සබඳකම් පවත්වා තිබේ.

---

* භාරතයට පැමිණි පළමු වන මහමදික ආක්‍රමණිකයා.

ග්‍රාමණේය යන්නෙහි අර්ථය ග්‍රාම නායකයා යන්න යි. දුටුගැමුණු යනු ජ්‍යෙෂ්ඨ ග්‍රාමණේය නොහොත් නායක ගාමිණී බව මහාචාර්ය පරණවිතාන පැහැදිලි කර තිබේ. කාවන්තිස්ස රජතුමා කාක භාෂාව දන සිටියේ ය. අශෝක රජතුමා ගේ බිරිය වේදිස, එතුමා වයඹ ඉන්දු නිම්නයේ පාලකයා වශයෙන් සිටිය දී පාවාගත් ග්‍රීක කාන්තාවකි. මහින්ද හා මිත්තා ඇය ගේ දරුවෝ වෙති.* අශෝක රජතුමා ලංකාවේ ධර්ම ප්‍රචාරය පිණිස තම දූපුතුන් ම මෙහි එවීමට එක් හේතුවක් වූයේ ග්‍රාමණේය/ග්‍රීක සබඳතාව යි.[13]

අශෝක ධර්මදූත ප්‍රතිපත්තිය අනුව පලස්තීනයට යැවූ භික්ෂූන් අතර හීබෲ බසින් ධර්මය දේශනා කළ හැකි කාශ්මීර භික්ෂූන් සිටිය යුතු ය. කනානයේ බුදු සසුන පිහිටුවූ උන්වහන්සේලා, පර්සියාව, ඇෆ්ගනිස්ථානය සහ ඊජිප්තුව යන රටවල පිහිටි යුදෙව් ජනපදවල ද බුදු සසුන ව්‍යාප්ත කළ හ. මේ අතරින් වඩාත් කීර්තිමත් බෞද්ධ ජනපදය භාරතයේ සිට අපරදිගට වැටුණු ප්‍රධාන තවලම් මාර්ගයේ රමණීය බිම් පෙදෙසක් වූ ඇෆ්ගනිස්ථානයේ බමියාන්** සාතුවේ ගොඩනහා තිබුණි. බමියාන් යනු බුද්ධ භූමිය යි. පුරාණ ලෝකයේ පිහිටි විශාලතම සිටි, හිඳි සහ සැතපෙන පිළිම බමියාන්හි ප්‍රධාන විහාරයේ නිර්මිත ව තිබුණි.

---

* "මහා වංසෙ පවසන්නෙ අසොක කුමාර කාලෙදි පිය රජු ගෙන් ලැබුණු උදේනි නුවර රජකම කරවන්න යන ගමන් විදිසා නුවර නැවතිලා ඉදිද්දි ඒ නුවර සෙට්ඨියා ගේ දු සමඟ හිත් ඇතිවෙලා ඇය සමග වාසයෙන් පුතෙකුත් දුවකුත් ලබා ගත්ත බවයි." (මහින්දාගමනය ගැන අලුත් මතයක්, මහාචාර්ය සෙනරත් පරණවිතාන, රසවාහිනී, දිනය සොයාගත නොහැකි විය.)

** බමියාන් විහාරය ඇෆ්ගනිස්ථානයේ බමියාන් සාතුවේ පිහිටුවා තිබුණි. එහි නේවාසික භික්ෂූන් වහන්සේලා පන්දහසක් වැඩ විසූ බව හියුං සාං වාර්තාවේ සඳහන් වේ. වර්තමානයේ බමියාන්වල එක ම බෞද්ධයකු හෝ නොමැත. බමියාන් පුරාණ විහාරයේ බෞද්ධ සිතුවම් සහිත ලෙන් සිය ගණනක් තිබේ. මේවා චීනයේ ටුං හුවා ලෙන්වලට ඉතා සමාන ය. ඇෆ්ගන් යුධ අනාථයෝ ලෙන්වල පදිංචි ව සිටිති. ඔවුන් නිසා සියලු ම ලෙන් චිත්‍ර විනාශ වී යන අතර නටබුන් ලෙස තවමත් සුරක්ෂිත ව ඇති බමියාන් පිළිම වහන්සේලා විනාශ කළ යුතු ය යි තලිබාන්වරුන් තීරණය කර ඇත. බමියාන් පිළිම වැනසීම අපරාධයක් ලෙස හඳුන්වමින් ඊට ප්‍රථම විරෝධතාව දක්වූයේ ඉන්දියාවේ මධ්‍යම ආණ්ඩුව යි. ඉක්බිති බමියාන් පිළිම රැකගැනීම සඳහා ලෝක ජනමතයක් ඇති වුණි. අප ද අන්තර්ජාලය ඔස්සේ ශ්‍රී ලංකාව වෙනුවෙන් ඊට දායක වීමු.

කාබුල් කෞතුකාගාරයෙහි වූ ඇෆ්ගනිස්ථානයේ බෞද්ධ පුරාවස්තු සහ පූජනීය ස්ථාන පිළිබඳ සියලු ම ලේඛන තලිබාන්වරුන් ගිනි තබා ඇත. ටයිම් සරාවේ පළ වූ ඡායාරූපයකි



බෞද්ධ ලංකාවේ සමහර මහමදික දේවස්ථාන අසලින් යන විට වාහනවල තළා හැඬවීම පවා තහනම් ය. ඇෆ්ගනිස්ථානයේ බමියාන් විහාරයේ බුදු පිළිම ඉදිරියේ මස් කඩයක් දමාගත් මහමදිකයකු බැටළුවකු හම ගසන අයුරු මෙම චිත්‍රයෙන් දක්වෙයි. රටවල් සහ රටවැසියෝ කෑතියෙනි.

කාශ්මීර බෞද්ධයන් අතර, පසු කලෙක මහායාන බුදු සසුන වඩාත් ජනප්‍රිය වූයේ ය. ඊටත් පසු කලෙක මහායානය තුළින් උපන් තන්ත්‍රයාන හා වජ්‍රයාන නිකායයන් පැතිර ගියේ ය.[14] කාශ්මීරයේ ඉපදී සසුනට ඇතුළු වූ කීර්තිමත් සිද්ධවරයන්* කිහිප දෙනකු ගේ නම් ශේෂ වී තිබේ. තේ පානය ලොවට හඳුන්වා දී ඇත්තේ චීනයට වැඩම කළ බෝධි ධර්ම නමැති දකුණු ඉන්දියානු භික්ෂුව විසිනි. කෝපි පානය ලොවට හඳුන්වා දුන් නිකොයුදසුත්ත කාශ්මීර සිද්ධවරයෙකි.[15]

තන්ත්‍රයාන සහ වජ්‍රයාන සසුන් තුළින් පහළ වූ උප නිකායයන්හි අභිචාර හා වන්දනා ක්‍රම රටින් රටට වෙනස් වූයේ ය. භික්ෂූන් වහන්සේලා ගේ සිවුරු පැහැය සහ සිවුරු පොරවන ක්‍රමය ද සමාන නොවිණි. නිකාය සංග්‍රහයේ නිල් සිවුරු පෙරවූ තන්ත්‍රයානික නිකායක් ගැන සඳහන් වේ.[16] කස්සප බුදුන් සමයේ සිට යෝනක ස්ථවිරවරු සුදුපාට සිවුරු ම පෙරවූ හ. ඔවුන් ගේ රටෙහි පැවති ආගම සිහිවීම වශයෙන් එසේ කරන ලද බව සඳහන් ය.[17]

බෝසත් යේසු

යොහාන් දේශකයා යේසු ගේ ඥාතියෙකි. ළමා යේසු ගේ ජීවිතයට බෙහෙවින් බලපෑ එතුමා මුණගැසීම ටිබෙටයේ සිට පලස්තීනයට පැමිණි බෝසත් යේසු ගේ පළමු කාර්යය වූයේ ය. තම ශිෂ්‍යයන්ට යේසු හඳුන්වා දුන් යොහාන් ලාමාවරයා, 'නුඹලා නොහඳුනන කෙනෙක් නුඹලා අතරට පැමිණ සිටියි. එතුමා මට පසු ව එන දේශකවරයාණෝ ය. උන් වහන්සේ මට වඩා කොයි උතුම් තරම් ද යි කීවොත්, මා උන් වහන්සේ ගේ වහන් සහලේ පටි මුදන්නට තරම් වත් සුදුසු නොවේ' ය යි කීවේ ය.[18]

සිය ධර්ම ප්‍රචාරය ආරම්භ කළ යේසු භික්ෂුව, 'නුඹලා බලාපොරොත්තුවෙන් සිටින දෙවියන් ගේ පුත්‍රයා මම වෙමි. නුඹලා ගේ ගැලවුම්කරුවා මම වෙමි' කියමින් යුදෙව් වර්ගයා ඉතිහාසය මුළුල්ලේ බලාපොරොත්තුව සිටිනා පුද්ගලයා තමා බව ඔවුන්ට කීයේ ය. යේසු කළේ අතිශය බරපතල ප්‍රකාශයකි. රබීවරුන් තර්ක කළ ලෙසට යේසු දෙවියන්ට අපහාස කරමින් මෙසායා මුළා කරන්නට වූයේ ය. යේසු වනාහි රබීන් අනුමත නොකළ ආගමකට අයත් පූජකයෙකි. භික්ෂුවක බයිබල් ඉතිහාසයට සම්බන්ධවීමට උත්සාහ දරන අයුරු ඔවුහු දුටුව හ.

යුදෙව් ජනතාව සදාචාරාත්මක ව පිරිහී සිටිනු දුටු යේසු එහි වරද රබීවරුන්ට පවරමින් ඔවුන් විවේචනය කරන්නට වූයේ ය. බුද්ධ ශ්‍රාවකයකු වශයෙන් යේසු, සිය ශාස්තෘවරයා අනුගමනය කළා විය හැකි ය. එහෙත් රබීවරුන් සහ භාරතීය බ්‍රාහ්මණයන් අතර පූජකයින් වශයෙන් විශාල අසමානතාවක් පැවතිණි. බ්‍රාහ්මණයා යනු ඉතා දීර්ඝ ආගමික ඉතිහාසයකට සම්බන්ධ පූජකයෙකි. ආයුර්වේදය ගොඩනැංවූ සෘෂිවරු විද්‍යාඥයෝ වූ හ. යෝග ශාස්ත්‍රය බිහි කළ පතංජලී, කාල්පනිකයෙකි. යෝග ශාස්ත්‍රය විග්‍රහ කෙරෙන ආත්ම විද්‍යාව නැමති සුප්‍රසිද්ධ ග්‍රන්ථයේ පතංජලී හඳුන්වා ඇත්තේ මෙසේ ය.

"පතංජලී ආගමික ලෝකයේ විද්‍යාඥයා ය. පරම විඥානයේ ගණිතඥයා ය. අන්තර් ඥානය ඔප්පු කළ තාර්කිකයා ය."[19]

ගෞතම බුද්ධොත්පත්තිය, අභිනිෂ්ක්‍රමණය ආදිය හෙළිදරව් කළේ ද, සිදුහත් කුමරුට ශාස්ත්‍ර ඉගැන්වූයේ ද බ්‍රාහ්මණයන් විසිනි. බුදුන් වහන්සේ පළමු ව ආර්ය අෂ්ටාංගික මාර්ගය දේශනා කළේ ද බ්‍රාහ්මණයන් පිරිසකට ය.

මහා බ්‍රහ්මයා ලොව මැවී ය යන්න බ්‍රාහ්මණයන් ගේ පිළිගැනීම වූ අතර, භාරතීය වැසියෝ බ්‍රාහ්මණ ධර්ම අදහමින් තිස් තුන් කෝටියක් දෙවිවරුන් වන්දනා කළ හ. සිද්ධාර්ථ කුමරා, බ්‍රාහ්මණයන් ගෙන් මූලික අධ්‍යාපනය ලබා, බුදු වූ පසු ද බ්‍රාහ්මණ ධර්ම පමණක් නොව, බ්‍රාහ්මණ පූජකයන් පවා නිර්දය ලෙස විවේචනය කළේ, පොදු ජනයා දෙඩූ ප්‍රාකෘත භාෂාවෙනි. සංස්කෘත යනු දේව භාෂාව විය. ප්‍රාකෘත යන වදනෙහි අරුත අපිරිසිදු යනු යි.[20]

'ලෝකය මැවූ මහා බ්‍රහ්මයා, බ්‍රාහ්මණයන් සිය මුඛයෙන් මැවූ බව' කී විට, බුදුන් වහන්සේ, මහා බ්‍රහ්මයා ගේ මුඛය ස්ත්‍රී යෝනියකට සමාන කළ හ. ඉන් කෝප වූයේ බ්‍රාහ්මණ පූජකයින්

---

* මහායාන බුදු සමයේ විකාශනය අවසන් වූයේ සිද්ධවරයන් බිහිවීමෙනි. සිද්ධවරයන් යන්නෙහි සරල තේරුම සෘද්ධීන් යන්න යි.

අතලොස්සක් පමණි. බුද්ධ ශාසනයේ ප්‍රසිද්ධ භික්ෂූන් වහන්සේලා අතරින් බහුතරය බ්‍රාහ්මණයෝ වූ හ. විවේචනය, තර්කය සහ වෙනත් ආගම් දර්ශන ඉවසීම බ්‍රාහ්මණ සම්ප්‍රදායයක් වූයේ ය. **කජුරාහෝ** බඳු මෛථුන ප්‍රතිමා පිරුණු දේවාල ගම් ගොඩනැංවූයේත්, **කාමසූත්‍ර** බඳු සූත්‍ර ග්‍රන්ථ රචනා කළේත් පැරණි සම්ප්‍රදාය බිඳිමින් නව සම්ප්‍රදායයන් සෙවූ එබඳු බ්‍රාහ්මණයන් ය. චාර්වාක ද බ්‍රාහ්මණයෙකි. මෙබඳු සම්ප්‍රදායයක් යුදෙව් රබීවරු නොදත් හ. අනිකුත් ආගම් දර්ශන මිථ්‍යා විශ්වාසයන් ලෙස සලකා මර්දනය කිරීම ඔවුන් ගේ සම්ප්‍රදාය හා නීතිය වූයේ ය.

යුදෙව් ආගම ප්‍රකාශ කරන මැවුම්කරුවා හෙවත් යොහෝවා තමන් හැර තවත් දෙවිවරුන් සිටින බව පිළිගන්නෙකි. ඔහු, 'මම නුඹලා ලොවේ සිටින ශ්‍රේෂ්ඨතම මනුෂ්‍ය ජාතිය බවට පමුණුවමි. නුඹලා මා හැර අනිකුත් දෙවිවරුන් සරණ නොයායුතු ය' යි යුදෙව්වන්ට අණ කළේ ය. එය අල්ලස් ක්‍රමයකින් මහජනයා දිනීමකි. යොහෝවා ගේ පූජක පිරිස වූ රබීවරු, තිඹිරිගෙයි සිට ම අනෙකුත් දෙවිවරුන් ඇදහීම තුරුස්සන මූලධර්මවාදී පිරිසක් වූවෝ ය. පසු කලක සංවිධානය වූ මහමදික සහ ක්‍රිස්තියානි ආගම්වල දේවගැතිවරුන් මූලධර්මවාදීන් වූයේ යුදෙව් ආගම අනුගමනය කරමින් තම ආගම් සකස් කිරීම නිසාවෙනි. තමා අදහන දෙවියන් හැර අනෙකුත් දෙවිවරුන් නොපිළිගැනීම, තම ආගමට පිටස්තර සියලු ආගම් සහ ඇදහිලි මිථ්‍යා විශ්වාස ලෙස ප්‍රකාශ කිරීම සහ මිථ්‍යා දෘෂ්ටිකයින් විනාශ කිරීම, කතෝලික හා මහමදික ආගම් සිය ආගමික ප්‍රතිපත්ති ලෙස ක්‍රියාත්මක කළේ ය.* අදටත් මොවුන් ගේ අප්‍රසිද්ධ ආගමික ප්‍රතිපත්තිය තමන් ගේ ආගමට දිනාගැනීම යි. යුරෝපය හා ඇමරිකාව මූලස්ථානය කර ගත් කිසි ම මිෂනාරී සංවිධානයක් ලෝකයේ කිසි ම තැනක කිසිදු පුද්ගලයකුට පරාර්ථ සේවයෙන් උපකාර නොකිරීම මීට හොඳ ම නිදසුනකි. මිෂනාරී සංවිධානයක් අසරණයකුට හෝ විපතට පත්වූවකුට හෝ උපකාරයක් කරන්නේ තම ආගමික සංවිධානයට එම පුද්ගලයා ඇතුළු කරගැනීමේ පරමාර්ථයෙන් පමණි. එය දෙපාර්ශවයක් අතර සිදුවන ගනුදෙනුවකි.

1999 නත්තල් දා දිවයින පුවත්පතට ලිපියක් සැපයූ අර්නස්ට් පෝරුතොට පියතුමා, යේසුස් වහන්සේ ආසියාවේ දී නැවත උපදීමක් පිළිබඳව පවසා තිබුණි. 'එහි එක් අරමුණක් වන්නේ ආසියාවේ ජීවත් වන කතෝලිකයන් ක්‍රිස්තුස් වහන්සේව අදහන හැටි, උන්වහන්සේ ගේ කිතුණු චින්තනය තම සහෝදර සහෘද රටවැසියන් සහ ආගමිකයන් අතර බෙදාහදා ගන්නා හැටි ආසියාතික විය යුතු යි යන පදනම' බව කියන පියතුමා, ''එසේ නොමැතිව ආසියාවේ ආගම් අට (08) අදහන අය කෙසේ හෝ ක්‍රිස්තියානි ආගමට ගුප්තව හරවාගැනීමේ රහසිගත සැලැස්මක් අනුව නොවන බව' ද පුන පුනා කිහිප වරක් ම සඳහන් කර තිබුණි.[21] හොරාට කලින් කෙහෙල් කැන වැට පැන්නා වගේ ය යි පිරුළක් තිබේ. 'මොන යම් ක්‍රමයකින් හෝ අන්‍යාගමිකයන් ක්‍රිස්තියානියට හැරවීමේ රහසිගත සැලැස්මක් ද ක්‍රියාත්මක වන බව මේ ප්‍රකාශයෙන් ගම්‍ය වෙයි. කතෝලික ආගමට දිනාගැනීමේ කටයුතු 2000 වර්ෂයේ දී උත්සන්න වී ඇති බව පෙනේ. ඔක්ස්ෆර්ඩ් විශ්වවිද්‍යාලය පළ කළ සිතුවම් සහිත ක්‍රිස්තියානි ඉතිහාසය කෘතියෙහි දක්වෙන පරිදි 2000 වසර අවසන් වන විට වන විට දස ලක්ෂ 2020ක් ක්‍රිස්තියානි කිරීමේ සැලැස්මක් ක්‍රියාත්මක ව පවතී.[22]

කිසියම් ආගමක් සංවිධානයක් වූ විට දේශපාලනය හා සම්බන්ධ වේ.[23] බුදුරජාණන් වහන්සේ, බුදුන් පිරිනිවන් පෑ පසු බුදු සසුනේ නායකත්වය පිණිස භික්ෂුවක් නම් කරන ලෙස දේවදත්ත කළ යෝජනාව ප්‍රතික්ෂේප කළේ බුදු සසුන සංවිධානයක් වීම වැළැක්වීම පිණිස ය. සංවිධානයක පරමාර්ථය බලය තහවුරු කරගැනීම යි. බලයට ආශාව යනු තෘෂ්ණාව යි. මහමදාගම, කතෝලික හා ක්‍රිස්තියානි ආගම් සංවිධානයන් ය. එහෙත් යුදෙව් හා යුදෙව් ආගම අනුසාරයෙන් උපන් මහමදික හා ක්‍රිස්තියානි ආගම් සාමය යන වචනය හඬ නැඟීමට දැඩි කැමැත්තක් දක්වයි.

නිදා සිටින කාලය තුළ පමණක් කඩුව ඉණෙන් ගැළවූ

---

* කතෝලික සභාවේ උපදෙස් මත කතෝලික අධිරාජවරුන් පැනවූ ආඥා: ''සියලු ම මිථ්‍යා ඇදහීම් නැතිකර දැමිය යුතු ය. එසේ වුව ද ප්‍රාකාරයෙන් පිට ඇති සියලු ම දේවස්ථාන ගොඩනැගිලි නොකඩවා ආරක්ෂා කරනු දකීමට කැමැත්තෙමු.'' (340 3 ආඥාව) ''ප්‍රතිමාවලට බලි පූජා කරන හෝ ප්‍රතිමා වන්දනා කරන හෝ කවරකු වුව ද මරණයට පත්කළ යුතු යැයි අපි ආඥා කරමු.'' (356 - 6 ආඥාව). කතෝලික ආක්‍රමණය, බෞද්ධ ජාතික බලවේගය, 1963, පි. 43.



ක්‍රි.ව. 1900 සිට 2000 කාලසීමාව දක්වා ක්‍රිස්තියානි ආගමේ ව්‍යාප්ති ඉලක්කය



PEOPLE PRACTICING THE SEVEN MAJOR RELIGIONS

Source: World Almanac, 1995

WORLD		NORTH AMERICA	
Judaism	18.1 million	Judaism	6.8 million
Christianity	1.9 billion*	Christianity	241 million*
Eastern Orthodox	*174 million*	*Eastern Orthodox*	*6 million*
Protestant	*383 million*	*Protestant*	*97 million*
Roman Catholic	*1 billion*	*Roman Catholic*	*98 million*
Islam	1 billion	Islam	3.3 million
Hinduism	752 million	Hinduism	1.3 million
Buddhism	335 million	Buddhism	560,000
Confucianism	6.2 million	Confucianism	26,000
Traditional Chinese religions (including Taoism)	141 million	Traditional Chinese religions (including Taoism)	123,000

*The totals given for Christianity include Eastern Orthodox, Protestant, Roman Catholic, Anglican, and other Christians.

ආගම් අනුව ලෝක ජනගහනය (1995)

මොහොමඩ්තුමා කඩු කොපුවේ ඉස්ලාම් යන වචනය කාටදෝ කියා ලියවාගෙන තිබුණේ ය. ඉස්ලාම් යනු සාමය යි. මහමදිකයන් සාමය වෙනුවෙන් ජිහාද් නම් ආගමික. යුද්ධ කරති. ක්‍රිස්තියානීහු ශුද්ධ වූ යුද්ධ (Crusade) කරති. කන්වර්ටඩ් කෘසේඩ්ස් (Cunverted Crusades) නම් මිෂනාරී කණ්ඩායම ක්‍රිස්තියානියේ පැවැත්ම වෙනුවෙන් මනුෂ්‍ය ඝාතනයේ යෙදෙන පිරිසකි. ලංකාවේ වැඩවිසූ, රට දැය සමය වෙනුවෙන් අරගල කළ එඩිතර භික්ෂූන් වහන්සේලා බොහොමයක් දෙනා අපවත් වී ඇත්තේ බඩේ අමාරු හැදීමෙන් බව රහස් වාර්තාවලින් හෙළිදරව් වී ඇති බවත් මෙය සැකකටයුතු කරුණක් බවත් මහ තෙර නමක් අප හා පැවසූ හ. සංඝයා වහන්සේලා බොහෝ කොට ම යැපෙනුයේ සැදැහැවතුන් ගෙන් ලැබෙන දානමානවලිනි. සංවිධානාත්මක පුද්ගලයනට දාන වේලට වස මුසු කිරීම එතරම් අපහසු නැත. ලංකාවේ භික්ෂු ඝාතනය ඇරඹුණේ බෞද්ධ බලවේගය සංවිධානයේ පුරෝගාමියකු වූ කොටගම වාචිස්සර හිමි මරා දැමීමෙනි. යුගයේ ජනප්‍රිය ම භික්ෂුව වූ උන්වහන්සේ 'ඇපැන්ඩිසයිටිස් ශල්‍යකර්මයේ' දී ද්‍රවිඩ වෛද්‍යවරියක විසින් දෙන ලද වැරදි එන්නතක් විස වීමෙන් අපවත් වූ හ. ඇතැම් භික්ෂූන් වහන්සේලා මීට වෙනස් ක්‍රමවලට අපවත් වී ඇත. පානදුරේ අරියධම්ම ස්වාමීන් වහන්සේ නිදසුනකි. බණ්ඩාරනායක ඝාතනයට වරදකරුවන් කොට මරාදමන ලද සෝමාරාම භික්ෂුව තමා නිවැරැද්දේ අපරාධකරුවකු වූයේ ය යි තමාට පැවසූ බව එකල බන්ධනාගාර ප්‍රධාන ජේලර්වරයා හෙළි කළ තොරතුරු ඇතුළත් ලිපියක් ලංකාදීප පුවත්පතේ පළ විය. බුද්ධ රක්ඛිත හිමියෝ තමා බණ්ඩාරනායක ඝාතනයට සම්බන්ධ නැති බව වාචික ව ද ලිඛිත ව ද කියා සිටිය හ.* බණ්ඩාරනායක ඝාතනයට භික්ෂූන් වහන්සේලා හසු කිරීම කුමන්ත්‍රණයක් ය යි සැක කරන්නෝ සිටිති. එසේ ම බොරු අපචාර චෝදනාවලට බෞද්ධයන් හසු කිරීමේ කූට ව්‍යාපාරයක් ද ක්‍රියාත්මක බව හෙළිදරව් වෙමින් පවතින්නේ ය යි මාධ්‍යවේදී මතුගම සෙනෙවිරුවන් අප හා කී ය.

යෙරුසලම බේරාගැනීමට කළ යුද්ධය, පාප් හැදින්වූයේ

---

* එල්ලුම් ගහ මුල දශක තුනක අත්දැකීම්, ප්‍රසන්න සංජීව තෙන්නකෝන්, ඉරිදා ලංකාදීප, 2001 ජනවාරි 7, සහ 14

මොහොමඩ්තුමා ආගම් ප්‍රචාරයේ යෙදෙන අයුරු දක්වෙන චිත්‍රයක්
Jacobb, Williams. World Religions



DOVE
John the Baptist saw the Holy Spirit enter Jesus in the form of a dove.

"යේයුස් වහන්සේ ගේ සිරුරට ශුද්ධ වූ ආත්මය පරවියකු වේශයෙන් ඇතුළු වනු ජෝන් ද බැප්ටිස්ට් දුටු වේ ය."
Methologies & Religions

ශුද්ධ වූ යුද්ධය නමිනි. මහමදිකයන් ඉස්ලාම් යන පදය භාවිතයට ගත් නිසා ක්‍රිස්තියානීහු ද සාම ලාංඡනයක් නිර්මාණය කළ හ. ඒ පරෙවියා යි. යේයුස් වහන්සේ ගේ සිරුරට ශුද්ධ වූ ආත්මය පරෙවියකු වේශයෙන් ඇතුළු වන ජෝන් ද බැප්ටිස්ට් දුටු බව ක්‍රිස්තියානි ග්‍රන්ථවල සඳහන් වේ.[24] පරෙවි ලාංඡනය ඇති සැම මෑතක ම ක්‍රිස්තියානි මූලධර්මවාදීහු සැඟ වී සිටිති. පරෙවියා පෙරදිග රටවල පණිවිඩකාරයෙක් වූයේ ය; රෝමයේ ඔත්තු බැලීම පිණිස යොදාගත් පක්ෂියා ය.

රබීවරු යේසු කෙරෙහි කෝප වූ හ. දෙවියන් ගේ පුත්‍රයා වශයෙන් තමන් හඳුන්වා ගන්නා යේසු, යුදෙව් ආගම වැනසීම පිණිස ඊශ්‍රායලයට පැමිණි, යක්ෂයා ගේ නියෝජිතයකු ය යි ඔවුහු ප්‍රකාශ කළ හ. කිසියම් පුද්ගලයකු ඝාතනය කිරීම සඳහා රබීවරුන් යොදාගත් සරල ම උපක්‍රමය මෙය යි. වෙනත් ආගම් අදහන්නන් සහ සොබාදහම වන්දනා කරන්නන් යක්ෂයා විසින් වසඟ කරගනු ලැබුවන් ය යි චෝදනා කිරීම, ක්‍රිස්තියානි හා මහමදික පූජකවරුන් ගේ චාරිත්‍රයකි. ඔවුන් ගේ එම සිරිත රබීවරුන් ගෙන් ලබාගත්තකි. රබීවරුන් යේසුට විරුද්ධ ව ඉදිරිපත් කළ, යක්ෂයා සමඟ සබඳතා පැවැත්වීමේ චෝදනාව අකර්මණ්‍ය වූ විට ඔවුහු වෙනත් චෝදනා ඉදිරිපත් කළ හ.

1. යේසු, තමා දෙවියන් වහන්සේ ගේ පුත්‍රයා බව කියමින් දෙවියන් වහන්සේට නින්දා කළේ ය.
2. යේසු, තමා යුදෙව්වන් ගේ රජු බව කියමින් ජනතාව රැවටුවේ ය.

මෙයින් පළමුවන චෝදනාව මඟින් ප්‍රකාශ වූයේ යේසු යුදෙව් ව්‍යවස්ථාවට අයත් දස පනතේ තුන් වැනි වගන්තිය උල්ලංඝනය කළ බව යි.

රෝම ආණ්ඩුකාරයා ද යේසුට චෝදනා එල්ල කළේ ය.

1. රෝම ආණ්ඩුවට අයබදු ගෙවීම පැහැර හැරීම.
2. මහජනතාව කැරැල්ලක් සඳහා පෙළඹවීම.

මෙසේ, පැමිණිලි පාර්ශවයන් දෙකක් විසින් යේසුට බරපතල චෝදනා එල්ල කර තිබුණි.[25]

අධිකරණ විනිසුරු වශයෙන් කටයුතු කළ රෝම ආණ්ඩුකාර පොන්ටියස් පිලාතේ, යේසු අහිංසකයකු බව කී නමුදු, නායක

පූජකයා ගේ ඉල්ලීමට පිටු පෑමට නොහැකි බැවින් එතුමන්ට ලීකදේ ඇණ ගැසීමේ මරණ දඬුවම නියම කළ බව බයිබලයේ සඳහනි. ටිබෙට් මූලාශ්‍ර දක්වන පරිදි, යේසු ඊශ්‍රායලයට පැමිණ දේශන පැවැත්වීමට පටන්ගත් පළමු දින සිට, නගරාධිකාරීහු, යේසු පාලකයන්ට විරුද්ධ ව ජනතාව පොළඹවතැ යි ආණ්ඩුකාරයාට දන්වූ හ. පිලාතේ ගේ චරපුරුෂයෝ, යේසු ගේ සෙවණැලි වූවෝ ය. යේසුට මරණ දඬුවම නියම කළ පිලාතේ, යේසු ගේ අනුගාමිකයන් පසුපස හඹායමින් ඔවුන් දඩයම් කරවී ය. අවසානයේ එසින්ස් සසුන සෝදාහරිනු ලැබුවේ ය. සිදුවීම් මෙතරම් පැහැදිලි ව තිබිය දී, පිලාතේ යහපත් මිනිසකු බව බයිබලය සඳහන් කරන්නේ ඇයි? පිලාතේ රෝම පුරවැසියෙකි. පසු කලෙක අලුත් තෙස්තමේන්තුව සැකසූ රෝම දේවගැතිවරු, රෝමවරුන් ගේ ගෞරවය රැකගැනීම පිණිස පිලාතේ ගේ පව් සේදූ හ.

යේසු ගැන සෙවූ පිලාතේ, වරෙක එතුමා යම් නගරයක දේශනයක් පවත්වනු දැක, තමාට එම ස්ථානයට යාගත නොහැකි නිසා චරපුරුෂයන් යැවූ සැටි බයිබලයේ විස්තර කෙරේ. දක්ෂ රාජ්‍ය පාලකයකු වශයෙන්, පිලාතේ, යේසු පිළිබඳ සියලු තොරතුරු රැස් කළේ ය. යේසු, ටිබෙට් ආගමික රාජ්‍යයේ නායක දලයි ලාමා වහන්සේ ගෙන් අභිෂේකය ලැබූ බෝධිසත්වයකු බව ඔහු දැන සිටියේ ය. බෝධිසත්වවරයකු යනු, ලෝකය ගලවා ගැනීම පිණිස කලාතුරකින් පහළවන මහා පුරුෂයෙකි. එවැන්නෙක් මනුෂ්‍ය ලෝකයට එන්නේ දෙව්ලොවෙන් බව පැවසේ. දේවපුත්‍රයකු පැමිණ යුදෙව්වන් ගලවාගන්නා බව මෝසස් කියා තිබේ. බයිබලයේ ලේඛනගත වූ එම කතාව සනාථ කරන යේසු, 'දෙවියන් ගේ දරුවා වන මම ඊශ්‍රායල්වරුන් ගේ ගැලවුම්කරුවා වෙමි' යි කියා සිටියි. යේසු හා යුදෙව් ඉතිහාසය අතර සම්බන්ධතාවක් දුටු පිලාතේ, යේසු පසුපස එක්වන ජන බලවේගය දකිමින් භීතියට පත් වූයේ ය. කූට රාජ්‍ය තාන්ත්‍රිකයකු වූ ඔහු, යේසු විනාශ කිරීම රබීවරුන්ට බාරකර ඇත් වී සිටියේ ය.

රබීවරු යේසු ගේ ජනප්‍රියත්වය කෙරෙහි ඊර්ෂ්‍යා කළ හ. මෝසස්, වහලුන් වශයෙන් ඊජිප්තුවේ ජීවත් වූ යුදෙව් වර්ගයාට රටක් රාජ්‍යයක් ලබාදෙමින්, ආත්ම ගෞරවය ඇති ජාතියක් වශයෙන් ලොවේ ජීවත්වීමට ඉඩ සලසා දුන්නේ ය. ඔහු ඉගැන්වූ අන්දමට, යොහෝවා සතුරන් වැනසුවේ ය. සතුරාට අයත් නම්, යොහෝවා, බාල බිළිඳුන්, මහල්ලන් වුව අනුකම්පා නැති ව විනාශ කළේ ය. යේසු, යොහෝවා ගේ පුත්‍රයා නම්, තම පියා අනුගමනය කළ යුතු වන්නේ ය. එහෙත්, යොහෝවා ගේ එක ම පුත්‍රයා බැව් පවසන යේසු කටයුතු කරන්නේ පියා පරිද්දෙන් නොවේ. ඔහු පියා ගේ ඉගැන්වීම් වෙනස් කරමින් සතුරාට ප්‍රේම කරන්නට කියන්නේ ය; වම් කම්මුලට ගැසූ පුද්ගලයාට දකුණු කම්මුලත් අල්ලන්නට කියන්නේ ය; උතුරු සළුව පැහැර ගත් පුද්ගලයාට දකුණු සළුවත් දෙන්නැ යි කියන්නේ ය යි ඔවුහු යේසු විවේචනය කළ හ.

මෝසස් පිහිටුවූ ඊශ්‍රායලය රෝමවරුන් විසින් යටත් කරගෙන ඇත. ඊශ්‍රායල් වර්ගයා, රෝමවරුන් ගේ වහලුන් වී සිටිති. ඔවුන්ට අවශ්‍ය වී ඇත්තේ රෝමවරුන්ට දකුණු කම්මුල ඇල්ලීමට නොවේ. රෝමවරුන් ගෙන් නිදහස ලබාගැනීම යි. යේසු, යුදෙව් ජාතියේ ආත්ම ශක්තිය වනසන, යුද මනස දියාරු කරන, ජන බලවේගය ඔවුන් වෙතින් උදුරාගන්නා පුද්ගලයකු හැටියට රබීවරු තීන්දු කළෝ ය.

යේසුස් වහන්සේ පලස්තීනය රෝමවරුන් ගෙන් නිදහස් කර ගැනීමේ ව්‍යාපාරය සාමකාමී මඟකින් මිස මෝසස් කළ පරිදි යුද්ධයකින් තීරණය කිරීමට නොසිතූ හ. එතුමන් ටිබෙටයේ සිට ඊශ්‍රායලයට පැමිණියේ යුදෙව්වන් කෙරේ කරුණාවෙනි. එතුමාට තම වර්ගයා ගලවා ගැනීමට අවශ්‍ය නොවූයේ නම්, ටිබෙටයේ වාසය කිරීමට පුළුවන්කම තිබුණි. යේසු යුදෙව්වන් ගලවාගැනීමට උත්සාහ කළේ දේව රාජ්‍යයක් ගොඩනැංවීමෙනි. එතුමා අදහස් කළ දේව රාජ්‍යය ටිබෙටයේ පැවතුණාක් බඳු ආගමික රාජ්‍යයකි.

රබීවරු, යේසුස් වහන්සේ ගේ ධර්මය ඊශ්‍රායල් සම්ප්‍රදායික චින්තනය අනුව විනිශ්චය කරන්නට වූහ. එවිට ඔවුන් යේසු දුටුවේ, දස පනත උල්ලංඝනය කළ, මහජනයා මුළා කරන කපටියකු වශයෙනි. බර්බාස් මිනීමරුවෙකි; ස්ත්‍රී දූෂකයෙකි; බේබද්දෙකි. රබීවරුන් දුටු ලෙසට ඔහු ගෙන් සමාජයට හිරිහැරයක් මිස බලපෑමක් නො වුණි. යේසු ගෙන් සමාජයට හිරිහැරයක්

නොවෙතත්, ඔහු යුදෙව් ආත්මය වෙනස් කරමින් ඊශ්‍රායල් සමාජය උඩුයටිකුරු කරන සැටි ඔවුහු දුටුව හ. යේසු, පෙරදිග බෞද්ධ රාජ්‍ය නායකයකු වෙතින් බෝසත්වරයකු ලෙස අභිෂේක ලැබීම හාස්‍යයට ලක් කළ ඔවුහු, කටු ඔටුන්නක් එතුමාට පළඳවා, වීථිවල ප්‍රදර්ශනය කරවා, ගොල්ගොතා වධක භූමියට ගොනගොස් ලීකදේ තබා ඇණ ගැසූ හ. යුදෙව්වන් ගේ රජු ය යි භාෂා ගණනාවකින් ලියූ කොළයක් ප්‍රදර්ශනය කළ හ. 'උඹ දෙවියන් ගේ පුතා කීවා නේද? දන් දෙවියන්ට කියා ගැළවී කතාව ඔප්පු කරපන්' ය යි අභියෝග කළ හ.[26]

දෙවියෝ, යේසු ගලවා නොගත් හ; අඩු ම වශයෙන්, එතුමා ගේ දිය පිපාසය සංසිඳවීම පිණිස වැහි බිඳක් වත් පාත් නො කළ හ. රෝම සොල්දාදුවෝ යේසු ලීකදේ තබා ඇණ ගැසුවෝ ය.

බයිබලයේ උත්පත්ති පොතේ සඳහන් වන ලෙස දෙවියන් වහන්සේ පෘථිවියේ ගහ කොළ සතුන් මවා අවසානයේ දී ආදම් සහ ඒවා මැවූ හ. ඔහු ඔවුනට ගස් දෙකක් පෙන්වා ඒ ගසේ ගෙඩි නොකන්නැ යි කීවේ ය. සර්ප වෙසින් පැමිණි යක්ෂයා "ඒවා" වරදට පොළඹවා තහනම් ගස්වල ගෙඩි කෑමට උසිගැන්වී ය.

බයිබලයේ සඳහන් තහනම් ගස් හා නාගයා ගේ කතාව ඊජිප්තියානු ජනශ්‍රැතියකි. නාගයා පැරණි ලෝකයේ බුද්ධියේ සංකේතයකි. බයිබල් කතාවට පාදක වූ ජනශ්‍රැතියෙන් පැවසෙන අන්දමට ලෝකය මැවූ දෙවියන් වහන්සේ පුරුෂයා සහ ස්ත්‍රිය මැවූ හ. ඔවුනට රාත්‍රිය ගත කිරීමට සිදුවූ ස්ථානයේ තිබුණේ එක ඇඳකි. ඇඳේ නිදාගන්නේ කවුරුන් ද යන්න පිළිබඳ ව ඔවුන් අතර වාදයක් ඇති වී දබරයකට පෙරළුණි. දෙවියන් වහන්සේ මුල් අකීකරු ස්ත්‍රිය විනාශ කර පුරුෂයා ගේ ඉළ ඇටයකින් පුරුෂයා ගේ අණ පිළිපදින කීකරු ගැහැනියක් මැවූ හ. එවිට නාගයා ඉදිරිපත් වී ස්ත්‍රියට ප්‍රඥාව ලබා දුන්නේ ය.[27]

බයිබල් කතාකරුවෝ ජනශ්‍රැතියක් සොරාගෙන නාගයා යක්ෂයා ගේ නියෝජිතයා කළ හ. යුදෙව්වන් ගේ මැවුම්කරු ස්ත්‍රිය පහත් කොට සැලකුවෙකි. පුරාණයේ සර්පයා, යක්ෂයා ගේ නියෝජිතයකු ලෙස සළකා ඇත්තේ යුදෙව්වන් පමණි.[28]

තහනම් ගස් යනු මොනවා ද? සදාකාලික ජීවනය හා ප්‍රඥාව යි. දෙවියන් මනුෂ්‍යයාට සදාකාලික ජීවනය හා ප්‍රඥාව ලැබෙනවාට අකමැති මන්ද? එසේ වුව හොත් තමන් ගේ 'හුළං [illegible]' බව දන්නා හෙයිනි. මනුෂ්‍යයා සදාකාලික ජීවනය සහ ප්‍රඥාව හිමිකර ගත හොත් 'අප ගලවා ගත මැනව' යි දෙවියන්ට යාඥා කිරීම අවශ්‍ය නොවේ.

යේසුස් වහන්සේට ඇණ ගසන ලද්දේ පලස්තීනයේ පාලක [illegible]' විසිනි. එය ආණ්ඩුවක් යටතේ ක්‍රියාත්මක වූ අධිකරණයක් මගින් පුද්ගලයකුට පැමිණවූ දඬුවමකි. මනුෂ්‍ය ඝාතනය පමණක් නොව සත්ව හිංසාව පවා බෞද්ධ විශ්වාසය අනුව අකුසල් ක්‍රියාවකි. එහෙත් දේවධර්මාචාර්යවරු, යේසුට ඇණ ගැසීම පිළිබඳ ව මුළු මහත් මනුෂ්‍ය වර්ගයාට ම වරද පටවමින් බෞද්ධයින් වන අප සැම ද පව්කාරයන් බව කියති. තර්කය සැබෑ නම් කිසියම් පුද්ගලයකු ගේ පියා, අත්තා හෝ මීමුත්තා හෝ කළ වරදට පුතා හෝ මුණුබුරා හෝ දඬුවම් ලැබිය යුතු ය. ඇමරිකාවේ ඉන්දිය ශිෂ්ටාරය වැනසීමේ පාපයට වර්තමාන ඇමරිකාවේ ජීවත්වන සුදු ජාතිකයන් වගකිව යුතු ය. අසවේදු කළ අපරාධවලට ඉන්දියාවේ සිටින ලංකාවේ කටයුතු භාර පෘතුගාල මහ කොමසාරිස්වරයා හෙළා දකිය යුතු ය. බ්‍රවුන්රිග් ආණ්ඩුකාරයා උඩරට සිංහල රාජධානිය වැනසීමේ අපරාධයට බ්‍රිතාන්‍ය මහ කොමසාරිස්ට දොස් පැවරෙන්නේ ය. ලංකාවට වතු කම්කරු ද්‍රවිඩයින් දහස ගණනින් ගෙනවුත් අනවශ්‍ය ප්‍රශ්න ඇති කළේ [illegible] ය යි අප කිව යුත්තේ ය. කුඹුරු පනත ඉදිරිපත් කොට සිංහල සමාජය විනාශ කිරීම පිළිබඳ ව පිලිප් ගුණවර්ධන ගේ දරුවන්ට සාප කළ යුත්තේ ය.

එසීන්ස් නමින් බුද්ධ ශාසනයක් දන් ලෝකයේ නැත. එසින්ස් බෞද්ධයන්ට අයත් ව තිබුණේ ය යි කිය හැකි පුරාවස්තුවක් හෝ පලස්තීනයේ නොමැත. මිහිතලයෙන් වඳවූ එසින්ස් බෞද්ධ ශාසන ඉතිහාසයේ වැදගත් ම ඓතිහාසික සිද්ධිය යේසුස් වහන්සේ ලීකදෙන් ගලවා ගැනීම වන්නේ ය.

පාදක සටහන්

1 මතෙව් 2. 1- 2
2 මතෙව් 2. 11. 12
3 Hassnain, Fida, A Search of The Historical Jesus, Gateway Books, UK, 1994
"In Tibet and Ladak, special rituals are conducted for finding Bodhisatvas or Tulkus. When a head Lama passes away, monks are required to find his successor. They find the baby into whose body the soul of the departed Lama has taken refuge. A careful study of cosmic sings is conducted by Lamas......... As would be the custom with Buddhist Lamas, they come again later to take the child for education and worship." p50,
4 Paranavithana, Senarath, Bodhisattva Avalokiteshware in Ceylon, B. C. Law Bhandarker Research Institute, 1946, p15-18.
5 ජස්ටින් විජේවර්ධන, චීනයේ හා තිබ්බතයේ මහා සංඝ සංහාරය, ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, 1965.
6 Encylopeadea India, New Delhi, 1990
7 ගණන් කතාව 12.1 පරණ තෙස්තමේන්තුව
8 1. Al Beruni, Tr. Edward Sachau, London, 1880, 2. Catrou, History of Mougal Empire, Tr. Alex Moor, London, 1836. 3. Claudius, Christian Researches in Asia, London, 1912.
9 Hassnain, Fida, A Search of The Historical Jesus, Gateway Books, UK, 1994, p. 4-5
10 Hassnain, Fida, ibid, p.186
11 මහාවංශය, 12 වන පරිච්ඡේදය, 4 වන ගාථාව.
12 The Gramini in Ancient India, CHJ Vol-10, 1960.
13 Paranavithana, Senarath, The Greeks and the Mauryas, Lake House, Colombo, 1970.
14 Hassnain, Fida, Buddhist Kashmir, New Delhi, 1973.
15 කොලට් සේනානායක, සැඟවුණු සුවඳ, විසිදුනු ප්‍රකාශකයෝ, බොරලැස්ගමුව, 1995.
16 කඩවත ඒ. එස්. පෙරේරා, නිකාය සංග්‍රහය හෙවත් ශාසනාවතාරය, ආර්. පෙරේරා, 1935, 17 පිටුව.
17 තේජා ගුණවර්ධන, කොහොඹා කංකාරිය, අරුණ ප්‍රකාශකයෝ, 1979, 131 පිටුව.
18 යොහාන් 1. 26
19 Rajneesh, Bagavan, Yoga Vol. 3
20 Rajneesh, Bagavan, Dhammapada S8, Rebel Publishing House, Germany, 199
21 අර්නස්ට් පෝරුතොට පියතුමා, ජේසුතුමා ආසියාවේ නැවත ඉපදෙන්නට හද ඇයි?, දිවයින, 1999 දෙසැම්බර් 25
22 The Oxford Illustrated History of Christianity, Oxford University Press
23 Rajneesh, Bagavan, Priests and Politics, Rebel Publishing House, Germany 1992, p, 39,
24 Methologies & Religions, p18
25 The Crucifixion By An Eye Witness, p29-31, "Death warrant of Jesus"
26 මතෙව් 27. 40-44
27 Rajneesh, Bagavan, Rajneesh Bible Vol. 1, Discourse 16'
28 Rajneesh, Bagavan, ibid, "God is the Greatest fiction ever"

4

යෙරුසලමේ දුවරුනි, මා නිසා නොහඬන්න

යේසුස් වහන්සේ ගේ දේශනා සහ ආගමික වැඩපිළිවෙල හේතු කොටගෙන යෙරුසලමේ හට ගෙන පැවති ජන නොසන්සුන්තාව ආගම හා අත්වැල් බැඳගත් දේශපාලනයක් වූයේ ය. ජොසපුස් විස්තර කරන ලෙසට "කෲර පුද්ගලයකු වූ පිලාතේ ගේ හදවතේ කිසිදු මනුෂ්‍ය දයාවක් නොතිබුණි. ඔහු ගේ පාලනය යටතේ යුදාව අල්ලසට යට වූ රටක් විය. ප්‍රචණ්ඩ ක්‍රියා සහ සොරකම් නිතර සිදු වුණි. අසාධාරණ විනිශ්චයන් යටතේ මරාදැමූවන් නිමක් නැත. සැහැසි ක්‍රියා හේතුවෙන් මහජනයා දුක්ඛිත භාවයට පත් ව හුන් හ".[1] ඊශ්‍රායල් ජනතාව ගේ ගැලවුම්කරුවා පැමිණෙන බව මෝසස් කියා තිබුණි. යොහාන් බඳු එසීන්ස් දේශකයෝ ද ඊශ්‍රායල් ජනතාව ගලවා ගැනීමට සමත් පුද්ගලයකු පහළ වේ ය යන අදහස ස්ථිර කළ හ. ඊශ්‍රායල් ජනතාව ගේ ගැලවුම්කරුවා තමන් බව පවසමින් යේසුස් වහන්සේ ඉදිරිපත් වූයේ මෙබඳු පසුබිමක බව බයිබලය කියවන විට පැහැදිලි වෙයි.[2]

බෝධිසත්වයකු යනු සංසාර ගමනින් මනුෂ්‍ය වර්ගයා එතෙර කිරීම පිණිස ඉදිරිපත් වන ගැලවුම්කරුවෙකි. පැරිසිස්වරුන් බෝසත් ජේසු කී දහමක් වෙනත් අර්ථයකින් විග්‍රහ කළා විය හැකි ය. ගැලවුම්කරු පිළිබඳ කතාව සෝල් ගේ නිර්මාණයක් වීමට ද පුළුවන. සෝල් යේසුස් වහන්සේ ගේ නාමයෙන් මෙ බඳු එකතුකිරීම් ගණනාවක් කර ඇත්තේ ය. නිදසුනක් දක්වතොත්, 'යේසුස් වහන්සේ මනුෂ්‍ය වර්ගයා වෙනුවෙන් කුරුසියට බිලිවූයේ ය' යන කතාව සෝල් විසින් පැරණි ජන ඇදහීම්වලින් උකහා ගන්නා ලද්දකි. මර්ස්, ඇඩොනිස් හා මිත්‍ර වැනි මිත්‍යාදෘෂ්ටික දේවතාවන් වන්දනා

කළවුන් අතර තිබුණු මෙ බඳු ආත්ම පූජා යුදෙව් ආගමේ නො තිබුණි.[3]

යේසුස් වහන්සේ ස්වකීය ධර්ම ව්‍යාපාරය ආරම්භ කළේ රබී පූජකයකු ලෙස හෝ එසින්ස් හික්ෂුවක වශයෙන් හෝ නොව අභිෂේක ලැබූ බෝධිසත්වයකු ලෙසිනි. යොහාන්තුමා, තමන් යේසු ගේ වහන් සහලේ පටි ගැලවීමට තරම් වත් සුදුසු නැති බව කීවේ ය.[4] ජෝන් ද බැප්ටිස්ට් එතුමන් පිළිගත් තවත් එසින් හික්ෂුවකි. යේසුස් වහන්සේ කිසි විටෙකත් රෝම පාලනය විවේචනය නොකළ හ. උන්වහන්සේ ගමින් ගමට දේශන පවත්වමින් ඊශ්‍රායල් ජනතාව ගේ පරිහානියට හේතුව සාකච්ඡා කළ හ. පැරිසිස් පූජක ආයතනය ඊශ්‍රායල් වර්ගයා ගේ පරිහානියට හේතු වී ඇති බව ජනතාව වටහාගත්තේ එවිට ය.

පැරිසිස් රබීවරු රෝම පාලනයට හසුවූ පලස්තීනයේ වරප්‍රසාද හිමි පන්තියක් බවට පත් ව මහජනයා පෙළමින් අලස ලෙස ජීවත් වූ හ. යේසුස් වහන්සේ ගේ ධර්ම සේවාව ඇරඹී වසර දෙකක් ගත වන විට යෙරුසලමේ තත්වය බෙහෙවින් වෙනස් විය. මහජනයාට වෙනසක අවශ්‍යතාව තදින් ම දැනී තිබිණ. එළඹෙන පාස්කු උත්සව දිනයේ දී යේසු ගේ අනුගාමිකයන් ප්‍රධාන දේවාලය අත්පත් කරගනිතැ යි යන ආරංචිය කන වැකුණු රබීවරු බියෙන් තැතිගත් හ. ඔවුහු රැස්වී සාකච්ඡා කර ඉතා ඉක්මනින් යේසු අත්අඩංගුවට ගෙන මරා දැමිය යුතු ය යන තීරණයට එළඹුණ හ. රබීවරුන් ගේ තීන්දුව ඇසූ නිකොඩමුස්, 'යේසුට විරුද්ධ ව ඉදිරිපත් කරන චෝදනා පිළිබඳ ව එතුමන් ගෙන් නිදහසට කරුණු නොවිමසා එතුමන් මරාදැමීමට තීන්දු කිරීම නීත්‍යානුකූල නොවේ ය යි' රබී නායකයා ප්‍රමුඛ සැන් හෙන්ඩ්‍රින් සභාවට පෙන්වා දුන් නමුදු පැරිසිස්වරු ඔහු ගේ විරෝධතාව නො පිළිගත් හ.[5] නිකොඩමුස් ද සැන් හෙන්ඩ්‍රින් සභාවේ නියෝජිතයක් වූයේ ය.

යේසු ගේ ජීවිතයට එල්ල වී ඇති බලවත් තර්ජනය ගැන නිකොඩමුස්, ඇරිමිතියාවේ යෝසප් හා එසින්ස්වරු කිහිප දෙනෙක් එක්වී සාකච්ඡා කළ හ. හැකි ඉක්මනින් ක්‍රියාත්මක වී යේසු, සතුරන් ගෙන් බේරාගත යුතු බව ඔවුහු පිළිගත් හ.[6] යේසුස්

වහන්සේ මේ කාලයේ කැපර්නවුම්හි විසූවේ ය. ගලීලිය සමීපයේ පිහිටි ධීවර ගම්මානයක් වූ කැපර්නවුම් යේසුස් වහන්සේ ගේ දේශපාලන වැඩපිළිවෙලෙහි මූලස්ථානයක් ව පැවතුණි. බයිබලයේ සඳහන් අන්දමට නම් ගේබ්‍රියල් දූතයා එතුමාට දර්ශනය වූයේ ය. "නැගිටින්න. යෙරුසලමට යන්න." ඔහු එතුමාට කීවේ ය.[7] යේසු හදිසියේ කැපර්නවුම් සිට යෙරුසලමට පැමිණීම අභිරහසකි. කිසියම් කුමන්ත්‍රණකාරී වැඩපිළිවෙලක් මගින් උන්වහන්සේ යෙරුසලමට ගෙන්වී ය යි අනුමාන කළ හැකි ය. බයිබලයේ සඳහන් පරිදි ගේබ්‍රියල් උන්වහන්සේ පෙළඹවී නම් ඊට දෙවියන් වහන්සේ ද සම්බන්ධ වී ඇත්තේ ය.

ප්‍රධාන ශ්‍රාවකයන් පිරිසත් සමග ගමනේ යෙදුණු එතුමා අන්තිම හෝජනයෙන් පසු ව ඔලිව් කන්දෙහි ගෙත්සෙමනේ නමැති ස්ථානයෙහි විසුවේ ය. එතුමා කණස්සලු ගතියකින් ද දැඩි චිත්ත වේදනාවකින් ද පසු වූ බව ශුභාරංචිකරුවෝ කියති.[8] යේසු බඳු පුද්ගලයකු කණස්සලු භාවයෙන් සිටියේ මන්ද? ගැලවිය නොහැකි සේ තමා සතුරු කුමන්ත්‍රණයකට හසුවී සිටින වග හා ප්‍රධාන අනුගාමිකයන් ගෙන් එකෙකු සතුරන්ට එකතු වී සිටින බව එතුමා දැනගත් බැවිනි.

යුදාස් ගේ සහායෙන් ඔලිව් කන්දේ දී යේසුස් වහන්සේ අත්අඩංගුවට ගෙන නායක පූජකයා ඉදිරියට පමුණුවන ලදි. තමන් දෙවියන් ගේ පුත්‍රයා බව කියමින් දෙවියන්ට අපහාස කරන බවටත් යුදෙව්වන් ගේ රජු බව කියමින් ජනතාව මුළා කරන බවටත් ඔවුහු උන්වහන්සේට චෝදනා කළ හ; උන්වහන්සේට පහර දී නින්දා අපහාස කළ හ.[9] උන්වහන්සේ වෙනුවෙන් සාක්කියක් දීමට එක ම ශ්‍රාවක ගෝලයකු හෝ ඉදිරිපත් නො වීණි. යේසුස් වහන්සේ පාවා දුන් යුදාස් එල්ලී මැරී තිබුණි. නොඑසේ නම් එල්ලා මරා දමා තිබුණි.

රබීවරු යේසුස් වහන්සේ පිලාතේ ආණ්ඩුකාරයා වෙත ඉදිරිපත් කළ හ. "මට මොහු ගේ කිසිදු වරදක් පෙනෙන්නේ නෑ." පිලාතේ කීවේ ය.[10] "මොහු තමන් යුදෙව්වන් ගේ රජු ය යි කියනව. සීසර් අධිරාජයාට විරුද්ධ ව කතා කරනව." පැරිසිස් රබී පිරිස කියා සිටිය හ. පැරිසිස්වරුන් ගේ චෝදනාව ඉතා

දරුණු දේශපාලන උපක්‍රමයක් වූයේ ය. යේසුස් වහන්සේ තමන් රජු බව ප්‍රකාශ කිරීම සීසර් අධිරාජයාට විරුද්ධ ව කැරලි ගැසීමකි.[12]

ඊශ්‍රායලය රෝමයට යටත් ව තිබුණෙන් සීසර් අධිරාජයා ඊශ්‍රායලයේ ද රජු විය. යේසුස් වහන්සේ තමන් යුදෙව්වන් ගේ රජු බව කීවේ එම දේශපාලන අර්ථයෙන් නොවේ. උන්වහන්සේ ටිබෙටයේ දී බෝසත්වරයකු වශයෙන් අභිෂේක කරනු ලැබ සිටිය හ. ටිබෙට් සම්ප්‍රදායට අනුව දලයි ලාමා වහන්සේ රටේ ආගමික රාජ්‍ය නායකයා වන පරිදි තමන් ද යුදෙව් වර්ගයා ගේ ආගමික නායකයා ය යන සිතිවිල්ල යේසුස් වහන්සේ ගේ සිත තුළ වූයේ ය. ආගමික අර්ථයෙන් තමා යුදෙව්වන් ගේ නායකයා ය යි උන්වහන්සේ ප්‍රකාශ කළ හ. සීසර්ට හෝ පිලාතේට එරෙහි ව උන්වහන්සේ කිසි ම ප්‍රකාශයක් නොකළ හ.

විනිශ්චයාසනයට ගිය පිලාතේ නඩු කිහිපයක් විසඳුවේ ය. ස්ත්‍රී දූෂකයකු හා මැරවරයකු වශයෙන් නම් දරූ බර්බාස්ට විරුද්ධ නඩුවක් ද ඔහු විනිශ්චය කළේ ය. **පාස්කුව** වෙනුවෙන් එක් සැකකරුවකු නිදහස් කිරීමේ බලය ඔහු සතු වූයෙන් නිදහස් කළ යුත්තේ බර්බාස් ද යේසු ද යන්න ඔහු රැස් ව සිටියවුන් ගෙන් විමසුවේ ය. රැස් ව සිටි රබීන්ට පක්ෂපාත පිරිස 'බර්බාස්' කියමින් කැගැසූ හ. බර්බාස් නිදහස් කෙරුණි.[12] යේසුස් වහන්සේට ඇණ ගසා මරාදමන්නට නියම වුණි. ඔවුහු යේසුස් වහන්සේට රතු රෙදි කැබැල්ලක් අන්දවා කටු වැල්වලින් සාදන ලද ඔටුන්නක් හිසට බොහෝ සේ නින්දා අපහාස කළ හ. අවසානයේ නැවත උන්වහන්සේ ගේ ඇඳුම් අන්දවා **ගොල්ගොතාව** නමැති කන්ද මුදුනට ගෙන යන ලදි. රෝම හේවායන් ගෙන් සිදුවන ඕනෑ ම ගැහැටකට මුහුණ දීමට සූදානමින් උන් වහන්සේ පසුපස හඬා වැලපෙමින් පැමිණි මරියා මාතාව, ඇගේ සොහොයුරිය (යේසුස් වහන්සේ ගේ සුළු මව), මරිය මගදලේනා ආදී ස්ත්‍රී පිරිස දෙස බැලූ යේසුස් වහන්සේ මෙසේ කී හ. "යෙරුසලමේ දූවරුනි, මා නිසා නොහඬන්න. නුඹලා හැඬිය යුත්තේ මා නිසා නොවේ, නුඹලා සහ නුඹලා ගේ දරුවන් ගැන යි".[13]

ඇණගැසීම සිදු කරන ලද්දේ සබත් දිනයට පෙර දින

හෙවත් සිකුරාදා තුනේ හෝරාවට බැව් මාක් කියයි.[14] දඬුවම විඳින්නා ලීකඳ මත පණ අදිමින් ජීවත් වන කාලය දික් කිරීමේ පරමාර්ථයෙන් ඇණගැසුම් කන පුද්ගලයාට ඇඹුල් මිදි යුෂ කෝප්පයක් පෙවීමේ චාරිත්‍රයක් තිබිණ. සිරිත් පරිදි යුදෙව් කාන්තාවක් පැමිණ යේසුස් වහන්සේට පමණක් ඇඹුල් මිදි යුෂ කෝප්පයක් පිළිගැන්වූවා ය.[15] "පියාණනි මොවුන්ට කමා කරන්න. මොවුන් කරන්නේ කුමක් ද කියා මොවුන්ට නොවැටහේ" යි ඇණ ගසන්නට තැත් කරද්දී උන්වහන්සේ කී හ.[16]

සෙබලු උන්වහන්සේ කුරුසියේ තබා ඇණ ගැසූ හ. උන්වහන්සේ දිය පිපාසයෙන් කෑ ගැසූ හ. උන්වහන්සේ ගේ තොල් වියළී ගිය විට සොල්දාදුවෙක් දිග යෂ්ටියක කෙළවර රෙදි කැබැල්ලක් බැඳ විනාකිරි පොහවා උන්වහන්සේ ගේ දෙතොලේ ඇතිල්ලුවේ ය.[17] ප්‍රාණය නිරුද්ධ වන අවස්ථාවේ දී උන්වහන්සේ "මාගේ දෙවියනි, මාගේ දෙවියනි! ඔබ මා අත්හැරියේ ඇයි?" යනුවෙන් විලාප හඬින් කෑ ගැසූ හ යි මාක් කියයි.[18] "පියාණනි, ඔබ ගේ අතට මගේ ආත්මය භාර දෙමි" යි පැවසූ බව ලූක් පවසා ඇත.[19] ජෝන් පවසන පරිදි හිස කඩාවැටීමට පෙර "එය අවසාන යි" යනුවෙන් උන්වහන්සේ සිහින් හඬින් කෙඳුරූ හ.

ශුභාරංචිකරුවන් ගේත් එසින්ස්වරුන් ගේත් සාක්ෂිවලට අනුව මෙදින සවස් කාලයේ ස්වභාව ධර්මයා පවා කම්පිත ව තිබිණ. අහස අන්ධකාර විය. කිසියම් විපතක් වේ ය යි බිය පත් ජනතාව නිවෙස් බලා ගිය හ. ගොල්ගොතාවේ ඉතිරි වූයේ යේසුස් වහන්සේ ගේ ඥාති පිරිස, එසින්ස් සාමාජිකයන් සහ සොල්දාදුවන් පමණකි. පැරිසිස් යුදෙව්වන් ගේ ආගමික නීතිය හෙවත් දස පනතේ හතර වැනි නීතිය පරිදි සබත් දිනය ආරම්භවීමත් සමඟ ම සියලු ම යුදෙව්වන් තම දෛනික කටයුතු සියල්ල නවත්වා ආගමික කටයුතු ඇරඹිය යුතු වෙයි.[20] සබත් කාලය තුළ කිසිවකු ඇණගසා තැබිය නොහැකි ය.[21] ඇණගැසූවන් සිටිත් නම් ලී කඳන්වලින් මුදා ඔවුන් ගේ දෙපා බිඳිණු ලැබේ.[22]

මෙදින ද සිරිත් පරිදි සබත් කාලය එළඹීමත් සමඟ චාරිත්‍රානුකූල ව ලී කඳන්වලින් මුදා සිටි ඇණගැසුම් කැවුන් ති

දෙනා වෙත පැමිණි සෙබළු යේසුස් වහන්සේ සමග ඇණ ගසනු ලැබූ මිනිසුන් දෙ දෙනා ගේ දෙපා බින්ද හ. යේසුස් වහන්සේ ගේ දෙපා නො බිදින ලදි.[23] සොල්දාදුවෙක් උන්වහන්සේ ගේ ළපැත්තට හෙල්ලයකින් ඇන්නේ ය. උන්වහන්සේ ගේ සිරුර තුවාල වී ලේ ගලන්නට විය.[24]

යේසුස් වහන්සේට ඇණගැසීමේ සිද්ධිය පිළිබඳ කරුණු පිරික්සීමේ දී අවධානය යොමු කළ යුතු විශේෂ කරුණු කිහිපයක් ම වෙයි. යුදෙව්වන් ගේ ඇණ ගැසීමේ දඬුවම ලෝකයේ පැවති අතිශයින් ම කෲර මරණ දඬුවම යි. ඇණගැසුම්කෑවකු බඩගින්නේ හා අධික පිපාසයෙන් දුක් විදිමින් දින ගණනක් ජීවත්වීම මෙම දඬුවමේ ප්‍රධාන ලක්ෂණය යි.[25] පැරණි ඊශ්‍රායලයේ ඇණගැසීම කර ඇත්තේ දැනට කතෝලික දේවස්ථානය පෙන්වන ආකාරයේ කුරුසියක නොවේ. ලී කඳක ය. අත්වලට ඇණ ගැසීමට භාවිතා කළ ලී පලකය නිසා ඇණගැසුම් කඳ කුරුසයක් ලෙස පෙනුන ද එය කුරුසයක් නොවී ය. දඬුවම් ලබන්නා ගේ තට්ටමට පහළින් රිංගන කුඩා ලී කැබැල්ලක් එහි විය.[26] යේසුට ඇණගැසූ ලී කඳ ඊට වෙනස් එකක් විය. එහි තට්ටම තැබීමට කුඩා සැදලයක් Sadile තිබිණ. ඇණගැසුම්කන්නා මහ පොළොවේ වැතිරූ ලී කඳේ තබා ලණුවලින් වෙළීම සිරිත වූ නමුදු යේසුස් වහන්සේට එවැන්නක් කර නැත. ඇණ ගසන ලද පුද්ගලයෙක් අඩු වශයෙන් දින දෙකක් ලී කඳේ පනඅදිමින් නොමැරී පසුවෙයි.

යේසුස් වහන්සේට තුන් වන පැයේ දී ඇණ ගැසූ බව මාක් කියයි.[27] මාක් සහ මැතිව් දෙදෙනා ම උන්වහන්සේ නව වන පැයේ දී ආත්මය හළ බව කියති.[28] ඒ අනුව යේසුස් වහන්සේ පැය හයක් ලීකඳේ ගතකර ඇති බව පෙනේ. එහෙත් ලූක් ගේ ප්‍රකාශයෙන් පැහැදිලි වන්නේ හය වන පැයේ දී යේසුස් වහන්සේ ආත්මය හළ බව හෝ උන්වහන්සේට ඇණගසනු ලැබූ බව හෝ ය.[29] පිලාතේ හය වැනි පැයේ දී යේසු ගේ නඩුව විසඳීම පිණිස විනිශ්චයාසනයේ වාඩි වූ බව යොහාන් පවසයි.[30] ඔහු ගේ සාක්ෂි අනුව පිලාතේ හිතාමතා ම කල් මරමින් තීන්දුව දීම කල්දැමූ බවට සැක පහළ වන්නේ ය.[31]

පුරාණ ඊශ්‍රායලයේ කාලය මැන ඇත්තේ ඉර උදාවේ සිට පැය එක දෙක ආදි වශයෙනි. ඒ අනුව තුනේ හේරාව යනු උදෑසන නවය ය. හයේ හෝරාව යනු මධ්‍යාහ්න දොළහ ය. නවයේ හෝරාව සවස තුන ය.[32]

එසීන්ස් වාර්තාවලට අනුව යේසුස් වහන්සේට ඇණගසා පැය තුනකට පසු ව එනම් නව වන හෝරාවේ දී මල මුහුද දෙසින් රත්පැහැ මීදුමක් මතු විය. භූමිකම්පාවකින් භාත්පස දෙදරා ගියේ ය. පරිසරය අන්ධකාරයෙන් වැසුණි. ඒ අවස්ථාවේ යේසුස් වහන්සේ ගේ හිස පපුව මතට කඩා වැටුණි.[33] හය වන පැයේ සිට නව වන පැය තෙක් පරිසරය අන්ධකාර ව පැවති බව ශුභාරංචිකරුවෝ ද කියති.

මේ සියලු තොරතුරු සම්පිණ්ඩනය කර විභාග කරන කල්හි යේසුස් වහන්සේ ලීකඳේ ගත කර ඇත්තේ පැය තුනක් පමණ බව පැහැදිලි වෙයි.

"උදෑසන නවයට යේසුස් වහන්සේ පිලාතේ හමුවට පමුණුවන ලදී. දහවල් වන තෙක් නඩුව විභාග කෙරණි. හය වන පැයේ දී හෙවත් මධ්‍යාහ්න දොළහට පමණ ගොල්ගොතාවේ දී ඇණ ගැසීම සිදු විය. සවස තුනට උන්වහන්සේ ගේ සිරුර බිමට බාන ලදි. ඒ අනුව යේසුස් වහන්සේ ඇණගසා පැය තුනකට පසු බිමට බා ඇත." ෆීඩා හස්නේන් පවසයි.[34]

සොල්දාදුවන් පැය තුනක් ඇතුළත යේසුස් වහන්සේ මිය ගිය බව තීරණය කළේ ඇයි? උන්වහන්සේ ගේ සිරුරෙන් ලේ හා වතුර ගලද්දීත් සොල්දාදුවන් එතුමා ගේ දෙපා නොබින්දේ ඔවුන් අඥානයන් ලෙස කටයුතු කළ නිසා ද? සොල්දාදුවන් අල්ලස් ගෙන සිටියා ද විය හැකි ය. එසේත් නැතිනම් යේසුස් වහන්සේ ගලවා ගැනීමේ කුමන්ත්‍රණයක් ක්‍රියාත්මක විණි.

යේසුස් වහන්සේ බයිබලයේ සඳහන් අන්දමේ දිළිඳු පවුලක පුද්ගලයකු නොවන බව ඇතැම් ඉතිහාසඥයෝ කියති.[35] එසීන්ස් වාර්තා අනුව, ඔවුහු යේසුස් වහන්සේ ගලවා ගැනීමට කුමන්ත්‍රණය කළ හ. ඇරිමිතියාවේ යෝසප් නම් ධනවත් සැන් හෙන්ඩ්රින් මන්ත්‍රීවරයා යේසුස් වහන්සේ ගලවා ගැනීමේ වැඩපිළිවෙල මෙහෙයවූයේ ය. ඔහු යේසුට ආදරය කළ එසීන්ස්වරයෙකි. මරියා ගේ මාමා කෙනෙකි.[36] යේසුස් වහන්සේ ගේ ප්‍රධාන අනුගාමිකයන් කිසිවකු සිද්ධියට සම්බන්ධ නොවීම ද වැදගත් කරුණකි. ඇණගැසීමට පෙර ස්ත්‍රියක උන්වහන්සේට ටොස්කා නමැති ඇඹුල්



ඇණගැසීම දක්වෙන පැරණි රෝම චිත්‍රයක්

අප්‍රිකාවට යුරෝපා සංස්කෘතිය සහ ක්‍රිස්තියානි ආගම හඳුන්වාදීම ඕලන්ද චිත්‍රයක්

මිදි යුෂ කෝප්පයක් පෙවූ බව ඉහත සඳහන් කෙරිණි. ටොස්කා, දඬුවම ලබන පුද්ගලයා ගේ වේදනාව වැඩිවීම පිණිස දෙනු ලබන වයින් වර්ගයක් වුව ද යේසුස් වහන්සේට පෙවූ ටොස්කාවලට සිහිමුර්ඡා වීමටත් වේදනාව දුරු කිරීමටත් අවශ්‍ය ඖෂධ මුසු කර තිබිණ. ඇණ ගසන අවස්ථාවේ උන්වහන්සේ සිටියේ අඩ සිහියෙනි. 'ටොස්කා ඇඹුල් මිදි යුෂ සොරුන් දෙදෙනාට නොදී උන්වහන්සේට පමණක් දුන්නේ ඇයි ද' යි ඩම්ලෝ ප්‍රශ්න කරයි.[37]

ඇණ ගසන අවස්ථාවේ යේසුස් වහන්සේ විලාප හඬින් කෑ ගසා ඇත්තේ ඇරමයික් හා හීබෲ භාෂාවට අයත් වචනවලිනි. යුදෙව්වන් අතර ව්‍යවහාර භාෂා දෙකක් තිබිණ. හීබෲ දේව භාෂාව වූ අතර ඇරමයික් පොදු ජන භාෂාව විය. යේසුස් වහන්සේ ඇරමයික් භාෂාව භාවිතා කළ හ. භාෂාවේදීන් පෙන්වන ලෙසට ඇණගසන අවස්ථාවේ යේසුස් වහන්සේ කී දෑ පරිවර්තනයේ දී වෙනස් වී ඇත්තේ ය. උන්වහන්සේ දෙවියන්ට කෑගසා නැත.[38] බයිබලයේ සඳහන් ලෙසට 'එලොයි එලොයි ලාමා සබක්තානි' යන්න උන්වහන්සේ ගේ අවසන් වචන විය. එහි අරුත "මාගේ දෙවියනි මාගේ දෙවියනි ඔබ මා අතහැරියේ ඇයි?" යන්න නොවේ.. ලාමා සබක්තානි යනුවෙන් උන්වහන්සේ කතාකරන්නට ඇත්තේ නම ආචාර්ය ලාමාවරයාට ය යි අනුමාන කළ හැකි ය.

යේසුස් වහන්සේ මියගිය බව සොල්දාදුවෝ පිලාතේට දන්වූ හ. උන්වහන්සේ පැය කිහිපයක් ඇතුළත මිය යාම ගැන පුදුමයට පත් පිලාතේ, උන්වහන්සේ ගේ සිරුර ඇරිමිතියාවේ යෝසප්ට ලබාදෙන්නැ යි පිලාතේ රෝම සොල්දාදුවන්ට කීවේ ය. යෝසප් යේසුස් වහන්සේ ගේ සිරුර ලබාගැනීමට අනුමැතිය ලබාගත් බව ඇසූ පැරිසිස් රබීවරු පිලාතේ වෙත වහා ගොස්, "යේසු මලවුන් ගෙන් නැගිටින බව කියල තියෙනව. ඔහු ගේ සිරුර අනුගාමිකයන් අතට පත් කරන්න එපා" යි ඉල්ලා සිටිය හ. පිලාතේ, වධක භූමිය වටා ආරක්ෂක භටයන් යෙදීමට පූජකයන්ට අවසර දුන්නේ ය.

එදින සබත් දිනයට පෙර දිනය මෙන් ම පාස්කුව සඳහා සූදානම් වන දිනය ද විය. රැස්ව සිටි ජනයා විසිර යන්නට වූ හ.[39] ඇරිමිතියාවේ යෝසප් යේසුස් වහන්සේ ගේ සිරුර පිරිසිදු ලිනන් රෙද්දකින් ඔතා ඔහු විසින් අලුතින් සාදන ලද සෙල්මුවා

සොහොනක තැන්පත් කර දොර වැසුවේ ය.[40] යේසුස් වහන්සේ අතුරුදහන් වීමෙන් පසු සිරුර ඔතා තිබුණු ලිනන් රෙද්ද තෝමස් භාරයේ තිබුණි. මේ කාලයේ ඔඩෙස්සාව සිරියාවේ ප්‍රාන්තයක් විය. ඔඩෙස්සාවේ පාලක අබ්ගාර් ලාදුරු රෝගයෙන් පෙළුණෝ ය. අනානියස් ඔහු ගේ සාත්තු සේවකයාට යේසුස් වහන්සේ ලෙඩ සුව කරන අන්දම කීවේ ය. යේසුස් වහන්සේ හමුවීම පිණිස අබ්ගාර් ගේ නියෝජිතයන් පැමිණෙන විට උන්වහන්සේට ඇණගසා තිබුණි. තෝමස් ඔවුන්ට ලිනන් රෙද්ද දී අබ්ගාර් ඉන් දවටන්නැ යි කීවේ ය. ප්‍රතිකාරය අබ්ගාර් වෙත සුවය ගෙනායේ ය. ටියුරින් ෂ්‍රවුඩ් යනුවෙන් හැඳින්වෙන්නේ යේසුස් වහන්සේ ගේ සිරුර ඔතා තිබුණු බව පැවසෙන ඔඩෙස්සාවට ගෙන යන ලද ලිනන් රෙද්ද යි. ටියුරින් ෂ්‍රවුඩ් මියගිය පුද්ගලයකු ගේ නොව ජීවත්වූවකු ගේ සිරුරක් ඔතා තිබූ රෙද්දක් බව පසු ව කළ පරීක්ෂණවලින් හෙළි විය. යුදෙව් චාරිත්‍රය අනුව මියගිය පුද්ගලයකු සුසාන ගෘහයට ඇතුළු කිරීමට පෙර ස්නානය කරවා රෙද්දක දවටති. ටියුරින් ෂ්‍රවුඩ් රෙද්දෙන් යේසුස් වහන්සේ දවටූයේ නම් මියගිය අයකු සේ සලකා ස්නානය කරවා නොවේ.[41]

බයිබලයට අනුව ඇණගැසීමෙන් පසු දින මගදලේනා, මරියා මාතාව, ජේම්ස් ගේ මව, සැලෝමි ඇතුළු කාන්තා පිරිසක් යේසුස් වහන්සේ ගේ සොහොන වෙත ගියෝ ය.[42] ගල්දොර පෙරළා ඇති බවත් යේසු සිරුර සොහොනේ නැති බවත් ඔවුහු දුටුව හ.[43] සොහොනේ අයිනක දිග සුදු වස්ත්‍රයක් හැඳි තරුණයෙක් වාඩිවී සිටියේ ය.[44] "බිය වෙන්න එපා. හැමෝට ම කියන්න, යේසු ගැලීලියට ගියා කියල. ගැලීලියට ගිහින් එතුමාව හමුවෙන්න." ඔහු ඔවුනට කීයේ ය.[45]

මගදලේනා වහා ගොස් සිද්ධිය සිමොන් පීටර්ට කීවා ය. සිමොන් පීටර් සහ තවත් අනුගාමිකයෝ කිහිප දෙනෙක් ඉක්මනින් සොහොන වෙත ගිය හ. යේසුස් වහන්සේ ගේ සිරුර ඔතා තිබුණු ලිනන් රෙදි විසිකර තිබිණ. උන්වහන්සේ ගේ හිස ඔතා තිබුණු රෙදි කැබැල්ල මුල්ලක විය.[46] එහෙත් උන්වහන්සේ ගේ සිරුර එහි නො විණි. යෝසප් හෝ නිකොඩමුස් හෝ පිළිබඳ කිසිදු ආරංචියක් දන ගැනීමට කිසිවකුටත් නොපුළුවන් විය.

ඇණගැසීමෙන් තෙ දිනකට පසු ව උන්වහන්සේ මළවුන් ගෙන් උත්ථානය වී සිය ශ්‍රාවකයනට ප්‍රදර්ශනය වූ බව බයිබලයේ සඳහන් ය.[47] මොවුන් කියන ලෙසට යේසුස් වහන්සේ උන්වහන්සේ ගේ ශ්‍රාවකයනට සහ බැතිමතුනට එකොළොස් වාරයක් ප්‍රදර්ශනය වී ඇත. ඇණගැසීමෙන් අවුරුදු හයකට පසු ව ඩමස්කසයේ දී සෝල්ට දර්ශනය විය. බයිබලයට අනුව යේසුස් වහන්සේ ඇණගැසීමෙන් අවුරුදු හයකුත් දින හතළිහක් ගත වන තුරු වරින් වර ප්‍රදර්ශනය වී ඇත.[48]

යුදෙව් විශ්වකෝෂයෙහි මෙසේ සඳහන් වෙයි. "ශුභාරංචිකරුවන් ඇරිමිතියාවේ යෝසප් ගැන යාන්තම් සඳහන් කර ඇතිවා පමණකි. ඔහු පිලාතේ වෙත ගොස් මිය ගිය යේසු ගේ සිරුර ඉල්ලුම් කළේ ඇයි? ඔහු යේසු සිරුර ඔහු විසින් අලුතින් තනවන ලද ලෙනක තැන්පත් කිරීමට හේතුව කුමක් ද? යෝසප් සහ නිකොඩමුස් තෙල් වර්ග ලිනන් රෙදි හා සුවඳ ද්‍රව්‍ය විශාල ප්‍රමාණයක් රැගෙන සොහොන වෙත ගියේ කුමකට ද? යේසු කුරුසියෙන් උත්ථානය වීම පැහැදිලි කර ගැනීමට එසින්ස් සාක්ෂි අත්‍යවශ්‍ය වේ".[49] මෙම ප්‍රශ්න සියල්ලට ම පිළිතුර ඇරිමිතියාවේ යෝසප් සහ යේසුස් වහන්සේ අතර පැවති ඥාති සබඳතාව යි. යෝසප්ට යේසු ගේ සිරුර ඉල්ලුම් කිරීමේ අයිතිය තිබුණි. මරියාට යේසු ලැබුණු පිළිවෙල බඳු අතිශය පෞද්ගලික රහස් එළිකරන ශුභාරංචිකරුවෝ යේසුස් වහන්සේ ගේ ජීවිතයට සම්බන්ධ වැදගත් ප්‍රසිද්ධ කරුණු සඟවති.

පැරණි යෙරුසලමේ සොහොන් ලංකාවේ සොහොන් බඳු ඒවා නොව, පස් කන්දක් හාරා තනනු ලබන පවුල් ගණනාවකට අයත් විශාල ලෙනකි. ලෙන් දොර විවෘත කිරීමට සහ වසා දැමීමට හැකි වන පරිදි සවිමත් ව සාදනු ලැබේ. ලෙන තුළ මෘත ශරීර ගණනාවක් තැන්පත් කළ හැකි ශාලා බොහෝ විට දෙකක් තිබේ. යෝසප් යේසුස් වහන්සේ ගේ සිරුර තැන්පත් කිරීමට අලුතින් සොහොනක් සෑදීම අභිරහසකි. සොහොන තුළට වාතය ගලායාමට දොර හා උළුවස්සෙහි ඉහළ කෙළවර අතර හිඩැසක් ද තබා තිබුණි.[50] සබත් කාලය ආරම්භ වීමත් සමඟ ම යෝසප් හා නිකොඩමුස් බෙහෙත් ඖෂධ තෙල් වර්ග හා ලිනන් රෙදි

රැගෙන සොහොනට ඇතුළු වී යේසුස් වහන්සේට ප්‍රතිකාර කරන්නට වූ හ. "**කුරුසියේ ඇණගැසීම ඇසින් දුටුවකු ගේ සාක්ෂි**" ග්‍රන්ථයේ වෛද්‍ය ප්‍රතිකාර කරන ලද ආකාරය පිළිබඳ දීර්ඝ විස්තරයක් ද අන්තර්ගත ය. බෙහෙත් ගල්වන අතර පැය කිහිපයකට පසු ව යේසුස් වහන්සේ ගේ තොල් සැලෙන්නට වූයෙන් ඔවුනට අසීමිත සතුටක් දැනුණි.[51] සිහිය ලැබූ උන්වහන්සේ මහත් සේ දුර්වල ව හුන්නේ ය. නිකොඩමුස් උන්වහන්සේට වයින් උගුරක් පෙවී ය. උන්වහන්සේට උයන්පල්ලකු ගේ ඇඳුම් අන්දවා පිටතට කැඳවාගෙන යන ලදි.[52]

එසින්ස්වරුන් සතු ව ඉතා දියුණු වෛද්‍ය සේවයක් තිබුණු බව ඔවුන් පිළිබඳ ඇති සෑම වාර්තාවක ම දක්වේ. යේසුස් වහන්සේ ද වෛද්‍යවරයකු වූ බව අපි ඉහත සඳහන් කළෙමු. "සත්හට වන බව දුකට වෙදාණන්" වූ බුදුන් වහන්සේ වෛද්‍යවරයකු වශයෙන් කටයුතු කළ අවස්ථා තිබේ.[53] මහායාන බුදුසමයට අනුව සියලු ම බෝධිසත්වවරු වෛද්‍යවරු වෙති. මහායාන බුදු සමය තුළින් බිහිවූ අවලෝකිතේශ්වර වන්දනාව යටතේ ලංකාවේ වෛද්‍ය ක්‍රමය ලැබූ දියුණුව පිළිබඳ ව අවලෝකිතේශ්වර වන්දනාව ගැන සෙවූ සෑම ඉතිහාසඥයකු ම පාහේ සඳහන් කර තිබේ.[54] වෛද්‍ය විද්‍යාව බෞද්ධයන් ගේ උරුමයකි. එසින්ස්වරුන් යේසුස් වහන්සේව ජීවත් කරවූයේ වෛද්‍ය විද්‍යාවේ මහිමයෙනි.

ක්‍රි. ව. 326 දී කොන්ස්ටන්ටයින් අධිරාජයා යේසුස් වහන්සේට ගෞරව පිණිස යෙරුසලමේ දේවස්ථානයක් ඉදි කරවූයේ ය. ඔහු දේවස්ථානය ඉදිකරවූයේ යේසුට ඇණ ගැසූ ස්ථානයේ මිස සොහොනක් මත නොවේ.[55] යේසුස් වහන්සේ මරණයෙන් ගැලවී නොගියේ නම් උන්වහන්සේ ගේ සිරුර කොහේ හෝ තිබිය යුතු ය. උන්වහන්සේ ගේ සිරුර අහසට පැන නැඟී දෙව්ලොව ගියේ ය යි යමෙකු කියන්නේ නම් එවැනි මනස්ගාත කියන්නන් සමඟ සාකච්ඡා කිරීම හෝ අඥානකමකි. පොළවෙන් ඉහළ දෙව්ලොවක් නැත්තේ ය.

එසින්ස් සාක්ෂි අනුව ඔවුන් ගේ සාමාජිකයන් දෙ දෙනෙක්, යේසුස් වහන්සේ ඔලිව් කන්ද පාමුල පිහිටි වයෝවෘද්ධ මිනිසකු

ගේ නිවෙසට ඔසොවා ගෙන ගිය හ. උන්වහන්සේ බොහෝ දුර්වල වී උන් හ. පසුදින එසින්ස්වරුන් ගේ රහසිගත රැස්වීමක් පැවැත්විණි. ඊට සහභාගි වූ නිකොඩමුස් යේසුස් වහන්සේ ගේ සෞඛ්‍ය තත්ත්වයත් එතුමන් රැක බලාගත යුතු අන්දමත් පැහැදිලි කළේ ය. යේසුස් වහන්සේ තමන් වහන්සේට ශ්‍රාවකයන් හමුවීමට අවශ්‍ය බවට ඉල්ලීමක් කළ නමුදු, 'උන්වහන්සේ නැවතත් සතුරන් අතට පත් කළ නොහැකි බව' කී ඇරිමිතියාවේ යෝසප් ඊට විරුද්ධ විය. ආරක්ෂාව පිණිස උන්වහන්සේ, ජෝන් ද බැප්ටිස්ට් ජීවත් වූ යේසු අනුගාමිකයන් විශාල පිරිසක් සිටින මසාදා නිම්නයේ වනගත පෙදෙසකට ගෙන යාමට තීරණය කළ ඔවුහු, පසුදින රාත්‍රියේ දුෂ්කර පටු මාවත් ඔස්සේ යේසුස් වහන්සේ මසාදා නිම්නයේ ආරක්ෂිත ස්ථානයකට ගෙන ගිය හ.[56]

පෙරළා යෙරුසලමට ගිය නිකොඩමුස් හා යෝසප් ඔත්තුකරුවන් ගේ මාර්ගයෙන් යේසුස් වහන්සේ ගේ තත්වය දිනපතා දැනගත් හ. යේසුස් වහන්සේ ගේ මළ සිරුර අතුරුදහන්වීම පිළිබඳ ඕපාදූප යෙරුසලම පුරා පැතිර ගියේ ය.

යේසුස් වහන්සේ ගේ දෙව්ලොව ගමන ගැන ශුභාරංචිකරුවන් සිව් දෙනෙකු කියන පරස්පරවිරෝධී කතා මෙසේ ය.

"සතියේ පළමු වැනි දින හිරු උදාවත් ම ඔවුන් සොහොන වෙත ගිය හ. 'කවුද අපිට සොහොනෙ දොර තල්ලුකරල දෙන්නෙ,' ඔවුහු එකිනෙකා කී හ. නමුත් ඔවුනට සොහොනේ විශාල ගල් දොර පෙරළා ඇති බව දක්නට ලැබුණි. ඊට ඇතුළු වූ කල දිග සුදු සිවුරක් ඇඳගත් තරුණයකු දකුණු පැත්තේ වාඩිවී සිටිනවා දක්නට ලැබුණි".[57]

"සතියේ පළමු වැනි දින හිරු උදාවත් ම සුවඳ ද්‍රව්‍ය රැගෙන ඔවුහු සොහොන වෙත ගිය හ. ගල්දොර පෙරළා ඇති බවත් යේසු සිරුර එහි නැති බවත් ඔවුන්ට දක්නට ලැබුණි. ඔවුන් බිරාන්ත වී සිටිනා කල ධවල වස්ත්‍ර පොරවා ගත් පුද්ගලයන් දෙ දෙනෙක් හදිසියේ ම පසෙකින් පහළ වූ හ".[58]

"සතියේ පළමු වන දින මග්දලායේ මරියා ද අනිත් මරියා ද සොහොන වෙත ගිය හ. එකවර ම භූමිකම්පාවක් සිදු විය. දෙව්ලොවින් දේවදූතයෙක් පැමිණ ගල්දොර පෙරළා ඒ මත වාඩි

වූයේ ය. ඔහු ගේ මුහුණින් ආලෝක කිරණ නිකුත් විය. ඔහු ඇඳ සිටියේ හිම මෙන් සුදු වස්ත්‍රයකි'''.[59]

සොහොන් පිටිය රැකවල් කළ සොල්දාදුවෝ මෙසේ කී හ. "අපි ඉතා අවධානයෙන් යේසු ගේ සොහොන මුර කළෙමු. අහසින් විශාල ශබ්දයක් පැතිරී සිදුරක් මතුවුණි. ආලෝක ධාරා විහිදුවමින් එයින් බට පුද්ගලයන් දෙ දෙනෙක් සොහොන වෙත පැමිණ ගල්දොර පෙරළා ඊට ඇතුළු වූ හ. ඉන්පසු ඔවුහු යේසුව වාත්තු කරගෙන එළියට පැමිණ ආකාශ ගත වූ හ".[60]

යේසුස් වහන්සේ දෙව්ලොව ගිය පුවත යෙරුසලමේ වැසියන් මවිත කළ ආශ්චර්යයක් වන අතර දිනෙන් දින යේසුස් වහන්සේ ගේ සෞඛ්‍ය තත්වය යහපත් අතට හැරුණි. දිනක් උන්වහන්සේ එමාවුස් නම් ගමට පාගමනින් ගියේ ය. උන්වහන්සේ ගැමියන් දෙ දෙනකු සමඟ කතාවට වැටුණි. "උඹ අහල නැද්ද නාසරත් යේසු ගැන. රබීල මිනිහට ඇණ ගහල මැරුවනෙ." ක්ලිපාස් නමැත්තා කී ය.

"පූජකයන් කියන දේ විශ්වාස කරන්ඩ තරම් උඹල මෝඩ ද? යේසුට තමන් ගේ වුවමනාවන් ඉෂ්ට කරගන්ඩ ඕනෑම දුකක් විඳින්ඩ පුළුවන් බව උඹලට තේරෙන්නෙ නැද්ද?" යේසුස් වහන්සේ උත්තර දුන් හ.[61] ගම්මු දෙ දෙනා උන්වහන්සේට රාත්‍රී භෝජනය පිණිස ආරාධනා කළෝ ය. කෑම මේසයේ දී උන්වහන්සේ ඔවුනට ආශීර්වාද කළ හ. ඔවුන් ගේ ඇස් ඇරුණි. ඔවුන්ට උන්වහන්සේ හඳුනාගත හැකි විය.[62]

යේසුස් වහන්සේ ගේ අනුගාමිකයන් අතරේ ද උන්වහන්සේ පිළිබඳ නොයෙකුත් විවාද ඇති විය. "කිසි ම පුද්ගලයෙකු සොහොනෙන් නැගිටින්ඩ බෑ." තෝමස් රැස්වීමක දී කීවේ ය. එතැනට හදිසියේ ම යේසුස් වහන්සේ ඇතුළු වූ හ. සියල්ලෝ ම අවතාරයකැ යි බිය වූ හ. "මොකද කලබල වුණේ? මේ බලන්ඩ මගේ අත් දිහා. කකුල් දිහා. අල්ලල බලන්ඩ. අවතාරවලට ඇට මස් නහර නැහැනෙ. මේ මම". යේසුස් වහන්සේ කී හ.[63] සියල්ලෝ ම උන්වහන්සේ දෙස අවිශ්වාසයෙන් යුතු ව බලා සිටිය හ. "මොනව ද කන්ඩ තියෙන්නෙ?" උන්වහන්සේ ඇසූ හ. ඔවුහු උන්වහන්සේට දුම්ගැසූ මාළු පෙත්තක් දුන් හ. උන්වහන්සේ එය

වැළඳූ හ.[64] තෝමස් කන්ටෙන්ඩර්, උන්වහන්සේ ජීවත් වන බව කිසිසේත් ම විශ්වාස නොකළේ ය. දිනක් උන්වහන්සේ තෝමස් හමුවී "මගෙ ඇඟිල්ල අල්ලගන්ඩ. මගෙ ළඟට ළංවෙන්ඩ. දැන්වත් විශ්වාස කරන්ඩ" යි කී හ.[65]

එසීන්ස්වරුන් පවසන පරිදි උන්වහන්සේ දිනෙන් දින එක් එක් ස්ථානවලට යමින් එසීන්ස් නිවෙස්වල නැවතුණ හ. දිනක් ලාසරස් ගේ නිවෙසේ දී මව මරියා සහ ශ්‍රාවක පිරිසක් මුණගැසුණි. එදින පැමිණි නිකොඩමුස්, ඇරිමිතියාවේ යෝසප් අත්අඩංගුවට ගැනීමේ කණගාටුදායක සිද්ධිය උන්වහන්සේට සැළ කළේ ය. සියල්ලෝ ම කැළඹීමට පත් වූ හ. යේසුස් වහන්සේ යෝසප් ගේ ජීවිතය ආරක්ෂා වේවා යි ප්‍රාර්ථනා කළ හ. සිරබාරයෙන් නිදහස් වූ යෝසප් එංගලන්තයේ පදිංචියට ගියේ ය.[66] යේසුස් වහන්සේ ගැලීලිවලට ගොස් සිමොන් පීටර් මුණගැසුණේ ය. තෝමස් ඇතුළු අනුගාමිකයන් රැසක් ම මුණගැසීමට උන්වහන්සේට හැකි විය. උන්වහන්සේ නැවතත් බෙතානිවලට ගොස් මරියා මුණගැසුණි. මරියා, මාර්තා සහ ලාසරස් සොයුරු සොයුරියෝ වෙති. ඔවුහු යේසුස් වහන්සේ සමඟ දැඩි සබඳතාවක් දැක්වූවෝ ය.[67] ටික දිනක් බතානිහි විසූ උන්වහන්සේ යෙරුසලමේ අනාගතය ගැන ශෝකවෙමින් යෙරුසලම හැර යාමට සූදානම් වූ හ. තමන් හැර දා යන යේසුස් වහන්සේ නැවත ආපසු නොඑන බව අනුගාමිකයනට වැටහුණි.

යේසුස් වහන්සේට ඇණ ගැසුවේ ඇයි?

ශුභාරංචිකරුවන් පවසන පරිදි යේසුස් වහන්සේ සාමයේ දූතයෙකි. මහජනයා වෙනුවෙන් අනුකම්පාවෙන් සේවය කළ වෛද්‍යවරයෙකි. උන්වහන්සේ ධර්මිෂ්ටභාවයේ ආනිසංස සහ අධර්මිෂ්ටභාවයේ විපාක පැහැදිලි කරමින් මනුෂ්‍යයා යහමඟ යැවීමට උත්සාහ ගත් හ; මුළු හදවතින් ම මනුෂ්‍යයාට ප්‍රේම කරමින් මනුෂ්‍යයන් තුළ දෙවියන් කෙරේ ප්‍රේමය ඇති කිරීමට උත්සාහ ගත් හ. පැරිසිස් රබීවරු ද දෙවියන් වෙනුවෙන් ම කැපවූ පිරිසක් වූ හ. එහෙත් පැරිසිස් රබීවරුනට යේසුස් වහන්සේ

කෙරෙහි අප්‍රමාණ වෛරයක් ඇති වෙයි. ඔවුහු, සාමය වෙනුවෙන් කැපවූ දෙවියන්ට මුළු හදින් ප්‍රේම කළ යේසුස් වහන්සේ අල්ලා ඇණගසා මරා දමූ හ. මෙය පිළිගත හැකි ද? එසේ නම් ඊට හේතු කවරේ ද?

යේසුස් වහන්සේ ගේ වැඩපිළිවෙල අවිහිංසාවදී වුව ද දේශපාලන ක්‍රියාවලියකි. ඉන් අපේක්ෂා කරන ලද්දේ බලය ලබාගෙන සිටි පිරිසක් වෙතින් බලය ලබාගැනීම යි. මහත්මා ගාන්ධි ගේ අවිහිංසාවාදී වැඩපිළිවෙල අධ්‍යයනය කිරීම යේසුස් වහන්සේ ගේ අවිහිංසාවාදී පිළිවෙත තේරුම් ගත හැකි පහසු ම ක්‍රමය යි. ගාන්ධි අවිහිංසාවාදය මගින් බ්‍රිතාන්‍ය පාලනයට එරෙහි ව ඉන්දියානු ජනතාව සංවිධානය කළේ ය. ඇමරිකාවේ මැන්චෙස්ටර් විශ්වවිද්‍යාලයේ මහාචාර්ය එස්. ජී. එෆ්. බ්‍රැන්ඩන් සාක්ෂි ඉදිරිපත් කරමින් පැහැදිලි කරන පරිදි යේසුස් වහන්සේ ගේ සාම දේශපාලන ව්‍යාපාරය අභ්‍යන්තරයේ ප්‍රචණ්ඩකාරී දේශපාලන බල අරගලයක් තිබුණි. උන්වහන්සේට ඊශ්‍රායලය රෝම පාලනයෙන් නිදහස් කර ගැනීමට වුවමනා විය. යුදෙව් ජනතාව ගේ නායකත්වය හිමිකර ගැනීම පිණිස උන්වහන්සේ අවිහිංසාවාදී සටනක් මෙහෙයවූයේ ය. දලයි ලාමා වහන්සේ ටිබෙට් රාජ්‍යය නිදහස් කරගැනීම සඳහා අවිහිංසාවාදී ව්‍යාපාරයක් මෙහෙයවති. උන්වහන්සේ ගේ අවිහිංසාවාදී ව්‍යාපාරය චීනයට හිංසාවක් ව ඇත. ලෝකයේ විශාල ජන පිරිසක් සාමයේ ප්‍රතිමූර්තිය වශයෙන් පිළිගන්නා උන්වහන්සේ චීනය විසින් සිය පරම සතුරා සේ සලකනු ලැබේ. යේසුස් වහන්සේ ගේ පිරිස යෙරුසලමේ මහා දේවාලයේ බලය අල්ලා ගැනීමට උත්සාහ කළ බව බ්‍රැන්ඩන් පෙන්වා දෙයි.[68] ගෙත්සෙමනේ දී අත්අඩංගුවට පත් වන්නට පෙර උන්වහන්සේ සන්නද්ධ වන ලෙස තම අනුගාමිකයන් ගෙන් ඉල්ලා සිටිය හ.[69] උන්වහන්සේ ගරිල්ලා නායකයකු ලෙස ගරිල්ලා යුද්ධයක් දියත් කළ බවත්; පැරිසිස්වරුන් සමග බල අරගලයක යෙදුණු බවත් ඔහු ගේ අදහස යි.[70] අප ගේ අදහස උන්වහන්සේ එසේ කළේ ආත්මාරක්ෂාව පිණිස බව යි. උන්වහන්සේ අත්අඩංගුවට ගන්නා ලද අවස්ථාවේ කඩුවෙන් කොටා නායක පූජකයා ගේ සෙබළකු ගේ කනක් කැපූ පේත්‍රුස් වැන්නවුන් උන්වහන්සේ ගේ

පෞද්ගලික ආරක්ෂකයන් විය යුතු ය.

යේසුස් වහන්සේ ඉපදීමට වසර පන්සියයකට පෙර විසූ නබී ෂෙචරියා කී උදානයක් උපුටා දක්වන ඉයන් විල්සන්, යේසුස් වහන්සේ සාමයේ නියෝජිතයා වශයෙන් විජයග්‍රාහී ව යෙරුසලමට ඇතුළුවීම අපේක්ෂා කළ බව පෙන්වයි.

> යෙරුසලමේ දූවරුනි, සතුටින් ඔල්වරසන් දෙන්න
> අන්න බලන්න, ඔබලා ගේ රජතුමා පැමිණේ
> එතුමා ජයග්‍රාහී ය, විජයග්‍රාහී ය
> නිහතමානී බැවින් කොටළුවකු පිටේ පැමිණෙන්නේ ය...
> එතුමා ජාතියට සාමය දේශනා කරන්නේ ය
> එතුමා ගේ අධිරාජ්‍යය සාගරයෙන් සාගරයට පැතිර යන්නේ ය
> (ෂෙචරියා 9. 9-10)

කොටළුවකු පිට නැඟුණු යේසුස් වහන්සේ යෙරුසලමට ඇතුළු වන කතාව මැතිව් සඳහන් කර ඇත්තේ ය.[71] සිද්ධිය නිරූපණය කරන ගල් සිතුවමක් වතිකානු කෞතුකාගාරයේ තිබේ. ඉන් පැහැදිලි කෙරෙන්නේ යේසුස් වහන්සේ සිය ආගමික හා දේශපාලනික ව්‍යාපාරය මෙහෙයවීමේ දී පාරම්පරික යුදෙව් අදහස්වලට සම්බන්ධ වූ ආකාරය යි. උන්වහන්සේ තමන් දෙවියන් ගේ පුත්‍රයා යි කීමේ එක් පරමාර්ථයක් නම් පාරම්පරික චින්තනය පිළිගන්නා යුදෙව්වන් දිනාගැනීම යි.

යේසුස් වහන්සේට ඇණගැසීමෙන් පසු ව යෙරුසලමේ යේසු අනුගාමිකයෝ තම සංවිධානයේ නායකත්වයට උන්වහන්සේ ගේ සොහොයුරු ජේම්ස් පත් කර ගත් හ. පාලක හෙරොඩ් ඇග්‍රිපා, ජේම්ස් අත්අඩංගුවට ගෙන ගල් ගසා මරා දමුවේ ය. සිමොන් පීටර් අත්අඩංගුවට ගන්නා ලදි. යේසුස් වහන්සේ අත්අඩංගුවට ගැනීමට පෙර ම සිරගත කරන ලද යොහාන් දේශකයා සිරගෙදර තුළ ම මරා දමන ලදි. ජෝන් ද බැප්ටිස්ට් වේලාසනින් ම මරා දමා තිබිණ. ඇණගැසීමෙන් පසු ව යේසුස් වහන්සේ ගේ අනුගාමිකයන් දඩයම් කිරීම ඇරඹිණ. යෙරුසලමේ ප්‍රධාන යේසු අනුගාමිකයනට ගැලවීමට තිබූ එක ම මඟ රටින් පලායාම පමණකි.

පැරිසිස් යුදෙව් පූජකයනට තව දුරටත් වරප්‍රසාද ලබමින්

රෝමවරුන් යටතේ කටයුතු කළ නොහැකි විය. බලවත් ජන අප්‍රසාදයක් ඔවුන් හඹා ආයේ ය. එයින් මිදී ජනතා නායකත්වය දිනාගැනීම පිණිස පැරිසිස් රබීවරු රෝම පාලකයන්ට විරුද්ධ ව සටනක් ආරම්භ කළ හ. රෝම හමුදාව යෙරුසලමේ මහා දේවාලය ගිනිබත් කළේ ය. යෙරුසලමේ වැව ලෙයින් රත් පැහැ ගැන්වී මිනිස් හිස්වලින් පිරිණි. දස දහස් ගණනක් යුදෙව්වෝ වහලුන් ලෙස රෝමයට අල්ලා ගෙන යනු ලද හ. සිරකරුවෝ එකොළොස් දහසක් බඩගින්නේ මිය ගිය හ.[72] කිසි ම යෙරුසලම් වැසියෙකුට ගැලවිය නොහැකි විය.[73]

යේසුස් වහන්සේ බතනියාවෙන් පිටවීමට පෙර යෙරුසලම සිහිකර ශෝකවූයේ ඇයි ද යි දැන් වැටහෙනු ඇත. තමා සමග පවත්නා බලඅරගලය ජයගන්නා රබීවරුන් ඉදිරියේ දී කරගන්නා විනාශයෙන් යෙරුසලමේ සිදු වන මහා ජන සංහාරය උන්වහන්සේ දුටුව හ. යෙරුසලමේ දූවරුනි, මා වෙනුවෙන් නොව නුඹලා සහ නුඹලා ගේ දරුවන් වෙනුවෙන් හඬන්නැ යි උන්වහන්සේ කීවේ අනාගත ව්‍යසනය මනසින් දකීමෙනි.[74]

පෝල් වූ සෝල්

"I am a Pharisse. A son of Pharisse."[75] "I for the traditions for my Fathres.[76]

-Soul.

"මම පැරිසියෙක්මි. පැරිසියකු ගේ දරුවෙක්මි". "මුතුන් මිත්තන් ගේ සිරිත් ආරක්ෂා කිරීම මගේ පරමාර්ථය යි. මොවුහු මෝසස් තැනූ ස්ථානය විනාශ කරති. එය කරවන්නේ යේසු නමැත්තා යි".

-සෝල්

සෝල්, දකුණු තුර්කියේ ග්‍රීක හා යුදෙව් සංස්කෘතීන් සංකලනය වූ තවුරුස් කඳුකර පෙදෙසේ පිහිටි ටෙර්සුස් නම් කුඩා නගරයේ උපන් යුදෙව්වෙකි. රෝම පාලනයට යටත් තවුරුස් කඳුකරයේ විසූ ජනයා ග්‍රීක භාෂාව කතා කළ හ. කිසියම් හේතුවක් නිසා

සෝල් ගේ දෙමව්පියෝ ඔහු ද කැටි ව යෙරුසලමට පැමිණිය හ. සෝල්, පැරිසිස් රබීවරුන් යටතේ අධ්‍යාපනය ලැබී ය. දැඩි මූලධර්මවාදියකු වූ ගැමාලිල් ඔහු ගේ හොඳ ම ගුරුවරයා වූයේ ය. යෙරුසලමේ දී ඔහු කළ වැදගත් ම කාර්යය ස්ටෙපන් මරාදැමීමට හවුල්වීම යි. ස්ටෙපන්, පැරිසිස්වරුන් විවේචනය කිරීම නිසා ගල් ගසා මරා දමන ලද පුද්ගලයෙකි.

අධ්‍යාපනය හමාර කිරීමෙන් පසු සෝල්, පැරිසිස්වරයකු වශයෙන් තවුරුස් ගමට ගියේ ය. යේසු නමැත්තකු පැරිසිස් රබීවරුන් විවේචනය කරන බව ඇසූ සෝල් තදින් කිපුණේ ය. යේසු මරාදැමිය යුතු බව ඔහු ගේ තීරණය විය. ඒ කාර්යයට සහභාගි වීම පිණිස යෙරුසලමට එන්නැ යි නායක පූජකවරයා ඔහුට ලිපියක් යැවී ය. සෝල් ලිපිය ද රැගෙන යේසු මරාදැමීම පිණිස යෙරුසලම බලා පිටත් විය.[77] සිරියාවේ ඩමස්කස් නගරය පලස්තීනයෙන් පලා ආ යේසු අනුගාමිකයන් විශාල පිරිසක් විසූ නගරයකි. ඩමස්කසයට ළඟාවෙද්දී සෝල්, අහසින් මතුවූ රුවක් දුටුවේ ය. "සෝල් ඇයි මට හිංසා කරන්න හොයන්නෙ?" රුව කතා කළේ ය. "ඔබ කවුද?" සෝල් ඇසුවේ ය. "මම යේසු. ඇයි මට හිරිහැර කරන්ඩ හොයන්නෙ?" යි සෝල් ගෙන් ඇසූ රුව අතුරුදහන් විය.

සෝල්ට අනානියස් හමු විය. යේසුස් වහන්සේ ගේ හොඳ ම අනුගාමිකයකු වූ අනානියස් යෙරුසලමෙන් ඩමස්කස් නගරයට පලා විත් තිබිණි. යේසුස් වහන්සේට ඇණගැසීම ඇතුළු බොහෝ කාරණා සෝල් සමග විස්තර කළ ඔහු, "උන්වහන්සේ තමන් ගේ ධර්මය ලොවේ ප්‍රචාරය කරන්නා වශයෙන් සෝල්ව නම් කළා" යි කිවේ ය.[78] සෝල් තනතුර භාරගත්තේ ය. පෝල් යනුවෙන් රෝම නමක් දමාගත් ඔහු 'යේසුස් වහන්සේ වෙනුවෙන්' උන්වහන්සේ ගේ වැඩපිළිවෙල මෙහෙයවීම භාර ගත්තේ ය.

යේසුස් වහන්සේ ගේ කතාවේ ඉතා ම වැදගත් සිද්ධිය උන්වහන්සේ ගේ දේශපාලනික මෙන් ම ආගමික ව්‍යාපාරයේ නායකත්වය පෝල් අතට පත් වීම යි. පෝල් එක් දිනක් හෝ යේසුස් වහන්සේ ඇසුරු කළ පුද්ගලයෙක් නොවී ය. ඔහු උන්වහන්සේ පිළිබඳ ව දැනගත්තේ පැරිසිස්වරුන් වෙතිනි.

උන්වහන්සේ මරාදැමීම ඔහු ගේ අරමුණ විය. ඔහු දුෂ්ට අරමුණක් ඉටුකිරීම පිණිස පැමිණි ප්‍රචණ්ඩ පුද්ගලයෙකි. අනානියස් හා කළ කුමන්ත්‍රණයෙන් පසු ව ඔහු ගේ දේශපාලන ආගමික ව්‍යාපාරයේ නායකත්වය භාරගත් ඔහු යෙරුසලමට ගොස් යේසුස් වහන්සේ දේශනා කළේ මොනවා ද යි විපරම් කළේ ය. ඉන්පසු ඔහු රෝම රාජ්‍යය පුරා ම සංචාරය කරමින් යුදෙව්වන් සංවිධානය කරන්නට විය. බයිබලයේ කොටසක් රචනා කරනු ලැබ ඇත්තේ ඔහු විසිනි.

ඇමරිකාවේ මැන්චෙස්ටර් විශ්වවිද්‍යාලයේ පෙරදිග අධ්‍යයන අංශයේ විශේෂඥයකු වූ ජෝන් අලෙග්රෝ, ''ද සැක්‍රඩ් මෂ්රූම් ඇන්ඩ් ද ක්‍රොස්''[79] නමින් පොතක් පළ කරමින් පෝල් සංවිධානය කළ යේසු ධර්මය කුමක් ද යි පැහැදිලි කරන විවරණයක් කරයි. ඔහු සඳහන් කරන ලෙසට, පලස්තීනය නිදහස් කර ගැනීම සඳහා යේසුස් වහන්සේ පූජනීය බිම්මල නමින් රහස් සංවිධානයක් ආරම්භ කළ හ. සෝල් ගොඩනැංවූ සංවිධානය යේසුස් වහන්සේ ගේ සංවිධානයට සමාන නොවේ. ප්‍රචණ්ඩත්වය ඊට සෘජු ව ම සම්බන්ධ ව තිබිණ. ක්‍රිස්ට් සෝල් ගේ සංවිධානයේ සංකේත නාමය යි. ක්‍රිස්ට් රහස් සංවිධානය මුලින් ම යුදෙව්වන් අතර පැතිරුණි. පසු ව රෝමවරුනට විරුද්ධ ව කටයුතු කළ ග්‍රීකයන් අතර ද සංවිධානය ජනප්‍රිය විය. පණිවුඩකරුවා යන තේරුම ඇති හීබෲ භාෂාවේ මෙසයියා යන වචනය ග්‍රීක භාෂාවට පරිවර්තනය වීමේ දී ක්‍රිස්ට් වී ඇතැ යි ද ඇතැම් භාෂාවේදීහු කියති.[80] ක්‍රිස්ට් සංවිධානයේ සාමාජිකයෝ සහ අනුගාමිකයෝ ක්‍රිස්තියානීන් වූ හ. ක්‍රිස්තියානීන් වනාහි ප්‍රචණ්ඩ ක්‍රියාවල නිරත දාමරික පිරිසක් බව ප්ලිනි හා ජොසපුස් ද පවසා ඇත.[81]

රෝම පාලනයට විරුද්ධ ව ප්‍රචණ්ඩ ක්‍රියාවල නිරතවීමේ චෝදනාව යටතේ ක්‍රිස්තියානීන් බොහෝ දෙනෙක් මරණ දඬුවමට යටත් වූ හ. රෝමය ගිනි තැබීම නිසා පුළුස්සා මරා දමන ලද ක්‍රිස්තියානි සංවිධානයේ සාමාජිකයන් බොහෝ ය. යුදෙව්වන් රෝම පාලනයට විරුද්ධ ව ගරිල්ලා යුද්ධයක් දියත් කළේ ක්‍රිස්ට් සංවිධානය තුළිනි.[82] සෝල්, ත්‍රස්තවාදී ක්‍රියා මෙහෙයවීම් පිළිබඳ ව සැකපිට යුදාවේ දී අත්අඩංගුවට ගන්නා ලදි. රෝම වැසියකු වූ ඔහු ඇණගැසීමේ දඬුවමට ලක් නොකොට රෝමයට යවන ලදුව රෝමයට විරුද්ධ ව ක්‍රියාකිරීම පිළිබඳ ව වරදකරු වී හිස ගසා දමන ලද්දේ ය.

රෝම අධිරාජ්‍යයේ වහලුන් වශයෙන් සිටි යුදෙව්වන් විසින් පතුරුවන ලද ක්‍රිස්තියානි දේශපාලනය වර්තමාන ඇමරිකාවේ බ්ලැක් මුස්ලිම්* ව්‍යාපාරය මෙන් රෝම අධිරාජ්‍යයේ වහලුන් අතර ජනප්‍රිය ආගමක් බවට පත් විය. රෝම අධිරාජයා ගේ වාසලේ සිටි වහලුන් අතර පවා ක්‍රිස්තියානි දහම පැතිරුණි. කොන්ස්ටන්ටයින් යනු රෝම අධිරාජයා ගේ අන්තඃපුරයේ සිටි හෙලේනා නම් රූමත් බිසවක් අධිරාජයාට දාව ලැබූ දරුවෙකි. හෙලේනා ක්‍රිස්තියානි ආගම ඇදහූ වහල් කාන්තාවක් වූවා ය. කොන්ස්ටන්ටයින් ගේ පිය අධිරාජයා මිය ගිය පසු රෝම සිහසුන සඳහා බල අරගලයක් ඇති විය. රෝම හමුදාවේ කොටසක් දිනාගත් කොන්ස්ටන්ටයින් ක්‍රිස්තියානි නාමයෙන් සටන් කර මිලාවියන් පාලමේ සිදුවූ සටනින් ප්‍රතිවාදී හමුදාව පරදවා ජයගත්තේ ය.[83] තමාට රෝම ප්‍රභූන් වෙතින් නිසි ගරු සත්කාර නොලැබුණු නිසාත් මව ගේ දැඩි බලපෑමට ලක්වූ නිසාත් මව ගේ ආගම රාජ්‍ය ආගම බවට පත් කළ කොන්ස්ටන්ටයින් අධිරාජයා රෝමයේ ජනප්‍රිය ව තිබූ මිත්‍ර වන්දනාව තහනම් කළේ ය.

දෙසැම්බර් 25 රෝමවරුන් ඇදහූ මිත්‍ර දෙවියා ගේ උපන් දිනය යි. ඔවුහු එදින අපරාජිත දිනය (Dies Natalis Inviciti - Birth day of the unconquered) ලෙස නම් කර සැණකෙලි පැවැත්වූ හ. ක්‍රිස්තියානි ආගම රෝමයේ රාජ්‍යාගම වූ පසු ජස්ටින් අධිරාජයා ගේ කාලයේ (ක්‍රි.ව.527-565) දියෝනීසිස් නම් පූජකයා විසින් ක්‍රි.ව. 533 වසරේ දී මිත්‍ර දෙවියා ගේ උපන් දිනය යේසුස් වහන්සේ ගේ උපන් දිනය ලෙස වෙනස් කරන ලදි.[84] යමෙකු ගේ උපන් දිනය වෙනස් කිරීම වර්තමාන ඉතාලියේ ද බරපතල වරදකි. යේසුස් වහන්සේ ගේ උපන් දිනය වෙනස් කිරීම ඉතිහාසය විකෘති කිරීමකි. අධිරාජයා වංචාව අනුමත කළ බැවින් මුළු මහත් ලෝකය ම යේසුස් වහන්සේ ගේ උපන් දිනය දෙසැම්බර් 25 වශයෙන් සලකති. කොන්ස්ටන්ටයින් අධිරාජයා ගේ සමයේ යේසුස් වහන්සේ මිත්‍ර දෙවියන්ට සමාන කිරීමට ද උත්සාහ ගනු

---

* ඇමරිකාවේ කලු අප්‍රිකානුවන් ගේ ආගමික දේශපාලන ව්‍යාපාරයකි.



කොන්ස්ටන්ටයින් අධිරාජයා නිසොයින් කවුන්සිලය පවත්වා සත්‍ය හෙළිදරව් කෙරෙන පොත් පුළුස්සනු දක්වෙන සිතුවමක්.
Ian Wilson ගේ Jesus ග්‍රන්ථයෙනි

ලැබ ඇත. රෝමයේ ශාන්ත පීටර් දේවස්ථානයේ පුරාවිද්‍යා කැණීමක දී හමු වූ මොසයික් චිත්‍ර සටහන නිදසුනකි. චිත්‍රයේ යේසුස් වහන්සේ සූර්ය දිව්‍ය රාජයා වශයෙන් යුධ රථයේ නැග පැමිණෙනු සටහන් කර ඇත.[85] යේසු ඇදහීම ස්ථිර වූ පසු ව මිත්‍ර ඇදහීම රෝමයෙන් අතුරුදහන් විය.

දියෝනීසිස් පූජකයා ගේ වංක ක්‍රියාව නිසා යේසුස් වහන්සේ ගේ උපත් දිනය ගැටළුවක් වී ඇත්තේ ය. ලූක් හා මැතිව් යේසු උපත මෙසේ විස්තර කරති.

"....... එම නගරයේ බැටලු පල්ලෝ බැටලුවන් තණ පිට්වලට දක්කා රාත්‍රි කාලය බැවින් උන් ගැන සෝදිසියෙන් උන් හ."[86] "යුඩියාව හෙරොඩ් රජු පාලනය කරන සමයේ බෙත්ලෙහෙම් නගරයේ යේසු උපත් බව අසා ශාස්ත්‍රවන්තයන් තිදෙනෙක් පෙරදිග සිට පැමිණ, 'යුදෙව්වන් ගේ රජු උපන්නේ කොහි ද? අපි එතුමන් උපන් බව පෙන්වන තරුව දක එතුමන් වන්දනා කිරීම පිණිස පැමිණියෙමු' කියමින් එතුමන් සෙවූ හ".[87]

යේසුස් වහන්සේ ගේ උපත් දිනය පිළිබඳ ව ඉතිහාසඥයන් මෙන් ම කාලගුණ විද්‍යාඥයන් ද උනන්දු වී ඇත. ඔවුන් පැහැදිලි කරන අන්දමට පසුගිය වසර දෙදහස තුළ බෙත්ලෙහෙමේ කාලගුණයෙහි ලොකු වෙනසක් සිදු වී නැත. පලස්තීනයට අධික ශීත කාලයක් වන දෙසැම්බරයෙහි රාත්‍රි කාලයට බැටලුවන් තණබිම්වලට දක්කන්නේ නැත. කාට හෝ සෘතු මාරු වී තිබේ.[88]

පැරණි ම යුගයේ රෝම චිත්‍ර අතර භික්ෂුවකට සමාන ආකාරයකින් අඳින ලද යේසුස් වහන්සේ ගේ සිතුවම් ද ඇත. පසු කලෙක වතිකානුව යේසු රුව ක්‍රමයෙන් වෙනස් කරන්නට විය. යේසු රුවට රැවුලක් එක් කර පැරණි චිත්‍රවල නිරූපිත යේසු තුළින් විද්‍යාමාන වූ නොමේරූ කොලු ගතිය වෙනස් කෙරිණි. රෝමයේ හා ග්‍රීසියේ පැරණි යේසු සිතුවම් පිරික්සූ අපට කොන්ස්ටන්ටයින් අධිරාජයා ගේ රුව දක්වෙන නව වන සියවසට අයත් ලේඛනයක අඩංගු චිත්‍රයක් දක්නට ලැබුණි. වර්තමානයේ යේසුස් වහන්සේ ලෙස වන්දනා කරන්නේ කොන්ස්ටන්ටයින් අධිරාජයාට බව යථෝක්ත චිත්‍රය පැහැදිලි කරයි.

ක්‍රිස්තියානි ආගම නීතිගත කර ක්‍රිස්තු රූපය නිර්මාණය

ඉහළ: යේසුස් වහන්සේ ගේ හාස්කම් දක්වෙන එකොළොස් වන සියවසට අයත් සිතුවමකි. එතුමා ගේ රැවුල සහ දිග කොණ්ඩය නැත. ඇඳුම සිවුරකි.

140 පිටුව ඉහළ: මියගිය ලාසරස්ට පණ දෙන යේසුස් වහන්සේ. උන්වහන්සේ ගේ ඇඳුම සිවුරකි. තුන් වන සියවස, රෝමය. පහළ: තුන් වන සියවසට අයත් ඇතුළත් රෝම නිර්මාණයක්. එහි ද සිවුරුදරුවෝ සිටිති.



1454 දී පමණ ජර්මනියේ මේන් නගරයේ මුද්‍රණය කරන ලද යුරෝපයේ පළමු බයිබලය වන ගටෙන්බර්ග් බයිබලයේ ඇතුළත් භික්ෂුවක ගේ සිතුවමකි.

වමේ: යේසුස් වහන්සේ ගේ රැවුල නැති සිතුවමක්. Christianity සඟරාවෙනි

දකුණේ: යහපත් එඬේරා සිහිකරවන මෙම බෝධිසත්ව රූපය ක්‍රිස්තියානි හා බෞද්ධ ආගම් අතර සබඳතාව අප හිතනවාට වඩා සමීප එකක් බව සඟරාව පවසයි





ඉහළ: රෝමයේ ශාන්ත මේරි දෙව්මැදුරේ ඇති යේසුස් වහන්සේ දක්වෙන සිතුවමකි.
පහළ: එම සිතුවමේ ඇති යේසුස් වහන්සේ ගේ උඩුකය. එහි රැවුලක් නැත. ඇඳුම සිවුරකි.


MENSIS NOVEMBER
FRONDIBUS A MISSIS REPETUNT SUA TRICORAMINE

රෝම සිතුවමකි. භික්ෂුවක් ද?



යේසු කණස්සල්ලේ සංකේතය යි.
1999 දෙසැම්බර් ටයිම් සඟරාවෙනි.



ඕලන්දයේ ඇම්ස්ටර්ඩෑම් නගරයේ
රිජ්ක්ස් කෞතුකාගාරයේ සිහිවටන
වෙළෙඳ කුටියේ විකිණීමට ඇති යේසුස්
වහන්සේ දක්වෙන පින්තූර පතක්

කිරීමට මුල් වූයේ කොන්ස්ටන්ටයින් අධිරාජයා බැවින් චිත්‍ර ශිල්පීහු අධිරාජයා ගේ රුවට සමාන ලෙස යේසු රුව නිර්මාණය කළ හ.

යේසුස් වහන්සේ කිසි දිනෙක සිනා නොවුණු බව ක්‍රිස්තියානි විශ්වාසය යි. කඩා එල්ලෙන මුහුණක් මිස ප්‍රීතියෙන් පසුවෙන යේසු රුවක් ලෝකයේ කිසි ම තැනක ඇති බවක් වාර්තා නොවේ. යේසුස් වහන්සේ ඉන්නේ පුදුමාකාර ශෝකයකිනි. ලේ පෙරාගත් සිරුරෙන් යුතු ව ශෝකයෙන් බලා සිටින යේසු රුව නිතර ඇස ගැටීම අසුබ පල ගෙනදේ ය යන විශ්වාසය බටහිර ඇතැම් ක්‍රිස්තියානි බැතිමතුන් තුළ ඇත. යේසු කණස්සල්ලේ සංකේතය බව 2000 මාර්තු ටයිම් සඟරාවේ සඳහන් කර තිබුණි.

යේසු සිනා නොවූ බවට ප්‍රචලිත කතාව බුදුන් පිළිබඳ ගෙතුණු කතාවක් අනුව උපන්නක් වීමට ද පුළුවන. පාප් ද මෑතක දී බුදුහු සර්ව අසුබවාදියකු ය යි චෝදනා කළේ ය. ඊට හේතුව බුදුන් වහන්සේ ජීවිතය අනිත්‍ය බව ප්‍රකාශ කිරීම යි. සිංහල බෞද්ධ ආචාර්යවරයකු වූ මහාචාර්ය ඩබ්ලිව්. එස්. කරුණාරත්න පාප් ගේ ප්‍රකාශයට බොහෝ කලකට පෙර මෙවැන්නක් ලිව්වේ ය.

"ජාති, ජරා, මරණ යන පාලි වචනවලින් ගම්‍ය වන දේ දුක ය යි බුදුන් පළකොට ඇත. භක්තියට, පුදපූජාවට, බාහිර විමුක්තියට නැඹුරු වූ පුද්ගලයා මේ වචනවල තේරුම වරදවා ගනී. ජාති යනු ඉපදීම බව පැවසේ. ජරා යනු මහලුබව ය යි පැවසේ. මරණය යනු පණයෑම බව පැවසේ. කායික වශයෙන් මේ සිදුවීම් වරදවා ගන්නා පුද්ගලයා විපරීත නිගමනවලට එළඹෙයි."[89]

ජීවිතය අනිත්‍ය බව ප්‍රකාශ කිරීම සනාතන ධර්මයක් මිස සර්ව අසුබවාදී දර්ශනයක් නොවේ. ශෝකයෙන් පසු වන කිසි ම බුදු පිළිමයක් ලෝකයේ තිබිය නොහැකි ය. බුදු පිළිමයේ විශේෂ ලක්ෂණය අකම්පිතභාවය යි. සනාතන ධර්මය අවබෝධ කරගත් පුද්ගලයා සර්ව දෘෂ්ටි ප්‍රහාණය කෙරුවෙකි. එවැන්නෙක් මිථ්‍යා දෘෂ්ටි පමණක් නොව සම්‍යක් දෘෂ්ටීන් ද ප්‍රහාණය කර ඇත්තේ ය.[90]



කුරුස ලකුණු ඇතුළත් සිරිපා සටහනක්.
අමරාවතී කැටයමක් ඇසුරින් අඳින ලද්දකි.
The Island, 21. 5. 1988

සර්ව සුබවාදී දර්ශනයක් ද තිබේ. නැගෙනහිර යුරෝපයේ සිට ඉන්දියාවට පැමිණි තෙරේසා මව්තුමිය සර්ව සුබවාදී දර්ශනය දේශනා කළ පූජකවරියකි. සර්ව සුබවාදී දර්ශනය යනු මනුෂ්‍යයන් ගොනාට අන්දවන දර්ශනයක් බව පෙන්වන රාජනීස්, තෙරේසා මව්තුමිය ගේ අනාථ දරුවන්ට පිහිට වීමේ ව්‍යාපාරය ඉන්දියාවේ අසරණ දිළිඳු හින්දු මුස්ලිම් හා වෙනත් බැතිමතුන් කතෝලිකයන් කිරීමේ ව්‍යාපාරයක් බව පෙන්වා දෙයි. ඇය විසින් එකතු කරන ලද දරුවන් දහස් ගණනෙන් එක් අයකු හෝ ඇමරිකාවේ පොහොසත් ක්‍රිස්තියානි පවුලකට වත් ලබා ගැනීමට නොහැකි වූ බව ඔප්පු කරන රාජනීස් ඇය තෝර තෝරා යුරෝපයේ හා ඇමරිකාවේ කතෝලිකයන්ට ම පමණක් අනාථ දරුවන් සැපයූ බව පෙන්වා දෙයි. අනාථ දරුවන් රැස් කළ ඇය, දුප්පත්කම හා විපත් ආශීර්වාද ලෙස සලකන්නැ යි අසරණයන්ට කීවා ය. සැබවින් ම ඉන්දියානු අනාථයන් තෙරේසා මව්තුමියට ආශීර්වාදයක් විය. ඇය අනාථ දරුවන්ට කළ සේවය වෙනුවෙන් නෝබල් තෑග්ග හිමි කර ගත්තා ය.[91]

තෙරේසා මව්තුමිය ගේ කතෝලික පැක්ටේරියේ සේවය කරන නූතන පැන්තේරාවියන් අනාථ දරුවන් ගිනියම් කරන ලද පිහිවලින් හංවඩුගසා හික්මවන අයුරු පසුගිය දිනවල වාර්තා විය.[92]

කුරුසය ක්‍රිස්තියානි ආගමේ සංකේතය ලෙස තෝරා ගන්නා ලද්දේ පලස්තීනයේ සංචාරය කළ කොන්ස්ටන්ටයින් ගේ මව හෙලේනා බිසව විසිනි. ඇගේ තෝරාගැනීමට හේතුවක් තිබුණි. යේසුස් වහන්සේ කුරුසය සිය ආගමික සංකේතය වශයෙන් පිළිගත් මහායාන භික්ෂුවකි.* මහායානයෙන් බිඳුණු තන්ත්‍රයාන සහ වජ්‍රයාන නිකායිකයෝ ද කුරුසය ආගමික සංකේතයක් ලෙස භාවිත කළ හ. මහායානිකයෝ ධර්මකාය, සම්භෝගකාය හා නිර්මාණකාය කුරුසයෙන් අදහස් කළ හ. කුරුසය ඉපදී ඇත්තේ ආර්ය සංකේතය වූ ස්වස්තිකයෙනි. පසු කලෙක මහායානික භික්ෂූහු කුරුසය විශ්ව වින්‍යාසය හා සම්බන්ධ වන හැටි පැහැදිලි කළ හ.[93]

---

* කවරෙක් නුමුත් මා පස්සේ එන්ට කැමති නම්, ඔහු තමා ගේ කැමැත්ත අත්හැර, තමා ගේ කුරුසිය රැගෙන, මා අනුව ඒවා. (මාර්ක් 8. 34)



ධර්මචක්‍ර කුරුසිය දක්වෙන කැටයමක්. ටොප්කපේ කෞතුකාගාරය, ඉස්තාන්බුල්



From its simplicity of form, the cross has been used both s a religious symbol and as an ornament, from the dawn of ian's civilization. Various objects, dating from periods long nterior to the Christian era, have been found, marked with rosses of different designs, in almost every part of the old vorld. India, Syria, Persia and Egypt have all yielded numberess examples, while numerous instances, dating from the later itone Age to Christian times, have been found in nearly every art of Europe. The use of the cross as a religious symbol in pre-Christian times, and among non-Christian peoples, may probably be regarded as almost universal, and in very many cases it was connected with some form of nature worship. Two of the forms of the pre-Christian cross which are perhaps most frequently met with are the tau cross, so named from its resemblance to the Greek capital letter T, and the *svastika* or *fylfot*[1] 卐, also called "*Gammadion*" owing to its form being that of four

FIG. 1. FIG. 2.

is a common Egyptian device, and is indeed often Egyptian cross. The *svastika* has a very wide tribution, and is found on all kinds of objects. It a religious emblem in India and China at least ten before the Christian era, and is met with on Buddh and inscriptions from various parts of India. A fine urn found at Shropham in Norfolk, and now in the Museum, has three bands of cruciform ornaments The two uppermost of these are plain circles, each contains a plain cross; the lowest band is formed of a squares, in each of which is a *svastika*. In the Vatican there is an Etruscan fibula of gold which is marked *svastika*, but it is a device of such common occurrence of pre-Christian origin, that it is hardly necessary individual instances. The cross, as a device in differen and often enclosed in a circle, is of frequent occurrence and medals of pre-Christian date in France and Indeed, objects marked with pre-Christian crosses are in every important museum.

කුරුසියේ ආරම්භය ස්වස්තිකය යි. බ්‍රිතාන්‍ය විශ්වකෝෂයේ කුරුස විස්තරයෙනි.



ධර්මචක්‍ර කුරුසයක්

ශක්ති	රත්න	කාය	ගුණ	ලෝක
ධ්‍යානිබුද්ධ	බුද්ධ	ධර්ම	සත්ව	අරූප
බෝධිසත්ව	ධම්ම	සම්භෝග	රජස්	රූප
දේවතා	සංඝ	නිර්මාණ	තමස්	කාම

ක්‍රිස්තු පූර්ව යුගයට අයත් ගල් කුරුස හා කුරුස සටහන් මහායානය පැතිර ගිය රටවලින් ලැබී ඇත. ගාන්ධාරයේ වෙහෙරක් කැනීමේ දී හමුවූ කලාත්මක බවින් පිරිපුන් කුරුසියක් පිළිබඳ ව පකිස්තාන් පුරාවිද්‍යා වාර්තාවක සඳහන් වෙයි.[94] බෞද්ධ රජවරු ඔටුනු මස්තකයේ කුරුස ලාංඡනය දරූ හ. දෙගල්දොරුවේ බිතු සිතුවම් නිදසුනකි. බුද්ධ, ධර්ම, සංඝ ත්‍රිරත්නය ලංකා කුරුසයෙන් සංකේතවත් කෙරිණි.

හෙලේනා බිසව යේසුස් වහන්සේ භාවිත කළ කුරුස සංකේතය ගැන අසා කුරුසය ක්‍රිස්තියානි සංකේතය කළා ය. ක්‍රිස්තියානි පූජකයෝ කුරුසය යේසුස් වහන්සේට ඇණගැසූ දඬුකඳේ ලාංඡනය බවට පත් කළ හ. කුරුසියේ ලෝකෝත්තර වටිනාකම නැතිවී දඬුවමේ සංකේතයක් බවට පෙරළිණි. ලංකාවේ බස්නාහිර වෙරළබඩ ප්‍රදේශයේ කුරුසිය යනු දුක නැතිනම් කරදරය හඳුන්වන දෙයකි. "මේක හරි කුරුසයක්නෙ" යි යමකු කියන්නේ කරදරයක් ඇඟවීමේ අටියෙනි.

කොන්ස්ටන්ටයින් අධිරාජයා අනුගමනය කළ පසු කාලීන අධිරාජවරුන් විසින් ක්‍රිස්තියානි ආගම තහවුරු කරන ලද්දේ එය රෝමවරුන් ගේ නිර්මාණයක් සේ සලකමිනි. ග්‍රීකයන් අතර කෙතරම් දාර්ශනිකයන් බිහිවුණ ද රෝමවරුන් බිහි කළ ක්‍රිස්තියානි ආගම විසින් ඔවුහු අභිබවන ලද හ. ක්‍රිස්තියානි ආගමට දර්ශනයක් සැපයීම පසුකාලීන ක්‍රිස්තියානි ලේඛකයන් වූ බැසිල්, ග්‍රෑගරි ජෝන් හා ක්‍රිසෝස්ටම් ආදීන් අතින් සිදු විය. ක්‍රි. ව. 500 දී මහා ලියෝ පාප් ක්‍රිස්තියානි සාහිත්‍ය වංශයක් ගොඩනැංවීමට උනන්දු වූයේ ය. ශුභාරංචිකරුවෝ යුරෝපයට ද යවන ලද හ. ක්‍රි. ව. 800 දී රාජත්වය හා කිතු සසුන අතර සබඳතා නීතිගත කෙරිණි. ක්‍රි. ව. 774 දී, කොන්ස්ටන්ටයින් අධිරාජයා රෝම නගරය අවට පෙදෙසක් පාප්වරුන්ට පරිත්‍යාග කළ බවට හොර ඔප්පුවක් පෙන්වා චාලිමේන් නම් මළපොතේ අකුරක් නොදත් පාලකයා

චේතිය රජතුමා

ඔටුනු මස්තකයෙහි කුරුස සහිත
දෙගල්දොරුවේ චිත්‍ර.
බර්ලින් පුස්තකාලය

වෙස්සන්තර රජතුමා සහ ජාලිය කුමරු

වටු හැන්ඩ්රියන් පාප් එම බිම් පෙදෙස අත්පත් කර ගත්තේ ය. එම බිම් කොටස වතිකානුව බවට පත් වූ අතර සෑම පාප්වරයකු ම පෝල් නම භාවිතා කරන්නේ පළමු වන පාප් හෙවත් පෝල් යනුවෙන් නම වෙනස් කරගත් සෝල් සිහි කිරීම සඳහා ය.

කතෝලිකයන් පිළිගන්නා අන්දමට ක්‍රිස්තියානි ආගම සකස්කිරීමේ දී බයිබලයට එක් කළ අලුත් වගන්ති හා නීති සැමෙකක් ම පාප් ගේ නිර්මාණයන් ය. දෙවියන් නියෝජනය කරන පාප්ට වැරදීමක් සිදුවිය නොහැකි බවත් ඔහු ක්‍රිස්තියානීන් ගේ අවසාන විනිශ්චයකරුවා බවත් රෝමවරු ලෝකයට ප්‍රකාශ කළ හ. මාටින් ලූතර්, පාප් ප්‍රමුඛ කතෝලික සභාවට විරෝධය දක්වමින් ආරම්භ කළ විප්ලවය රෙපරමාදු ප්‍රතිසංස්කරණය වන්නේ ය.[86]

පාප් බයිබලයට එක් කළ නවාංග බොහෝ ය. ඉන් කිහිපයක් මෙසේ යි.

1.	ශුද්ධ වූ පැන් ඉසීම ආරම්භය	ක්‍රි. ව. 120 දී
2.	පාදිලිවරුන් ගේ ආරම්භය	ක්‍රි. ව. 348 දී
3.	ක්‍රිස්තියානි කිරීම ආරම්භය	ක්‍රි. ව. 1000 දී
4.	පාදිලිවරුන්ට බ්‍රහ්මචරියාව පැවරීම	ක්‍රි. ව. 1015 දී
5.	පව් සමාව ආරම්භය	ක්‍රි. ව. 1119 දී
6.	කසාදය නම් දෙයක් සක්‍රමේන්තුවට එක්කිරීම	1139
7.	යක්ෂ පරීක්ෂාව ආරම්භය	ක්‍රි. ව. 1204 දී
8.	පාදිලිවරුන්ගේ කනට කොඳුරා කියන පව් සමාව	1215
9.	පාප් නිවැරදි බව දන්වීම	ක්‍රි. ව. 1870 දී
10.	මරියා ස්වර්ගස්ථ වූ බව පැවසීම	ක්‍රි. ව. 1950 දී[96]

ක්‍රි. ව. 1204 දී පාප් හඳුන්වා දුන් යක්ෂ පරීක්ෂාවෙන් යුරෝපයේ කිසිදු ජන වන්දනාවකට ගැළවිය නොහැකි විය. මධ්‍යතන යුගය දක්වා ම යුරෝපයේ ග්‍රාමීය සමාජ කිසිදු සංවිධානගත ආගමකට ගොදුරු වී නොසිටිය හ. ගස් ගල් වන්දනා කළ ඔවුන් අතර වෙනත් නොයෙක් ජන ඇදහිලි ද තිබුණි. යක්දෙස්සියෝ (Witches) ජන ආගම්වල ප්‍රධාන කාර්යභාරයක් ඉටු කළ හ. නොයෙකුත් ගුප්ත විද්‍යා ශාස්ත්‍ර දත්, පේන කියූ යක්දෙස්සියෝ වෛද්‍යවරියන් වශයෙන් ද කටයුතු කළ



ජෝන් ඔෆ් ආර්ක් පිළිස්සීම
Marschall Richard, Witch Craft Saraband, 1995

කාන්තාවන් පුළුස්සනු දක්වෙන 16 වන සියවසට අයත් ජර්මන් චිත්‍රයක්
Bartow, Anne Liewellum. A new history of European witch hunts
Pandora Pub., 1971

හ. විත්තඹූකම් කරන ලද්දේ ද ඔවුන් විසින් ම ය. යක්දෙස්සියන් යකුන් සමග සම්බන්ධකම් පවත්වන බවට කතෝලික සභාවේ නායකයන් විසින් කරන ලද චෝදනාව පාප් විසින් අනුමත කරන ලදි. දරුවන් සඳහා සකස්කර ඇති ළමා බයිබල් විශ්වකෝෂයේ සඳහන් වන ලෙසට සාතන් යනු යක්ෂයා යි. ඔහු දෙවියන් ගේ ප්‍රතිවාදියා යි. මිනිසුන් ගේ සිත නොමඟ යැවීම සාතන් ගේ පිළිවෙත යි.[97]

යක්දෙස්සියන් පිළිබඳ ව ගෙතුණු ජනප්‍රවාද ගැන උනන්දු වූ කතෝලික සභාව යක්ෂයාට විරුද්ධ ව යුද්ධයක් ආරම්භ කරමින් යක්දෙස්සියන් දඩයම් කරන්නට විය. පිළිගත් වෛද්‍යවරියන් පමණක් නොව අසාමාන්‍ය දේහ ලක්ෂණ ඇති ඕනෑ ම කාන්තාවක යක්දෙස්සියක ලෙස සැකයට භාජනය කෙරිණි. ඇතැම් තරුණියක සැකයට පාත්‍ර වූයේ හිසකෙස් රැළිගැසී තිබීම නිසා ය. නොඑසේ නම් ඇගේ ඇස්වල ඉංගිරියාව තිල් පැහැයෙන් නොව කලු පැහැයෙන් යුක්ත වීම නිසා ය. සැක කරන ලද තරුණිය හෝ කාන්තාව හෝ දේවස්ථානයට ගෙනවුත් නොයෙකුත් වධ බන්ධනවලට ලක් කරමින් ප්‍රශ්න කරන ලදි.[98] අධික වධබන්ධන ඉවසිය නොහැකි කාන්තාවක් තමන් යක්ෂයා සමග හාදකම් පවත්වන බව පිළිගතහොත් ඇය සමග යකා රමණය කරන්නේ ද යන්න දැනගැනීමට ද පාදිලිවරුනට අවශ්‍ය විය. යක්ෂයාට ඇත්තේ දෙබල් ලිඟුවක් ය යන මතය ඔවුන් පිළිගෙන ප්‍රසිද්ධ කර තිබුණි. ස්ත්‍රිය යක්ෂ සමාගම පිළිගන්නේ නම් තමා තින්දෙන් රමණය කළේ යකා සමග බව ඇය දැනගත්තේ කෙසේ ද යන ප්‍රශ්නයට පිළිතුර ද පාදිලිවරු ඇගේ මුඛයෙන් ම බලාපොරොත්තු වූ හ. ඉන්පසු ඇය ප්‍රසිද්ධියේ පුළුස්සා මරාදමනු ලැබේ.*

කාම උන්මාදයෙන් පෙළුණු පූජකයන් ගේ ක්‍රීඩාවක් වූ

---

* Rajneesh Bagvan, Rajneesh Bible Vol.1.

"They described in detail how the devil comes, how he looks, with two hornes....... instead of fingers, hooves. Not only that, they described that the devil has a forked sexual organs. That is great imagination..... Why a forked sexual organ? So that the devil can have a double intercourse at the same time, so he can use both the women's entries in the body at the same time. And it was belived, and they were burned." p363.

"විච් හන්ටින්" යටතේ යුරෝපයේ දහස් සංඛ්‍යාත කාන්තාවනට මරණය හිමි විය.[99]

ජෝන් ඔෆ් ආක් ප්‍රංශයේ සිටි ජන නායිකාවකි. ඇය විච් හන්ටින් යටතේ අල්ලා මරාදමනු ලැබුවා ය. එක පාප්වරයකු ඇය මරාදැමීම අනුමත කළ අතර පසු ව පත්වූ පාප්වරයෙක් සිද්ධිය වැරදීමක් බව පවසා සමාව ඉල්ලා ජෝන් ඔෆ් ආක් ශාන්තුවරියක ලෙසින් ප්‍රකාශ කළේ ය.[100]

වතිකානු තානාපතියකු වූ කොරාඩෝ බල්ඩුසි ලියා ප්‍රසිද්ධ කළ ග්‍රන්ථයක් ගැන සඳහන් කරන රාජනීස් භගවාන්, 'නරකාදියේ යකුන් 1,758,640,175 දෙනකු සිටින බව බල්ඩුසි ලියා ඇතැ යි ද ඔහු නරකාදියේ යකුන් ගණනය කළේ කෙසේ දෑ යි ද ප්‍රශ්න කරයි. සාතන් ගේ හමුදාව වන මොවුහු විවිධ ක්‍රමවලින් මනුෂ්‍යයා නපුරට පොළඹවන්නේලු.[101]

ක්‍රි. ව. 1215 දී පාප් හඳුන්වා දුන් කණට කොඳුරා කරන පව් සමාව මනුෂ්‍යයන් රවටා ඔවුන් ගේ තොරතුරු දැනගැනීමකි. මෙය කාලාන්තරයක් මුළුල්ලේ ලෝකය පුරා සිදු කෙරෙන මානව හිමිකම් උල්ලංඝනය කිරීමකි. කණට කොඳුරා කරන පව් සමාව නිසා පුද්ගලයනට සිය පුද්ගලිකත්වය රැකගත නොහැකි වේ. ඔවුන් දෙවියන්ට ප්‍රකාශ කරන සියල්ල දැලෙන් එපිට සිටින පූජකයෝ අසා සිටිති.

යේසු විජ්ජාකරුවකු කිරීම

ක්‍රිස්තියානි දහම රෝමවරුන් ගේ නිෂ්පාදනයකි. එහි නිර්මාතෘවරයා වන්නේ යේසුස් වහන්සේ ගේ යුදෙව් දේශය නිදහස් කරගැනීමේ ජාතික ව්‍යාපාරය උදුරාගත් සෝල් ය. ඔහු පැරිසිස් සාමාජිකයෙකි. කිසි දිනෙක යේසුස් වහන්සේ දැක නැති ඔහු උන්වහන්සේ ගැන අසා කෝපයට පත් ව උන්වහන්සේ මරාදැමීම පිණිස ඉදිරිපත් වූවෙකි. සෝල් පැමිණීමට පෙර ඔහු ගේ පාර්ශවය විසින් යේසුස් වහන්සේට ඇණ ගසන ලදි. ඩමස්කසයේ දී සෝල් අනානියස් ගෙන් සිද්ධිය දැන ගත්තේ ය. ඉන්පසු අනානියස් හා සතර කන් මන්ත්‍රණයක් කළ සෝල් කල දුටු කල වළ ඉහ ගතිමින් යේසුස් වහන්සේ ගේ ජාතික ආගමික ව්‍යාපාරය සියතට ගත්තේ ය.

සෝල්, යේසුස් වහන්සේ ගේ නාමයෙන් උන්වහන්සේ ගේ සියලු දේශනා වෙනස් කරන්නට විය. බුදුන් බ්‍රාහ්මණ දහම නිර්දය විවේචනයට ලක් කළ ශාස්තෘවරයෙකි. උන්වහන්සේ ගේ ශ්‍රාවක ශ්‍රාවිකාවන් උන්වහන්සේ ගේ දහම සංඝායනා පවත්වා ග්‍රන්ථාරූඪ කර තිබිය දී පවා බ්‍රාහ්මණයෝ බුදුන් විෂ්ණු ගේ දස අවතාරවලින් එකක් කළ හ. තෝස කඩවල එල්ලී සිටින දෙවිවරුන් අතරට බුද්ධ රූපය ආවේ එලෙසිනි. සෝල් ගේ ක්‍රියාව බමුණන් ගේ ක්‍රියාවට ඉතා සමාන එකකි. "ක්‍රිස්තියානි ආගමේ මූලධර්ම සැදූ පුද්ගලයන් අතර පෝල් ප්‍රධාන වෙයි. ඥානවන්තයකු වූ ඔහුට සමාකාලීන ආගම් ගැන හොඳ අවබෝධයක් හා උනන්දුවක් තිබුණි. යුදෙව් ආගම, මිත්‍ර ඇදහීම හා ඇලෙක්සන්ද්‍රියානු විශ්වාසයන් ගැන හදාරා සිටි ඔහු, ඒ හැමෙකකින් ම අදහස් හා ආවේගකර හැඟීම් ඇති කරන කොටස් ක්‍රිස්තියානි ආගමට එක් කළේ ය" යි එච්. ජී. වේල්ස් කියයි.[102]

පෝල් යේසු චරිතය තමන් රිසි පරිදි සකස් කරමින් උන්වහන්සේ ගේ චරිතය සාතනය කරන්නට විය. බයිබලයේ අලුත් ගිවිසුම පිරී ඇත්තේ හාස්කම්වලිනි. යේසුස් වහන්සේ මළවුන්ට පණ දෙයි, බිහිරන්ට ඇසෙන්නට සලස්වයි. කොරුන් ඇවිද්දවයි. අන්ධයන්ට පෙනීම ලබාදෙයි. ජලය මත ඇවිදියි. කුණාටු නවතා මුහුද නිශ්චල කරයි. ධීවරයනට මාළු අහින් මවයි. වතුර වයින් කරයි. ගල් පාන් කරයි. එක පාන් පෙත්ත ජන ගංගාවකට බෙදයි. යේසු චරිතය ගොඩනංවා ඇති සියලු ම හාස්කම් සහ විජ්ජා පැරිසිස් චින්තනයෙන් හින්නවූ ඒවා ය. යුදෙව් ආගමේ ශාස්තෘදායක මෝසස් විජ්ජාකරුවෙකි. ඔහු යුදෙව්වන් දහස් ගණනක් බලා සිටිය දී සිනායි කන්ද උඩ මොන තරම් හාස්කම් කළේ ද? සෙනග සියල්ලෝ ම ගිගුරුම් ද විදුලිය ද හොරණෑ ශබ්ද ද කන්දෙන් දුම් පිටවෙනු ද ඇසුවෝ ය; දුටුවෝ ය.[103]

සෑම පුද්ගලයකු ගේ ම ජීවිතයේ අපූර්ව සිදුවීම් ඇත්තේ ය. සනාතන ධර්මය එයයි. ඊට බාහිර ව කිසි ම පුද්ගලයකුට හාස්කම් කළ නොහැකි ය. ඇස් බැන්දුම් හෙවත් විජ්ජා පමණක්

කළ හැකි ය. ලෝකයේ අති දක්ෂ විජ්ජාකරුවෝ සිටිති. වඩාත් ම ප්‍රසිද්ධ විජ්ජාකරුවකු වන ඇමරිකානු ජාතික ඩේවිඩ් කොපර්පිල්ඩ් කාන්තාවක ඔසොවා ගෙන අහසේ ඇවිදියි.

විජ්ජා බලා ප්‍රීතිවීම ද විජ්ජාකරුවනට මුලාවීම ද මනුෂ්‍ය ගතියකි. විජ්ජාවලින් මිනිසුන් නොදිනීම බුද්ධ චරිතයේ ප්‍රධාන ලක්ෂණය යි. බුදුන් ආවර්තනී මායාවෙන් පුද්ගලයන් වශීකරතැ යි මතයක් බුදුන් දවස භාරතයේ තිබිණි. ආර්ය අෂ්ටාංගික මාර්ගය හෙවත් අංග අටකින් යුතු උතුම් ප්‍රතිපදාවක් බුදුන් දේශනා කොට ඇතත් අනුගාමිකයන් අතර ජනප්‍රිය ව ඇත්තේ ආර්ය මාර්ගයේ කිසිදු සූත්‍රයක නැති බෝධි පූජා, ධාතු පූජා, බුද්ධ පූජා ආදිය යි.[104]

විජ්ජාව ඇස්බැන්දුමකි. විජ්ජාව වෘත්තිය කරගත් මිනිස්සු සිටිති. මීට හය හත් වසරකට පෙර ජර්මන් රූපවාහිනියේ විදේශීය සංග්‍රහය නම් සුප්‍රසිද්ධ වැඩසටහන ඇදහීමෙන් ලෙඩ සුව කරන්නන් පිළිබඳ වාර්තාවක් ඉදිරිපත් කළේ ය. බ්‍රසීලයේ නගරවල විශාල රැස්වීම් පවත්වමින් මහජනයා දහස් ගණන් එක් කළ පාදිලිවරයෙක් කොරුන් ඇවිද්දුවේ ය. යක් දෝෂවලින් පෙළුණු ගැහැනුන් ගේ ශරීරවලින් යකුන් පන්නා සුව කළේ ය. ඔහුට දරුවන් දෙදෙනෙක් සිටිති. දෙදෙනා ම ඇවිදීමට බැරි උපන්ගෙයි කොරු ය. අප්‍රිකාවේ රටරටවල ඇවිදිමින් ගොළුවන් කතාකරවූ නෙදර්ලන්ත පාදිලිවරයකු විවාහ වී සිටියේ ගොළු ගැහැණියක සමඟ ය. ජර්මන් රූපවාහිනී වැඩසටහන අවසන් කරන ලද්දේ මහජනයාට ප්‍රශ්නයක් ඉදිරිපත් කරමිනි. මොවුන්ට මෙතරම් හාස්කම් කළ හැකි නම්, යේසු අනුගමනය කරමින් ගල් පාත් බවට පත් කරන්නට බැරි ඇයි? තුන් වන ලෝකයේ දරුවෝ බඩගින්නේ මිය යති. ඔවුන් වැඩි දෙනකුට ඇස්, කන් ආදියේ දුර්වලතා ඇති වන්නේ ආහාර අහේනිය නිසා ය.

ලංකාවේ ද ප්‍රසිද්ධ වේදිකාවල දී සහ ගෙන් ගෙට ගොස් ඇදහිල්ලෙන් ලෙඩ සුව කරන නළු පාදිලිවරු සිටිති. මොවුහු, වේදිකාවල ටීටර් නැටූ හෝ පැරණි කාලයේ කුඹුරු අස්වැන්න අහවර කළ පසු ගෙයින් ගෙට ගොස් සත් දිනක් සොකරි නැටූ හෝ ගැමි නැට්ටුවනට සමාන නොවෙති. පාදිලිවරුන් ඇදහිල්ලෙන් ලෙඩ සුව කරන බව කියමින් ගෙයින් ගෙට නටන්නේත් වේදිකාවල රඟදෙන්නේත් අසරණ බෞද්ධයන් තම සංවිධානවලට කොටුකර ගැනීමේ කපටි චේතනාවෙනි. යේසුස් වහන්සේ විජ්ජාකරුවකු නොවුණු බව ඔප්පු වන හොඳ ම අවස්ථාව ඇණගැසීමේ සිද්ධිය යි. එසීන්ස්වරු යේසුස් වහන්සේ ලී කඳෙන් ගැලවුණේ කෙසේ ද යි පැහැදිලි කරති.

යේසුස් වහන්සේ මරාදැමීමේ අවස්ථාව නොලැබූ සෝල් උන්වහන්සේ විජ්ජාකරුවකු බවට පමුණුවාලීම උන්වහන්සේ ගේ චරිතය ඝාතනය කිරීමකි. සෝල් ඇති කළ ක්‍රිස්තියානි ව්‍යාපාරය යේසුස් වහන්සේ ගේ සැඟවුණු ජීවිතය එළිකිරීම වළක්වයි. එහෙත් ඔවුනට උන්වහන්සේ ගේ වයස අවුරුදු දහතුන සහ තිහ අතර කාලය සම්පූර්ණ කළ නොහැකි ය. යේසුස් වහන්සේ ගේ ජීවිතයේ අප්‍රසිද්ධ කාලය බයිබලයේ හිඩැසකි. බයිබලයේ හිඩැස මනුෂ්‍යයාට බුද්ධියේ කඩතුරා හැර ඇත්ත දැනගැනීමට කරන ආරාධනාවකි.

පාදක සටහන්

1 Keller, Werner, The Bible as History, Hodder, London, 1956, p373

2 "මාර්ගය ද සැබෑව ද ජීවනය ද මම ය. මා පිහිට කරගෙන මිස කිසිවකු පියාණන් වහන්සේ වෙතට පැමිණෙන්නේ නැත." යොහාන් 14. 6

යොහාන් 19. 25

3 Levi, The Aquarian Gospel.

"The Jews in Palestine never believed in human sacrifice, nor in the crucifiction of the Messiah for the sins of the world. The Pagans believed that their gods Adonis, Attis, Osiris and Mithra had died for the sins of mankind. It was paul who borrowed the idea of a scapegoat and laid stress on the crucified Jesus. The theory of "original sin" and redemption by the death of the son of God was an invention by Paul." p151.

4 යොහාන් 1-27

5 Levi, The Aquarian Gospel, p194.

6 The Crucifixion By An Eye-Witness, Indo Ameracan Book, USA 1907, p. 57.

7 Ragg, Lonsdale, The Gospel of Barbannas, Oxford, 1907, 59.

8 ලූක් 22. 44,

9 මාක් 14. 43-65

10 ලූක් 23. 4-5
11 Keller, Werner, The Bible as History, Hodder, London, 1956, p374
12 මතෙව් 27. 15-26
13 ලූක් 23. 28
14 මාක් 15. 25
15 මතෙව් 27. 34-35
16 ලූක් 23. 34
17 The Crucifixion By An Eye-Witness, Indo Ameracan Book, USA 1907, p64.
18 මාක් 15. 34
19 ලූක් 23. 46
20 Cecil Northcott, Bible Encyclopeadia, p141.
21 Deut 21.23
22 යොහාන් 19. 32
23 ජෝන් 19. 32-33
24 ජෝන් 19. 32-34
The Crucifixion By An Eye-Witness, p71.
25 Hassnain, Fida, A Search of The Historical Jesus, p106.
26 Cornu (horn) The Bible as History, p377.
27 මාක් 15. 25
28 මාක් 15. 37, මතෙව් 27. 50
29 ලූක් 23. 33-44
30 යොහාන් 19. 13-14
31 යොහාන් 18. 28 සිට 19. 16 තෙක්
32 Hassnain, Fida, A Search of The Historical Jesus, p109.
33 The Crucifixion By An Eye-Witness, 1907
34 Hassnain, Fida, A Search of The Historical Jesus, p109.
"During the ancient times, among the Jews, a day was counted from sunrise, so the third hour could be 9am, the sixth hour 12 noon and the ninth hour 3pm."
35 Ian Wilson, Jesus, Haper & Row, 1984, p131.
36 Hassnain, Fida, A Search of The Historical Jesus, p73.
37 Dummelow Rev. J., Commentary on the Holy Bible, London, 1917.
38 Allegro, John, The Sacred Mushroom and the Cross, p158
39 The Crucifixion By An Eye-Witness, p.64
40 මැතිව් 27. 59-60
41 Ian Wilson, The Shroud of Turin, Penguin, 1978.
42 ලූක් 24. 1-2
43 ජෝන් 20. 1
44 මාක් 16. 5
45 මාක් 16. 7
46 ජෝන් 20. 7

47 මතෙව් 28. 1-20, මාක් 16. 1-20, ලූක් 24. 1-53, යොහාන් 20. 1-29.
48 Peloubets Select Notes on the International Lessons, Boston, 1918, p190-193.
49 Jews Encyclopaedia Vol. 8, London, 1905, p250.
50 The Crucifixion By An Eye-Witness, Indo Ameracan Book, USA 1907
51 Ibid, p65-75.
".....Our brother, having heard a slight noise with in the grotto, went to observe what had happened. He observed with inexpressible joy that the lips of the body moved and that it breathed."
52 Ibid, p81.
53 කළුකොදයාවේ පඤ්ඤාශේඛර මාහිමි, ත්‍රිපිටකයේ ආයුර්වේදය, වික්‍රමාරච්චි අභිනන්දන ග්‍රන්ථය, 1968, 43-46 පිටු.
54 Paranavithana, Senarath, Avalokiteswara in Ceylon, B.C. Law Com, Vol. 1, Poona, 1951.
55 Hassnain, Fida, A Search of The Historical Jesus, p136.
56 The Crucifixion By An Eye-Witness, p102-104.
57 මාක් 16. 2-5
58 ලූක් 24. 14
59 මතෙව් 28. 1-4
60 The Apocryphal New Testiment Tr. M. R. James, Gospel of Peter, London, 1926, p35-40
61 ලූක් 24. 25-26
62 ලූක් 24. 30-31
63 ලූක් 24. 36-40
64 ලූක් 24. 36-42
65 ජෝන් 20. 27
66 Lewis, H. A. Christ in Crowell? Aqurian, 1991.
67 Who's who in Bible, Readers Digest Association, NY, 1994
68 Brandon, S. G. F., The Trail of Jesus of Nazerath Batsford, London, 1968.
69 ලූක් 22. 36-38
70 Ian Wilson, Jesus, The Evidence Harper & Row, USA, 1984, p114.
71 මැතිව් 21. 1-7
72 Schonfield, Hugh, Saints Against Ceaser, Mackdonald, London, 1942, p142.
73 Josephus, The Jews Wars, Tr. W. Whiston, London, Vol. iiix, p9.
74 මැතිව් 23. 27
75 Acts 23.6
76 Gal. 1-14
77 Who's who in Bible, Readers Digest Pub.
78 Act of Apostels 9. 10-15

79 Allegro, John, Sacred Mushroom and the Cross, Hodder & Stoughton, London, 1970.
80 Ian Wilson, Jesus, Haper & Row, 1984, p58
81 එම
82 Allegro, John, Sacred Mushroom and the Cross
83 Ian Wilson, Jesus, Haper & Row, 1984, p158-160.
84 The Bible as History p353
85 Ian Wilson, Jesus, Haper & Row, 1984, p161.
86 ලූක් 2. 8
87 මැතිව් 2. 1-3
88 Keller, Werner, The Bible as History, Hodder, London, 1956, "At Christmas time Bethlehem is in the grip of frost, and tn the Promised land no cattle would have been in the fields in that temperature."p353-354.
89 මහාචාර්ය ඩබ්ලිව්. එස්. කරුණාරත්න, බෞද්ධ දර්ශනය හා චරණය, සමයවර්ධන, කොළඹ, 1992, 12 පිටුව.
90 මැදුම් සගිය, මහා තණ්හාසංඛය සූත්‍රය.
91 Rajaneesh Bible Vol. 2, Rajneesh Publication, USA, 1986. Positive Thinking: Philosopy for Phonies, p778-811.
92 Net Yahoo.com (AFP) "Mother Teresa Nun Hurting Indian Street Children." (21 September 2000)
93 Lincoln, Bruce, Myth, Cosmos and Society, Harward University Press,1986.
94 ASIAR 1908-09, p57-58
95 Nischan, Bodo, Lutherans and Calvinists in the age of Confessionalism, Ashgate Pub., 1999.
96 කොලට් සේනානායක, කරාව කතාව, බර්ලින් ශ්‍රී ලංකා මානව හිමිකම් සංවිධානය, බර්ලින්, 1992
97 Cecil Northcott, Bible Encyclopedia for Children, Westminister Press. 1964.
98 Levack, Brain, Witch Hunting in Continental Europe, Garlend Pub. 1992.
99 Beth Hess & Myra Farree, Sexual Terrorism, Sage Pub., 1972.
100 John of Arc, Encyclopaedia Britanica.
101 Rajneesh Bagvan, One Seed Makes the Whole Earth Green, Rebel Pub., Germany, 1989, "1,758,670,175 Devils", p137.
102 Wells, H. G., Short History of the World Pelican, p129.
103 නික්මයාම 20. 18
104 ඩබ්ලිව්. එස්. කරුණාරත්න, බෞද්ධ දර්ශනය හා චරණය, සමයවර්ධන, කොළඹ, 1992

5

යේසුස් නම් බුද්ධ ශ්‍රාවකයාණෝ

නිකොලොස් නොටෝවිෂ් ගවේෂකයා විසින් ප්‍රසිද්ධ කරන ලද, "යේසුස් වහන්සේ ගේ අප්‍රකට ජීවිතය" යුරෝපයේ සහ ඇමරිකාවේ බුද්ධිමතුන් විසින් අගය කරන ලද ග්‍රන්ථයක් වූයේ ය. එය කියවීමෙන් ආස්වාදය ලැබුවෝ යේසුස් වහන්සේ පිළිබඳ ව වඩ වඩාත් කරුණු සොයන්නට වෙහෙසුණ හ. එම උත්සාහයන් ගේ මල්ඵල වශයෙන්, අප්‍රධාන අපොස්තල්වරුන් ගේ සහ එසින්ස්වරුන් ගේ ග්‍රන්ථ කිහිපයක් ම ප්‍රකාශයට පත් විය. අශුභ ප්‍රතිඵලය වූයේ, කතෝලික සභාව ප්‍රධාන තවත් ක්‍රිස්තියානි ආයතන කිහිපයක් ම එක් වී බයිබලයට පටහැනි යේසුස් වහන්සේ පිළිබඳ ඓතිහාසික සාක්ෂි විනාශ කිරීමේ දවැන්ත මෙහෙයුමක් ආරම්භ කිරීම යි.[1] මොවුහු, ටිබෙටය, නේපාලය හා ලඩාකය යන රාජ්‍යයන්හි විහාරාරාමවල පැවති ඓතිහාසික ලේඛන විශාල ප්‍රමාණයක් අත්අඩංගුවට ගෙන හෝ විනාශ කර හෝ ඇත්තා හ. කතෝලික සභාව තිඹිරිගෙයි පටන් ම විද්‍යා විරෝධී ආයතනයක් වූයේ ය. ඉතිහාසයේ වඩාත් ම ප්‍රකට සිද්ධිය, බෲනෝ නමැති විද්‍යාඥයා පුළුස්සා මැරීම යි. බෲනෝ පෘථිවිය ගෝලාකාර වස්තුවක් බව ප්‍රසිද්ධියේ ප්‍රකාශ කළා පමණකි. ඉතාලි විද්‍යාඥයෙක් එම දඬුවමට යටත්වීමේ අනතුර අබියසට ම ගියේ ය. හේ ගැලීලියෝ ය. "පෘථිවිය වටේ සූර්යයා කැරකෙනවා නොවේ, පෘථිවිය සූර්යයා වටේ පරිභ්‍රමණය වෙනවා" යි කී ගැලීලියෝ රෝම ආගමික හමුදාව විසින් අත්අඩංගුවට ගන්නා ලදි. අඳුරු කුටියක රඳවා තබන ලද ගැලීලියෝ, අධිකරණ ශාලාවට ආයේ අන්ධයකු වශයෙනි. "හොඳයි, කිසි ප්‍රශ්නයක් නෑ. මම බයිබලයේ තියෙන දේ ම මගෙ පොතෙත් ලියන්නම්. ඒත් සූර්යා වත් පොළොව වත් මගෙ පොත කියවන්නෙ නෑ. යථාර්ථය පවත්නා තාක් පොළොව සූර්යා වටේ යාවි.[2]" ඔහු කීවේ ය. ගැලීලියෝ ගේ ජීවිතය බේරුණු

නමුදු දිවි ඇති තෙක් අඳුරු සිර කුටියක දිවි ගෙවන්නට සිදු විය.[2]

මාකෝ පෝලෝ චීනයට ගිය පළමුවැනි යුරෝපා ජාතිකයා ලෙස සැලකේ. චීනය ගැන වටිනා තොරතුරු සම්භාරයක් ලියා තැබූ පළමු යුරෝපා ජාතිකයා මාකෝ පෝලෝ වන්නේ ය. ඔහු තවත් යුරෝපීයයන් දෙ දෙනකු ද සමඟ චීන දේශ සීමාවක දී අත්අඩංගුවට ගත් චීන සෙබලු, 'අපි කතාකරන සුදු වඳුරන් තිදෙනකු අල්ලා ගතිමු' යි චීන අධිරාජයාට පණිවිඩ යැවූ හ. කුබ්ලයිඛාන් අධිරාජයා 'සුදු වඳුරන්' රාජ සභාවට ගෙන්වා ගත් අතර, මාකෝ පෝලෝ සමඟ දැඩි මිත්‍රත්වයක් ඇති කරගෙන, රාජකීය අමුත්තකු වශයෙන් වසර විසි ගණනක් මාලිගාවේ රඳවා ගත්තේ ය. මාකෝ පෝලෝ නමැති ප්‍රඥාවන්ත ඉතාලි ජාතිකයා චීනයේ රාජ්‍ය පාලන කටයුතුවලට පවා හවුල් වූයේ ය. ඔහු පෙරළා ඉතාලියට ගියේ සිංහලයන් ගේ රට වශයෙන් චීන ජාතිකයන් හැඳින්වූ ලංකාව ඔස්සේ ය. මාකෝ පෝලෝ ඉතාලියට යන විට ඔහු ගේ පරම්පරාවේ වැඩි දෙනෙක් ජීවතුන් අතර නොසිටිය හ.

ඉතාලියේ දී චීන ජාතිකයකු ලෙසින් ඇඳුම් ඇන්ද, ආහාරපාන පිළියෙල කරගත්, මාකෝ පෝලෝ තමන් වාසය කළ චීනයේ දියුණුව ගැන යමක් කීවේ ද, ඉතාලි ජාතිකයනට ඒවා සුරංගනා කතා විය. දහසක් බුදුවරුන් වැඩවසන පන්සල්, සැතපුම් ගණනක් දිග මහා ප්‍රාකාරය, සැතපුම් හය සියයක් දිග ඇල මාර්ගය, ජලරෝද, තැපැල් සේවය, මුදල් නෝට්ටු, පොත් දහස් ගණන් ඇති මහා පුස්තකාල, විශ්වකෝෂ, තාරකා නිරීක්ෂණය කරන දූරදර්ශක කන්නාඩි, ගෙවල් රත්කරන ගල් අඟුරු, මනුෂ්‍ය ශරීරයට කරන සැත්කම් ආදි චීනයේ ඇතැ යි මාකෝ පෝලෝ කියන අපූර්ව දේ කිසිවක් ඉතාලි ජාතිකයන්ට සිතා ගැනීමට පවා නොහැකි කරුණු විය. අද්භුත චාරිකාවක යෙදී පැමිණි මාකෝ පෝලෝ පිළිබඳ ව පාප්ට ද අසන්ට ලැබුණි. ඔහු කැඳවූ පාප්, "උඹ චීන අධිරාජයාට දෙවියන් වහන්සේ ගැන කිව්වේ නැද්ද" යි ඇසුවේ ය.

"මා කිව්වා. එවිට සිනාසුණු අධිරාජයා, 'තුඹල ගේ රටේ ඉන්නේ එක දෙවිය යි. මගේ රටේ තිස්තුන් කෝටියක් දෙවිවරු සහ දේවතාවියො ඉන්නවා' කිව්ව. තවත් වරක් මා ඒ ගැන කී විට, 'මෝඩයින් එක දෙවියො යි කියනවා. බුද්ධිමතුන් කෝටි ගණනින් දෙවිවරු ඉන්නවා කියනවා' යි කිව්ව." මාකෝ පෝලෝ උත්තර දුන්නේ ය.

"මාකෝ පෝලෝ පිස්සෙක්, විගඩමෙක්." පාප් ප්‍රකාශ කළේ ය. පාප් ගේ ප්‍රකාශය නිසා මාකෝ පෝලෝ නමැති ශ්‍රේෂ්ඨ මිනිසා බේගල්කාරයකු වශයෙන් සමාජ සම්මත විය. ඉතාලියේ සර්කස් මඩුවල ක්ලවුන් කෙනෙකු - කෝලමෙකු - උපන්නේ පාප් ගේ ප්‍රකාශයෙන් පසු ව ය. 'කෝලමා' වනාහි චීන ඇඳුමෙන් සැරසුණු ශ්‍රේෂ්ඨ දේශාටක මාකෝ පෝලෝ ය. යමෙකු කියන කතාවක් පල් බොරුවක් බව කීම සඳහා It is a Marco Polo යනුවෙන් උපහැරණයක් යුරෝපය පුරා පැතිර ගියේ ය.[3]

1996 දී පාප් වහන්සේ, පල්ලිය එදා ගැලීලියෝට කළ අසාධාරණය වෙනුවෙන් ප්‍රසිද්ධියේ සමාව ඉල්ලා සිටියේ ය.

පාප් වහන්සේ, 2000 මාර්තු මස වතිකානුවේ දී පාස්කුව වෙනුවෙන් සිය කෙටි දේශනය පවත්වමින් පසුගිය වසර දෙ දහස තුළ පල්ලිය විසින් සිදු කර ඇති අපරාධවලට - විශේෂයෙන් ම දෙවන සහශ්‍රකයේ දී කරන ලද අපරාධවලට - සමාව ඉල්ලා සිටියේ ය.[4] පාප් ඉදිරියේ සිටගත් කාදිනල්වරු සහ බිෂොප්වරු සත් දෙනෙක් පල්ලිය විසින් එදා මෙදාතුර, යුදෙව්වන්ට, කාන්තාවන්ට, ස්වදේශිකයන්ට, වතිකානුවට ආගමනයවූවන්ට, දිළින්දන්ට සහ නූපන් දරුවන්ට කර ඇති අපරාධවලින් කිහිපයක් ගෙනහැර දක්වූ හ. ස්වර්ගයේ හිමිකරුවන් වන දිළින්දන්ට ද පල්ලිය අපරාධ කර ඇත. නූපන් දරුවන්ට කරන වැරදිවලට සමාව ඉල්ලා සිටීම මගින් මේ අපරාධ රැල්ල තවමත් නිමාවී නැති බවට ඉඟියක් ද කෙරෙයි.

කෙසේ වුව ද සමහර බටහිර විචාරකයන් පවසන්නේ මේ 'පව්සමාව' කූට උපක්‍රමයක් බව යි. පල්ලිය විසින් දෙවන ලෝක සංග්‍රාමය වැනි අවස්ථාවල දී කරන ලද කෲර සමූල ඝාතන ආදිය පිළිබඳ ව වචනයක් හෝ සඳහන් නොකිරීම මගින් පැහැදිලි වන්නේ, පල්ලිය තවමත් තම අතීත වැරදිවලට සුදුහුණු ගෑමේ අරමුණින් යුතු ව කටයුතු කරන බව ය යි ඔවුහු කියති.[5]

කතෝලික සභාව විසින් කරන අප්‍රකට වැරදි බොහෝ ය. මොවුහු, ඇමරිකානු මහද්වීපයේ රටවල මනුෂ්‍ය ශිෂ්ටාචාරයන් සම්පූර්ණයෙන් ම විනාශ කළ හ. ස්පාඤ්ඤයන් ඇමරිකානු මහාද්වීපයට ගොඩබසින විට එහි මායා සහ ඇස්ටෙක් නමින් ඉතා දියුණු රාජ්‍යයන් දෙකක් පැවතුණි. අද මෙක්සිකෝව නමින් හැදින්වෙන රටේ පැවති මායාවරුන් ගේ අගනුවර පැවති ශ්‍රී විභූතිය ඉතිහාසඥයෝ පැහැදිලි කරති.[6] ස්පාඤ්ඤ සොල්දාදුවෝ, භාරතයට කඩාවැදුණු මහමදිකයන්ට නොදෙවෙනි ලෙසට පුස්තකාල ගිනිබත් කළෝ ය. මිෂනාරීහු, ස්පාඤ්ඤයන් තුවක්කුවෙන් වධ කළ මුල්ඉන්දියානුවන් (රතුඉන්දියානුවන්) සංඛ්‍යාවට වඩා විශාල මුල්ඉන්දියානුවන් සංඛ්‍යාවක් වැනසුවෝ ය. ඔවුහු ඉන්දියානුවන්ට වසංගත රෝග බෝකළ හ. ඒ, ඉන්දියානු ස්ත්‍රීන්, මහල්ලන් හා දරුවන් සඳහා අනාථ කඳවුරු තනා, යුරෝපයේ ආරෝග්‍යශාලාවල වසූරිය, පැපොල ආදී බෝවන රෝග වැළඳුණු රෝගීන් පාවිච්චි කළ ඇඳුම් ගෙනවුත් එම අනාථ කඳවුරුවල බෙදාහැරීමෙනි. යුරෝපීයයන් පැමිණීමට පෙර ඇමරිකානු මහද්වීපයේ එබඳු රෝග නො තිබුණි. ජනගහනයෙන් සියයට අනූවක් ම මිය ගොස් ඇත්තේ සරම්ප හා පැපොල වසංගතවලිනි.[7]

ඔවුන් ලංකාවේ මොන තරම් අපරාධ කර තිබේ ද? වත්තල විජයබා පිරුවන,[8] තොටගමුවේ විජයබා පිරුවන හලාවත තුමුලසෝම පිරිවෙන බඳු කීර්තිමත් විශ්වවිද්‍යාල ගිනි තබා ඇත. ගෝවේ ප්‍රතිරාජයා ගේ අණ අකුරට ම පිළිපදිමින්[9] ක්‍රියාත්මක කෙරුණු බස්නාහිර වෙරළේ පන්සල්, පිරිවෙන් හා පුස්තකාල උදුරාදැමීමේ ව්‍යාපාරයේ ප්‍රසිද්ධ ම පුද්ගලයා සෙබස්තියන් නම් පාදිලිවරයෙකි. මෙම සියලු අපරාධ සිදු කර ඇත්තේ බයිබලය පමණක් නිවැරදි ය යන ඇදහීම නිසා ය.

ඉසා (යේසු) භාරතයේ සහ ටිබෙටයේ ආශ්‍රමයන්හි අධ්‍යාපනය ලබා බෞද්ධ භික්ෂුවක් වශයෙන් ටිබෙටයෙන් පිටත් වී ඊශ්‍රායල් දේශයට ගිය පිළිවෙල ටිබෙට් ඓතිහාසික මූලාශ්‍රවල සඳහන් ව තිබේ. එබැවින් ටිබෙට් ඓතිහාසික වාර්තා බයිබලයේ ඉගැන්වීමට සහ පාප් වහන්සේට බලවත් අභියෝගයක් වී ඇත. ඔළුවෙන් හිටගෙන සිටින සම්ප්‍රදායික ක්‍රිස්තියානි ඉගැන්වීම දෙපයින් සිටුවයි. එම නිසා, යේසුස් වහන්සේ ගේ අප්‍රකට ජීවිතය හෙළිකිරීම වැළැක්වීම සඳහා කතෝලික සභාව ප්‍රමුඛ ක්‍රිස්තියානි සංවිධාන උපරිම ශක්තිය යොදති.

අද ලෝකයේ ඇති බලවත් ම රට ඇමරිකාව ය යි පොදු පිළිගැනීමක් තිබේ. සත්‍යය එය නොවේ. ලෝකයේ බලවත් ම රට, වර්ග සැතපුම් අටක බිම් ප්‍රමාණයක් ඇති වතිකානුව යි. දේශපාලන බලයෙන්, වතිකානුව ඇමරිකාවට වඩා බලසම්පන්න ය. පාප් ආගමික නායකයකු මෙන් ම දේශපාලන නායකයකු ද වන්නේ ය. ඔහු මුළු ලෝකය ම පාලනය කරයි. පාප්ට තරම් ජන හමුදාවක් ලෝකයේ කිසි ම දේශපාලන නායකයකු සතු ව නැත. ඔහු ගේ අනුගාමික සංඛ්‍යාව කෝටි ගණනකි. සෝවියට් හවුල බිඳ දමන ලද්දේ ඇමරිකාව තනි ව ම නො වේ. වතිකානුවේ ආධාර නොලැබුණේ නම්, සෝවියට් හවුල බිඳදැමීමට ඇමරිකාව අසමත් වනවාට සැක නැත. අවසානයේ පාප් ප්‍රසිද්ධියේ ම සෝවියට් හවුල බිඳ දැමීමේ සටන මෙහෙයවූයේ ය. පෝලන්ත පාප්, පෝලන්ත සොලිඩරටියේ වැලේසාට ඩොලර් දස ලක්ෂ සියයක් රහසේ යැව්වේ ය.[10] වතිකානුව එබඳු බලවත් රටකි. වතිකානු බැංකුවට ලෝකයේ සිව් දෙසින් මුදල් ගලා එයි. ඉතාලියේ ආව් බිෂොප් තනතුරට උසස් වූ මාකින්කුස් (Marcinkus) මුලින් වතිකානු බැංකුවේ අධිපති වශයෙන් කටයුතු කළේ ය. ඔහු ගේ සේවා සමය තුළ බැංකුවේ අර්බුදයක් ඇති විය. සිද්ධිය දන සිටි පුද්ගලයින් දෙදෙනෙක් වූ හ. ඉන් පළමුවැන්නා එංගලන්තයට ගිය අවස්ථාවේ එහි පාලමක් උඩ එල්ලී මියගොස් තිබුණි. පොලිස් කොමසාරිස්වරයකු ඝාතනය කිරීමේ චෝදනාව යටතේ අත්අඩංගුවේ සිටි දෙ වැන්නා, උදෑසන පානය කළ කෝපි කෝප්පයට මුසුකර තිබුණු සයනයිඩ් විසෙන් මිය ගියේ ය.[11]

මෙබඳු කටයුතු පිළිබඳ ව කීර්තියක් දිනා සිටින වතිකානුව, යේසුස් වහන්සේ ටිබෙටයේ අධ්‍යාපනය ලැබූ භික්ෂුවක් නොවන බව තහවුරු කිරීමට වෙහෙසෙයි. ඔවුන් ගේ වෑයම නිෂ්පල කරමින් යේසුස් වහන්සේ ටිබෙටයේ අධ්‍යාපනය ලැබූ යුදෙව් භික්ෂුවක් ය යි ලෝකයාට පැහැදිලි කිරීම අසීරු කරුණකි. යේසුස් වහන්සේ ඊශ්‍රායලයේ බෞද්ධ සමාජයක් ගොඩනැංවීමට

දරු වෑයමට වඩා දුෂ්කර උත්සාහයකි. රාජනීෂ් භගවාන් ශ්‍රී ලෙසට, "සත්‍යය වනාහි අසත්‍යය නමැති මහා ගල් පර්වතය පාමුල පිපුණු කිණිහිරි මලක් බඳු ය. ගල් පර්වතයෙන් හමා එන කුඩා ගල් පොත්තකින් ඒ කිණිහිරි මල වොප්ප වී යා හැකි ය."[12]

මහාචාර්ය ෆීඩා හස්නේන්, ජොහැන් ෆොස්ට්‍රෝම් ආදී ගවේශකයන් ගණනාවක්, යේසුස් වහන්සේ ගේ අප්‍රකට ජීවිතය හෙළිකරන තොරතුරු විනාශ කරන කතෝලික හා ක්‍රිස්තියානි මෙහෙයුම් ගැන තොරතුරු දක්වති; පර්යේෂණ ග්‍රන්ථ හා අත්පිටපත් විනාශ කරමින්, එම විෂය ගැන පර්යේෂණවල යෙදෙන්නන් වළක්වන හැටි පෙන්වති; ඉතිහාසය හෙළිදරව් කරන පුරාවස්තු විනාශ කළ තැන් ඉදිරිපත් කරති. හොඳ ම නිදසුන සුප්‍රසිද්ධ ටුන් හුවා බෞද්ධ ලෙන් තුළ තිබී 1907 වසරේ දී සොයාගත් ලේඛන පිටපත් විනාශ කිරීම යි. ගවේෂක ස්ටයින්, ටුන් හුවා ලෙන්වලින් පුස්කොළ පත් ඉරු දහස් ගණනක් ලැබුණු බව ප්‍රකාශ කළ අතර මින් සමහරක් යේසුස් වහන්සේ ගැන තොරතුරු අඩංගු ඇරමයික් ලේඛන බවත් ප්‍රසිද්ධ කළේ ය. ටුන් හුවා ලෙන්වලින් ලැබුණු ලේඛන සියල්ල ම කියවීමට පෙර විනාශ වූ බව පසු කලෙක අසන්නට ලැබුණි.[13]

ලෝකයේ ජීවත් වන මනුෂ්‍යයන් අතරින් අතිමහත් බහුතරයක් භක්තිවන්තයෝ වෙති. ඇදහීමට මිස ගවේෂණයට අකැමැති භක්තිවන්තයෝ වනාහි අවදි ව සිටිය ද මනසින් නිදා සිටින්නෝ ය. ජාත්‍යන්තර දේශපාලන සංවිධාන බවට පත් ව ඇති සංවිධානාත්මක ආගම් සියල්ල ම භක්තිවන්තයන් තමන් වෙත රඳවාගැනීමට හෝ දිනාගැනීමට හෝ වෙහෙසෙති. භක්තිවන්තයන්ට, අන්ධ භක්තිය නිසා ම ජාත්‍යන්තර දේශපාලන බල අරගලයක යෙදී සිටින ආගමික සංවිධාන ගැන නො වැටහේ. ඒ ගැන නොසලකා භක්තිවන්තයන් ගේ සිත් අවදිකිරීමට වෙහෙසෙන පුද්ගලයන් ගැන ද කලාතුරකින් අසන්ට ලැබේ. යුදෙව්වන් ගේ රජු (King of the Jews) ග්‍රන්ථය ලියූ පින්ලන්ත ජාතික ජොහැන් ෆොස්ට්‍රෝම් එවැන්නෙකි.

උපතින් කතෝලිකයකු වූ ඔහු, අනගාරික ධර්මප්‍රිය මහින්ද නමැති ලාංකික ආචාර්යවරයා යටතේ බුදුදහම හදාළේ ය. ධර්මප්‍රිය මහින්දයෝ ද උපතින් කතෝලිකයෙක් වූ හ. බුදු දහම හදාරා බෞද්ධ උපාසකයකු වූ ධර්මප්‍රිය මහින්දතුමා, ථෙරවාදී බුදුදහම ලෝකයේ ප්‍රචාරය කරමින් රටරටවල ඇවිද්දේ ය. එම නිසා ධර්මප්‍රිය මහින්දතුමන්, එතුමා ගේ ඇතැම් අබෞද්ධ ඥාතීන්ට පෙනී ඇත්තේ ඔල්මාදකාරයකු ලෙසට ය. මොවුන් ගෙන් එතුමාට බොහෝ හිරිහැර සිදු වූ බව ජොහැන් ෆොස්ට්‍රෝම් බර්ලින් ශ්‍රී ලංකා මානව හිමිකම් සංවිධානයේ අ. රෝ. වි. අබේසිංහට එවූ පුද්ගලික ලිපියක සඳහන් ය. පානදුර, දේශ සේවා මාවතේ, අංක 13 නිවෙසේ පදිංචි ව සිටි ධර්මප්‍රිය මහින්දතුමා අකාලයේ අභිරහස් ලෙස මිය ගියේ ය. ජොහැන් ෆොස්ට්‍රෝම් යුදෙව්වන් ගේ රජු ග්‍රන්ථය ප්‍රසිද්ධ කර ඇත්තේ ඔහු ලංකාවේ සිටිය දී ය. එය අංග සම්පූර්ණ පර්යේෂණ ග්‍රන්ථයකි. ප්‍රකාශක, ගංගොඩවිල, දීපානි මුද්‍රණ ශිල්පීයෝ ආයතනය යි. ජොහැන් ෆොස්ට්‍රෝම් ගේ ග්‍රන්ථය දන් පොත් සාප්පුවල නැත. අප දනගත් ලෙසට ඥාතීන් ගේ විරෝධය නිසා ඔහු පොත විකිණීම අත්හිටවූයේ ය.

යේසුස් වහන්සේ ගේ ධර්මය

ටිබෙට් ලේඛනවල සඳහන් ලෙසට යේසුස් වහන්සේ මතු බුදුවීමට පෙරුම්පුරන බෝධිසත්වයෙකි. උන් වහන්සේ දේශනා කළේ බුද්ධ වචනය යි. යේසු වදාළ ධර්මය ග්‍රන්ථාරූඪ කරගත්තෙක් නැත්තේ ය. අපොස්තල්වරුන් සිව් දෙනකු විසින් යේසුස් වහන්සේ ගේ අතුරුදන්වීමෙන් කලකට පසු ව, යේසු සහ යේසුස් ගේ ධර්මය බව සඳහන් කරමින් ලියූ තොරතුරු ගොන්නක් ඉතිරි ව තිබේ. ඒවා ද මුල් පිටපත් නොවේ. එම නිසා බයිබලය අසමාන තොරතුරුවලින් හා මිථ්‍යා කතාවලින් පිරුණු වාර්තා සංග්‍රහයක් වී තිබේ. මෙය විස්මයට කරුණක් නො වේ.

අඩ සිය වසකට වැඩි කාලයක් තිස්සේ බුදුන් වහන්සේ ධර්මය දේශනා කළ හ. උන්වහන්සේට සමීප ව ජීවත් වූ ශ්‍රාවක භික්ෂූන් වහන්සේලා සිය ගණනක් වූ හ. ඔවුන් අතරින් සමහරෙක්, භික්ෂු ශාසනයට ඇතුළුවීමට පෙර උගතුන්, තාර්කිකයන් හා

දාර්ශනිකයන් වශයෙන් භාරතයේ නම් දරා සිටියවුන් වූ හ. හොඳ ම නිදසුන අග්‍රශ්‍රාවක සැරියුත් තෙරණුවෝ වෙති. සාරිපුත්‍ර, බුදුන් සමඟ වාදයට පැමිණි, භාරතයේ නම් දරා සිටි තාර්කිකයෙකි, උගතෙකි.[14] සැරියුත් බඳු තෙරුන් වහන්සේලා සිය ගණනක් බුද්ධ ශ්‍රාවකයන් වී සිටිය හ. බුද්ධ ධර්මය මනාව වටහා ගෙන එම මාර්ගය අනුව ජීවත්වූ උන්වහන්සේලා කිසිවකුට ජීවමාන බුදුන් දේශනා කළ ධර්මය ග්‍රන්ථාරූඪ කිරීමේ අවශ්‍යතාවක් නො විණි. සම්බුද්ධ පරිනිර්වාණයෙන් පසු ඇතැම් භික්ෂූන් වහන්සේලා හිතුවක්කාර ලෙස කටයුතු කරන්නට සිතූ හ. මහා කාශ්‍යප, ආනන්ද උපාලි, ප්‍රමුඛ සිව්පිළිසිඹියා-පත් මහ රහතන් වහන්සේලා පන්සියයක් රැස්වී පළමු ධර්ම සංගායනාව පවැත්වූයේ සම්බුද්ධ ධර්මය රැකගැනීමේ පරමාර්ථයෙනි. ත්‍රිපිටකය බිහිවූයේ එහි ප්‍රතිපලයක් වශයෙනි. එහෙත් මගධයේ විසූ සමහර භික්ෂූන් වහන්සේලා ධර්ම සංඝායනාව නොපිළිගත් හ. ඇතැම් භික්ෂූහු, සංඝායනාව සඳහා සහභාගිවීමට පවා අකැමැති වූ හ.

පළමු වන ධර්ම සංඝායනාවට සහභාගි නොවූ භික්ෂූන් පිරිසක් වෙන ම සංඝායනාවක් කළෝ ය. බෞද්ධ ඉතිහාසයේ සඳහන් වන ලෙස, නිකාය භේදයේ ආරම්භය එය යි. පළමු වන සංඝායනාව පැවැත්වූ භික්ෂූහු ස්ථිරවාදීන් ලෙසත් දෙවන සංඝායනාවට සහභාගිවූවෝ මහායානිකයන් ලෙසත් භේද වූ හ. යේසුස් වහන්සේ ගේ අනුගාමිකයන් අතර දර්ශනවාදීන් හෝ උගතුන් හෝ නොසිටි නිසා එවැනි අර්බුදයක් ඇති නොවී ය යි යමකුට තර්ක කළ හැක්කේ ය. එහෙත් එය ගුඩු තර්කයකි.

යේසුස් වහන්සේව බිහි කළ එසීන්ස් බුදු සසුනෙහි සිටි භික්ෂූන් වහන්සේලා සමහරෙක් ඊශ්‍රායලයේ විසූ දාර්ශනිකයන් වශයෙන් නම් දරා සිටියෝ ය. යේසුස් වහන්සේට ඇණ ගැසීමෙන් නොබෝ දිනකට පසු ව රෝම හමුදාව යේසු අනුගාමිකයන් හා එසීන්ස්වරුන් දඩයම් කිරීම ඇරඹී ය. එහෙයින්, යේසුස් වහන්සේ දේශනා කළ ධර්මය සංඝායනා කිරීමට උන්වහන්සේ ගේ අනුගාමිකයන්ට අවස්ථාව නො ලැබුණි. ජීවිත ගලවා ගැනීම පිණිස වෙහෙසුණු ඔවුන් ගෙන් සමහරෙකුට සිදු වූයේ, යේසු ගේ ධර්මය කුමක් ද යන්න හෝ නොදන සිටි සෝල් බඳු දරදඬු

පුද්ගලයන් යටතේ සංවිධානය වීමට ය.

ඇණ ගැසීමේ සිද්ධියෙන් පසු යේසු අනුගාමිකයන් සංවිධානය කරන ලද්දේ සෝල් විසින් පමණක් ම නො වේ. පලස්තීනයෙන් පිට යේසු වන්දනාව ආරම්භ කළ තවත් පිරිසක් ද වූ හ. කතෝලික සභාව බලවත් වූ පසු වඳ කරනු ලැබූ මෙම යේසු වන්දනා කණ්ඩායම සිරියාව, ඊජිප්තුව, පර්සියාව, ඇෆ්ගනිස්ථානය, ලඩාකය, භාරතය ආදී රටවල විසිරී විසූ හ. මොවුන්ට අයත් සොහොන් පිටි කිහිපයක්, ඇෆ්ගනිස්ථානය, ලඩාකය ආදී රටවලින් සොයා ගනු ලැබිණි. ඔවුන් ගේ සොහොන් කොත් හැමෙක'ක ම ඇති සොහොන් ගල්වල නෙළුම් මල සහ කුරුසය කැටයම් කර තිබේ.[15] නෙළුම් මල බෞද්ධාගමේ සංකේතය යි. කුරුසිය යේසු ගේ සංකේතය යි. එම නිසා මෙම සොහොන් කොත් අයිතිකරුවන් යේසු බෞද්ධයන් ලෙස හැඳින්වීම වඩා යුක්ති සහගත වෙයි.

ඇතැම් ඉතිහාසඥයන් නෙළුම සහ කුරුසිය භාවිතා කළ පිරිස නෙස්ටෝරියානු ක්‍රිස්තියානීන් ලෙස හඳුන්වන්නේ සාධක පරීක්ෂා කිරීමෙන් නොවේ. නෙස්ටෝරියානු නිකාය සිරියාවේ විසූ නෙස්ටෝරියස් නම් පූජකයකු විසින් අරඹන ලද්දකි. කොන්ස්ටන්ටයින් අධිරාජයා ගේ නිසොයින් කවුන්සලයෙන් පසු ව සිරියාවෙන් පිටුවහල් කරන ලද මොවුහු, පර්සියාවට පැමිණිය හ.[16] නෙස්ටෝරියානුවෝ කිසි ම කටයුත්තක දී නෙළුම් මල භාවිත නොකළ හ. නෙස්ටෝරියානු ක්‍රිස්තු භක්තිකයන් සීගිරිය ගොඩනැංවූ කාලයේ ලංකාවේ විසූ බව මහාචාර්ය සෙනරත් පරණවිතානයන් ද පවසා ඇත්තේ ය.[17]

යේසු මතු බුදු වන බුදුවරයකු වශයෙන් වන්දනා කර ඇත්තේ යේසු බෞද්ධයන් විසින් පමණි. මොවුන් වැඩිදෙනා, සෝල්ට හසු නොවූ යේසුස් වහන්සේ ගේ ඥාතීහු වූ හ. සිය නියෝජිතයකු වශයෙන් යේසුස් වහන්සේ විසින් ම කාශ්මීරය බලා පිටත්කර හරින ලද තෝමස්, ප්‍රසිද්ධ ම යේසු බෞද්ධයෙක් වෙයි. තෝමස් ගේ දකුණු ඉන්දියානු ධර්මදූත සේවාව ඉතා සාර්ථක එකක් විය. කාශ්‍යප දවස දකුණු ඉන්දියාවට පලා ගිය මිගාර ආදීනට මුණ ගැසෙන්නට ඇත්තේ තෝමස් ගේ බෞද්ධ ධර්මදූත සේවයේ ප්‍රතිපලයක් වූ යේසු බෝසතුන් වන්දනා කළ

දකුණු ඉන්දියානු යුදෙව් බෞද්ධයන් පිරිසක් විය යුතු ය.[18]

තෝමස්, උපැවිදි වූ පුද්ගලයකු වශයෙන් ධර්ම ප්‍රචාරයේ යෙදීම නිසා එතුමා ශාන්තුවරයෙක් ලෙස ප්‍රසිද්ධියට පත් වූයේ ය. ඔහු ශාන්ත තෝමස් කෙනකු බවට පත් කර ක්‍රිස්තියානි කරන ලද්දේ පසු කාලයක දී ය. මෙවැනි අවශෝෂණය කිරීම ක්‍රිස්තියානි ආගමේ සාමාන්‍ය ලක්ෂණයකි. යේසු උපන් දිනය දෙසැම්බර් 25 කළ අන්දම ඉහත පරිච්ඡේදයක සඳහන් කළෙමු. තාරා වන්දනාව අනුව මරියා පිහිටුවීම තවත් නිදසුනකි.

දේශපාලන පරමාර්ථයෙන් යේසු අනුගාමිකයකු වූ සෝල් යේසුස් වහන්සේ ගේ ධර්මය වටහා ගත්තෙක් නොවී ය. ඔහු ගොඩනැංවූ ක්‍රිස්තියානි ආගමේ හරය මතු නොව සංවිධානාත්මක ව්‍යුහය සහ සිරිත් විරිත් ද පැරිසිස් දහමට වෙනස් නො විණි. පැරිසිස් දහම ස්ත්‍රිය පුරුෂයාට වඩා පහත් ලෙස සලකයි. බයිබලයේ ද ස්ත්‍රිය පුරුෂයා ගේ ඇට කැබැල්ලකින් මවන ලද බව සඳහන් වේ. ආදම් නපුරට පොළඹවන ලද්දේ ස්ත්‍රිය විසිනි. යේසුස් වහන්සේ ඇණ ගැසීමට ගෙන ගිය තැන පටන් උන්වහන්සේ පසුපස හඬා වැලපෙමින් ගියේ අනුගාමිකයන් නොවේ. ස්ත්‍රී පිරිසකි. ඔවුන් ගෙන් ලබාගත් කිසි ම කටඋත්තරයක් බයිබලයේ නැත. යේසුස් වහන්සේ ගේ සහෝදරයන් ගේ නම් බයිබලයේ ඇතත් සහෝදරියන් ගේ නම් සඳහන් නොවේ.[19]

මෝසස් ගේ යාවේ ආගම තහවුරු වීමට පෙර කනානය (ඊශ්‍රායලය) සහ අවට රටවල දෙවිවරු පමණක් නොව, දේවතාවියෝ ද වන්දනා කරන ලද හ. කනානයේ පුරාවිද්‍යා කැනීම්වලින් පැරැන්නන් වන්දනා මාන කළ දේවතාවියන් ගේ ප්‍රතිමා සොයාගෙන තිබේ. පැරිසිස්වරු සියලු දේවතාවියන් වන්දනාව තහනම් කර පුරුෂ වන්දනාව තහවුරු කළ හ.

මහායාන හා එයින් බිඳුණු අනෙකුත් නිකායන් පැතිරුණු සෑම රටක ම තාරා බෝසත් වන්දනාව පැතිර පැවතිණි. පහළොස් වන ශත වර්ෂයේ දී රචිත තිසර සන්දේශයේ කැගල්ලේ දොරවක ගමේ පිහිටි විහාරයේ තාරා පිළිමයක් ගැන විස්තර වර්ණනයක් තිබේ.

බෝරා යස වියන මහරු සිරිලක මැදුර වෙසෙසී
තෝරා හැර දුසිරි සුසිරි ලකරින් ලකළ එකසී
වාරා නොව රුසිරු ඉසුරු දෙන සුරබි දෙන් සදිසී
තාරා බිසොවුනුදු නැමද යා ගත් එයින් නොලැසී
131 කවිය

තාරා අවලෝකිතේශ්වර බෝධිසත්වයාණන් ගේ පතිනිය යි. එතුමිය චීනය, නේපාලය, ටිබෙටය, ලඩාකය ආදි රටවල කුවාං යින් නම් වූවා ය. ඇය පොදු ජනතාව ගේ දේවතාවියක ලෙසින් බොහෝ පිදුම් ලබන බෝධිසත්වවරියකි. එතුමිය පිළිබඳ ව කියැවෙන ජනප්‍රවාද බොහෝ ය. එක් කතාවකට අනුව, ගොයම් ගසේ හැදුණේ බොල් වී ය. බඩගින්නේ පසුවන මනුෂ්‍යයන් දැක උණුවූ හදවතින් යුතු කුවාං යින් රාත්‍රි කාලයේ කුඹුරුවලට ගොස් තම පියයුරු මිරිකා තන කිරෙන් බොල් වී ඇට පුරවන්නට වූවා ය. වරෙක ඇගේ පියොවුරුවල කිරි අවසන් විය. ඇය ලෙයින් වී ඇට පිරෙව්වා ය. සුදු සහ රතු යන පාට දෙකකින් සහල් ඇතිවූයේ කුවාං යින් ගේ ක්‍රියාවෙනි. කුවාං යින් කුඩා දරුවනට අප්‍රමාණ සෙනෙහසක් දක්වන්නියකි. ඇය ඉන්නේ ද උරහිසට වඩාගත් දරුවකු සමඟිනි. අජන්තා චිත්‍ර අතර ද දරුවකු වඩාගත් තාරා රූපයක් තිබේ.

යේසුස් වහන්සේ කුවාං යින් වන්දනා කළ භික්ෂුවක් වූ හ. ඊජිප්තුව ආදි රටවල විසූ මහායානිකයෝ ද කුවාං යින් වන්දනා කළ හ. එසීන්ස්වරුන් අතර ද කුවාං යින් වන්දනාව තිබෙන්නට ඇත. හෙලේනා බිසව කුවාං යින් වන්දනාව ක්‍රිස්තියානි ආගමට හරවා ගත්තේ කුවාං යින් වෙනුවට මරියා යොදවමිනි. මරියා ගේ ජීවිත කතාවේ කිසි ම තැනක ඇය දරුවකු සුරතල් කළ බවක් සඳහන් නොවේ. ඇය කුඩා දරුවකු කරපින්නා ගත් පිළිරුව කුවාං යින් ප්‍රතිමාවේ විකෘතියකි.

පෘතුගීසි පාදිලිවරු තාරා බෝසතාණන් වැඩ විසූ පන්සල්වලට මරියා ගෙන ගිය හ. ලංකාවේ බස්නාහිර මුහුදුබඩ වෙරළ තීරුව පිරී ඇත්තේ කතෝලික මාතා වන්දනා ස්ථානවලිනි. බස්නාහිර මුහුදු වෙරළ මරියා, නිර්මල කන්‍යා මරියා, සින්දාත්‍රියේ මාතා, ශාන්ත ආනා තුමිය, මඩුමාතා, ජපමාල මාතා, කාර්මේල්

ඕනෑ ම රටකට පුරාවස්තු අමිල සම්පතකි. පුරාවස්තු ප්‍රදර්ශන සඳහා යැවීමේ දී ඒවායේ අනුරූ යැවීම පිළිගත් සම්ප්‍රදාය යි. ලංකාවේ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව එම සම්ප්‍රදාය කඩකරමින් අමිල වටිනාකමක් ඇති මෙම තාරා ප්‍රතිමාව ඇතුළු බෞද්ධ පුරාවස්තු ගණනාවක් යුරෝපයේ ප්‍රදර්ශනවලට යවා තිබුණි. ඒවා යුරෝපයේ ප්‍රදර්ශනය කරන ලද්දේ බෞද්ධ හා හින්දු ප්‍රතිමා නමිනි.

කුවාං යින් කතාව විස්තර කෙරෙන 19 වන සියවසට අයත් චීන සිතුවමක්

මාතා, කාතික්ක මාතා, ශාන්ත විනිප්‍රිඩා ආදී වෛවාරන්න නම් ඇති කාන්තාවන් වන්දනා කරන භූමි කලාපයක් වී තිබේ. මෑතක් වන තුරු ම, කතෝලික ආගම ස්ත්‍රීන් වන්දනාව තබා කාන්තා අයිතිවාසිකම් පිළිබඳ ව වත් සැලකිලිමත් වූ ආගමක් නොවී ය. බස්නාහිර වෙරළේ කාන්තා වන්දනාව කෙරෙන සෑම දේවාලයක ම ඉතිහාසය පෘතුගීසි කාලය හා සබැඳේ. මේවා ගොඩ නංවා ඇත්තේ පරංගි පාදිලිවරුන් විසිනි. පෘතුගීසීහු, ලංකාවේ මුහුදුබඩ පළාත්වල පැතිර පැවති තාරා මෑණියන් ගේ දේවාල බිඳ දමා ඒවායේ ගොඩනැගිලි පාදම් මත අභිනව කතෝලික මාතා දේවාල ඉදි කළ බව පැහැදිලි ය.

වරක් ජර්මන් රූපවාහිනියේ විදේශීය සංග්‍රහය අප්‍රිකාවේ පිග්මිවරුන් අතරට මිෂනාරීන් පැමිණි ආකාරය පිළිබඳ වාර්තා වැඩසටහනක් ඉදිරිපත් කළේ ය. පිග්මීන් වනවාසී ගෝත්‍රයකි. ඔවුන් ජීවත් වන වනාන්තර ගමකට ගිය මිෂනාරීන් පිරිසක්, පිග්මි ස්ත්‍රී පුරුෂයනට ජංගි, ප්ලාස්ටික් උපකරණ සහ පිහි ආදිය තෑගි දෙමින් ඔවුන් දිනාගත් හ. පිග්මිවරු කම්බා නම් දෙවියකු වන්දනා කළෝ ය. කම්බා දෙවියන් හැර එතුමා ගේ පිළිරුවක් ගැන පිග්මිවරු දන නොසිටිය හ. ඔවුහු රුස්ස ගසක් පාමුළ දෙවියන්ට පූජා පැවැත්වූයේ එතුමා ගස විමාන කරගෙන වසතැ යි අදහමිනි. මිෂනාරීහු, පිග්මීන්ට කුඩා දේවස්ථානයක් තනා දුන් හ. කලකට පසු දේවස්ථානයේ තැන්පත් කිරීම සඳහා දෙවියන් ගේ ප්‍රතිමාවක් ද පිග්මිවරුන්ට තෑගි ලැබුණි. කළුපාට තීන්ත තවරා පිග්මි සිරුරක් අනුව සාදා තිබුණු එම ප්‍රතිමාවේ මුහුණ, රෝම ප්‍රතිමා සහ චිත්‍රවල පෙන්වන යේසුස් වහන්සේ ගේ මුහුණ ම ය.

ලංකාවේ අම්මා දේවාලවල පාදම් මත ඉදිකළ අලුත් දේවාල තුළට යුරෝපීය හෝ අරාබි හෝ ස්ත්‍රීන් ගේ ප්‍රතිමා ආයේ පිග්මීන්ට යේසු රුව දුන් ලෙස වංචාවෙන් නොව තුවක්කුවේ බලයෙනි. මරියා ගේ රුව දක්වෙන පැරණි ම ප්‍රතිමාවන්හි ඇ මොට්ටැක්කිලියකින් සැරසී සිටින්නී ය. පලස්තීනයේ විසූ මරියා ගේ සැබෑ පෙනුම ඊට සමාන විය යුතු ය. පසු කාලයක දී මරියා ගේ රුව වෙනස් කරමින් ඇය ගේ හිසට මැණික් ඔටුන්නක්

මරියා ප්‍රතිමාවේ විකාශනය දක්වෙන සිතුවම්
174 පිටුව ඉහළ: කුවාං යින් ගේ සිතුවම් දෙකක්. (බෙයිජින් කෞතුකාගාරය) පහළ: වමේ ඉසිස් සහ හෝරස් (ඊජිප්තුව) දකුණේ: මිතුර් මතුනා (රෝමය) 175 පිටුව ඉහළ: වමේ ඉසිස් හා හෝරස් දකුණේ: චෙස්ටොක්හෝවා හෙවත් කළු මැඩෝනා පහළ: වමේ තාරා දේවිය දක්වෙන අජන්තා සිතුවමක්. දකුණේ මරියා

පළඳවනු ලැබ ඇත. ක්වාං යින් රූවල ද එතුමිය මැණික් ඔටුන්නක් පැළඳ සිටින්නී ය.

ලංකාවේ අදටත් පවතින අම්මා වන්දනාව තාරා බෝසත් වන්දනාවේ ශේෂ වූ අංගයකි. අපි ලංකාවේ බස්නාහිර මුහුදුබඩ වෙරළේ කතෝලික මාතාවන් වන්දනා කරන දේවස්ථාන පිළිබඳ ව ගවේෂණයක් කළෙමු. එහි දී පැහැදිලි වූ එක් කරුණක් නම් හැම කතෝලික මාතා දේවස්ථානයක් ම පැරණි අම්මා දේවාලයක් මත ගොඩනංවා ඇති බව යි. කතෝලික මාතා දේවස්ථානයක් පිළිබඳ ලිඛිත වාර්තාවක් හෝ ප්‍රවාදයක් හෝ ඇත්නම්, දේවස්ථානය ගොඩනැංවීමේ දී ඊට නුදුරු තැනකින් හාස්කමින් හමු වූ, දේවස්ථානයට සම්බන්ධ මාතාව ගේ ප්‍රතිමාවක් ගැන සඳහන් වේ. හලාවත කාර්මෙල් මව් ප්‍රතිමාව දර කඩන්ට ගිය ස්ත්‍රියකට හමුවිණි. බත්තුලුඔය කන්‍යා මරියා ප්‍රතිමාව පොළොවෙන් මතු විය.[20] තළවිල ප්‍රතිමාව ගස් බෙනයකින් මතුවූ බව කතෝලික ජනශ්‍රැතිය යි. බස්නාහිර වෙරළ තීරුවේ අයුරින් මාතාවන් වන්දනා කරන කලාපයක් මොවුන් උපන් යුරෝපයේ කිසි ම රටක නැත්තේ ය.

බස්නාහිර මුහුදුබඩ කලාපයේ තාරා දේවාල සම්බන්ධ දීර්ඝ ඉතිහාස කතාවක් ඇත. සෑම පැරණි අම්මා දේවාලයක ම තේවා කළ අම්මාවරු හෙවත් දොවොල් ස්ත්‍රීන් වූහ. ගාඩි (රොඩී) වංශයේ ඉතිහාස කතාවට අනුව ගාඩි ස්ත්‍රීන් හෙවත් ගාඩි බිළින්දියන් තාරා දේවාලවල තේවා කළ දෙවොල් ස්ත්‍රීන් පිරිසකි. දේවාලයේ දායක පවුලක සාමාජිකයකු මිය ගිය විට නිවෙසේ අයෙක් දේවාලයට පැමිණ බුලත් දී ගාඩි ස්ත්‍රීන්ට ආරාධනා කරති. මිය ගිය අය ගේ නිවෙසට යන ගාඩි බිළින්දියෝ දුක්මුළා නම් කවි විශේෂයක් ගායනා කරති. දුක්මුළාවලට පහන් ගී යන නම ද යෙදී ඇත්තේ ඒවා පහන් එළියේ කරන ලද ගායනා නිසා ය. ඔවුහු පහන් ගී වශයෙන් යසෝදරා ජාතක කවි සහ වෙස්සන්තර ජාතක කවි වැඩි වශයෙන් ම ගායනා කළෝ ය. පහන් කවි ගායනා කරන ලද්දේ ඊට ම සුවිශේෂී වූ තාලයක් යටතේ ය. කරුණා රසය දනෙන අයුරිනි. මේ කවි දුක්මුළා ලෙසින් හැඳින්වූයේ ද එම ගායනා ලාලිත්‍යය හෙවත් ලය නිසා ය. කතෝලික මළගෙවල්වල පසන් ගී කියන්ට පටන් ගත්තේ දුක්මුළා අනුකරණය කරමිනි. ගොන්සාල්වේස් පාදිලිතුමා කොචින්හි කතෝලික මූලස්ථානයට යැවූ ලිපියක මේ පිළිබඳ ව සඳහනි.

"මුහුදුබඩ ස්ත්‍රීන් කෙනෙක් මියගිය විට මිනිය ඉදිරියේ අරුත් සුන් කවි කියන නිසා මම ඔවුන්ට ගායනා කිරීම සඳහා නිරය හා දේව විනිශ්චය ගැන කියවෙන ගී උගැන්වීමි,"[21] යි ඔහු කියයි. මළ ගෙවල කුලියට හැඬීමේ සිරිත ද ගොන්සාල්වේස් පාදිලිතුමා බෝකළ චාරිත්‍රයක් ය යි අනුමාන කළ හැකි ය. මෑතක් වන තුරු ම මළ ගෙවල කුලියට අඬන ස්ත්‍රීහු, මීගමුව පළාතේ සිටිය හ.

ක්‍රිස්තියානි ආගමේ නිෂ්පාදකයන් එසින්ස් බෞද්ධයන් ගේ පුදපූජා සහ අභිචාරයන් ද ක්‍රිස්තියානි ආගමේ අංග බවට පත් කළ හ. මේවායින් සමහරක් යේසුස් වහන්සේ විසින් පලස්තීනවාසී තම අනුගාමිකයන්ට හඳුන්වා දුන් බෞද්ධ චාරිත්‍රයන් ය. පිරිත නිදසුනකි. කතෝලික සමූහ ගායනාව පිරිතෙන් උපන්නකි. ශබ්දපූජා පැවැත්වීම, ගණ්ඨාර ගැසීම්, නවගුණ වැල මැතිරීම (ජපමාලය), පුෂ්ප පූජාව ආදිය බෞද්ධ සිරිත් අනුකරණය කිරීම්වලට නිදසුන් වේ. කතෝලික දේවගැතිවරුන් කලිසමට උඩින් අඳින සුදු ලෝගුව යුදෙව් භික්ෂූන් ගේ සුදු සිවුර අනුව සකස්කර ගෙන තිබේ. කතෝලික කන්‍යා සොහොයුරියන් කළු නළල් පටියක් පළඳින්නේ යුදෙව් භික්ෂුණීන් ගේ කලු ලෝගුව සංකේතවත් කරමිනි. වයඹ දිග ඉන්දියානු ප්‍රදේශයන්හි විශේෂයෙන් ම අවකානයේ කොටසක් වූ බිලාරයේ ජීවත් වූ යුදෙව් භික්ෂූන් වහන්සේලා අධික සීතල නිසා මෙබඳු ඇඳුමක් සකස් කරගෙන සිටිය හ. වීථි සංචාරය පෙරහැර අනුව සාදාගත්තකි. ප්‍රතිමා සහ සිත්තම් බෞද්ධ චාරිත්‍රයක් වන අතර, යොහෝවා ගේ අණට විරුද්ධ ව යමින් කතෝලිකයන් රූප වන්දනාව කරන්නේ ද එසින්ස්වරුන් අනුකරණය කරමිනි. උපවාසය, පූජක බ්‍රහ්මචරියාව ආදී ක්‍රිස්තියානි ආගමික සිරිත් අවශෝෂණය කරගෙන ඇත්තේ එසින්ස් බුද්ධාගමෙනි. මෙබඳු ආගමික චාරිත්‍ර රෝමවරු හෝ යුදෙව් රබීවරු හෝ දන නොසිටිය හ.

"CHRIST MILITANT," Byzantine mosaic, c. 520

ක්‍රිස්තියානි සොල්දාදුවෙක්.
බයිසෙන්තියානු මොසායික් චිත්‍රයකි. ටයිම් සඟරාවේ පළ වූවකි.

ජර්මනියේ හරිත ව්‍යාපාරය ආරම්භ වූයේ පරිසර සංවිධානයක් වශයෙනි.[22] සංවිධානයේ ආරම්භක සාමාජිකයන් දෙ දෙනකු වූ කෙලී සහ බැස්ටියන්, 'සාමයේ දූතයා වෙනුවෙන් පවත්වන නත්තල වෙනුවෙන් මිලියන ගණනක් සතුන් මැරීමේත් ගස් කපා පරිසරය වැනසීමේත් අර්ථය කුමක් දැ' යි ප්‍රශ්න කරන පුවතක් ජර්මනියේ පළ වන ස්පිගල් සඟරා කලාපයක පළ වී තිබිණ. ක්‍රිස්තියානි ආගම අවශෝෂණය කරගෙන ඇති ඇතැම් බෞද්ධ සිරිත් 'එළුවා ගේ ගෙළේ පිහිටි තනපුඩු' ලෙස පවතී.

මෝසස් යුදෙව් ආගම ආරක්ෂා කිරීම සඳහා යුදෙව්වන් අතර පැරිසිස් පිරිසක් ඇති කළේ ය. යුදෙව් චින්තනය යුදෙව් ජාතියෙන් ගිලිහීයා නොදී ආරක්ෂා කිරීම පැරිසිස්වරුන් ගේ ආගම වූයේ ය. යේසු දේව පුත්‍රයා බව කීම ඔවුන් ගේ සංස්කෘතියට අනුව මිත්‍යාවක් නොවේ. මරියා දේව දාසියකි. ඇය ලැබූ දරුවා ඉම්මානුවෙල් හෙවත් දේව පුත්‍රයා වූයේ ය. "මම දේව පුත්‍රයා වෙමි" යි කීමට යේසුට අයිතිය තිබුණි. යේසු පවසන්නේ බොරුවක් නොවන බව පැරිසිස්වරුන් නොදැන සිටියා ද නොවේ. සත්‍ය ප්‍රකාශ කරන යේසු වටා මහජන ගංගාව රොක්වනු දුටු ඔවුහු බිය වූ හ. ඔවුහු බොරු තර්කයෙන් යේසු පරාජය කළ හ.

යේසු ධර්මය සෝල් විසින් විකෘති කරන ලදි. යේසුස් වහන්සේ යුදෙව් වර්ගයා ගලවාගැනීමට උත්සාහ කිරීම මෝසස් ගේ කතාවට සම්බන්ධ කිරීම හොඳ ම නිදසුනකි. යේසුස් වහන්සේ මෝසස් පැවසූ ආකාරයේ දේව රාජ්‍යයක් ලබා දීමට උත්සාහ නොකළ හ. යේසුස් වහන්සේ ගේ දේව රාජ්‍යය සංසාරයෙන් එතෙර වීම යි. "පොළවේ රැස්කරගන්නා වස්තුව වෙනුවට, ස්වර්ගයෙහි වස්තුව රැස්කරගන්න"[23] උන්වහන්සේ කී හ. වරක්, යේසුස් වහන්සේ සදාකාල ජීවනය ගැන දේශනා කරන බව ඇසූ පොහොසත් තරුණයෙක් උන්වහන්සේ වෙත පැමිණ, "ආචාරීන් වහන්ස, සදාකාල ජීවනය ලබාගැනීම සඳහා කුමන යහපත් ක්‍රියාවක් මවිසින් කළ මනා ද" යි ඇසුවේ ය. එවිට යේසුස් වහන්සේ, "යන්න නුඹ සතු සියලු ම වස්තුව විකුණා දුගීනට දෙන්න. එවිට ස්වර්ගයේ දී නුඹට වස්තුව ලැබෙන්නේ ය" යි කී හ. බොහෝ වස්තුව හිමිකරුවකු වූ ඔහු ගියා මිස ආපසු ආයේ

නැත.[24] යේසුස් වහන්සේ දේශනා කළ ස්වර්ගය නිර්වාණය යි. එතුමා තරුණයාට පැහැදිලි කළේ සදාකාලික ජීවනය ලබා ගත හැක්කේ තෘෂ්ණාවෙන් මිදීමෙන් බව යි. ගිහි ජීවිතය තෘෂ්ණාවෙන් මිදීමට බාධාවක් බව ප්‍රකාශ කෙරෙන කතා විශාල සංඛ්‍යාවක් බෞද්ධ සාහිත්‍යයේ තිබේ.

මහා භාරතය යනු පුරාණ ඉන්දියාවේ රාජධානි දෙකක් අතර ඇතිවුණු බිහිසුණු සංග්‍රාමයක තොරතුරු සඳහන් කෙරෙන කතාවකි. යුද්ධය සිදුවී ඇත්තේ කුරු සහ පාණ්ඩව දෙ පිරිස අතර ය. මොවුහු එක ම ඥාති පිරිසක් වූ හ. යුද්ධ භූමියට ගිය අර්ජුන, "මම කුමකට යුද්ධ කරන්න ද? කොහොම ආයුධ ඔසවන්න ද? එහා පැත්තේ සිටින්නේ මගේ මාමලා ය. බාප්පලා ය" කියමින් ආපසු හැරෙන්නට සූදානම් විය. එවිට ක්‍රිෂ්ණා ඔහුට මෙසේ කී ය. "අර්ජුන උඹ ඇවිත් ඉන්නේ යුද්ධ කරන්න යි. ඔතන කල්පනා කරන තැනක් නෙමේ. ප්‍රතිවාදී පිලේ සතුරන් මිසක නෑදෑයන් නැහැ. ඔවුන්ට විදපන්. උන්ව මරපන්. සතුරන් විනාශ කරපන්."[25]

යුධ බිමේ දී මෝසස් ද ක්‍රිෂ්ණා වැන්නෙකි. ඔහු ගේ අරමුණ වූයේ යුදෙව් දේශය බිහි කිරීම යි. ඇසට ඇසක් ය. දතට දතක් ය යි ඔහු යුදෙව්වන්ට ඉගැන්වී ය. යේසුස් වහන්සේ මෝසස් ගේ ඉගැන්වීම් වෙනස් කරන්නට විය. "තාගේ අසල්වැසියනට ප්‍රේම කරව. සතුරාට වෛර කරව කී බව නුඹලා අසා ඇත. නුඹලා සතුරාට ප්‍රේම කරන්න. නුඹලාට පීඩා කරන්නන් උදෙසා යාඥා කරන්න."[26] පැරිසිස් පූජකයෝ වියරු වූ හ. සෝල් සැදූ ක්‍රිස්තියානි ආගමේ යේසු ගේ බණ සහ මෝසස් ගේ අණ එකට කලවම් කර තිබේ.

19 වන සියවසේ මුල් භාගයෙහි ටිබෙටයට පැමිණි මහමදික සංචාරකයකු වූ මීර් උසුට් ඌලා, නමැති මහමදික සංචාරකයා බුද්ධාගම ක්‍රිස්තියානි ආගමට ඉතා සමාන බව පවසමින් ටිබෙට් රටේ ජනප්‍රවාදයන් පවා ක්‍රිස්තියානි ජනප්‍රවාදයනට සමාන බව සිය සංචාරක වාර්තාවේ ලියා ඇත්තේ ය. ඔහු මෙසේ ද සඳහන් කරයි.

"ඔවුන් ගේ ධර්ම ග්‍රන්ථයන්හි සත්‍යවාදී බව, දුශ්චරිතයෙන් වැළකිය යුතු බව ආදි කාරණා අවධාරණයෙන් සඳහන් කර තිබේ. ඔබේ පොරෝනාව උදුරාගත් අයට කබායත් දෙන්න. ඔබ ගේ එක කම්මුලකට ගැසූ අයට අනිත් කම්මුලත් අල්ලන්න යි අණ කර තිබේ."[27]

යේසුස් වහන්සේ යුධ බෙරය සාම බෙරයක් බවට පත් කරති. සුප්‍රසිද්ධ කන්ද උඩ දේශනාව ඇරඹෙන්නේ මෙසේ ය.

"සිතින් දිළිඳුදෝ භාග්‍යවන්තයෝ ය. මක්නිසා ද ස්වර්ග රාජ්‍යය ඔවුන් ගේ ය. ශෝකවන්නෝ භාග්‍යවන්තයෝ ය. මක්නිසා ද ඔවුහු සනසනු ලබන්නෝ ය. මොළොක් ගුණ ඇත්තෝ භාග්‍යවන්තයෝ ය. ඔවුහු පොළොව උරුම කර ගන්නෝ ය. ධර්මිෂ්ටකමට ආසාකරන්නෝ භාග්‍යවන්තයෝ ය. මන්ද ඔවුහු තෘප්තියට පත්වන්නෝ ය. දයාවන්තයෝ භාග්‍යවන්තයෝ ය. මන්ද ඔවුහු දයාව ලබන්නෝ ය."

මෝසස් ඉගැන්වූයේ යේසුස් වහන්සේ දේශනා කළ දයාව, කරුණාව, මෛත්‍රිය ආදියට විරුද්ධ දෑ ය. ඇහැට ඇහැක් ය යන ඉගැන්වීම හොඳ ම නිදසුනකි. මෝසස් බණ කී පුද්ගලයෙක් නොවී ය. ඔහු හමුදාවක් මෙහෙයවූ පූජක සෙන්පතියෙකි. අණදෙන්නෙකි; ආඥාදායකයෙකි. දස පනත ඉදිරිපත් කිරීමේ දී ද "මේවා පිළිපැදිය යුතු ය. නැතිනම් නුඹලාට දඬුවම් ලැබේ" යි කීවා මිස "මේවා පිළිපැදීම යහපත් වේ" යි කියා පිළිපදින්නන්ට සිතීමට අවකාශ දී නැත්තේ ය. මෝසස් සිනායි කන්දට ගිය අවස්ථාවේ ආරොන් තවත් පිරිසක් සමඟ සාම්ප්‍රදායික ගව පූජාවක් කළේ ය. පෙරළා පැමිණි මෝසස් එම පූජාවට සහභාගි වීමේ වරදට එක් රැයක දී ආරොන් හැර තුන් දහසක් දෙනා මරා දම්මේ ය. යොහෝවා ද එබඳු ම අයකු බව ගොමාරා හා සොඩම් නගර වැනසීමේ සිද්ධියෙන් පැහැදිලි වේ.

මළ මුහුද අසල පිහිටි ගොමාරා සහ සොඩම් නගර දෙකේ නුවරුන් අතර සමලිංගික සේවනය පැතිරීම නිසා කෝප වූ යොහෝවා මෝසස් ලවා නගර දෙක පොළොවට සමතලා කරවී ය.[28] එහෙත් හය වන පාවුලු පාප්තුමා සුප්‍රකට සමලිංගිකයකු විය. එතුමා මිලාන්හි කාදිනල්වරයා ව සිටිය දී තරුණයකු හා ඇරඹූ සබඳතාව පාප් පදවියට පත් වූ පසු ද පවත්වාගෙන ගියේ ය යන්න සුප්‍රකට රහසකි.

යේසුස් වහන්සේ කිසිවකුට අණ නොකළ හ; බණ කී හ.

"නපුරු සිතුවිලි, මිනීමැරුම්, කාම මිථ්‍යාචාරය, බොරුකීම, අපහාස කිරීම ආදිය සිතින් නික්මෙන දේවල් ය. මනුෂ්‍යයා අපවිත්‍ර වන්නේ තමා තුළ ම ඇත්තා වූ දුර්ගුණ නිසා මිස නොසේදූ අත්වලින් කෑම කෑවාට නො වේ."[29] ජලයෙන් පවිත්‍ර කිරීම මෝසස් ඉගැන්වූ යුදෙව් ආගමික චාරිත්‍රයකි. යේසුස් වහන්සේ, යමෙකු ගේ ක්‍රියාවක් සඳහා බාහිර හේතු සාධක නොව සිත ම ප්‍රධාන වන බව කීම බෞද්ධ ඉගැන්වීමකි.

උන්වහන්සේ වරක් ගලීලයේ මුහුදුබඩ ගමක දී ධීවරයන් අමතා දේශනයක් කරමින් ජීවිතය කුඹුරකට උපමා කළ හ. "කෙත නම් ලෝකය යි. එහි හොඳ බීජ වපුරන තැනැත්තා මනුෂ්‍යයා යි. හොඳ බීජ නම් දිව්‍ය රාජ්‍යයේ පුත්‍රයෝ වෙති. කිරිඳි නම් යමපල්ලා ගේ දරුවෝ ය. ඒවා වපුළ සතුරා නම් යක්ෂයා යි. අස්වනු කපන්නේ දේවදූතයෝ ය. අස්වනු කපා අවසානයේ කිරිඳි එක්කොට දවන්නාක් මෙන් අවසානයේ දී පව්කාරයෝ දවෙන්නෝ ය. එහි දී හැඬීම් ද දත්මිටිකෑම් ද වන්නේ ය. ධර්මිෂ්ඨයෝ තමා ගේ පියා ගේ රාජ්‍යයේ සූර්යයන් මෙන් බබළති."

බුදුන් වහන්සේ ධර්ම දේශනා ගණනාවක දී කුඹුර උපමා සඳහා යොදාගත් හ. යේසු ධීවරයන්ට ධර්මය දේශනා කරද්දී කුඹුර උපමාවට ගත්තේ බෞද්ධ සම්ප්‍රදායක පිහිටමිනි.

යේසු ඇතැම් විට දස පනත උල්ලංඝනය කළේ ය. සබත් දිනයේ ඇවිදිමින් රෝගීන්ට සත්කාර කිරීම නිදසුනකි. ඒ ගැන යුදෙව් පූජකයන් ප්‍රශ්න කළ විට, උන් වහන්සේ, 'මගේ පියාණන් කටයුතු කළ ලෙස මමත් කරමි'[30] යි කියමින් තමා නීති කැඩුවේ නැති බවත්, වංශ චාරිත්‍රයක් අනුව කටයුතු කළ බවත් කී හ. මෙබඳු කතා බුදුන් සහ බුද්ධ ශ්‍රාවක චරිත අතර අනන්ත වත් තිබේ. බුදුන් වහන්සේ සිඟා ලද ආහාර වළඳමින් කපිලවස්තු නුවරට පැමිණිය හ. උන් වහන්සේ වෙත පැමිණි පියරජතුමා, "සිද්ධාර්ථයිනි, ඇයි අපට ලැජ්ජා කරන්නෙ. ඇයි හිඟා කන්නෙ" යි ඇසුවේ ය. "මහරජතුමනි, මේක අපේ වංශයේ චාරිත්‍රය," බුදුහු වදාළ හ.

යේසු ඇතැම් විට තම ශාස්තෘන් වහන්සේ මෙන් පුද්ගලයන්ට මානසික ප්‍රතිකාර කළේ ය. අබ නිපදවන ගමක දී මළ දරුවකුට පණ ලබා දීමට වෙහෙසුණු කිසා ගෝතමී නම් ස්ත්‍රිය ඇමතූ බුදුන්, "නැඟණිය, මේ ගමේ ඇවිද කිසිවකු මිය ගොස් නැති පවුලකින් අබ ටිකක් අරගෙන එන්න. මම ඔබේ දරුවාට පණ ලබා දෙමි" යි වදාළ හ. යේසු, වරක්, අනාචාරයේ හැසුරුණේ යි අල්ලාගත් ස්ත්‍රියකට ගල් ගසා මරන්ට සූදානම් වූ පිරිසක් දැක ඔවුන් වෙත ගොස්, "රහසිගත ව හෝ අනාචාර ක්‍රියාවක් කර නැති කෙනෙක් තුඹලා අතර ඉන්නවා නම් මැයට පළමු ගල ගසන්න" යි කීවේ ය. රැස්ව සිටි සියල්ලෝ ම ලැජ්ජාවෙන් විසිර ගියෝ ය.

දස පනතෙහි දෙ වැනි පනත මෙසේ ය. "අහසෙහි, පොළවෙහි, ජලයෙහි කිසිදු තැනක මට සමාන දෙයක් සාදා නො ගන්න. ඊට නමස්කාර නො කරන්න. ඊට සේවය නො කරන්න." මහමදාගම යුදෙව් ආගමට සමාන වන මෙම නීතිය යටතේ මහමදිකයෝ ද යුදෙව්වන් මෙන් රූප හා සංකේත වන්දනාව පාපයක් ලෙස සලකා දැඩි සේ හෙළා දකිති. එම නිසා ඕනෑ ම රටක් ආක්‍රමණ කළේ ද, මහමදිකයෝ එම රටවාසීන් ගේ වන්දනා රූප විනාශ කරති. පර්සියාව, ඇෆ්ගනිස්ථානය, පකිස්ථානය, ඉන්දියාව, බංගලාදේශය, මාලදිවයින්, ඉන්දුනීසියාව ආදී සෑම රටක ම බෞද්ධ සිද්ධස්ථාන පොළොවට සමතලා කර ඇත්තේ මෙම ප්‍රතිපත්තිය යටතේ ය. දන් ලංකාවේ ඓතිහාසික බෞද්ධ සිද්ධස්ථාන වෙත ද මහමදික බුල්ඩෝසර් පැමිණෙයි. යටත් විජිත ගොඩැංවීමේ දී කතෝලික සභාව විසින් ද අනිකුත් ආගම් සංහාරය පිණිස මෙම නීතිය තදින් ම ක්‍රියාවේ යොදවන ලද නමුදු යේසුස් වහන්සේ මෙන් ම එසින්ස්වරු ද බෞද්ධයන් වශයෙන් රූප වන්දනා කළෝ ය. නොයෙකුත් පුද පූජාවන්හි යෙදුණ හ. ඔවුන්ට ත්‍රිවිධ රත්නයක් තිබුණි. බෝසත්වරු සිටිය හ.

එසින්ස් බෞද්ධයකු වශයෙන් භාරතයට ගිය යේසු භාරතයෙන් පැමිණියේ එසින්ස් බෞද්ධයකු වශයෙන් නොවේ. තන්ත්‍රයානික බෝධිසත්ත්වවරයකු වශයෙනි. ටිබෙයේ පරිදි දලයි ලාමා කෙනකු යටතේ පාලනය වන ආගමික රාජ්‍යයක් ඊශ්‍රායලයේ බිහිකිරීම එතුමා ගේ උත්සාහය විය යන්න අප ගේ අදහස යි.

ටිබෙට් සම්ප්‍රදායයට අනුව බෝධිසත්ත්වයකු අභිෂේක කරනු

ලබන්නේ ඔටුනු පැළඳවීමෙනි. දලයි ලාමා අභිෂේක මංගල්‍යවල දී ද මෙම චාරිත්‍රය ඉටු කෙරේ. ලංකාවේ භික්ෂූන් වහන්සේලා ගේ උපසම්පදා උත්සවවල දී ඔටුන්න ද සංකේතවත් කෙරන විශේෂ ඇඳුම් කට්ටලයක් භාවිතා කෙරෙන බව අපි දනිමු. මෛත්‍රය, අවලෝකිතේශ්වර ඈ බෝසත්වරු ද මැණික් ඔටුණු පැළඳ සිටිති. යේසුස් වහන්සේ ද එසේ මැණික් ඔටුන්නක් පළඳවා අභිෂේක කරන ලද බෝසත්වරයෙකි. ප්‍රැන්සිස් මාදිවෙල පියතුමා ගේ ලිපියකට අනුව යේසුස් වහන්සේ අභිෂේක ජින නමින් ද හඳුන්වා ඇත්තේ ය.[31] දලයි ලාමාවරයාට ටිබෙටයේ ආගමික රාජ්‍ය නායකත්වය උරුම වන පරිදි යේසුස් වහන්සේ ද අභිෂේකයෙන් යුදෙව්වන් ගේ ආගමික රාජ්‍ය නායකත්වයට හිමිකම් කී හ. මම යුදෙව්වන් ගේ රජු ය යි උන්වහන්සේ කළ ප්‍රකාශයෙහි එම එම අරුත ද සැඟ ව තිබුණි.

යේසුස් වහන්සේට ඇණගැසීමේ දී රබීවරු උන්වහන්සේ ගේ අභිෂේක මංගල්‍යය සහ ආගමික රාජ්‍ය නායකත්වය හැල්ලුවටත් උපහාසයටත් ලක්කර ඇති බව පෙනේ. ඇණගසන්නන්ට කටු ඔටුනු පැළඳවීමේ සිරිතක් යුදෙව්වන් අතර නොතිබුණි. කටු ඔටුන්නක් පළඳවා ඇණගසනු ලැබ ඇති එක ම පුද්ගලයා යේසුස් වහන්සේ පමණි. උන්වහන්සේට කටු ඔටුන්නක් පැළඳවූ පැරිසිස්වරු නොයෙකුත් අන්දමින් උන්වහන්සේට අපහාස උපහාස ද කළ බවත් යුදෙව්වන් ගේ රජු ය යි ලියූ කොළයක් ප්‍රදර්ශනය කළ බවත් බයිබලයේ සඳහන් ය. ඒ උන්වහන්සේ ගේ අභිෂේකය ගර්හාවට නින්දාවට සහ අවතක්සේරුවට ලක්කිරීම පිණිස ය.

යේසු කටයුතු කර ඇත්තේ සාමාන්‍ය එසින්ස් භික්ෂුවකට වෙනස් අයුරකිනි. භික්ෂූන් වහන්සේලා බ්‍රහ්මචාරීන් වෙති. එසින්ස් භික්ෂූහු ද විවාහ නොවෙති. යේසු විවාහ වූයේ ය යි සිතීමට අනුබල දෙන සිද්ධි ගණනාවක් තිබේ. යුදෙව් ව්‍යවස්ථාව අනුව යුදෙව් දරුවකු වයස දහතුන වන විට විවාහ ගිවිස ගත යුතු ය. එසේ නොකිරීම යොහෝවාට අගෞරව කිරීමකි. විවාහ නොවූවකුට දේශකයකු වීම සපුරා තහනම් ය. අවුරුදු දහ තුනේ දී යේසුට තම දියණිවරුන් විවාහ කර දීමට ධනවත් යුදෙව් පවුල් කිහිපයක් ම උත්සාහ කළ බැව් ඉසානාථ සූත්‍රයෙහි සඳහනි. විවාහ වීමට

අකැමැති වූ යේසු රහසිගත ව ම කාශ්මීරය බලා සිටත් වූයේ ය.

යේසු ධර්මදේශකයකු වශයෙන් කටයුතු කරද්දී එතුමා මරිය මගදලේනා සමඟ ඉතා සමීප සබඳතා පැවැත්වූයේ ය. මගදලේනා යේසු ගේ පෙම්වතිය බව එතුමා ගේ සමීප ම අනුගාමිකයෝ දැන සිටියෝ ය. **සිමොන් පීටර්** වරක් මගදලේනාට මෙසේ කීවේ ය. "සොහොයුරිය, එතුමා අන් සියලු ම කාන්තාවන්ට වඩා ඔබට ආදරය කළ බව අපි දනිමු. ගැලවුම්කරුවා ඔබට කී දේවල් අපට කියා දෙන්න. එතුමා කියාදුන් ඔබ දන්නා අප නොදන්නා හා නොඇසූ දේවල් තිබේ."[32]

පිලිප් ශුභාරංචිකරුවා මෙසේ සඳහන් කර ඇත්තේ ය. "ගැලවුම්කරුවා මරිය මගදලේනා සමඟ සම්බන්ධකම් පැවැත්වූයේ ය. එතුමා අන් සියලු ම ස්ත්‍රීන්ට වඩා ඇයට ඇලුම් කළේ ය. එතුමා ඇගේ තොල් සිපගත්තේ ය."[33]

මරිය මගදලේනා මග්දලායේ උපන් කාන්තාවකි; දේවදාසියකි. පැරිසිස් රබීවරුන් ඇය හඳුන්වා ඇත්තේ ද වෛශ්‍යාවක ලෙස ය. යේසුස් වහන්සේට මරිය මගදලේනා හැර **මාර්තා**, **සූසානා**, **පිලිපි**, ජොහානා සහ **රචෙල්** ආදී තවත් ස්ත්‍රීන් පස්දෙනකු ආදරය කර තිබේ. එතුමා මරිය මගදලේනාට වැඩි ආදරයක් දක්වූයේ ය. යේසුස් වහන්සේ විවාහ වූයේ නම්, එතුමා තුළ පැවති බෞද්ධ රාජ්‍යයක් ඇති කිරීමේ පරමාර්ථය තවත් තහවුරු වේ. ඊශ්‍රායල් සම්ප්‍රදායට අනුව පූජකයකු නම් විවාහ විය යුත්තේ ම ය. නොඑසේ නම්, ඔහු ඒ සඳහා නුසුදුස්සෙක් වෙයි. බෞද්ධ රාජ්‍යයක අත්තිවාරම දැමීම සඳහා තමා විවාහකයකු බව යුදෙව් ජනතාව වෙත ඔප්පු කිරීම යේසුස් වහන්සේ ගේ බලාපොරොත්තුව වූයේ යි සිතිය හැකි ය.

අපොස්තල් ජෝන් ගේ ලියවිලිවල මඟුල් උත්සවයක් පිළිබඳ ව සඳහන් වේ. ඊට යේසුස් වහන්සේ ගේ අනුගාමිකයන් බොහෝ දෙනකු සහභාගි වී තිබේ. මරියා උත්සවයට සහභාගි වන අමුත්තන්ට වයින්වලින් සංග්‍රහ කළ යුතු බව කීවා ය. යේසු වයින් ගැලුම් එකසිය අසූවක් (180)ක් සකස් කර දුන්නේ ය. අපොස්තල් ජෝන්, මංගල උත්සවය කාගේ ද යි සඳහන් නොකරයි. මනාලිය කවුරුන් ද යි ඔහු ගේ ලියවිල්ලේ සඳහන් නො වේ.[34] එහෙත් උත්සවයට සහභාගි වන අමුත්තන්ට සංග්‍රහ කරන්නේ

උත්සවය සංවිධානය කරන්නවුන් විසිනි. මංගල උත්සවය යේසු ගේ ය යි විශ්වාස කෙරේ.

ගාන්ධාරයේ රජකම් කළ කණිෂ්ක රජතුමා (ක්‍රි.ව. 78-103) බෞද්ධ ඉතිහාසයේ අතිශය ප්‍රසිද්ධ බෞද්ධ නරපතියෙක් විය. එතුමා ගාන්ධාරය ලෝකයේ කලාගාරය බවට පැමිණවූයේ ය. කණිෂ්ක රජතුමා යටතේ සිදුවූ බෞද්ධ ප්‍රබෝධය පිළිබඳ ව, වයඹ දිග ඉන්දියාවේ සංචාරය කළ සමකාලීන විදේශ සංචාරකයන් සියල්ලෝ ම සඳහන් කරති. තුර්කි ජාතිකයකු වූ එතුමා, වයඹ දිග ඉන්දියාවේ පැවති විවිධ බෞද්ධ නිකායයන් ඒකරාශී කර හතර වැනි ධර්ම සංඝායනාව පැවැත්වූයේ ය. සංඝායනාවේ සියලු තීරණ තඹපත්වල ලියවා ස්ථූපයක තැන්පත් කළ බැව් ඉතිහාසයේ සටහන් ව තිබේ. සංඝායනාව පැවැත්වූයේ ද කාශ්මීරයේ දී ය. රජතුමා සංඝායනාවේ සාර්ථකත්වය පිළිබඳ ව කෙතරම් සතුටට පත් වූයේ ද යත්, කාශ්මීරයේ පාලනයට භික්ෂූන් වහන්සේ නමක් පත් කරනු ලැබූ හ. උන් වහන්සේ ගේ සහාය පිණිස භික්ෂු මණ්ඩලයක් ද පත් කෙරිණි.[35]

කණිෂ්ක රජතුමාට කාශ්මීරයේ භික්ෂු පාලනයක් පිහිටුවීමට උපදෙස් දුන්නෝ කවරුහු ද? සංඝායනාවේ යේසු භික්ෂුව දරූ ස්ථානය කුමක් ද? යනාදී ප්‍රශ්න රාශියක් ඉදිරිපත් කරන බෞද්ධ කාශ්මීරය නම් ග්‍රන්ථය, යේසු උත්සාහ කළේ පලස්තීනයේත් එවැනි බෞද්ධ පාලනයක් ඇති කිරීමට ද යන ප්‍රශ්නය නඟයි. මෙම සංඝායනාවෙන් පසු ව වයඹ දිග ඉන්දියාවේ මහායානික භික්ෂූන් නෙළූ බුදු පිළිම බොහොමයක අත්ලේ මැද රවුමක් සලකුණු කර තිබේ.[36] මෙය යේසු භික්ෂුවට ඇණ ගැසීම සංකේතවත් කළ ලකුණක් ය යි ඇතැම් ඉතිහාසඥයෝ කියති.

නිමි

පාදක සටහන්

1 Hassnain, Fida, A Search of The Historical Jesus, p218-221
2 Bagvan Rajneesh, Priest & Politics, The Rebel Pub. House, Germany, "I am not against Pope", 23p.

3 Ramusio, Voyages and Travels, London, 1910
4 Pope Offers Apology For Church's Sins, Seattle Post - Intelligencer, 03.13.2000
5 එම
6 Lal Chaman, Hindu America, Hoshiarpur, India, 1956
7 Black Jeremy, Atlas of World History, Dorling Kindersley, 1999.
8 මහාචාර්ය ඩී. ඊ. හෙට්ටිආරච්චි, පෙරදිග උරුමය, ආසියාතික සංස්කෘතික සංවිධානය, 1973
9 කුමාරි ජයවර්ධන, ශ්‍රී ලංකාවේ කම්කරු ව්‍යාපාරයේ නැගීම, වෙස්ලි මුද්‍රණාලය, වැල්ලවත්ත, 1978, 31 පිටුව.
10 Bagvan Rajaneesh, Priests & Politics p30
11 එම, 26-27 පිටු
12 Rajneesh Bible 1
13 Forsstrom, Johan, The King of the Jews, p188.
14 Bagvan Rajaneesh, India My Love, The Rebel Pub, Germany, p12-13.
15 Bull, School of Oriental Studies, London, 9, 1938, p502.
16 Fossier, Robert, The Cambridge Illustrated History of the Middle Ages, 1989.
17 දූතයා, ජාතික සංස්කෘතික කතෝලික මාසිකය, 8 කලාපය, කතෝලික මුද්‍රණාලය, කොළඹ, 15 පිටුව.
18 Hassnain, Fida, A Search of The Historical Jesus, p160-161.
19 මතෙව් 13, 53-58
20 ආර්. පී. මිහිඳුකුලසූරිය, හලාවත උරුමය, ග්‍රැපිටෙක්, 1995, 96-97 පිටු.
21 Perniola, V., The Catholic Church in Sri Lanka Vol.11, 1983, p259.
22 Helmut, Lippelt, Die Grunen-net hrz.uni-oldenburgh.de.
23 මතෙව් 6.20
24 මතෙව් 19. 16, මාක් 19. 21
25 Das Guptha, Maha Baratha, ටියුබින්ගන් ඉන්ඩියෝලොජි පුස්තකාලයේ පිටපත.
26 ලූක් 5. 38-44
27 Meer Izzut-Oolah, Travels in Central Asia Tr. Henderson, 1812, p13.
28 Genesis, 19.24-29.
29 මතෙව් 15. 19-20
30 යොහාන් 5. 16-18
31 දූතයා, ජාතික සංස්කෘතික කතෝලික මාසිකය, 8 කලාපය, කතෝලික මුද්‍රණාලය, කොළඹ, 15 පිටුව.
32 Forsstrom, Johan, The King if the Jews, p235.
33 The Crucifixion by An Eye-witness, p53.
34 ජෝන් 2. 1-4
35 Hassnain, Fida, Buddhist Kashmir
35 Ibid

උප ග්‍රන්ථය 6

යේසුස් නම් බුද්ධ ශ්‍රාවකයාණෝ: කෙටි සටහනක්

ක්‍රිස්තියානි ආගමේ පදනම වන බයිබලය ඇදහිය නොහැකි අවිද්‍යාත්මක කතාවලින් පිරී ඇතත් එහි සඳහන් කිසිදු වාක්‍යයක් වෙනස් කිරීමට හෝ සාවද්‍ය ය යි පැවසීමට හෝ වතිකානුව ඉඩ නො දෙයි. වතිකානුව යනු, එක්සත් ජාතීන් ගේ සංවිධානයේ සාමාජිකත්වය දරන කුඩා ම රාජ්‍යය යි. එහි විශාලත්වය අක්කර එකසිය අටයි දශම හත (108. 7) කි. 1999 වසරේ ජන ලේඛනය පරිදි ජනගහණය අටසිය හැත්තෑ (870) දෙනෙකි.[1] වතිකානුවේ රාජ්‍ය නායකයා හෙවත් පාප් ලෝකයේ බලවත් ම දේශපාලනඥයා යි. මහමදික උවදුරෙන් යුරෝපය රැකගත් එතුමා සෝවියට් කොමියුනිස්ට් කඳවුර නමැති දැවැන්තයා මරා දැමීමේ සටනේ ද පෙරමුණ ගත්තේ ය. පාප්ට අනුගාමිකයන් නැති, එතුමා ගේ බලය හා තේජස නොපැතිරුණ එක ද කොදිව්වක් හෝ මේ මිහිතලයේ නොමැති තරම් ය.

එතුමා ගේ බලය කෙතරම් ද යත්, ග්‍රහලෝක තරණයට පවා එළඹ සිටින ඇමරිකාවේ ප්‍රාන්ත වැඩි සංඛ්‍යාවක පිහිටි පාසල්වල ඩාවින් ගේ පරිණාමවාදය ඉගැන්වීම අද පවා තහනම් ය. ඒ, බයිබලයේ සඳහන් ලෝකය මැවීම පිළිබඳ කතාව ආරක්ෂා කිරීමේ පරමාර්ථයෙනි. මෙබඳු උදාහරණ බොහෝ ය. පාප් ගේ ආදෘශ්‍යමාන හස්තය මුළු මහත් ලෝකය ම පාලනය කරයි.

මෙම තොරතුරු ඉදිරිපත් කරන ලද්දේ, යේසුස් වහන්සේ ගේ අප්‍රකට ජීවන තොරතුරු ගවේෂණය කිරීම කෙතරම් දුෂ්කර හා බැරෑරුම් කටයුත්තක් ද යන්න පැහැදිලි කිරීමට ය.

නිකොලොස් නොටෝවිෂ් නමැති ක්‍රිස්තියානි ගවේෂකයා

පෙරදිග සංචාරයක නිරත ව සිටිය දී, ටිබෙටයේ බෞද්ධ ආශ්‍රමයක තිබූ ඉසානාථ සූත්‍රය නමැති බෞද්ධ ග්‍රන්ථයක් සොයා ගත්තේ ය. මහත් ආයාසයක් ගෙන ක්‍රිස්තියානි මූලධර්මවාදීන් ගෙන් අත්පිටපත රැකගත් ඔහු, අවසානයේ දී ඒ මහරු ග්‍රන්ථයක් වශයෙන් මුද්‍රණද්වාරයෙන් ප්‍රකාශයට පත් කළේ ය.

බයිබලයේ සඳහන් යේසුස් වහන්සේ ගේ ජීවිත කතාව අසම්පූර්ණ බව ඇතැමුන්ට වැටහුණේ නොටෝවිෂ් ගේ ග්‍රන්ථය කියවීමෙන් පසුව ය. ඉන් පසු, ගවේෂකයන් කිහිප දෙනෙක් ම නොටෝවිෂ් ගේ සොයාගැනීම පිළිබඳ ව වැඩිදුර කරුණු පරීක්ෂා කරන්නට වූ හ.

වතිකානුව, මේ ගවේෂණ ව්‍යාපාරය නොඉවසී ය. වතිකානුව විසින් මෙහෙයවන ලද නොයෙකුත් සංවිධාන ටිබෙටයේ ආරාම එකක් නෑර පීරමින්, ඒවායේ තිබූ ඓතිහාසික ග්‍රන්ථ රැස් කරන්නට වන් හ. යේසු ගේ අප්‍රකට ජීවිත කතාව ගවේෂණය කරන්නෝ අධෛර්යවත් කරන ලද හ. ජනමාධ්‍යයන්ට, යේසු ගේ අප්‍රකට ජීවිතය පිළිබඳ නව සොයාගැනීම් නොවැදගත් කරුණු විය! වතිකානුවේ බලය පිළිබඳ වැටහීමක් ඇත්තෙකුට, යමෙකු යේසු ගේ ජීවිත කතාව හෙළිදරව් කිරීමට ගන්නා උත්සාහය පෙනෙනුයේ, 'ඉදිකටු සිදුරකින් රිංගීමට ඔටුවකු දරන වෑයමක්' පරිද්දෙනි.

ඉසානාථ සූත්‍රයට අනුව, යුදෙව් දේශයේ බෙත්ලෙහෙමේ ගව ලෙනක උපන් යේසු බිළින්දා අපවත් වූ දලයි ලාමා වරයෙකි. එතුමා ගේ උත්පත්තිය දැනගත් ලාමාවරුන් තිදෙනෙක් චාරිත්‍රානුකූල ව බෙත්ලෙහෙමට ගොස් යේසු බිළින්දාට ගෞරවාචාර දක්වා දකුම් පඬුරු පිළිගන්වා පැමිණිය හ. සේද මාවතේ ඊජිප්තුව, පර්සියාව හා භාරතය යන රටවල යුදෙව් ජනපද තිබුණි. යේසු, වයස දහතුනේ දී කාශ්මීර ජනපදයේ විසූ සිය ඥාතීන් වෙත ගියේ ය. ඥාන පිපාසයෙන් පෙළුණු එතුමා බ්‍රාහ්මණ හා ජෛන දහම් හදාරා යෝගාවචරයකු ලෙස කටයුතු කර අවසානයේ දී භික්ෂු ශාසනයට ඇතුළත් විය. මහායාන ධර්මය කෙරේ උනන්දු වූ උන්වහන්සේ ආරම්භයේ දී වජ්‍රයානික භික්ෂුවක ලෙසින් කටයුතු කර පසුව තන්ත්‍රයානික ධර්මය කෙරේ වඩාත් විශ්වාසය තබා ටිබෙටයට වැඩිය හ. එතුමා ටිබෙටයේ දී බෝධිසත්වවරයකු

වශයෙන් අභිෂේක ලැබී ය. සිය මව්බිමේ වැසියන්ට සේවය කිරීමේ අරමුණින් යුදෙව් දේශය බලා වැඩම කළ මෙතුමා ගේ කීර්තිය හා ජනප්‍රියතාව කෙරේ යුදෙව් රට යටත් කරගෙන සිටි රෝම පාලකයින් සැක කළ අතර බල අරගලයක යෙදුණු පැරිසිස්වරු ද උරණ වූ හ. ඔවුහු එක්වී එතුමාට ඇණගැසූ හ.

යේසුස් වහන්සේට ඇණ ගැසීම පිළිබඳ ව වාර්තා කරන තඹ පතක් නේපල්ස් නගරයට නුදුරින් පිහිටි ඇකිලා නමැති ස්ථානයේ කළ පුරාවිද්‍යා ගවේෂණයක දී ප්‍රංශ හමුදාවේ කලා කටයුතු භාර කොමසාරිස්වරයා විසින් සොයා ගන්නා ලදි.[2] හීබෘ භාෂාවෙන් ලියා ඇති එහි එක් පැත්තක, 'මෙහි පිටපත් සියලු ගෝත්‍ර වෙත යවන ලදි' යනුවෙන් සඳහන් වේ. අනික් පැත්තේ යේසුතුමා ගේ මරණ වරෙන්තුව පිටපත් කර තිබේ. එහි සඳහන් අන්දමට ඇණගැසීම සිදු කරනු ලැබ ඇත්තේ ටිබැරියස් සීසර් අධිරාජයා ගේ දහ හත් (17) වන රාජ වර්ෂයේ මාර්තු මස විසි හත් (27) වන දින ය. යේසුට ඇණ ගැසීමේ තීන්දුව දී ඇත්තේ ආණ්ඩුකාර පොන්ටියස් පිලාතේ විසිනි. පැමිණිල්ල ඉදිරිපත් කරන ලද්දේ නායක පූජක ජෝසප් බෙන් කයිපාස් විසිනි.

යේසුතුමා මරණයෙන් පසු උත්ථානය ලැබී ය යන්න බයිබලයේ ඉගැන්වීම යි. සැබෑ ලෝකයේ මියගිය පුද්ගලයකු යළි නොනැගිටියි. භක්තියෙන් අදහනු විනා ඓතිහාසික වශයෙන් යේසුස් වහන්සේ ලීකදේ මිය ගොස් නැති බව පැහැදිලි ය. භක්තිය බොහෝ විට ඇති වන්නේ බුද්ධියෙන් බාල වූ සිත් සතන් තුළ යයි මෑත යුගයේ විසූ බෞද්ධ පඬිවරයකු වූ මහාචාර්ය ඩබ්ලිව්. එස්. කරුණාරත්න පෙන්වා දී තිබේ.[3] යේසුස් වහන්සේ මරණයෙන් ගළවා ගැනීම සඳහා කිසියම් සංවිධානාත්මක වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක වූ බවට සාක්ෂි තිබේ. යේසුට ඇණ ගැසූ අවස්ථාවේ එම ස්ථානයේ දී ම සොරුන් දෙදෙනකුට ද ඇණ ගසන ලදි. ඔවුන් දෙදෙනා නොලැබූ වරප්‍රසාද රෝම හමුදා භටයන් ගෙන් යේසුස් වහන්සේට ලැබුණි.

ඇණ ගැසූ ලීකදේ එතුමා ගේ තට්ටම් රැඳවීම පිණිස කුඩා ලී පුවරුවක් සවිකර තිබුණි.

යේසු කිසියම් පානයක් බී සිහි මූර්ඡා ව සිටියේ ය.

ඇණ ගැසීමට මඳ වේලාවකට පෙර කාන්තාවක් එතුමාට පමණක් ටොස්කා කෝප්පයක් පෙව්වා ය. ඇඹුල් වයින් වර්ගයකට පැළෑටි යුෂ විශේෂයක් මිශ්‍ර කර සාදනු ලබන ටොස්කා පානය කරන්නකු සිහි මූර්ඡාවට පත් වෙයි. යේසුට ටොස්කා පෙවීමේ අරමුණ වූයේ, සිහි මූර්ඡා වී වැඩි කාලයක් ලීකදේ ගත කිරීමට ඉඩ සැලැස්වීම යි.

සබත් දිනය නිමිත්තෙන් ලී කදෙන් ඉවතට ගනු ලබන පුද්ගලයන් ගේ දණහිස් පොඩි කරනු ලැබේ. බිමට ගන්නා ලද සොරුන් දෙදෙනා ගේ දණහිස් පොඩි කරන ලද නමුදු, යේසුස් වහන්සේ ගේ දණ හිස් පොඩි නොකෙරිණි.

එතුමා ගේ ළපැත්ත තුවාල කළ සොල්දාදුවා, තුවාලයෙන් වතුර හා ලේ පිටවනු දුටු නමුදු එය නොසලකා ඉවත ගියේ ය.

පිලාතේ, යේසු අහිංසකයකු බව කීවේ ය. එතුමාට ඇණ ගැසීමට නියම කළේ සබත් දිනය ඇරඹීමට පැය ගණනකට පෙර වේලාවකි. එම නිසා එතුමා ලී කදේ ගත කර ඇත්තේ පැය තුනක පමණ කාලයකි.[5] මෙබඳු කෙටි කාලයක් තුළ ඇණ ගැසුම්කෑවෙකු මිය යන්නේ නැත.

යේසුස් වහන්සේ කුරුසියේ මිය නොගිය බව ඔප්පු කිරීමට ඇති තවත් සාක්ෂියක් නම්, උන් වහන්සේ ගේ දේහය ඔතනු ලැබූ හණ රෙදිකඩ ලෙස බොහෝ දෙනා විශ්වාස කළ ටියුරින්හි මෘත ශරීරාවරණය පිළිබඳ ව පර්යේෂණ කළ ඇතැම් විද්‍යාඥයන් ගේ මතය යි. ඔවුන් ගේ අදහස වූයේ එහි ඔතා තිබී ඇත්තේ මෘත දේහයක් නොව පණ ඇත්තකු ගේ සිරුරක් බව යි.

එසින්ස් ලේඛන අනුව ඇරිමිතියාවේ යෝසප්, පිලාතේ සමග රහස් ගනුදෙනුවක් කළේ ය. එය අල්ලස් දීමකි. යේසුස් වහන්සේ ගේ සමීප ඥාතියකු හා ප්‍රබල අනුගාමිකයකු වූ යෝසප් ධනවතකු වූ බවත් මන්ත්‍රීවරයකු වූ බවත් ඓතිහාසික වාර්තා පෙන්වා දෙයි. පිලාතේ යේසු ගේ ක්‍රියාකලාපය හොදින් අධ්‍යයනය කර සිටි පුද්ගලයෙකි. ඔහු, යේසු ගේ ජනප්‍රියතාව හා ආත්ම ශක්තිය කෙරෙහි බිය වී හුන්නේ ය. පිලාතේ අල්ලසට නැමුණි. යේසු අපරාධකරුවකු කර ඇණ ගැසූ විට එතුමා ගේ ආගමික හා දේශපාලන ජීවිතය හමාර වන බව වටහාගෙන ඔහු එම තීරණය

ගත් බව පෙනේ. ඇණගැසීමෙන් ඉතා ටික කාලයකට පසුව රෝම අධිරාජයා, පිලාතේ ආණ්ඩුකාර ධුරයෙන් පහකළේ ය. 'යේසුස් වහන්සේ ගේ උත්ථානය' බුද්ධිමත් රෝම අධිරාජයාට රහසක් නොවූ බව එයින් පැහැදිලි වෙයි.

යුදෙව් බයිබලය පවසන පරිදි යොහෝවා, යුදෙව් වර්ගයා ලෝකයේ ශ්‍රේෂ්ඨතම මනුෂ්‍ය කොට්ඨාශය බවට පත් කිරීම පිණිස ගැළවුම්කරුවකු එවන බව, මෝසස්ට කීවේ ය. යේසුස්, දේව පුත්‍රයා වන තමා ගැළවුම්කාරයා බව කීවේ ය. එම නිසා, 'පොතට අනුව', යේසු ගැළවුම්කරුවා නම්, යුදෙව් වර්ගයා ගළවා ගත යුතු ය. ඔවුන් ලෝකයේ ශ්‍රේෂ්ඨතම මනුෂ්‍ය කොට්ඨාශය බවට පැමිණවිය යුතු ය. එහෙත්, යේසු එවැන්නක් නො කළේ ය.

රබීවරුන් තර්ක කළ ලෙසට, යේසු දෙවියන් හාස්‍යයට ලක් කරමින් ජනයා මුළා කළ පුද්ගලයෙකි. මෝසස් ගේ නීතිය අනුව එබඳු තර්කයක් ඉදිරිපත් කළ හැකි ය. යුදෙව් ආගමික නීතිය පදනම් කරගෙන සැදුණු රෝම ලන්දේසි නීතිය යටතේ මහා ප්‍රසිද්ධියේ භයානක අපරාධ කළ පුද්ගලයන් නිදහස් වූ අවස්ථා ලංකා ඉතිහාසයේ මොන තරම් තිබේ ද? යේසුස් වහන්සේ යුදෙව් වර්ගයා ලෝකයේ ශ්‍රේෂ්ඨතම මනුෂ්‍ය කණ්ඩායම කිරීමට වෙහෙසුණු භික්ෂුවකි. උන්වහන්සේ යුදෙව් දේශය බෞද්ධ රාජ්‍යයක් කිරීමට වෙහෙසුණ හ.

යේසු ගේ ප්‍රසිද්ධ දේශනා නිසා රබීවරුන් අතර නොසන්සුන්තාවක් හටගෙන තිබියදී, ගේබ්‍රියල් නමැති යොහෝවා ගේ දූතයා, යෙරුසලමට යාම පිණිස යේසුස් වහන්සේ පෙළඹවූ බව බයිබලය පවසයි. රබීවරු යේසුස් වහන්සේ යෙරුසලමට පැමිණෙන බව දැන ගෙන 'සූදානම්' වූ හ. යේසුස් වහන්සේ අත්අඩංගුවට ගැනීම නිසා මහජනයා අතර කැළඹීමක් ඇතිවේදෝ යන සැකය ඔවුන් තුළ ජනිත වුව ද උන්වහන්සේ අත්අඩංගුවට ගෙන මරාදැමිය යුතු බව ඔවුන් ගේ තීරණය වූ බව බයිබලය වැඩි දුරටත් පවසයි. මේ සිද්ධි මාලාවෙන් පැහැදිලි වන්නේ යේසුස් වහන්සේ සතුරාට හසුවූයේ, එතුමා යෙරුසලමට ගිය නිසා බව යි. එසේ නම් දූතයකු යවා පොළඹවා යේසුස් වහන්සේ යෙරුසලම වෙත යවන ලද්දේ යොහෝවා විසින් ද?

"මනුෂ්‍යයා ගලවා ගැනීමට පැමිණි යේසුතුමා කුරුසියේ තබා ඇණ ගසා මරා දමනු ලැබුවේ ය. ඊට මනුෂ්‍ය සංහතිය ම වැරදිකරුවෝ වෙති. එම නිසා අප දෙව්පියාණන්ට අපව පාපයන් ගලවාගන්නැ යි යාඥා කළ යුතු ය" යි බයිබලය කියයි. මෙය අපූරු තර්කයකි. රබීවරුන් යේසුස් වහන්සේ කොටුකර ගන්නට සූදානම් වී සිටිය දී දුර බැහැර පළාතක සිටි එතුමා යෙරුසලමට යැවූ යොහෝවා, රබීවරුන් එතුමා මරාදැමූ පසු ව ඒ වරද මනුෂ්‍ය සංහතියට පවරයි. මෙය යොහෝවා දූතයකු එවා මරියා නමැති බාලවයස්කාරිය ගැබ් ගන්වා ඇය අසරණ කිරීමට සමාන සිද්ධියකි.

යෙරුසලමට පැමිණි යේසු මරාදැමීමට රබීන් තීන්දු කළ බව ඇසූ නිකොඩමුස් ඔවුන් වෙත ගොස්, කරුණු නොවිමසා කිසියම් පුද්ගලයකු මරාදැමීම නුසුදුසු බව කී නමුදු රබීවරු නිකොඩමුස් ගේ තර්කය නොපිළිගත් හ. නිකොඩමුස් වහා ම ඇරිමිතියාවේ යෝසප් හා එසීන්ස් භික්ෂූන් හමුවී යේසු ගේ ජීවිතය අනතුරෙහි බැව් දැන්වී ය. ඒ ගැන සාකච්ඡා කළ ඔවුහු, මොනයම් ක්‍රමයකින් හෝ යේසුස් වහන්සේ ගේ ජීවිතය ආරක්ෂා කරගත යුතු ය යන නිගමනයට එළඹුණ හ.

යේසුස් වහන්සේට රබීවරුන් ගේ කුමන්ත්‍රණය ගැන දැනගන්නට ලැබුණේ ගැළවිය නොහැකි පරිදි කොටු වූ පසු ව ය. උන්වහන්සේ යෙරුසලමෙන් පලා යාමට උත්සාහ නොකළේ, ඒ අවස්ථාවේ අන්තරායෙන් ගැළවීමට නොහැකි බව උන් වහන්සේට පැහැදිලි වූ හෙයිනි. තමා සමඟ සිටින පිරිසෙන් කවුරුන් හෝ රබීන් ගේ ඔත්තුකරුවකු වී ඇති බව එතුමා දැනගත්තේ ය. අවස්ථාවේ හැටියට එතුමාට කළ හැකි වූයේ සතුරන්ට මුහුණදීමට සූදානම්වීම පමණි. තමා පැය කිහිපයකින් සතුරාට හසුවන බව යේසුස් වහන්සේ අනුගාමික පිරිසට කී හ. "ඔබ වහන්සේ දෙව්ලොවට ගිය පසු ඊළඟට කැඳවාගෙන යන්නේ කවුද" යනාදී වශයෙන් ඔවුහු විකාර ප්‍රශ්න අසන්නට වූ හ.

ඔලිව් කන්දට යන අතරමග ස්ථානයක දී (ගෙත්සෙමනේ) ගෝල පිරිසට ටිකකට නවතින්නැ යි කී යේසුස් වහන්සේ බිම දණ ගසා දෙවියන්ට යාඥා කරමින් තමා බාරගන්නා ලෙස[4] කීවේ ය. එම අවස්ථාවේ දී ද යොහෝවා ගේ දූතයෙක් පැමිණ

එතුමන් දිරිගැන්වූයේ ය.[5] සතුරන්ට හසුවීමට පැය කිහිපයක් තිබියදී සුරදූතයා එතුමාට කීවේ මොනවා ද යන්න බයිබලයේ සඳහන් නො වේ. යොහෝවා සමඟ නිතර ම සම්බන්ධකම් පැවැත්වූ, 'සොයන්නාට සම්භවේ, තට්ටු කරන්නාට දොර ඇරේ' ආදී වශයෙන් භක්තිවන්තයාට දෙවියන් ඉතා ම සමීප බව දේශනා කළ යේසුස් වහන්සේට පෞද්ගලිකව නම් යොහෝවා ගෙන් කිසිදු පිහිටක් නො ලැබුණි. රබීවරුන්ට එතුමා ගේ බලය පෙන්වීමට තිබුණු හොඳ ම අවස්ථාවේ දී දෙව්පියා එතුමාට පිහිට නොවූයේ ය. යොහෝවා කිසියම් හාස්කමක් පෙන්වා යේසුස් වහන්සේට කුරුසියෙන් ගැලවීමට මඟපෙන්වූයේ නම්, රබීවරුන්ට යේසු දේවපුත්‍රයා බව පිළිගැනීමට සිදු වෙයි. එසේ වූයේ නම්, 'අපව පාපයෙන් ගලවාගන්න' යි කියමින් මනුෂ්‍ය සංහතිය යොහෝවාට යාඥා කළ යුතු වන්නේ නැත.

යොහෝවා යේසුස් වහන්සේට පිහිට නොවූයේ ය. එල්ලා මැරීම වෙනුවට ලීකඳේ ඇණගැසීමට පිලාත් ගේ සිත වෙනස් කළේ යොහෝවා නම්, එය යේසුස් වහන්සේ යොහෝවා ගෙන් ලබාගත් එකම පිහිට යි. එසීන්ස් ලේඛනවලට අනුව පිලාත් ගේ සිත වෙනස් කරන ලද්දේ ඇරිමතියාවේ යෝසප් විසිනි. ඔහු ගේ මුදලේ මහිමයෙනි.

මැතිව් ගේ හා මාක් ගේ සාක්ෂි අනුව අහස කළුවර වී තිබුණි. මහජනයා භීතියට පත්ව සිටිය හ. යේසුස් වහන්සේ මිය යාමට මොහොතකට පෙරදී, 'පියාණනි, ඔබ මා අතහැරියේ ඇයි' කියා කෑ ගැසුවේ ය. ලූක් පවසන්නේ, 'පියාණනි මම ඔබේ අතට මගේ ආත්මය බාරදෙමි' යි කී බව යි. 'සියල්ල අවසාන යි' යනුවෙන් කී බව යොහාන් කියයි.

භාෂා විශේෂඥයන් පැහැදිලි කරන පරිදි මැතිව් ගේ හා මාක් ගේ සාක්ෂිය ඇරමයික් භාෂාවෙන් වැරදි ලෙසට පරිවර්තනය කරනු ලැබ ඇත. 'නුඹ දෙවියන් ගේ පුත්‍රයා නම් දෙවියන්ට කියා ගැලවියන්' ය යි කී රබීවරුන්ට අවසාන පිළිතුර සැපයූ යේසුස් වහන්සේ, 'එලොයි එලොයි ලාමා සබක්තානි යනුවෙන් කෑගසා ඇත්තේ යොහෝවාට නොවේ. සබක්තානි නම් ලාමාවරයාට ය.

යේසුස් වහන්සේ ගේ අප්‍රකට ජීවිතය ගවේෂණය කරන්නන් පැහැදිලි කරන ලෙසට උන් වහන්සේ ඓතිහාසික පුද්ගලයකු

බැවින් බයිබලයෙන් බැහැර වෙනත් ලේඛනවල උන් වහන්සේ ගැන සඳහන් ව තිබිය යුතු ය. යේසුස් වහන්සේ ගේ සැබෑ චරිතය සොයා ගැනීමට නම් සෑම ඓතිහාසික සාක්ෂියක් ම පරීක්ෂා කළ යුතු වන්නේ ය. ඉසානාථ සූත්‍රය උන් වහන්සේ පිළිබඳ ව සඳහන් වන එක් ලේඛනයකි. ඉන් හෙළිදරව් වන අන්දමට මෝසස් ඊජිප්තුවේ පාරාවෝ රජු ගේ බාල පුත්‍රයා ය. පාරාවෝ නරපතියෙක් කනානය ආක්‍රමණය කර යුදෙව්වන් විශාල පිරිසක් වහලුන් ලෙස ඊජිප්තුවට ගෙනායේ ය. මොවුන් ගෙන් පැවතුණ යුදෙව් වහල්ලු නිදහස පිළිබඳ සිහින දකිමින් උන් හ.

ඊජිප්තු ඉතිහාසයේ වඩාත් ම දුක් වින්ද මනුෂ්‍ය කොට්ඨාශය යුදෙව්වෝ වෙති. අහස උසට ගොඩනංවා ඇති යෝධ පිරමිඩ තැනූවෝ ඔවුහු ය. පිරමිඩ තැනීම සඳහා භාවිත කර ඇති එක් කළුගල් කුට්ටියක් සෙලවීමට මිනිසුන් සිය ගණනක් එක් වී වීරිය කළ යුතු ය. මෙම ගල් නයිල් ගඟබඩ කිසිදු ප්‍රදේශයක දක්නා නො ලැබෙන, දුර බැහැර ඈත ප්‍රදේශවල සිට වහලුන් ගේ වීරියෙන් ගෙනෙන ලද ඒවා යි. එක් පිරමිඩයක් ගොඩනංවනු පිණිස වහලුන් ලක්ෂ සංඛ්‍යාවක් යොදා ගැනුණි. පිරමිඩයක වැඩ අවසන් වන විට ඒ වෙනුවෙන් දිවි පිදූ වහලුන් ගේ සංඛ්‍යාව දහස් ගණනක් විය.

ඊජිප්තු වහලුන් ගේ නිදහස සඳහා ඉදිරිපත් වූ පුද්ගලයා මෝසස් ය. එම නිසා යුදෙව් වහලුන් අතර මහත් කීර්තියක් අත්කර ගෙන සිටි මෝසස්ට ජීවිතය රැකගැනීම පිණිස රටින් පලායාමට පවා සිදු විය. යොහෝවා හමුවූ පූජකයකු වශයෙන් නැවතත් ඊජිප්තුවට පැමිණි ඔහු, යුදෙව්වන් වෙනත් ඇදහීම් ඉවත ලා යොහෝවා පමණක් අදහන්නට එකඟ වන්නේ නම්, ඔවුන්ට නිදහස හා සෞභාග්‍යයවත් රටක් ලබාදීමට යොහෝවා කැමති වූ බව කීවේ ය.

මේ කතාව යුදෙව් වහලුන්ට ඉමහත් සැනසීමක් විය. ඔවුන් සියල්ලෝ ම යොහෝවා වඳින්නට පටන්ගත් හ. මෝසස් යුදෙව්වන්ට නායකත්වය දෙමින්, ඊජිප්තුවට එරෙහි ව කැරැල්ලක් දියත් කරනු ඇතැ යි බිය වූ පාරාවෝ රජතුමා, ඊජිප්තුවේ ඇති වූ වසංගතවලින් වඩාත් බියපත් ව යුදෙව්වන් ද සමඟ ඔවුන් ගේ රටට යාමට මෝසස්ට අවසර දුන්නේ ය.

විශාල වහල් හමුදාවක් සමග ඊජිප්තුවෙන් පිටවූ මෝසස් හතළිස් අවුරුද්දක් වෙහෙසී යුදෙව් රාජ්‍යය ගොඩනැංවූයේ ය. "දෙවියන් අපට දෙන බව කී කිරි පැනි උතුරන දේශය මේක ද" යි ඊශ්‍රායලයේ කටුක දේශගුණය සහ නිමාවක් නැති යුද්ධ නිසා හෙම්බත් වූ යුදෙව්වන් අතර සිටි මෝසස් ඉදිරියේ ප්‍රශ්න කිරීමට තරම් එඩිතර යුදෙව් තරුණ පරපුර ප්‍රශ්න කරන්නට විය. ඔවුන් නිහඬ කිරීමට අදහස් කළ මෝසස්, යාවේ දෙවියන් මුණගැසීම පිණිස සිනායි කන්දට නැග ආපසු පැමිණ, යුදෙව්වන් අමතා මෙසේ කීවේ ය.

"මම ස්වාමීන් වහන්සේ සමග කතා කළා. යුදෙව්වන් ලෝකයේ ශ්‍රේෂ්ඨතම මනුෂ්‍යයන් කරන බවට උන්වහන්සේ පොරොන්දු වුණා. ඒ සඳහා ගැලවුම්කරුවකු එවන බවත් කීවා. ඒ සියල්ල කෙරෙන්නෙ මෙන්න මේ නීති පිළිපැද්දොත් පමණ යි. නීති කඩන්න එපා. ස්වාමීන් වහන්සේ කෝප වේවි. දඬුවම් ලැබේවි."

ඔහු යොහෝවා විසින් නියම කරන ලද නීති දහයක් යුදෙව්වන් හමුවේ ප්‍රකාශ කළේ ය. දසපනත නමින් හැඳින්වෙන්නේ එම නීති සංග්‍රහය යි. ඊට අමතර ව යොහෝවා විසින් පනවන ලද නීති බොහෝ වෙයි.

දස පනත යනු චර්යා ධර්ම සංග්‍රහයක් නොවේ; චර්යා නීති සංග්‍රහයකි. මෝසස් කෙරෙහි විශ්වාසය තැබූ යුදෙව් වහල්ලු, ලෝකයේ ශ්‍රේෂ්ඨතම මනුෂ්‍ය කොට්ඨාසය බවට පත්වීමේ පරම අභිලාෂයෙන් නීති රැකීමට මහත් පරිශ්‍රමයක් දැරූ හ; මුළු මහත් යුදෙව් වර්ගයාට ම හානි කරන්නවුන් සේ සලකා නීති කඩකරන්නන්ට දැඩි දඬුවම් පැමිණවූ හ; නීතියට පටහැනිව ලිංගික සබඳතා පැවැත්වූ ස්ත්‍රී පුරුෂයන් ගල් ගසා මරණයට පත් කළ හ.

යුදෙව්වන් නීති රැක්කේ දැඩි මානසික හා ශාරීරික පීඩා විඳිමිනි. එම පීඩාව දැඩි ලෙස ම දැනුණේ ආදර්ශවත් ලෙස ජීවිත ගත කළ යුතු වූ රබීවරුන්ට ය. මනෝවිද්‍යානුකූල මූලධර්මවලට අනුව, යුදෙව් රබීවරු ඔවුන් ලැබූ අධික මානසික හා ශාරීරික පීඩා නිසා දැඩි මූලධර්මවාදීන් බවට පත්වූ හ. මහමදිකයන් මූලධර්මවාදීන් වී සිටින්නේ ද රළු නීති රීති අණපනත් යටතේ

ඔවුන් පාලනය වන බැවිනි.

යේසුස් වහන්සේ ගේ උප්පත්ති නාමය වන එම්මානුවෙල් යන්නෙහි අර්ථය දෙවියන් ගේ පුත්‍රයා යන්න යි. යේසු තමන් දෙවියන් ගේ පුත්‍රයා බව කීවේ ය. තමා ගැළවුම්කාරයා බව කීවේ ය. එතුමා, යුදෙව්වන් දස පනත නමැති නීති සංග්‍රහයෙන් මුදවාගැනීම පිණිස වෙර දැරී ය. මෙය පොදු ජනතාව ගේ අමන්දානන්දයට මෙන් ම මූලධර්මවාදී පූජකයන් ගේ උදහසට ද හේතු විය.

ඉසානාථ සූත්‍රය හැරුණු විට, යේසු වහන්සේ ගේ අප්‍රකට ජීවිතය පිළිබඳ ව කරුණු හැදෑරීම පිණිස ඇති වැදගත් ම සාක්ෂි එසින්ස් වාර්තා සමූහය යි.

එසින්ස් යනු යුදෙව් බුද්ධ ශාසනය යි. එසින්ස් ලේඛනවලට අනුව, යේසු ගේ පියා වශයෙන් සැලකෙන යෝසප්, ඔවුන් ගේ දායකයෙකි. යොහාන්, යෝසප් ගේ ඥාතියෙකි. යේසු, ටිබෙටයේ සිට ආපසු යුදෙව් දේශයට පැමිණ ඇත්තේ බෝසත්වරයකු වශයෙන් මිස, එසින්ස් භික්ෂුවක වශයෙන් නො වේ. එතුමා පලස්තීනය බෞද්ධ රාජ්‍යයක් කිරීමට වැර වැඩී ය. ඊට එසින්ස් සහාය ලැබුණේ කවරා'කාරයකින් ද යන්න පිළිබඳ ව තොරතුරු නැතත් යේසුස් වහන්සේ මරණයෙන් ගළවා ගනු ලැබ ඇත්තේ එසින්ස්වරුන් විසිනි.

'මළ මුහුදේ සම්පත්‍ර' ද එසින්ස් ලේඛන සම්භාරයකි. සම්පත්‍රවලින්, 'යේසුස් වහන්සේ ඓතිහාසික පුද්ගලයකු බවත්, බයිබලය නිවැරදි බවත්' ඔප්පු වන්නේ ය යි ක්‍රිස්තියානි දේවධර්ම ආචාර්යවරු කියති. සම්පත්‍ර සොයා ගනු නොලැබුවේ වුව, බයිබලයේ ඓතිහාසික තොරතුරු අන්තර්ගත බව පිළිගත යුතු ය. බයිබලයේ සඳහන් සියලු තොරතුරු සත්‍ය බව එයින් අදහස් නො කෙරේ. යේසුස් වහන්සේ යෙරුසලමට ගිය බව පිළිගත හැකි නමුදු එතුමා මළවුන්ට පණ දුන් බව කෙසේ පිළිගනිමු ද? කුරුසියෙන් ගැළවීමට නොහැකි වූ යේසුස් වහන්සේ මියගිය ලාසරස්ට පණදුන්නේ ය යි කෙසේ විශ්වාස කරමු ද?

යේසුස් වහන්සේ පිළිබඳ ව බොහෝ තොරතුරු මහමදික ලේඛනවල ඇතැ යි මහමදික ඉතිහාසඥයෝ කියති. එය තවත්

වැදගත් සාක්ෂියකි. ඊජිප්තුව සහ ඉන්දියාව අතර පිහිටි මහමදික භූමි කලාපය තුළ යේසුස් වහන්සේ ජීවමාන සමයේ ජීවත් වූ ජනයා ගෙන් බහුතරයක් බෞද්ධයෝ වූ හ. පර්සියාව, අවකානය හා ගාන්ධාරය එකල බෞද්ධ රාජ්‍ය විය. එම බෞද්ධයෝ, කඩුවේ බලයෙන් මහමදාගමට හරවනු ලැබූ හ. සූෆී නමින් නිකායක් ඇතිකර ගන්නා ලද්දේ එසේ කඩුවේ බලයෙන් මහමදාගමට හරවන ලද බෞද්ධයන් විසිනි.

සූෆීන්, මූලධර්මවාදීහු නො වෙති. බුදුදහමේ ආභාසය විසින් දර්ශනවාදීන් බවට පමුණුවනු ලැබ ඇති ඔවුහු, සියලු ආගම් හා දර්ශන ඉවසති. සූෆීවරුන් ගේ දෙවියා 'සකී' නම් වෙයි. සූෆීවරුන් අදහන අන්දමට සකී දෙවියකු නොව දේවතාවියකි. මෙය තාරා වන්දනාවෙන් හින්න වූවක් විය හැකි ය. ඇගේ අතෙහි 'සකී' නමින් හැඳින්වෙන සුරා විතක් වෙයි. සකී බඳුනෙන් සුරා බිඳක් තොල ගෑ පුද්ගලයා ගේ සිතෙන් කෙලෙස් මල සියල්ල ඉවත් වන බව ඔවුහු අදහති.[21] ලංකාවේ මහමදික ජනයා අතර 'සබ්කි' නමින් ජනප්‍රිය මත්පැන් වර්ගයක් තිබේ. සබ්කි, සකී යන වචනයෙන් හින්න වූවකි. මූලධර්මවාදීන් තහනම් කරන තෙක් ම පර්සියාව, ඇෆ්ගනිස්ථානය, පකිස්ථානය ඈ දේශයන්හි සුරාසල්වල සුරා සැපයූ රූමත් කාන්තාවන් හඳුන්වන ලද්දේ ද සකී නමිනි. ඔවුහු අභිසාරිකාවෝ ද වූ හ.

ජයවර්ධනපුර සමයේ ලියැවුණු ගුත්තිල කාව්‍යයේ අඩංගු අලංකාර නගර පිහිටියේ වර්තමාන පකිස්ථානයේ ය. සාගල නුවර වර්තමාන සියල්කෝට් නගරය යි. මිලින්ද ගාන්ධාරයේ පෙෂාවෝර්හි රජකම් කළ ග්‍රීක රජෙකි. හෙළිදරව් නොවූ ඓතිහාසික පුවතක් ද ඇත්තේ ය. මක්කම පිහිටි සිරිපතුලක් පිළිබඳ ව සිංහල ජනශ්‍රැතියේ එයි. මෙබඳු ජනශ්‍රැති එකවර ම ප්‍රතික්ෂේප කරන්නන් අමතක කරන දෙයක් තිබේ. ලෝකයේ බොහෝ ඓතිහාසික තොරතුරු ගවේෂණවලින් අනාවරණය කරගැනීමට පෙර ජනශ්‍රැතිවල සඳහන් වුණි. බුද්ධිමත් ඉතිහාසඥයන්ට ජනශ්‍රැති යනු පොදු ජනතාව ආරක්ෂා කරන නොලියවුණු ඉතිහාස සාක්ෂි වන්නේ ය. මක්කම නමින් හැඳින්වෙන මැකාහි කව්බා දේවාලය ආබ්‍රහම් විසින් සාදන ලද්දක් බව බයිබලයේ සඳහන් වේ.[6]

කව්බාහි අල්ලා හෙවත් හුබාල් සමඟ තවත් දෙවිවරු 365ක් සහ දේවතාවියෝ වැඩවිසූ හ. ඔවුන'තර අල්-ලාත්, අල්-මනාත් හා අල්-උෂා නම් අල්ලා ගේ දියණියෝ ද වූ හ. සිරියාව ඊජිප්තුව පලස්තීනය ආදී රටවල බුද්ධාගම පැතිර තිබුණි. බහු දේව මධ්‍යස්ථානයක් වූ මැකාහි බුදුන් ගේ සිරිපතුලක් තිබුණේ නම් අරුමයක් නොවේ. මොහොමඩ් කඩුව ඔසොවා ගෙන ධර්ම ප්‍රචාරයේ යාමට පෙර බෞද්ධ ධර්ම දූතයෝ අරාබියේ ගම් දනව්වල දහම් දෙසමින් ඇවිද්ද හ.

කාශ්මීරයේ යුසු අසාෆ් සොහොන් ගල මත යේසුතුමා ගේ පතුල් ලාංඡන සලකුණු කර ඇත්තේ ය. සිරිපතුල් පිහිටුවීම බෞද්ධ සම්ප්‍රදායකි. බුද්ධ රූපය නෙළීමට පෙර බෞද්ධයෝ සිරිපතුල් වන්දනා කළ හ. සිරිපතුලක් මක්කම නොවූයේ නම් ලංකාවේ බෞද්ධයන් අතර එවැනි ජනශ්‍රැතියක් ප්‍රචලිත වූයේ ඇයි?

පැරණි ම සිත්තරු, යේසු රුව තමන් අසා ඇති අන්දමට භික්ෂුවක සේ සිතුවම් කළ හ. පසු කලෙක යේසු ප්‍රතිමාව වෙනස් කෙරිණි. යේසු බුද්ධ ශ්‍රාවකයකු බව වසන් කිරීම ද එහි අරමුණ වූවා විය හැකි ය.

සියලු ම ඓතිහාසික සාක්ෂි ඒකරාශී කරන විට යේසුස් වහන්සේ තන්ත්‍රයානික භික්ෂුවක් බව ඔප්පු වේ. උන් වහන්සේ ටිබෙට් සම්ප්‍රදායට අනුව කටයුතු කරමින් දේව රාජ්‍යයක් ගොඩනැංවීමට උත්සාහ කළ හ. එම දේව රාජ්‍යයේ ආරම්භය දලයි ලාමාවරයකු යටතේ පාලනය වන බෞද්ධ රාජ්‍යයක් පිහිටුවා ගැනීම යි. බෞද්ධ රාජ්‍යයේ පරමාර්ථය මනුෂ්‍යයා යහපත් ජීවිතයකට හැඩගස්වා සංසාර සාගරයෙන් එතෙර කරවීම යි. ලීකදේ ඇණගැසීම නිසා පලස්තීනයේ බෞද්ධ රාජ්‍යයක් ගොඩනැංවීම පිළිබඳ යේසුස් වහන්සේ ගේ සිහිනය බිඳවැටුණ ද එතුමා ගේ සිතින් බෞද්ධ රාජ්‍ය සංකල්පය ඉවත් නො විණි. කාශ්මීරයේ බෞද්ධ රාජ්‍යය ගොඩනංවන ලද්දේ එතුමා විසිනි. හතර වෙනි ධර්ම සංඝායනාවෙන් පසුව කණිෂ්ක රජතුමා ගේ අණ පරිදි එහි සියලු විස්තර තඹපත්වල ලියා ස්ථූපයක තැන්පත් කරන ලදි. මේවා විනාශ නොවී තිබී කිසියම් දිනක හමුවුවහොත්

මොහොමඩ් උත්පත්තිය. 14 වෙනි සියවසට අයත්, බෞද්ධ චිත්‍ර සම්ප්‍රදායට අනුව අඳින ලද චිත්‍රයකි.

පලස්තීනයෙන් ලැබුණු මවු දෙවඟන ගේ ප්‍රතිමාවක්

යුදෙව්වන් වන්දනා කළ දේවතා රූපයක්

යේසුස් වහන්සේ පිළිබඳ වටිනා තොරතුරු රාශියක් හෙළිදරව් වනු නොඅනුමාන ය.

බෞද්ධ රාජ්‍යය හා නිර්වානය පිළිබඳ ටිබෙට් දර්ශනය අළලා සම්පාදිත පොත්පත් විශාල සංඛ්‍යාවක් ඇතත්, මෙම විෂය පිළිබඳ ව සිංහලයෙන් ලියවුණු එක ම පොතක් හෝ දක්නා නො ලැබේ. තන්ත්‍රයානය යනු කාමුක ක්‍රියා ගුරුකොට ගත් මිථ්‍යාදෘෂ්ටියක් ය යි ඇතැමුන් ගේ හැඟීමක් තිබේ. එය අසත්‍යයකි. තන්ත්‍රයානික භික්ෂූන් වහන්සේලා ජීවිතයේ පරම සුවය හෙවත් නිර්වාණය පිළිබඳ ව සාකච්ඡා කිරීමේ දී ලිංගික ආශාවන් ගැන ගැඹුරු ලෙස සාකච්ඡා කර ඇතිවා පමණි. සිග්මන්ඩ් ප්‍රොයිඩ් නමැති ලෝක ප්‍රසිද්ධ මනෝ විද්‍යාඥයා මනුෂ්‍ය ජීවිතයේ හැම සිද්ධියකට ම ලිංගික ආශාව සම්බන්ධ කර තිබේ. තන්ත්‍රයානික භික්ෂූන් වහන්සේලා ප්‍රොයිඩ්ට අවුරුදු දහස් ගණනකට පෙර ලිංගිකත්වය පිළිබඳ ව සාකච්ඡා කළ හ.[7]

සරාහ, විදර්භයේ මහීපාල රජතුමා ගේ අග්‍රාමාත්‍යවරයා ගේ පුත්‍රයා යි. මහීපාල රජතුමන් සිය දියණිය සරාහට විවාහ කර කර දීමට අදහස් කළ නමුදු, භික්ෂුවක වීමේ ආශාවෙන් මඩනා ලද සරාහ, එකල සුප්‍රකට භික්ෂුවක වූ ශ්‍රී කීර්ති තෙරුන් වෙත ගොස් තමන් භික්ෂු ශාසනයට ඇතුළු කරගන්නා මෙන් ඉල්ලීමක් කළේ ය. තමන් දන්නා වේදය ඇතුළු සකල විධ දැනුම් සම්භාරය ඉවතලා භාවනා කරන්නැ යි ශ්‍රී කීර්ති තෙරණුවෝ සරාහට උපදෙස් දුන් හ.

සරාහ භික්ෂුව වසර ගණනාවක් නොකඩවා භාවනා කළේ ය. දිනක් එතුමා, දැහැන්ගත වී සිටිය දී, වෙළෙඳපළේ සිටින ස්ත්‍රියක තමා ගේ ආචාර්යවරිය වනු දුටුවේ ය. ශ්‍රී කීර්ති තෙරුන් වෙත ගිය සරාහ, එතුමා ගේ අවසරය ඇති ව වෙළෙඳපළ වෙත ගියේ ය. තමා භාවනා කරද්දී දුටු කාන්තාව වෙළෙඳපළෙහි කිසියම් ස්ථානයක ඊතලයක් සදමින් සිටිනා'යුරු දුටු එතුමා එම ස්ත්‍රිය සමීපයට ගියේ ය. ස්ත්‍රිය, එක් ඇසක් වසාගෙන එක ඇසකින් ඊතලයේ එක් පැත්තක් නිරීක්ෂණය කර, අනතුරු ව වසාගෙන සිටි ඇස විවෘත කොට විවර ව තුබූ ඇස පියවා ඊතලයේ අනෙක් පැත්ත නිරීක්ෂණය කොට ඊතලයේ ඇද හරින අන්දම, එතුමා බලා සිටියේ ය.

හදිසියේ ම සරාහ භික්ෂුවට, තමා එතෙක් භාවනා කරමින් සෙවූ සත්‍යය අවබෝධ විය. එතුමා ගී ගයමින් නටමින් එම ස්ත්‍රිය සමඟ සොහොන් පිටියක ජීවත් වූ බව සඳහන් වේ. තන්ත්‍රයානයේ නිර්මාතෘවරයාණෝ සරාහ තෙරණුවෝ ය.[8]

යේසුස් වහන්සේ මරිය මගදලේනා නමැති ස්ත්‍රිය සමග සම්බන්ධකම් පැවැත්වූ බව බොහෝ ඉතිහාසඥයෝ සඳහන් කරති. බයිබලයේ සඳහන් අන්දමට, එක් දිනක් මගදලේනා යේසු වෙත පැමිණ ඉතා ම මිල අධික සුවඳ දියරයකින් එතුමා ගේ දෙපා සෝදන්නට වූවා ය. එය දුටු ජුදාස්, "මනුෂ්‍යයින් බඩගින්නේ මිය යද්දී මැ මෙතරම් වටිනා සුවඳ වතුරින් ඔබේ දෙපා සේදීම අනුමත කරන්නේ ඇයි ද" යි යේසු ගෙන් ඇසුවේ ය.

එවිට යේසු, "දුප්පත්කම හැම විට ම තියෙනව. ඔබට මෙම ස්ත්‍රිය ගේ හදවත වැටහෙන්නෙ නැහැ. ඇයට සුවඳ වතුර වක්කරන්න ඉඩ හරින්න. එය මිල අධික ද නැද්ද කියමින් වටිනාකම මැනීම අවශ්‍ය දෙයක් නොවෙයි. මට ඇය ගේ හදවතේ ඇති වන උසස් හැඟීම් පෙනෙනව. ඒක තමයි ඇගේ පැතුම; යාඥාව. මට ඒ යාඥාව වළක්වන්න බෑ" යි කීවේ ය.[26]

යේසු මගදලේනා සමග හාදකම් පැවැත්වූ බව සැබෑ නම් එතුමා භික්ෂුවක් නොවේ ය යි යමකු තර්ක කළ හැකි ය. එහෙත් යේසුස් වහන්සේ අපට හුරුපුරුදු ථෙරවාදී භික්ෂුවක් නොව තන්ත්‍රයාන සම්ප්‍රදායට අනුව අභිෂේක කරන ලද බෝසත්වරයක් වූ හ. තන්ත්‍රයානයේ නිර්මාතෘ සරාහ තෙරුණුවන් කාන්තාවක් සමඟ ජීවත් වූ අයුරු ඉහත විස්තර කෙරිණි. සෑම බෝසත්වරයකුට ම පතිනියක් සිටින්නී ය. ඇය ඔහු ගේ ශක්ති වෙයි. එසේ නම් මගදලේනා, යේසු බෝසතුන් ගේ ශක්ති වන්නී ය.

එකල ඊශ්‍රායල් නීතිය අනුව දේශකයකු වීමට නම් විවාහ විය යුතු ම ය. යුදෙව්වන් ගේ විවාහ වීමේ වයස වූ අවුරුදු 13 දී යේසුට බොහෝ විවාහ යෝජනා ඉදිරිපත් කෙරුණු නමුදු ඔහු ඒවා ප්‍රතික්ෂේප කොට පෙරදිග බලා ගියේ ය. පෙරළා පැමිණි යේසුස් වහන්සේ සිය ආගමික ජාතික නායකත්වය සාක්ෂාත් කරගැනීමේ පළමු පියවර ඇරඹුවේ දේශකයකු වශයෙනි. එහෙයින් දේශකයකු වීම සඳහා අවශ්‍ය මූලික සුදුසුකම වූ විවාහකයකු වීම උන්වහන්සෙ මගදලේනා හා විවාහ වීමෙන් සපුරා ගත් බව සිතිය හැකි ය.

භාරතයේ පැතිර පැවති ශක්ති වන්දනාව හා මහායාන බෝසතුන් ගේ ශක්ති සමාන නැත. හින්දු දාර්ශනිකයන් පැහැදිලි කරන ලෙසට, ශක්ති යනු මිහිකත යි. එය අවසානයේ දී පරමාත්මය හෙවත් බ්‍රහ්මන් වෙයි. පරමාත්මය පිදීම සඳහා කළ පූජා ශක්ති පූජා නම් විය. ඇතැම් ශක්ති පූජාවල දී ඒවාට සම්බන්ධ වන ස්ත්‍රී පුරුෂයෝ සම්භෝගයේ යෙදුණ හ. මෙබඳු කාම උත්සව වත්මන් සමාජ විද්‍යාඥයන් හඳුන්වන්නේ අභිචාර ලෙසිනි.

ශක්ති වන්දනාව ආර්ය ශිෂ්ටාචාරය පැතිර ගිය කනානයේ පවා පැවතුණි. පලස්තීනයේ පුරාවිද්‍යා කැනීම්වල දී නිරුවත් දෙවඟනන් ගේ ප්‍රතිමා ලැබී තිබේ. ශක්ති වන්දනා පැවති දේවාලවල දේවදාසියෝ සිටිය හ. මරියා එබඳු දෙවොල් ස්ත්‍රියකි. ඇය ශක්ති පූජාවක දී ගැබ් ගත්තා ය. ශක්ති වන්දනාවේ නිරතවූවනට මෙබඳු ගැබ්ගැනීම් සාමාන්‍ය කරුණක් පමණක් ම විය. අපරාධයක් වූයේ, යොහෝවා ලබ්ධිකයන්ට පමණි. ලංකාවට කසාද නීතිය හඳුන්වා දෙන ලද්දේ යුරෝපීයයන් විසිනි. උඩරට සමාජයේ වූ එකගෙයි දීග කෑම යුරෝපීයයන්ට දුශ්චරිතයක් විය. බ්‍රිතාන්‍ය පාලන කාලය තෙක් ම සිංහල ස්ත්‍රීහු උඩුකය නොවැසූ හ. බ්‍රිතාන්‍යයෝ, ස්ත්‍රීන් ගේ උඩුකය වසාදැමීම සඳහා නීති පැනවූ හ.[27] එහෙත් ගැමි කාන්තාවෝ උඩුකය නොවැසූ හ. මෑතක් වන තුරු ම උඩුකය නොවැසූ ගැමිලියෝ විසූ හ. යුදෙව් ආගමික නීති මගින් අපරාධකරුවන් ලෙස හංවඩුගසනු ලැබූ දෙවොල් ස්ත්‍රීන් ගලවා ගැනීම සඳහා යම් යම් සංවිධාන එම සමාජයේ තිබුණි. එසින්ස්වරු ද එබඳු ස්ත්‍රීන් ගලවා ගත් හ. ස්ත්‍රිය කිසිවකුට විවාහ කරදීම පිණිස මැදිහත්වීමෙනි. මරියා යෝසප්ට විවාහ කර දී ඇත්තේ එසින්ස්වරුන් ගේ මැදිහත් වීමෙනි. යේසුස් වහන්සේ ගල් ගසා මරාදැමීමට නියම ව සිටි ස්ත්‍රියක ගලවා ගැනීමේ සිද්ධියක් බයිබලයේ සඳහනි.

පාදක සටහන්

1 CIA Fact Book net CIA.com

2 The Crucifixion By An Eye Witness - Death Warrent of Jesus, p29-31.
3 බෞද්ධ දර්ශනය හා චරණය - ඩබ්ලිව්. ඇස්. කරුණාරත්න
4 "Abba, Father all things are possible unto Thee: take away this cup from me. Nevertheless, not what I will, but what what thou will" Mark. 14.36
5 ලූක් 22. 43
6 නික්මයාම 2. 11
7 Rawsen Philip, Tantra, Germany, 1974
8 Lama Yoze, Tantra, p4 බර්ලින් මධ්‍යම පුස්තකාලයේ පිටපත.

ආශ්‍රිත ආගමික ග්‍රන්ථ

01 Bavishya Maha Purana .- Tr. Shrinath Sastri, Bombay. 1917
02 Bible Encyclopedia for Children, Ed. Cecil Northcott, Westminister Press. 1964.
03 Bock, Janet, The Jesus Mystery, Aura Books, Los Angeles, 1980
04 Catholic Encyclopedia, Ed. Rv. Peter M. J. Strarinskis, Sunday Vision Publishers, USA, 1995.
05 Churchward, Albert, The Origin and Evolution of Religion, 1924
06 Charles, R. H. The Book of Enoch, Oxford, 1893.
07 Dezirkoff, Boriz, H. P. Blavatzky Collected Writings Vol. 1-15, Theosophical Pub. House
08 Dummelow, Rev. J., Commentary on the Bible, London, 1917
09 Ghose, Ashutosh, Swami Abedananda: The Patron Saint, Calcutta, 1967
10 Durant, Will, The Age of Faith, Simon & Schuster, 1950
11 Gospel of Philip, Ed. James Robinson, NY, 1977
12 Gupta, S., Vedantha, India, 1956
13 Hiren, Yrjo, The Sacred Shrine, Mcmillen, London, 1912
14 Imal Collection, Teaching of the Holy Prophet, 1836
15 Klijin, A. F., tr. The Act of Thomas, Leiden, 1952
16 Lama Yoze, Tantra, London
17 Lonsdale & Laura, Tr., The Gospel of Barnabas, Oxford, London, 1907
18 Mahavamsa Tr. Geiger, Wilhelm, 1964 ed.
19 Mankinds Search for God, Watch Tower Bible Society, USA, 1990.
20 Meer Izzut-Oolah, Travels in Central Asia, 1812, Tr. Henderson, 1872.
21 Raijneesh Bagvan, Rajneesh Bible Vol. 1-4 Rajneesh Publications Inc., Boulder, USA, 1984
22 Rajwangari, Shrimad, Atma Siddhi, India
23 Robinson, Forbes, The Coptic Apocryphal Gospels, Metthuen & Co., Londan, 1902
24 The Family Bible Encylopedia Copy Publishing House, USA, 1972

25 The Koran., Tr. Al Ahmed, UK, 1953
26 The Holy Bible, Edi. Heiesger Marie, Oxford University Press, USA, 1995
27 The Torah, The Jewish Publication Society 1947
28 The Talmuds, Mcmillan, London, 1938
29 The Apocryphal New Testament, Tr. M. R. James, London, 1926
30 William, M., The Life of Mohamad, UK, 1920
31 අලුත් ගිවිසුම, ශ්‍රී ලංකා බයිබල් සමාගම, කොළඹ
32 දැනුම, International Bible Students Association, Ny, USA, 1995
33 බෞද්ධ දර්ශනය හා චරණය, ඩබ්ලිව්. ඇස්. කරුණාරත්න, 1992
34 මකුටමුණිධාරී අවලෝකිතේශ්වර නාථ පුරාණය, පරි. පී. බී. මීගස්කුඹුර, ප්‍රදීප ප්‍රකාශකයෝ, 1994
35 ශුද්ධ බයිබලය, ඉන්දු ලංකා බයිබල් සමාගම, කොළඹ, 1961

වෙනත් ග්‍රන්ථ

01 Allegro, John, The Sacred Mushroom and the Cross, Hodder & Stoughtion, London, 1970.
02 ASIAR 1908-1909
03 Beth Hess & Myra Farree, Sexual Terraorism, Sagwe Pub., 1972
04 Bhandarker Research Institute, B. C. Law Com., Vol. I Poona, 1951, Paranavitana, Senarath , Bodisatva Avalokitesvara in Ceylon
05 Black, Jeremy, Atlas of World History, Dorling Kindersley, 1999
06 Brandon, S.G.F. The Trail of Jesus Nazerth, Batsford, London, 1968
07 Burrows, M. The Dead Sea Scrolls, Viking, LOndon, 1956
08 Ceylon Historical Journal, RAS Vol. 1-10, 1960, The Gamini in the Ancient India.
09 Frosstrom, Johan, The King of the Jews, Deepani, Nugedoda, 1987.
10 Fossier, Robert, The Cambridge Issustrated History of the Middle Ages, 1989.
11 Great Men of India, Ed. L. F. Rushbrook Williams, The Home Library Club.
12 Hassnain, Fida , The Search for the Historical Jesus, Gateway Books, UK, 1994
13 Hassnain, Fida, Buddhist Kashmir, New Delhi, 1973
14 Hodgson, Peter, C., Hegal Lectures on the Philosophy of Religion Vol. 2, University of California Press, 1987
15 Josephus, Flavius, The Antiquities of Jewes, London, 1872
16 Josephus, Flavius, The Jewish Wars, Tr. W. Whiston, London
17 Ian Wilson, Jesus: The Evidence, Haper & Row, 1984
18 Ian Wilson, The Shroud of Turin, Penguine, 1978
19 Kamenka, Eugene, The Portable Max, Viking Penguine Press, 1983
20 Keller, Werner, The Bible as a History, Hodder, London, 1956

21 Kalhana's Rajatarangani, tr. Stein London, 1900
22 Lal, Chaman, Hindu America, India, 1910
23 Levak, Brain P., Witch Hunting in Continental Europe, Garland Pub., 1991
24 Levi, The Aquarian Gospel
25 Lincoln, Bruce, Myth, Cosmos and Soceity, Harward University Press, 1986
26 Marx, Karl, The Capital, Moscow
27 Marshall, John, Guide to Taxila, Cambridge, 1951
28 Margolis, Max & Marx History of the Jews People, USA, 1978
29 Merrick, Henrietta, In the World's Attic, Putnams, NY 1931
30 Nazeer, Ahmed, Jesus in Heavan on Earth, Muslim Mission, UK, 1952.
31 Nischan, Bodo, Lutherans and Calvinists in the Age of Confessionalism, Ashgate Pub., 1999
32 Notovich, Nicalos, The Life St. Issa, NY, 1894
33 Paranavithana, Senarath, The Greeka and Mauryas, Lake House, 1970
34 Paranavithana, Senarath, The Story of Sigiriya, Lake House, 1970
35 Peloubets Select Notes on the International Lessons, Boston, 1918, p190-193.
36 Perniola, V., The Catholic Church in Sri Lanka, Vol. 2, 1983
37 Prester John, Atlas of Exploration by John Hemming, Reed Books, 1997
38 Perera, S. G., Historical Sketches, Colombo, 1983
39 Roerich, Nicolai, Altai Himalaya, NY, 1929
40 Rajneesh Bagvan, Yoga Vol. 1-3, USA, 1975
41 Rajneesh Bagvan, Priest & Politics, Rebel Pub. House, Germany, 1995
42 Rajneesh Bagvan, One Seed Make Whole Earth Green, Rebel Pub., Germany, 1989
43 Rajneesh Bagvan, India My Love, Rebel Pub., Germany
44 Rawsen, Phillip, Tantra, Germany, 1974
45 Rumusio, Vojeges and Travels, London, 1910
46 Seranno, Miguel, The Serpant of Paradise, Ridder & Co., London, 1950
47 Schinfield, Hugh, Saints Against Ceaser, Macdonald, London, 1942
48 Shiva, Vandana, The Violence of Green Revolution, Zed Books, UK, 1991
49 The Crucifixion by An Eye-witness, Indo-American Book Co., 1907
50 Wells, H. G., Short History of the World, Pelican
51 Who's who in The Bible, Readers Digest Association, NY, USA, 1994
52 අකුරටියේ අමරවංශ නාහිමි, හේමචන්ද්‍ර දිසානායක, වංසත්ථප්පකාසිනි මහාවංශ ටීකාව, විද්‍යාලංකාර, 1994
53 අනගාරික ධර්මපාල අප්‍රකට අත්ලිපි, (සංස්.) පූජ්‍ය දොඩන්දූවේ ධර්මසේන

හිමි, රංජිත් අමරකීර්ති පලිහපිටිය, නාරද කරුණාතිලක, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, (මුද්‍රණයේ)
54 කතෝලික ආක්‍රමණය, බෞද්ධ ජාතික බලවේගය, 1963
55 කොලට් සේනානායක, ගිලන්පස පූජාවට හැලිඅරක්කු කලවම් කළ වසන්ත රාජා, බර්ලින් ශ්‍රී ලංකා මානව හිමිකම් සුරැකීමේ සංවිධානය
56 ජයවර්ධන, කුමාරි, ශ්‍රී ලංකාවේ කම්කරු ව්‍යාපාරයේ නැගීම, වෙස්ලි මුද්‍රණාලය, කොළඹ, 1978
57 ගංගොඩවිල සෝම හිමි, දේව සංකල්පය හා බෞද්ධ ආකල්ප, සිරි වජිරඤාණ ධර්මායතනය, මහරගම, 2000
58 ගුණවර්ධන, තේජා, කොහොඹා කංකාරිය, අරුණ ප්‍රකාශකයෝ, කොළඹ ජයතිලක. කේ. විමර්ශන සහිත තිසර සන්දේශය, ප්‍රදීප ප්‍රකාශකයෝ, 1991
59 දූතයා, ජාතික සංස්කෘතික කතෝලික මාසිකය, 8 වන කලාපය, කතෝලික මුද්‍රණාලය, 1972
60 පලිහපිටිය, රංජිත් අමරකීර්ති, අප්‍රමාණ මිතිසෙක්-ශ්‍රී චන්ද්‍රරත්න මානවසිංහ, ශ්‍රී චන්ද්‍රරත්න මානවසිංහ පදනම, බොරලැස්ගමුව, (මුද්‍රණයේ)
61 පෙරදිග උරුමය, ආසියා සංස්කෘතික සංවිධානය, මහාචාර්ය ඩී. ඊ. හෙට්ටිආරච්චි, වත්තල විජයබා පිරිවෙන පිහිටියේ කොහේද?
62 පෙරේරා, ආර්. ඊ. නිකාය සංග්‍රහය, 1935
63 පුරාණ යුගය, තිසර ප්‍රකාශකයෝ, දෙහිවල, 1962, පුරාණ ලංකාව හා විදේශයන් අතර වූ වෙළඳාම, බී. ජේ. පෙරේරා,
64 ප්‍රනාන්දු, ආර්. පී. සුසන්තා, හලාවත උරුමය, 1995
65 මුදියන්සේ සේනානායක, සැඟවුණු සුවඳ, විසිදුනු ප්‍රකාශන, 1995
66 ලංකාවේ මහායාන වාදය, පුරාණ යුගය, සෙනරත් පරණවිතාන, තිසර ප්‍රකාශකයෝ, දෙහිවල
67 විජේවර්ධන, ජස්ටින්, චීනයේ හා තිබ්බතයේ මහා සංඝ සංහාරය, ඇම්. ඩී. ගුණසේන, කොළඹ, 1965
68 හිගින්ස්, මේරි මියුසියස්, ගුත්තිල කතාව, කේව් සහ සමාගම, 1938
69 හේතුවාදී සන්දේශය, ප්‍රගති මුද්‍රණ ශිල්පියෝ, 1973

විශ්වකෝෂ

01 Cecil Northcott, Bible Encyclopedia for Children, Westminister Press, USA, 1964
02 Encyclopaedia Britanica, London
03 Encyclopaedia India, New Delhi, 1990
04 Jewish Encyclopaedia, London, 1905
05 The Family Bible Encyclopedia, Copylab, USA, 1972

තොරතුරු සපයාගත් කෞතුකාගාර සහ ආශ්‍රිත පුස්තකාල

01 British Museum Library
02 Berlin Frei University Indiology Library

03 Berlin Stadt Bibliotech
04 Moscow State Museum
05 Rijks Museum, Amsterdam
06 Roerich Musem, New York
07 Theosophical Library, Adyar, Madras
08 Top Kape Museum, Turky
09 Tübingen University Library, Germany
10 Tübingen Indiology Library, Germany

පුවත්පත්

01 අවුරුදු 150ක් පැරණි බයිබලයේ පිටපතක්, දිවයින ඉරිදා සංග්‍රහය 1995 ජනවාරි 15,
02 ජේසුතුමා ආසියාවේ නැවත ඉපදෙන්නට හදන්නේ ඇයි? අර්නස්ට් පෝරුතොට පියතුමා, දිවයින, 1999 දෙසැම්බර් 25,
03 මිහින්තලේ ගම්උදාවට බයිබල් ලක්ෂ දෙකක් බෙදන වැඩසටහනක්. දිවයින ඉරිදා සංග්‍රහය 1993 පෙබරවාරි 21,
04 රොබට් ගේ නිවෙසේ පැවති සංස්කෘතික විවාද, කොලට් සේනානායක, දිවයින, 1984 ඔක්තෝබර් 21.
05 වගතුග, ශ්‍රී චන්ද්‍රරත්න මානවසිංහ, ලංකාදීප, 1956 ජූලි 17, 1957 (දිනය සොයා ගත නොහැකි විය.)
06 Bull, School of Oriental Studies, London, 1938.
07 Himlischer Diktator, Der Spigel, Germany 44/1993.
08 Jesus war zweimal verheiratet und hatte drei Kinder Berliner Zeitung Germany, 22 July, 1992
09 Pope Offers Apology For Church's Sins, Seattle Post - Intelligencer, 03.13.2000
10 Unidentified objects emerge from Ruvanveli-seya premises, Gunapala Senadheera, The Island, 21. 5. 1988

අන්තර්ජාලය

01 CIA Fact Book, CIA.com
02 Emenesty International Reports, Emenesty.com
03 Lippelt, Die.Grunen
04 Yahoo.com

චිත්‍රපට

01 bei den Kanela Indianer, Jürgen Diekert, 1993 N3 Germany
02 World War ii, History Channel, TV USA
03 Little Buddha, Bernado Bertolucci

යේසුස් නම් බුද්ධ ශ්‍රාවකයාණෝ

දෙ වන මුද්‍රණය

"යමෙක් ඒ (බයිබලයේ) වචනවලට යමක් එකතු කරන්නේ නම් දෙවියන් වහන්සේ මේ පොතෙහි (බයිබ්ලයෙහි) ලියන ලද පිඩා ඔහුට එකතු කරන සේක. යමෙක් මේ අනාගත වාක්‍ය පොතේ වචනවලින් යමක් අහක් කරන්නේ නම් මේ පොතෙහි ලියා තිබෙන ජීවන වෘක්ෂයෙන් ද ශුද්ධ නුවරින් ද දෙවියන් වහන්සේ ඔහු ගේ කොටස අහක් කරන සේක."

(ශුද්ධ වූ යොහාන්, හෙළිදරව්ව 22.18)

බෲනෝ නම් විද්‍යාඥයා "ඒ වචනවලට" යමක් එකතු කළේ ය. පාප්තුමා ගේ ආඥාවෙන් බෲනෝ පුළුස්සා මරා දමන ලදි. ගැලීලියෝ නම් විද්‍යාඥයා "ඒ වචනවලට" යමක් එකතු කළේ ය. ඔහු ගේ දෑස් අන්ධකොට සිර කරන ලදි.

ඉතිහාසයේ ප්‍රසිද්ධ එම පුද්ගලයින් හැරුණු විට බයිබලයට පටහැනි කරුණු ප්‍රකාශයට පත් කොට මරණ දඬුවම ලැබූ, සිරගත කරනු ලැබූ උගත්තු බොහෝ වෙති.

සැබෑ යේසුස් වහන්සේ කවුරුන් දැයි හෙළිදරව් කරන "යේසුස් නම් බුද්ධ ශ්‍රාවකයාණෝ" බයිබලයෙහි සඳහන් කරුණු විශාල ප්‍රමාණයක් නිෂේධ කරයි. බයිබලයට අලුත් කරුණු රාශියක් එක් කරයි.

සැබෑ යේසුස් වහන්සේ හඳුන්වාදීම දඬුවම් ලැබිය යුතු වරදක් ද?

ගොඩගේ පොත් මැඳුර
ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ
661, පී. ද ඇස්. කුලරත්න මාවත,
කොළඹ 10

රු. 225/-

ISBN 955-20-4952-0

පිටකවරය:- කරුණාසිරි විජේසිංහ
මුද්‍රණය:- පැනසර, කටුබැද්ද